# යතිර බිඳහැර...

## ගවේෂණාත්මක මාධ්‍යකරණය

FRIEDRICH EBERT STIFTUNG

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

යතිර බිඳහැර....
ගවේෂණාත්මක මාධ්‍යකරණය

දෙවන මුද්‍රණය - 2012 දෙසැම්බර්

අධ්‍යයන කණ්ඩායම
ලක්ෂ්මන් ගුණසේකර, නාමල් පෙරේරා, සංජන හත්තොටුව, ලසන්ත රුහුණගේ, ජයසිරි ජේදුරුආරච්චි, රාහුල් හෙට්ටිආරච්චි, අසේල බැද්දගේ, මංගලනාත් ලියනාරච්චි, අසෝක සේනාරත්න, ටී. එම්. ජනූර් කිච්ලාන්

සක්ෂතා අධ්‍යයන කණ්ඩායම
ශාමිනී බොයිල්, මනික් මෙන්ඩිස්, ලසන්ත රුහුණගේ, සී. දොඩාවත්ත, කමල් ලියනාරච්චි

ප්‍රාදේශීය සක්ෂතා අධ්‍යයන කණ්ඩායම

විශේෂ දායකත්වය
සංජන හත්තොටුව
ලසන්ත රුහුණගේ

සැලසුම් කණ්ඩායම
ටී. කලෙයිමගල්, දිල්රුක්ෂි හඳුන්නෙත්ති, ෂාන් විජේතුංග, ආනන්ද ධර්මප්‍රිය ජයසේකර, හරිත දහනායක

ISBN: 978-955-1281-51-9

© සියලු හිමිකම් ඇවිරිණි. මෙම ග්‍රන්ථයේ අඩංගු කරුණු නැවත භාවිත කිරීමකදී හෝ සම්පාදනය කිරීමකදී ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් හා ෆ්‍රෙඩ්රික් ඊබට් ස්ටිෆ්ටුන්ග් ආයතනයේ අනුමැතිය ලබාගත යුතුය.



# යතිර බිඳහැර...

## ගවේෂණාත්මක මාධ්‍යකරණය

# පටුන


| අන්තර්ගතය | පිටුව |
| --- | --- |
| පෙරවදන | 01 |
| ස්තුතිය | 03 |
| මෙම සම්පත් ග්‍රන්ථය භාවිත කරන ආකාරය | 05 |
| **ප්‍රථම භාගය** | |
| පළමුවැන්න: ගවේෂණාත්මක වාර්තාකරණය කුමක්ද? කුමක් සඳහාද? | 08 |
| දෙවැන්න: වෘත්තීයභාවය හා ආචාරධර්ම | 15 |
| **ද්විතීය භාගය** | |
| තුන්වැන්න: ගවේෂණාත්මක කතා වස්තු බීජ | 22 |
| සිව්වැන්න: කතා වස්තුබීජය ඔපවත් කරගැනීම සහ කතාවට පිළිගැනීමක් ලබාගැනීම | 29 |
| පස්වැන්න: මානව මූලාශ්‍ර | 34 |
| සවැන්න: ලේඛන ඔස්සේ ගවේෂණය | 45 |
| සත්වැන්න: විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ගවේෂණය | 55 |
| අටවැන්න: කතාව සූදානම් කිරීම | 62 |
| නවවැන්න: 'අභියෝගාත්මක සම්මුඛ සාකච්ඡා' | 70 |
| දසවැන්න: හරිවැරදි බැලීම හා සංස්කරණය | 76 |
| **තෘතීය භාගය** | |
| එකොළොස්වැන්න: ගවේෂණාත්මක වාර්තාකරණ ව්‍යාපෘති කළමනාකරණය | 82 |
| දොළොස්වැන්න: ආරක්ෂාව | 87 |
| **උපග්‍රන්ථය** | |
| 1. ගවේෂණාත්මක මාධ්‍යකරණය පිළිබඳ නිර්වචන | ii |
| 2. ජනමාධ්‍යවේදයෙහි දස පනත | iii |
| 3. ගවේෂණාත්මක වාර්තාකරණය සඳහා වූ සත්විධ නියම | iv |
| 4. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම අනුමත කළ, ශ්‍රී ලංකා කර්තෘ සංසදය විසින් සකසන ලද වෘත්තීය ප්‍රතිපත්ති මාලාව (ආචාරධර්ම සංග්‍රහය) | vi |
| 5. ජාත්‍යන්තර ජනමාධ්‍යවේදී සම්මේලනය ප්‍රකාශයට පත් කළ ජනමාධ්‍යවේදී චර්යා මූලධර්ම පිළිබඳ ප්‍රකාශනය | x |
| 6. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ කෙසේද? | xii |
| 7. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ පැමිණිලි ආකෘති පත්‍රය | xviii |
| 8. 'මුනිවත බිඳීම' - සම්මුඛ සාකච්ඡා කලාව | xix |
| 9. මාධ්‍යවේදීන් සඳහා වන ආරක්ෂණ පද්ධතිය | xxv |
| 10. ආශ්‍රිත ආයතන නාමාවලිය | xxxi |
| 11. ආශ්‍රිත වෙබ් අඩවි නාමාවලිය | xxxiii |
| 12. ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය | xxxv |

# පෙරවදන

අද ලංකාවේ එක් ගමක් රාජ්‍ය නිලධාරීන් 30කට වැඩි පිරිසකගේ සේවය ලබයි. ඔවුන් කරන්නේ මොනවාද? ඔවුන්ගේ සේවය ජනතාවගේ අවශ්‍යතා සපුරාලන්නේද? මෙම සේවා සපයන ආයතන අත්‍යවශ්‍යද? දැනට ඇති මේවාට වඩා හොඳ විකල්ප මොනවාද? ජාත්‍යන්තර වශයෙන් කෙරෙන මිලදී ගැනීම් පිළිබඳ තීරණවලින් ජනතාවගේ ජීවිත බලපෑම්වලට ලක්වන්නේ කෙසේද? සාප්පු රාක්කවල කල් ඉකුත් වූ හෝ කල් ඉකුත් වීමට ආසන්න බෙහෙත් තිබෙන්නේ කෙසේද? මේවා ප්‍රශ්න කිරීම්වලට ලක් නොවී සහ පිළිතුරු නොලැබීම යට යන ප්‍රශ්නවලින් සමහරකි.

මේ අතර, වාණිජමය, දේශපාලනමය, සමාජමය හා සංස්කෘතිමය අවශ්‍යතා හා සබඳතා පිළිබඳ මායිම් මැකී යමින් පවතින සංකීර්ණ ලෝකයක, හරි දේ හා වැරදි දේ අතරත් පිළිගත හැකි දේ හා පිළිගත නොහැකි දේ අතරත් වෙනස, සාධාරණත්වය හා අයිතිවාසිකම් පදනම් කරගනිමින් විවෘත සාකච්ඡාවක් මගින්ම යළි යළිත් නිර්වචනය කරගත යුතුව ඇත. වඩා හොඳ මට්ටමේ පාලනයක්, සාධාරණත්වයක් හා තෘප්තිමත්භාවයක් සඳහා ජනතාවට මග පෙන්වන සංකල්පනාවන් බවට අදහස් පත් කොට ගත හැක්කේ සද්භාවයෙන් යුත් සැකය හා විවේචනාත්මක විවාදය මගිනි. දූෂිත රජයන්ගේ වර්ධනයට හොඳම බලශක්තිය වන්නේ වෙහෙසට පත් හෝ කොන් වී සිටින ජනතාවයි. මෙවැනි තත්ත්වයක් පැවතිය හැක්කේ ජනතාවගේ කුතුහලය වියැකී ගොස් හෝ සම්මුති ගස්වා යටපත් කරනු ලැබූ තත්ත්වයක් යටතේ පමණි.

ජනතාවගේ සුභසිද්ධියට හා යහපතට බලපෑම් කරන්නා වූ සමාජ සංසිද්ධීන් පිළිබඳව අනලස්ව සොයා බලා විධිමත්ව ඔවුනට දැනුම්දීමේ හැකියාවක්, වෘත්තියක් වශයෙන් ගවේෂණාත්මක ජනමාධ්‍යකරණයට ඇත. සාක්ෂි සාධක සහිත වාර්තාකරණයේදී පිළිගත හැකි ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කාර්යක්ෂම ක්‍රියාවලියක් අවශ්‍ය වේ. පිළිගත හැකි ප්‍රතිඵල යනුවෙන් මෙහිදී අදහස් කෙරෙන්නේ පාඨකයින්, ප්‍රේක්ෂකයින් හා ශ්‍රාවකයින් සක්‍රිය කළ හැකි ආකාරයට ඔවුන් තුළ ගොඩනැගෙන ආධ්‍යාත්මික වර්ධනයයි. මෙම ඉන්ධන නොමැති වේ නම් ප්‍රජාතන්ත්‍රවාදයේ 'එන්ජිම' නිසි ලෙස ක්‍රියාත්මක වීම නතර වනු ඇත. මෙහිදී තමන්ගේ යහපත වෙනුවෙන් දකින්නට, අවබෝධ කර ගන්නට සහ ක්‍රියාත්මක වන්නට ජනතාව පොලඹවන්නටත් ඔවුනට ශක්තිය සපයන්නටත් ජනමාධ්‍ය මෙවලම්වලට හැකියාවක් ඇත.

මෙය පශ්චාත් යුද කාලීන ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සංවර්ධනය සඳහා වැදගත් අවශ්‍යතාවක් වන හෙයින්, ශ්‍රී ලංකා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය සහ ෆ්‍රෙඩ්රික් ඊබර්ට් ස්ටිෆ්ටුන්ග් ආයතනය ගවේෂණාත්මක ජනමාධ්‍යකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා එක් වී සිටී. දූෂණයට එරෙහිව සාර්ථකව සටන් කිරීම සඳහා ගවේෂණාත්මක ජනමාධ්‍යකරණය පිළිබඳ පුහුණුව සහ හැකියා වර්ධනය

ප්‍රධාන සාධකයක් වන හෙයින්, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය එය සිය 2011-2015 ක්‍රමෝපායාත්මක සැලැස්මට අන්තර්ගතකොට ඇත. ගවේෂණාත්මක ජනමාධ්‍යකරණය ශ්‍රී ලංකාවේ පාලන තන්ත්‍රයේ ගුණාත්මක භාවය පිළිබඳ සංවාදයක් ගොඩනගනු ඇතැයිද, එනිසාම ශ්‍රී ලාංකික සමාජයේ සාකල්‍යතාව (සියලු ජන කොටස් හා ස්තර ඇතුළත් බව) වර්ධනය කරනු ඇතැයිද ෆ්‍රෙඩ්රික් ඊබට් පදනම විශ්වාස කරයි.

මෙම ඒකාබද්ධ උත්සාහයේ සාර්ථකත්වය රඳා පවතින්නේ, වැඩසටහන මගින් පුහුණුව ලබන්නන් ඉදිරිපත් කරන ප්‍රවෘත්ති වාර්තාවල ගුණාත්මක භාවය හා අදාළත්වය මතය. අවසානයේදී, දූෂණය අවම කිරීම සඳහාත්, සමාජයේ සාකල්‍යතාව වර්ධනය කරලීම සඳහාත්, පාලන තන්ත්‍රයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහාත් පුරවැසියන් දිරිමත් කෙරෙන්නේ මෙම ගුණාත්මක භාවය සහ අදාළත්වය මගිනි.

තත්ත්වයෙන් උසස් නිමැවුම් සහතික කිරීම සඳහා, ආයතන දෙකෙහි කණ්ඩායම ආත්ම පරීක්ෂාවෙන් බහුල වූද, වෘත්තිමය විවේචනාත්මක ප්‍රතිපෝෂණවලින් යුක්ත වූද, තාක්ෂණික සහායෙන් යුත් වූද ශක්තිමත් ක්‍රියාවලියක් ඉදිරිපත්කොට ඇත. (I) ගවේෂණාත්මක ජනමාධ්‍යකරණය සඳහා සම්පත් ග්‍රන්ථය (II) ගවේෂණාත්මක ජනමාධ්‍යකරණය සඳහා අත්පොත, සහ (III) පුහුණුකරුවන් පුහුණුකිරීමේ අත්පොත යන මෙම කෘති තුන, ජනමාධ්‍යවේදීන් ඔවුන්ගේ උතුම් වූ වෘත්තියෙහි පුහුණු කිරීම සඳහා යොදා ගන්නා දැනුම අන්තර්ගත කොටගන්නා අතර, ඒවා අපගේ දකුණු ආසියානු සහෘදයින් සමග මෙසේ බෙදා හදා ගන්නෙමු.

මෙම දැනුම උපයෝගී කර ගන්නවුන්ගේ සියලු කටයුතු සාර්ථක වේවායි පතන අතර, මේවායේ අනාගත සංස්කරණයන් වැඩි දියුණු කර ගැනීම සඳහා විවේචනාත්මක ප්‍රතිපෝෂණ ලබා දෙන මෙන් අපි පාඨකයන්ට ඇරයුම් කරමු.

**විජය ජයතිලක** (පී.එච්.ඩී.)
විධායක අධ්‍යක්ෂ
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා

**ජෝකිම් ෂ්ලුටර්**
නේවාසික නියෝජිත
ෆ්‍රෙඩ්රික් ඊබට් ස්ටිෆ්ටුන්ග්

2011 අගෝස්තු, කොළඹ

# ස්තුතිය

ගවේෂණාත්මක වාර්තාකරණය පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීම හා එම වාර්තාකරණයට අදාළ විශිෂ්ට උදාහරණ සැපයීම සඳහා සහ, ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය උදෙසා ගවේෂණාත්මක ජනමාධ්‍යකරණය පිළිබඳ වන මෙම පළමු ග්‍රන්ථයෙහි අන්තර්ගතය සහ අවසාන ආකෘතිය වැඩි දියුණු කර ගැනීමට උපකාරී වනු පිණිස, 2011 ජනවාරි සහ අප්‍රේල් මාසවල පැවති වැඩමුළුවලට සහභාගි වූ ශ්‍රී ලංකාවේ වාර්තාකරුවන්ගේ සහ කර්තෘවරුන්ගේ දායකත්වය මම අගය කරනු කැමැත්තෙමි.

ශාමිනී බොයිල් මහත්මිය, මනික් මෙන්ඩිස් මහත්මිය, ලක්ෂ්මන් ගුණසේකර මහතා, නාමල් පෙරේරා මහතා, ජයසිරි ජේදුරුආරච්චි මහතා, රාහුල් හෙට්ටිආරච්චි මහතා, අසේල බැද්දගේ මහතා, මංගලනාත් ලියනාරච්චි මහතා, ටී.එම්. ජනූර් කිව්ලාන් මහතා, කමල් ලියනාරච්චි මහතා, අසෝක සේනාරත්න මහතා සහ සී. දොඩාවත්ත මහතා මෙහිදී මා ස්තුතිවන්ත වන අය අතර වෙති.

අනෙකුත් පශ්චාත් යුද කාලීන සමාජයන්හි, විශේෂයෙන්ම අප්‍රිකාවේ, කාම්බෝජයේ, බෝල්කන් රටවල සහ මැදපෙරදිග වාර්තාකරුවන් සඳහා සම්පාදනය කරනු ලැබූ මීට පෙර ප්‍රකාශයට පත් කරන ලද කෘතීන්ගෙන්ද මෙම ග්‍රන්ථයට විශාල වශයෙන් කරුණු හා තොරතුරු ලබා ගන්නා ලදි. ‘ගවේෂණාත්මක මාධ්‍යකරණය සඳහා අරාබි වාර්තාකරුවෝ’ (Arab Reporters for Investigative Journalism - ARIJ) විසින් සම්පාදිත කතා පදනම් කරගත් මාර්ගෝපදේශන පොත මෙහිදී විශේෂයෙන්ම උපකාරී විය. මෙම ප්‍රකාශන සෑම තැනම ගවේෂණාත්මක වාර්තාකරුවන්ගේ උනන්දුව, ධෛර්යය සහ ලැදියාවට සාක්ෂියකි.

මීට අමතරව, විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ගවේෂණය පිළිබඳ පරිච්ඡේදය සම්බන්ධයෙන් සහ අනාගත භාවිතය සඳහා එම මාතෘකාව පිළිබඳ කුඩා මොඩියුලය සකස් කිරීම සම්බන්ධයෙන් http//groundviews.org වෙබ් අඩවියෙහි සමාරම්භක හා කර්තෘ සංජන හත්තොටුව මහතාටත්, ගවේෂණාත්මක ජනමාධ්‍යකරණයට අදාළ ශ්‍රී ලාංකික සිද්ධි අධ්‍යයනයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් ලසන්ත රුහුණගේ මහතාටත් ස්තුති කරනු කැමැත්තෙමි.

මෙම ව්‍යාපෘතියට මග පෙන්වීම සහ සහාය දැක්වීම ගැන ශ්‍රී ලංකා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය විජය ජයතිලක මහතාටද මගේ උණුසුම් සුබ පැතුම් පුද කරමි. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ගවේෂණාත්මක මාධ්‍යකරණ කණ්ඩායමේ ටී. කලෙයිමගල්, ෂාන් විජේතුංග සහ ආනන්ද ජයසේකර යන මහත්මමහත්මීන්ටද මම ස්තුතිවන්ත වෙමි. එසේම, මෙම සම්පත් ග්‍රන්ථය එළි දැක්වීම යථාර්ථයක් බවට පත් කිරීම සඳහා මතවාදීමය සහ මූල්‍යමය වශයෙන්

නොමසුරුව සහයෝගය දුන් ෆ්‍රෙඩ්රික් ඊබට් පදනමේ ශ්‍රී ලංකා නේවාසික නියෝජිත ජෝකිම් ෂ්ලුටර් මහතාට විශේෂ ස්තුතියක් පිරිනැමේ.

විශිෂ්ටතම ස්තුතියට හිමිකම් කියන්නේ මෙම ව්‍යාපෘතිය පිටුපස ගාමක බලය වශයෙන් ක්‍රියා කළා වූද, මෙම ව්‍යාපෘතිය කිසි විටෙක අත් නොහැරියාවූද, අප්‍රතිහත ධෛර්යයෙන් යුත් ගවේෂණාත්මක ජනමාධ්‍යවේදිනියක වන කාන්තාවයි. ඇය නම්, ශ්‍රී ලංකා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනයේ ප්‍රවර්ධන අධ්‍යක්ෂිකා, ගවේෂණාත්මක ජනමාධ්‍යකරණ වැඩසටහනේ ජාතික උපදේශිකා සහ *සන්ඩේ ලීඩර්* පුවත්පතේ හිටපු ගවේෂණාත්මක අංශ කර්තෘ දිල්රුක්ෂි හඳුන්නෙත්ති මෙනෙවියයි. මානව මූලාශ්‍ර නම් පරිච්ඡේදයට දායක වී ඉතා වැදගත් තොරතුරු හා සහාය සපයමින් කටයුතු කළ ඇය පොදුවේ සියලු දේ සිදු වන තැනට කටයුතු කළාය.

ශ්‍රී ලංකාවේ බොහෝ ගවේෂණාත්මක ජනමාධ්‍යවේදීහු සිය ගවේෂණාත්මක වාර්තාකරණය මඟින් සත්‍යය ප්‍රකාශ කරන්නට යාම නිසා ගැටලුවලට මුහුණ පෑහ. සමහරු සිය ජීවිතවලින් වන්දිගෙවූහ. මෙම අත්පොත ඔවුන්ට උපහාරයක් ලෙස පිදේ.

**රැල්ෆ් ෆ්රැමලිනෝ**
ජනමාධ්‍ය උපදේශක සහ *ලොස් ඇන්ජලිස් ටයිම්ස්* පුවත්පතේ
හිටපු ගවේෂණාත්මක වාර්තාකරු

කොළඹ, ශ්‍රී ලංකාව
2011 අගෝස්තු

# මෙම සම්පත් ග්‍රන්ථය භාවිත කරන ආකාරය

ගවේෂණාත්මක ජනමාධ්‍ය කතාවක හෝ ව්‍යාපෘතියක ආරම්භයේ සිට අවසානය දක්වා වාර්තාකරුවන්, විශේෂයෙන්ම ප්‍රාදේශීය වාර්තාකරුවන් ඉදිරියට ගමන් කරවිය හැකි ආකාරයට මෙම සම්පත් ග්‍රන්ථය සැලසුම් කරනු ලැබ ඇත.

මෙහි පරිච්ඡේද අනුපිළිවෙළින් පරිහරණය කිරීම මගින්, ගවේෂණාත්මක වාර්තාකරණය සාම්ප්‍රදායික ජනමාධ්‍ය කලාවෙන් වෙනස් වන ආකාරයත්, ඉහළ බලපෑමක් සහිත වාර්තාවක් පිළියෙළ කිරීමට කුමන දෑ අවශ්‍ය වේ ද යන්නත් වාර්තාකරුවන්ට සහ කර්තෘවරුන්ට උගත හැකි වනු ඇත.

ගවේෂණාත්මක කතාවකට වස්තුබීජයක් සොයාගැනීම, (මානව, මුද්‍රිත හා විද්‍යුත්) මූලාශ්‍ර හඹායෑම හා අවසාන වාර්තාව ලිවීම හෝ නිෂ්පාදනය කිරීම දක්වා වූ පියවර මෙම සම්පත් ග්‍රන්ථයෙහි ඇතුළත් වේ. එසේම එය ඉතා වැදගත් එහෙත් නිතරම පාහේ නොතකා හරින ලද කාරණයක් වන පාලකයන්ට සහ ජනමාධ්‍ය ආයතනවලට ගවේෂණාත්මක වාර්තාකරණ ව්‍යාපෘතිවලට සහාය වී ඒවා කළමනාකරණය කළ හැකි ආකාරය පිළිබඳවද අවධානය යොමු කරයි.

හැකි සෑම අවස්ථාවකදීම, මෙම සම්පත් ග්‍රන්ථය ශ්‍රී ලංකාවෙන් සහ දකුණු ආසියාවේ අනෙකුත් රටවලින් සත්‍ය වූ උදාහරණ ද ඉදිරිපත් කරයි. ප්‍රතිපත්ති මාලාවන්, මාර්ගෝපදේශයන්, ඉඟි පත්‍රිකා සහ වෙනත් ගවේෂණාත්මක ජනමාධ්‍යකරණ සම්පත්වල ප්‍රයෝජනවත් එකතුවක් ලෙස යොදාගත හැකි උපග්‍රන්ථයක්ද මෙහි ඇතුළත්ය.

මීට අමතරව, ක්ෂේත්‍රයේ සිටින වාර්තාකරුවන්ට වෙනම, සාක්කුවේ ගෙන යා හැකි 'අත්පොතක්' ද මේ සමග ඇත.

ගවේෂණාත්මක තොරතුරු දඩයම කෙරෙහි වාර්තාකරුවාගේ අවධානය රඳවා තබා ගැනීම අරමුණු කරගත් සිහිපත් කිරීම්, ටික් කොටු සහ වෙනත් අවශ්‍ය ලයිස්තු ලබාදීම මෙම අත්පොතෙන් සිදු කෙරේ. මෙම සම්පත් ග්‍රන්ථයේ වැදගත් තැන් යළි සිහිපත් කරමින් සිහි කැඳවන්නකු හා ප්‍රායෝගික මග පෙන්වන්නකු ලෙස එය කටයුතු කරයි.

පුම්තිරි යෙදුම් පිළිබඳ වචනයක්: 'ඔහු' හෝ 'ඇය' වැනි නොගැළපෙන යෙදුම් යොදා ගන්නවා වෙනුවට, ශ්‍රී ලංකාවේ වාර්තාකරුවන් හා කර්තෘවරුන් පිළිබඳව සඳහන් කරන විට මෙම ග්‍රන්ථය ගැහැණු හා පිරිමි සර්ව නාම පද පොදු අර්ථයෙන් යොදා ගනු ඇත.

## ප්‍රථම භාගය

# ගවේෂණාත්මක වාර්තාකරණ ශික්ෂණය සහ කලාව

## පළමුවැනි පරිච්ඡේදය

# ගවේෂණාත්මක වාර්තාකරණය කුමක්ද? කුමක් සඳහාද?

ජනමාධ්‍ය කලාව මිනිස් වර්ගයාගේ පැරණිතම අවශ්‍යතාවක් වන පුවත් දැන ගැනීමේ පිපාසාව සපුරාලයි.

පුරාණ සංස්කෘතීන්වල ගැමියන් ආහාර, ජලය හා වාසස්ථාන සොයා ගැනීම සම්බන්ධයෙන් උනන්දුව දැක්වූවා සේම තමන් අවට සිදු වන දේ දැන ගැනීමටද උනන්දු වූ බව මානව විද්‍යාඥයෝ පවසති. කාලයත් සමග ජනතාව අයිතිවාසිකම්, සහභාගිත්ව ක්‍රියාවලීන් සහ පොදුවේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව වඩාත් දැනුම්වත් වූ විට මෙම 'දැන ගැනීමේ අවශ්‍යතාව' සමාජයන්ට වඩවඩාත් වැදගත් විය.

පාලන තන්ත්‍ර සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සංකල්ප දකුණු ආසියාවට අලුත් ඒවා නොවේ. චානක්‍ය සහ විෂ්ණුගුප්ත යන නම්වලින් ද හැඳින්වුණු කෞටිල්‍ය දේශපාලන විද්‍යාවේ ඉතා වැදගත් ශාස්ත්‍රීය ග්‍රන්ථයක් වන *අර්ථශාස්ත්‍ර* නම් කෘතිය කළේ ක්‍රි.පූ. 4 වන සියවසේදීය. කෞටිල්‍ය පළමුවැනි මෞර්ය අධිරාජයා වූ චන්ද්‍රගුප්තගේ උපදේශකයකු වශයෙන් කටයුතු කළේය. ඒ කාලයේදී ඔහු පාලන තන්ත්‍රය හා ආර්ථික විද්‍යාව පිළිබඳ විධිමත් ශාස්ත්‍රීය ග්‍රන්ථයක් ලියුවේය. දේශපාලන විද්‍යාවේ පුරෝගාමියකු වශයෙන් සැලකෙන කෞටිල්‍ය සහ ඔහුගේ කෘති නිකලෝ මැකියාවෙලිගේ කෘතීන්ට වඩා වසර 1,200කින් පමණ පැරණිය.

රජු ධර්මය පිළිබඳ එකම අර්ථ නිරූපණය කරන්නා වශයෙන් නොව, එහි ආරක්ෂකයා වශයෙන් සැලකුණු රාජාණ්ඩුවේ පාලන තන්ත්‍රයට අදාළ පැති සියල්ලම පාහේ එහිදී සැලකිල්ලට ලක් කොට ඇත. එය අනාගමික සහ පැවිදි බලය අතර පැහැදිලි බෙදීමක් ගැන සඳහන් කරන අතර, අත්තනෝමතික බලයක් ඇතිවීම වැළැක්වීමට උපකාරී වන බහුකේන්ද්‍රීය ආයතනද ඊට ඇතුළත්ය.

ශ්‍රී ලංකාවේ 1931 සිට ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍රයක් පවතී. මේ අතර 1970 ගණන්වල සිට නැගෙනහිර යුරෝපයේ සහ ආසියාවේ සමහර කොටස්වලට අයත් රටවල් 60කට වැඩි සංඛ්‍යාවක ප්‍රජාත්නත්‍රවාදය පැතිරී ගොස් ඇත. අන්තර්ජාලය මගින් උත්තේජනය කරනු ලැබූ ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ව්‍යාපාර ටියුනීසියාව, ඊජිප්තුව, යේමනය හා බහරේන් යන මුස්ලිම් රටවල් සිසාරා යමින් පවතී.

කලෙක සිය දේශපාලන අනාගතය කෙරෙහි කිසිදු බලපෑමක් කළ නොහැකිව සිටි පුරවැසියෝ ප්‍රජාතන්ත්‍රවාදය වෙත නැඹුරුවීමත් සමගම දැන් ඡන්ද බලයෙන් සිය රාජ්‍ය නායකයින් තෝරා ගැනීමේ බලය ලබා සිටිති. එහෙත් මේ සඳහා ඔවුන්

වර්තමාන සිදුවීම් පිළිබඳ තොරතුරු නිවැරදිව හා අප්‍රමාදව දැනගැනීම අවශ්‍ය වේ. ජනමාධ්‍ය කලාව මෙම වැදගත් මෙහෙවර ඉටු කරයි. *එලිමන්ට්ස් ඔෆ් ජර්නලිසම්* කෘතියේ සඳහන් ආකාරයට, එහි මූලික අරමුණ වන්නේ නිදහස්ව හා ස්වයං පාලනයෙන් යුතුව ජීවත් වීමට පුරවැසියන්ට අවශ්‍ය තොරතුරු ලබා දීමයි.

සාම්ප්‍රදායික ජනමාධ්‍ය කලාවේ බොහෝ විට ඇතුළත් වන්නේ මානව විපත් හා ස්වාභාවික ආපදා පිළිබඳ 'උණුසුම් පුවත්', නිල නිවේදන හා නිල කටයුතු පිළිබඳ සාමාන්‍ය වාර්තා, එනම් ජනාධිපතිවරයාගේ ප්‍රකාශ හා පාර්ලිමේන්තුවේ සම්මත කරන නීති පිළිබඳ වාර්තා ආදියයි. සාම්ප්‍රදායික ජනමාධ්‍ය කලාව බොහෝවිට ප්‍රතිචාර දක්වන්නේ ස්වභාව ධර්මය හා බලධාරීන් විසින් සකස් කරන ලද ප්‍රවෘත්තිමය න්‍යාය පත්‍ර අනුවය. පුවත්පත්, ගුවන් විදුලි හා රූපවාහිනී වාර්තාවලින් අතිබහුතරය නියෝජනය කරන්නේ සාම්ප්‍රදායික ජනමාධ්‍ය කලාවයි.

ගවේෂණාත්මක ජනමාධ්‍ය කලාව වෙනස් දෙයකි.

ඇමරිකාවේ 1900 ගණන්වලදී ඇතිවූ සමාජ ව්‍යාපාරයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් බිහි වූ ගවේෂණාත්මක ජනමාධ්‍ය කලාව වඩා ආක්‍රමණශීලී හා ක්‍රියාශීලීය. බලවතුන්ගේ වැරදි හෙළිදරව් කිරීම මගින් රාජ්‍ය නිලධාරීන් පාලනයකට නතු කරමින් ද රජයේ හා වෙනත් ආයතනවල පමණ ඉක්මවා යෑම් මර්දනය කරමින්ද ගවේෂණාත්මක වාර්තාකරණය ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ප්‍රබල මූලාශ්‍රයක් ලෙස කටයුතු කරයි. මේ හේතුව නිසා ජනමාධ්‍ය ක්‍රියාකාරිකයෝ එය 'මුර බල්ලා' හෝ 'ගොවා' ජනමාධ්‍ය කලාව ලෙසත් 'කුණු ඇවිස්සීම' හා 'සාහසික ජනමාධ්‍ය කලාව' ලෙසත් හඳුන්වති.

සාම්ප්‍රදායික ජනමාධ්‍ය කලාව නව ප්‍රජාතන්ත්‍රවාදී සමාජය තුළට පැතිර ගියා සේම ගවේෂණාත්මක වාර්තාකරණයද ඉක්මනින් එය අනුගමනය කිරීම පුදුමයට කරුණක් නොවේ. කලෙක ඒකාධිපති පාලකයින්ගේ හොරණෑ බවට පත්ව සිටි වාර්තාකරුවෝ සහ කර්තෘවරු දේශීය ව්‍යාපාරිකයින්ගේ සාපරාධී සබඳතා හෙළිදරව් කිරීම සඳහා හෝ ජාතික දේශසීමා හරහා සිගරට් හොරෙන් පිටමං කිරීම පිළිබඳ විස්තර සොයා ගැනීම සඳහා වාර්තා පරිශීලනය කරමින්ද දුසිම් ගණනින් සම්මුඛ සාකච්ඡා පවත්වමින්ද සිටිති.

ඔවුහු යම් මෙහෙවරක් වෙනුවෙන් වාර්තා කරති. එනම්, වෙනත් අය සඟවා තබා ගෙන සිටින්නට උත්සාහ කරන තොරතුරු අනාවරණය කිරීම සහ ප්‍රජාව මුහුණදෙන ප්‍රශ්න විසඳීම සඳහා ඒවා යොදා ගැනීමයි.

විශේෂිත ලක්ෂණ: සාම්ප්‍රදායික ජනමාධ්‍යකරණයෙන් ගවේෂණාත්මක වාර්තාකරණය වෙන් කොට දක්වන සාධක ගණනාවකි. එම සාධකවලට මේවාද ඇතුළත්ය.

- සක්‍රිය බව. සාම්ප්‍රදායික වාර්තාකරණය සිදුවීම්වලට සහ 'පුවත් මවන්නන්ගේ' න්‍යාය පත්‍රවලට ප්‍රතිචාර දක්වයි. ගවේෂණාත්මක වාර්තාකරණය ප්‍රවෘත්තිමය කතා පසු පස හඹා යයි. එහෙයින් එය 'දුෂ්කර වාර්තාකරණය' නමින් හැඳින්වේ.

- වැරදි හෙළිදරව් කරයි. ගවේෂණාත්මක වාර්තාකරණයේ මූලික අවධානය යොමුවන්නේ දූෂණය, අපහරණය, මහජන සම්පත් නාස්තිය හෝ මහජන

සුභසිද්ධිය අනතුරට පත් කිරීම යනාදිය මුලිනුපුටා දැමීම කෙරෙහිය. එය බලවත් ආයතනවලට විනිවිද පෙනෙන අයුරින් කටයුතු කරන ලෙසට බලකරමින් රාජ්‍ය හා ව්‍යාපාරික ආවරණය විනිවිද යයි.



දෛනික වාර්තාකරණය නිකම් සතකු හෙළාගැනීමක් වැනිය

- **වගකීම් සහගත බව.** ගවේෂණාත්මක වාර්තාකරණය වැරදිවලට වගකිවයුත්තන් හෙළිදරව් කරමින්ද සමාජය විශෝධනය කිරීමේ හැකියාව ඇත්තන් හඳුනා ගනිමින්ද බලධාරීන් ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලට වගකියන්නට සලස්වයි.

- **ප්‍රතිඵල ඉලක්ක කරගැනීම.** ගවේෂණාත්මක මාධ්‍යකරණය මහජන අවධානයට ප්‍රශ්න යොමු කිරීම මගින් මහජන මතය සූදානම් කරමින් ප්‍රතිසංස්කරණවලට ජනයා පොලඹවයි. ගවේෂණාත්මක මාධ්‍යකරණය යනු යම් වෙනසක් ඇති කිරීමයි.

- **වැඩි කාලයක් අවශ්‍ය වීම.** ගවේෂණාත්මක වාර්තාකරණයට කෙටි මාර්ග නැත. එහි වැඩි වැඩ කොටසක් දුෂ්කර හා වැඩි ශ්‍රමයක් අවශ්‍ය කරන්නකි. දිනකට කතා කීපයක් ලිවීමට සිදු වී තිබෙන දකුණු ආසියාවේ හෝ ශ්‍රී ලංකාවේ ප්‍රවෘත්ති කාමරවල ගවේෂණාත්මක ජනමාධ්‍ය කලාව බහුලව භාවිත නොවේ.



ගවේෂණාත්මක වාර්තාකරණය දහඩිය හෙළා කරන ගොවිතැනක් වැනිය

- **ගැඹුරුය, පුළුල්ය.** සාම්ප්‍රදායික වාර්තාකරණයේදී මෙන් නොව ගවේෂණාත්මක ව්‍යාපෘතීන්හිදී අපගේ අවධාරණයන් තහවුරු කිරීම සඳහා බහුවිධ මූලාශ්‍ර සහ ලිපිලේඛන බොහෝ ගණනක් අවශ්‍ය වේ.

- **වෙනස් කාලාන්ත.** ගවේෂණාත්මක කතා ලියැවෙන්නේ හිතුමතයට සකස් කෙරෙන හෝ කාලය බෙදා සකස් කෙරෙන කාලාන්තයකට අනුව නොව ඒවා ලියැවෙන කාලයටය.

- **ප්‍රතිරාමුගත කිරීම.** සමහර විට ගවේෂණාත්මක වාර්තාකරණය යනු කලින්ම තමන් දැන සිටි කරුණු වෙනස් ආකාරයකට සම්බන්ධ කර බැලීමයි. එමගින් වැදගත් නව තොරතුරු මතු කර ගැනීමයි.

*ඩිගිං ඩීපර්: එ ගයිඩ් ෆෝ ඉන්වෙස්ටිගේටිව් ජර්නලිස්ට්ස් ඉන් ද බෝල්කන්ස්* (2009) නම් කෘතියේ දැක්වෙන ආකාරයට සමහර විට ගවේෂණාත්මක වාර්තාකරණය නොවන්නේ කුමක්දැයි විස්තර කිරීම වඩා පහසුය.

- **දෛනික වාර්තාකරණය හෝ 'පුවත් තරගය'.** ගවේෂණාත්මක ජනමාධ්‍යකරණය කතාවක් ගොඩනගාගැනීමට සාමාන්‍ය දෛනික කතාවකට වඩා වැඩි කාලයක් ගනී. වෙනත් ආකාරයකට ඒ ගැන සිතන්නේ නම් දෛනික වාර්තාකරණය නිකම් සතකු හෙළාගැනීමක් වැනිය.

එහිදී වාර්තාකරුවෙක් එළියට ගොස් සිය මාධ්‍යයට එදිනට දීම සඳහා කතාවක් රැගෙන එයි. ගවේෂණාත්මක වාර්තාකරණය දහඩිය හෙළා කරන ගොවිතැනක් වැනිය. එහිදී වාර්තාකරුවා සති ගණනක් නැත්නම් මාස ගණනක් ගතකොට කතා අස්වැන්නක් වගාදිගා කර ගනී.

- තනි මූලාශ්‍ර කතා. ගවේෂණාත්මත වාර්තාකරණය සඳහා මූලාශ්‍ර ගණනාවක් අවශ්‍ය වේ. එනම්, මානව, ලිපිලේඛන හා පරිගණක දත්ත ආදියයි. ඒවා අවශ්‍ය වන්නේ යටපත් වී ඇති සිදුවීම් රටා සහ සත්‍යයන් මතු කරගැනීමටය.

- කාන්දු ජනමාධ්‍යකරණය. රාජ්‍ය හෝ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ඇතුළත සිටින්නකු වෙතින් වාර්තාකරුවකු වෙතට ගලා ආ තොරතුරකින්, එනම් 'කාන්දුවකින්' ගවේෂණාත්මක කතාවකට මුලපිරිය හැකිය. එහෙත් අවසානයේ ගවේෂණාත්මක කතාව ගොඩනැගීම හෝ බිඳවැටීම රඳා පවතින්නේ මූලික වාර්තාකරණයේ ස්වභාවය මතය. මක්නිසාදයත්, තොරතුරු කාන්දු කරන්නන් එසේ කරන්නේ වාර්තාකරුවා තම අවශ්‍යතාවනට පාවිච්චි කිරීමේ බලාපොරොත්තුවෙනි. ගවේෂණාත්මක ජනමාධ්‍යකරණය කාන්දුව ඉක්මවාගොස් කතාව අතට ගනී.


- පැපරාසි ජනමාධ්‍යකරණය. ගවේෂණාත්මක ජනමාධ්‍යකරණය යනු ජනප්‍රිය පුද්ගලයන් පිළිබඳ ප්‍රවෘත්ති හෝ උද්වේගකාරී 'ටැබ්ලොයිඩ්' කතා හෝ නොවේ. එය මහජන සුභසිද්ධිය පිළිබඳව සැලකිල්ලක් දක්වන අතර, පෞද්ගලික තොරතුරු ඇතුළත් කර ගන්නේ ඒවා එම අරමුණට අදාළ නම් පමණි.

## ගවේෂණාත්මක ජනමාධ්‍යකලාවේ "P-4" සූත්‍රය

කතාව කුමක් වුවත්, ගවේෂණාත්මක වාර්තාකරණය එක් සරල අදහසකට ගොනු කළ හැකිය.

ගවේෂණාත්මක ජනමාධ්‍ය කලාව යනු යම් බලධරයකුගේ, රාජ්‍ය ආයතනයක, වාණිජ ව්‍යාපාරයක හෝ හඳුනාගත් පුද්ගලයකුගේ සැබෑ කාර්යඵලය (Performance), ඒ පිටුපස ඇති ප්‍රත්‍යක්ෂය (Perception), ප්‍රතිපත්ති (Principles) සහ ප්‍රතිඥා (Promises) සමග සැසඳීමයි.

වෙනත් විදියකට බලන්නේ නම්:



දැන් අපි මේ එක් එක් කොටස සලකා බලමු.

ප්‍රතිපත්ති යනු දේශපාලනඥයකු, රජයේ නිලධාරියකු හෝ ආයතනයක් පෙනී සිටිනවායැයි අදහස් කෙරෙන දේයි. නැත්නම් එසේ පෙනී සිටිය යුතු දේයි. බොහෝ විට සාක්ෂි සහිතව පෙනී යායුතු දෙයකි. නැත්නම් පොදුවේ දන්නා දෙයකි. උදාහරණයක් වශයෙන්, දේශීය පාසල් පද්ධතිය තිබෙන්නේ ආදායම, වර්ගය, ජාතිය හෝ ආගම නොසලකා සියලු ළමයින්ට අධ්‍යාපනය ලබා දීමටය. දේශපාලනඥයකු රාජ්‍ය වැය අඩු කිරීම හෝ රාජ්‍ය සේවය තුළට සදාචාර වටිනාකම් ඇතුළු කිරීම වැනි විශ්වාසයක් පදනම් කරගෙන තනතුරු සඳහා තරග කළ හැකිය. මේ ප්‍රතිපත්ති බොහෝ විට නිල ලිපිලේඛනවල හෝ රාජ්‍ය ආයතනයකට පදනම් වන නීතිරීතිවල හෝ දැකගත හැකිය. පැහැදිලිවම, ප්‍රතිපත්ති හා මහජන ප්‍රත්‍යක්ෂයන් අතර සමීප සබඳතාවක් පවතී.

ප්‍රත්‍යක්ෂය යනු නිලධාරියකුගේ හෝ ආයතනයක ප්‍රතිරූපයට සම්බන්ධ දෙයකි. සාමාන්‍යයෙන් මෙය එම නිලධාරියා හෝ ආයතනය විසින් මහජන ප්‍රතිචාර හෝ විශ්වාසය ඇදගැනීමේ අරමුණෙන් ප්‍රවේසමෙන් ගොඩනගාගන්නා ලද ඔවුන්ගේ 'මුහුණ'යි. අප සාමාන්‍යයෙන් මෙය දේශපාලනඥයන් සහ ඔවුන්ගේ දේශපාලන ව්‍යාපාරවලට සම්බන්ධ කර කල්පනා කළද, එය රජයේ ආයතන, ව්‍යාපාරික ස්ථාන සහ සිවිල් සමාජ සංවිධානවලටද අදාළය. ප්‍රත්‍යක්ෂය ප්‍රසිද්ධියේ පවත්වනු ලබන කතා, ප්‍රචාරක දැන්වීම්, මහජන සම්බන්ධතා කටයුතු, සංකේතාත්මක ක්‍රියාකාරකම් සහ නිල කටයුතු මගින් ජනතා සිත්තුළට ඇතුළු කෙරේ.

ප්‍රතිඥාවලින් අදහස් කෙරෙන්නේ, යම් නිශ්චිත කාරණයක් සම්බන්ධයෙන් තමන් කරන්නට අදහස් කරන දෑ ගැන මිනිසුන් සහ ආයතනික නිල දරන්නන් කරන නිශ්චිත ප්‍රකට ප්‍රකාශයි. ශ්‍රී ලංකාවේ 2004 සුනාමියෙන් විපතට පත්වූවන්ට සහන දීම පිළිබඳව රජයේ නිලධාරීහු බොහෝ ප්‍රතිඥා දුන්හ. විනිවිදභාවය හා සමාන ලෙස ආධාර බෙදා හැරීම තහවුරු කිරීමට රජය අසමත් වීම සහ පශ්චාත් සුනාමි ඉදිකිරීම්වලදී ඇති වූ බව කියන දූෂණ ගවේෂණාත්මක කතාවකට සුදුසු තේමාවක් ලබාදුන්නේය.

මෙම 'P' අකුරෙන් දැක්වෙන සෑම සංකල්පයක්ම ගවේෂණාත්මක කතාවකට දොරටුවක් විවෘත කරයි. සම්මුඛ සාකච්ඡා ගණනාවක් මගින් සහ ලිපිලේඛන ගණනාවක් මගින් සැබෑ කාර්යඵලය හෙළිදරව් කිරීම ගවේෂණාත්මක වාර්තාකරණයේ දුෂ්කරම වැඩකොටසයි.

## ගවේෂණාත්මක වාර්තාකරුවාගේ විශේෂ ගතිලක්ෂණ

ගවේෂණාත්මක ජනමාධ්‍යකරණය සතුව විශේෂ ලක්ෂණ ඇතුවා සේම එය ක්‍රියාත්මක කරන්නා සතුවද විශේෂ ගතිලක්ෂණ ඇත. ගවේෂණාත්මක වාර්තාකරුවෝ පොදුවේ සාමාන්‍යයෙන් (එහෙත් සෑම විටකම නොව) වසර ගණනාවක් තිස්සේ ප්‍රගුණ කරන ලද යම් යම් විශේෂ ගතිලක්ෂණ පෙන්නුම් කරති.

- විචාරාත්මක චින්තනය. ගවේෂණාත්මක ජනමාධ්‍යකරණය සඳහා අපචාර සහ වැරදි පිළිබඳ රටාවන් සොයාගැනීමට නම් අසමාන වූ සාධක ගොන්නක් එක්කොට විශ්ලේෂණය කිරීමේ හැකියාව තිබිය යුතුය. මේ සඳහා ව්‍යාජ හෝ සාවද්‍ය නොවන තර්ක තෝරා ගැනීමේ නිපුණතාව අවශ්‍යය.

- හඬා යෑම. ගවේෂණාත්මක වාර්තාකරුවෝ නිල පැහැදිලිකිරීම්වලින් සෑහීමකට පත් නොවෙති. ඔවුහු ප්‍රශ්නවලට පිළිතුරු හඬා යන අතර, ආයතනික වාර්තාවල පතුලටම කිඳා බසිති. සෑහීමකට පත් වන තෙක් ඔවුන් සිය කටයුතු නතර කරන්නේ නැත. ඔවුන් ප්‍රබල හැඟීම්වලින් යුක්ත වුවත් එම හැඟීම් ඔවුන්ගේ තාර්කික බව හෝ වෘත්තීය විනිශ්චයක් හෝ යටපත් කරන්නේ නැත.

- ප්‍රජාහිතවාදී වීම. ගවේෂණාත්මක ජනමාධ්‍යකරණය සිත් ගන්නාසුලු වන අතරම එහි කටයුතුවලින් 95%ක්ම දුෂ්කරය. ගවේෂණාත්මක වාර්තාකරුවෝ ප්‍රවෘත්ති කාමරවල දොරටුවේදීම සිය අත්මාභිමානය පරීක්ෂා කර ගනිති. සම්මාන හෝ ප්‍රසිද්ධ වර්ණනා සඳහා නොව, මහජන සුභ සිද්ධිය සඳහා ඔවුන් දුෂ්කරතා විඳ දරා ගනිමින් විෂය තුළ ගැඹුරට කිඳා බසිති. වරදක් නිවැරදි කරන තෙක්, දූෂණය ඉවත්කොට පිරිසිදු කරන තෙක් හා වැරදි කළ බලධාරීන් ඊට වගකිව යුතු තත්ත්වයට පත් කරන තෙක් අත් නොහරින, සාධාරණත්වය පිළිබඳ තියුණු හැඟීමක් ඔවුන් සතුව තිබේ. පුළුල් අර්ථයෙන් ගත හොත්, තමන් බලවතුන් සඳහා නොව ජනතාව සඳහා ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරන්නට උපකාරී වන්නේයැයි ගවේෂණාත්මක වාර්තාකරුවෝ විශ්වාස කරති.

- ධෛර්යවන්තය, එහෙත් විචක්ෂණශීලීය. ගවේෂණාත්මක වාර්තාකරුවෝ තම සගයන් විසින්ම ප්‍රතික්ෂේප කරනු ලැබීමේත්, බලධාරීන් විසින් හෙළාදකිනු ලැබීමේත්, නඩු මගින් බිය වැද්දීමට ලක් වීමේත්, ශාරීරිකව පහර දීමට ලක් වීමේත්, පිටුවහල් කරනු ලැබීමේත්, අසාධාරණ ලෙස සිරගත කරනු ලැබීමේත්, මරණයට පවා පත් කරනු ලැබීමේත් ශක්‍යතාවට මුහුණ දෙති. 'කිසිම කතාවක් ජීවිත අවදානමට තරම් වටින්නේ නැති' බව දන්නා ඔවුහු මෙම අනතුරු අවබෝධ කරගෙන ඒවා අවම කර ගැනීමට කටයුතු කරති.

- ක්‍රමවත් බව. ගවේෂණාත්මක වාර්තාකරුවන්ට අපිළිවෙළට කටයුතු කළ නොහැකිය. තම කතාව ගොඩනැගීමේදී හා ඉදිරිපත් කිරීමේදී ක්‍රමවත් බව ප්‍රතිඵලදායක වන වග දන්නා ඔවුහු ක්‍රමවත්ය, සුපරීක්ෂාකාරීය.

- සාධාරණ බව. ගවේෂණාත්මක වාර්තාකරණය සඳහා අනුමානයන් හා උපකල්පනයන් යොදාගත්තද, ගවේෂණාත්මක වාර්තාකරුවෝ තම අගතීන් අනුව නොව සිද්ධිමය සාධක අනුව කටයුතු කරති. තම කතාවල 'ඉලක්ක පුද්ගලයන්' හට පිළිතුරු දීම සඳහා විශාල වශයෙන් අවස්ථාව තිබිය යුතුයැයි ඔවුහු දැඩිව සිතති. ARIJ අත්පොතේ දැක්වෙන පරිදි ජනමාධ්‍ය ගවේෂණ යනු යමකුට හානි කළ හැකි 'ආයුධ' බව ඔවුහු දැන සිටිති. ඔවුන් මෙම ජනමාධ්‍ය ආයුධය පාවිච්චි කළ යුත්තේ අවධානයෙන් යුතුවය.

## ශ්‍රී ලංකාවේ ගවේෂණාත්මක ජනමාධ්‍ය කලාව

බොහෝ දියුණු වන රටවල මෙන්ම, විශේෂයෙන්ම පශ්චාත් ගැටුම් කාලීන සමාජවල මෙන්ම, පශ්චාත් යුද කාලීන ශ්‍රී ලංකාවේද ගවේෂණාත්මක වාර්තාකරණය විශේෂ අභියෝගයන්ගෙන් යුක්ත වේ.

රජයේ ලියකියවිලි ලබාගැනීම සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත වැනි නිල යන්ත්‍රණයක් ශ්‍රී ලංකාවේ නැත. සිවිල් සමාජය පොදුවේ දුබල එකක් වන අතර, එහෙයින් බලයට එරෙහිව නැගී සිටින වාර්තාකරුවන්ට, කර්තෘවරුන්ට සහ ප්‍රවෘත්ති ආයතනවලට වැදගත් ආයතනික සහායක් ලබාදීමට ඊට නොහැකිය. තිස් අවුරුදු යුද්ධය ජනමාධ්‍යවේදීන්ට එරෙහිව සතුරු සම්ප්‍රදායක් බිහි කර ඇත. මේ නිසා රජය ගැටුම් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය අභියෝගයට ලක් කළ ජනමාධ්‍යවේදීහු බොහෝ දෙනෙක් ඝාතනයට, සිරගත කරනු ලැබීමට හෝ රටින් පිටමං වීම සඳහා බල කරනු ලැබීමට ලක් වූහ.

එහෙත් සමහරවිට විශාලම අභියෝගය ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රවෘත්ති කාමරවලය. ජනමාධ්‍ය ආයතනවල ජනමාධ්‍යවේදීන්ගේ හිඟයක් පවතින අතර, ඒ නිසා පිටු හෝ විකාශන කාලය පිරවීම සඳහා එම ආයතන විශාල වශයෙන්ම සාම්ප්‍රදායික ප්‍රවෘත්ති මත රැඳී සිටී. එම ප්‍රවෘත්තිද බොහෝ විට කොළඹ කේන්ද්‍රීය වේ. ජනමාධ්‍යයනට සිදුවන හිරිහැර නිසා, වාර්තාකරුවෝ සහ කතුවරුද ගවේෂණාත්මක කතා ඇතුළත් සාරවත් ආකර මග හැර ස්වයං වාරණයක ගැලෙති. ප්‍රධාන වශයෙන් මුදල්ද ඇතුළුව ප්‍රවෘත්ති කාමර සම්පත්වල හිඟය විශාල බාධාකයක්ව පවතී. මේ අතර, පාඨකයන් සහ ප්‍රේක්ෂකයන් වුවද, තමන්ගේ ජීවිතවල වෙනසක් ඇති කළ හැකි ගවේෂණාත්මක වාර්තාකරණය වැනි දෙයක් ඉල්ලා සිටින්නේ නැත.

ප්‍රාදේශීය වාර්තාකරුවෝ ගවේෂණාත්මක ජනමාධ්‍යකරණය යොදා ගැනීමේදී අමතර බාධාවන්ට මුහුණ දෙති. බොහෝ දෙනකු ඉතා අඩු ගෙවීමක් ලබන අර්ධ කාලීන ජනමාධ්‍යවේදීන් වන හෙයින් ඔවුන්ට විවිධ ජනමාධ්‍ය ආයතන සමග කටයුතු කිරීමට සිදු වී තිබේ. මේ නිසා ගවේෂණාත්මක කතා සෙවීමට ඇති කාලය ඉතා අල්ප වේ. තම කර්තෘවරුන්ට ෆැක්ස් හා ඊමේල් යැවීමේ පහසුකම් ඔවුන්ට හිඟය. කතා කොළඹින් ඈත් වන තරමට ඒවාට කර්තෘවරුන්ගේ පිළිගැනීම ලබාගැනීම දුෂ්කර වන හෙයින්, ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන්ට මෙම කොළඹ කේන්ද්‍රීය කර්තෘවරුන්ගේ පක්ෂග්‍රාහිත්වය සමග සටන් කිරීමට ද සිදු වී තිබේ.

ප්‍රාදේශීය වාර්තාකරුවන් ගවේෂණාත්මක වාර්තාකරණය පිළිබඳ පුහුණුවක් ලබා හෝ දැනුම්වත් වී හෝ නැත. මක්නිසාදයත්, ඔවුන් ජීවත් වන්නේ ඔවුන් වාර්තා කරන ප්‍රදේශවලය. මේ නිසා ප්‍රබල හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් තර්ජනවලට හා ප්‍රහාරයන්ට ලක් වීමේ වැඩිම අවදානමක් ඇත්තේද ඔවුන්ටය. එම අනතුරට මුහුණදීමට ඔවුන් සූදානම් වුවද, තම කර්තෘවරුන් තමන්ගේ ගවේෂණාත්මක කතාව සහමුලින්ම ඉවත්කොට, වඩාත් හොඳ සම්බන්ධකම් ඇති කොළඹ සිට ක්‍රියාත්මක වන වාර්තාකරුවකුට එය පැවරීමේ බියක් ඔවුන් තුළ පවතී. එසේ වූ විට එම කතාව පළ වන්නේ කොළඹ වාර්තාකරුගේ නම යටතේය.

මෙවැනි සීමා තිබියදීත්, අනතුරු නොතකා දිගටම ගවේෂණාත්මක කතා හඹා යන නොසැලෙන වාර්තාකරුවන් බොහෝ දෙනකු නියෝජනය කරන, හාරා ඇවිස්සීමේ නම්‍යශීලී ජනමාධ්‍ය සංස්කෘතියක්ද තිබේ. ඒ අතරම, රට තුළ ඇති ප්‍රවෘත්ති කාමරවලින් උනන්දුවක් නොදැක්වෙන්නේ නම්, අභීත ගවේෂණාත්මක වාර්තාකරුවන්ට තම කතා පළ කරවාගත හැකි, විදේශවල සිට ක්‍රියාත්මක ශ්‍රී ලාංකික වෙබ් අඩවි ගණනාවක්ද ඇත.

## දෙවැනි පරිච්ඡේදය

# වෘත්තීයභාවය හා ආචාරධර්ම

අනතුරු ඉතා අධික බැවින් ගවේෂණාත්මක වාර්තාකරණයේ නියැළෙන්නන් ඉහළම මට්ටමේ ආචාරධර්ම අනුගමනය කළ යුතුය. මෙය ප්‍රමාණවත් ලෙස අවධාරණය කළ නොහැකිය. වාර්තාකරුවකු වැරදි සම්බන්ධයෙන් හෝ දූෂණ සම්බන්ධයෙන් යම් බලවත් නිලධාරියකුට හෝ ආයතනයකට එරෙහිව චෝදනා කරන්නට යන්නේ නම්, ඔහුත් ඔහුගේ ප්‍රවෘත්ති ප්‍රකාශනායතනයත් තමන්ගේ විශ්වසනීයත්වය ආරක්ෂා කරගැනීම සඳහා 'පිරිසිදු දෑත්වලින්' යුක්ත විය යුතුය. එහෙයින්, වාර්තාකරුවකු සිය ගවේෂණාත්මක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න ඔහු සිය මාධ්‍යමය 'ඉලක්ක' සම්බන්ධයෙන් සොයා ගන්නේ මොනවාද යන්න පමණටම වැදගත්ය.

ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව (ආචාරධර්ම පද්ධතිය) ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම විසින් සම්මත කරනු ලැබ ඇත. ඒවා මුද්‍රිත මාධ්‍ය කර්මාන්තය බැඳී කටයුතු කළ යුතු හොඳම ප්‍රතිපත්තීන් ලෙස එම කර්මාන්තය විසින් පොදුවේ පිළිගනු ලැබ තිබේ. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ප්‍රවෘත්ති වෙබ් අඩවි සඳහාද මෙම මාර්ගෝපදේශයන් පුළුල් කිරීමේ සැලසුම් දැන් සකස් වෙමින් තිබේ.

සමහර මාධ්‍ය ආයතන ස්වකැමැත්තෙන්ම ඊළඟ අදියරට පියවර මැන තිබේ. සිංහල විකල්ප පුවත්පතක් වන *රාවය* තමන්ගේම වූ ආයතනික රීති මාලාවක් හඳුන්වා දී ඇති අතර, පුවත්පත සඳහා බම්බුඩ්ස්මන්වරයකුද හඳුන්වා දී තිබේ. සමහර මාධ්‍ය ආයතන ත්‍යාග ලබා ගැනීම සඳහා තම ආයතනික ප්‍රතිපත්ති සකස් කොට ගෙන තිබේ.

එසේ වුවද ඇඟ බේරා ගැනීමේ කටයුතු තවදුරටත් සිදු වේ. විශේෂයෙන්ම මෙය සිදුවන්නේ අර්ධකාලීන ජනමාධ්‍යවේදීන් වන්නා වූද, තමන්ට අවශ්‍ය වෘත්තීය ප්‍රමිතීන් පිළිබඳ අවබෝධයක් පූර්ණ වශයෙන් නොතිබිය හැකි වූද ප්‍රාදේශීය වාර්තාකරුවන් අතරය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, හිතකර කතා ලිවීම සඳහා අල්ලස් ඉල්ලා සිටි අවස්ථාත් ව්‍යාපාරිකයන්ගෙන් කප්පම් ලබා ගැනීම සඳහා අහිතකර කතා පළ කරන බවට තර්ජනය කළ අවස්ථාත් තිබී ඇත. සමහර ව්‍යාපාර කටයුතු පිළිබඳ වාර්තාකරුවෝ තමන් වාර්තා කරන සමාගම්වලින් 'අනුග්‍රහයන්' ලබා ගනිති. ඔවුහු නව ජංගම දුරකථන වැනි නිෂ්පාදන ලබාගනිති. එක් වාර්තාකරුවකු තමන්ට සහ තම පවුලේ සාමාජිකයන් 25 දෙනෙකුට නොමිලේ ආහාර හා ගොල්ෆ් අවසරපත් දෙන ලෙසට නියම කළ බවද කියැවේ.

මේ අතර සමහර ප්‍රාදේශීය වාර්තාකරුවන් තම ඥාතීන්ට රැකියා දෙන ලෙසත් තම දරුවන් පාසල්වලට ඇතුළු කිරීමට සහාය දෙන ලෙසත් තමන් ආවරණය කරන දේශපාලනඥයින්ගෙන් ඉල්ලා ඇති බව දැන ගන්නට ඇත. ඔවුහු නිතරම

පාහේ තම කතා කාර්යාලයට යැවීම සඳහා දේශපාලනඥයන්ගේ ෆැක්ස් යන්ත්‍ර පාවිච්චි කරති. ඊටත් වඩා නරක දෙය නම්, දේශපාලනඥයකුගේ ප්‍රාදේශීය මාධ්‍ය සම්බන්ධීකාරකවරයා ප්‍රාදේශීය නිදහස් වාර්තාකරුවකු ලෙසින් ද්විත්ව රංගනයක යෙදෙමින් සිය හාම්පුතා ගැන පුවත් ලිවීමයි.

මේ සියලු කටයුතු ජනමාධ්‍ය කලාවේ වටිනාකම බාල්දු කරන අතර, පොදුවේ වර්තමානයේ වාර්තාකරුවන් පිළිබඳව ඇති නරක ප්‍රතිරූපයටද තව දුරටත් දායක වේ. නිලධාරීන්ගේ දූෂණ හෙළිදරව් කිරීම අරමුණු කරගත් ගවේෂණාත්මක වාර්තාකරුවන් ආචාරධර්මීය සීමා නොඉක්මවීමට විශේෂයෙන්ම සැලකිලිමත් විය යුතුය. එහෙයින් සියලු ජනමාධ්‍යවේදීන් පහත සඳහන් කරුණුවලින් වැළකිය යුතුය:

- පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා වාර්තා කිරීම. ගවේෂණාත්මක වාර්තාකරණය ඇත්තේ මහජන සුභසිද්ධිය සඳහාය. එහෙයින් ගවේෂණාත්මක වාර්තාකරුවකු යම් විවේචනාත්මක දෙයක් ලියන බවට හෝ ප්‍රකාශයට පත් කරන බවට තර්ජනය කරමින් අල්ලස් ඉල්ලා සිටීම හෝ කප්පම් ඉල්ලීම හෝ නොකළ යුතුය. ත්‍යාග, නොමිලේ ආහාර සහ විශේෂ වරප්‍රසාද ලබා නොගත යුතුය. පෞද්ගලික ලාභ ප්‍රයෝජන ගන්නා බවට පෙනුමක් හෝ තිබීම වාර්තාකරුගේ සහ ඔහුගේ ආයතනයේ විශ්වසනීයත්වයට හානි කරයි.

- දේශපාලන න්‍යාය පත්‍ර. ගවේෂණාත්මක කතාවක් වාර්තාකරුගේ දේශපාලන අවබෝධය හෝ දැක්ම වෙතින් පැනනැගිය හැකි වුවත්, මතවාද නිසා හෝ තමන් කැමති පරමාර්ථයක් නිසා හෝ තොරතුරු නොතකා පැත්තකට බර කොට නොලිවිය යුතුය. කතාවක් යනු සැබැවින්ම ඇති කතාවකි. ගවේෂණාත්මක වාර්තාකරු පෞද්ගලික විශ්වාසයන් මත නොව සාධක මත රැඳී කටයුතු කරයි.

- ලැදියාවන් අතර ගැටුම්. මූලාශ්‍ර හෝ කතා ඉලක්ක සම්බන්ධ කරගත් ව්‍යාපාරික ගනුදෙනු, පෞද්ගලික සබඳතා හෝ උද්වේගපදව් තිබිය නොහැකිය. මෙය වාර්තාකරුගේ පවුල හා මිතුරන් සම්බන්ධයෙන්ද අදාළ වේ. තමන් විසින් ගවේෂණය කරනු ලබන මිනිසුන් වෙතින් ජනමාධ්‍යවේදීන් ස්වාධීන විය යුතුය.

- පක්ෂග්‍රාහිත්වය. ශ්‍රී ලංකාව වැනි එකිනෙකා සමීපව බැඳුණු ස්ථානවලදී ගවේෂණාත්මක වාර්තාකරුවකු තමන් දන්නා අය සම්බන්ධයෙන්ම කතා ලිවීම නොවැළැක්විය හැකිය. අමුත්තකු සම්බන්ධයෙන් මෙන්ම මිතුරකු සම්බන්ධයෙන්ද දැඩි බවකින් යුතුව කටයුතු කිරීමට වාර්තාකරු හැකි සෑම දෙයක්ම කළ යුතුය.

- ආවේගශීලී බව. ගවේෂණාත්මක කතා කම්මැළි කතා නොවිය යුතු අතරම, අවුස්සනසුලු ස්වභාවයෙන් හා අතිශයෝක්තියෙන්ද තොර විය යුතුය. ගවේෂණාත්මක වාර්තාවලින් වැඩිම බලපෑමක් ඇති වන්නේ ඒවා මධ්‍යස්ථභාවයකින් යුතුව තමන් සොයාගත් දෙයෙහි හරයට පමණක් සීමා කොට ලිවීම මගිනි.

- සොරකම් කිරීම. ගවේෂණාත්මක වාර්තාකරු සොරකම් නොකළ යුතුය. ආයතනයක ඇතුළත සිටින්නන් සිය කැමැත්තෙන් කාන්දු වන්නට සැලැස්වූ

ලියකියවිලි පාවිච්චි කිරීම පිළිබඳව සලකා බැලිය හැකි වුවත් කිසිවකුටත් ඒවා සොරකම් කරන ලෙස නොකිව යුතුයි. මෙය ඉතා සියුම් බෙදීමක් ලෙස පෙනුණද, එය නෛතික වශයෙන්ද ආචාරධර්මීය වශයෙන්ද ඉතා වැදගත් කරුණකි.

## රචනා සොරකම හා ව්‍යාජ පුවත් නිර්මාණය කිරීම

මත සොරකම, එනම් අන්‍ය ජනමාධ්‍යවේදියකුගේ බව නොකියා ඔහුගේ භාෂාව හෝ වාර්තාකරණය සොරකම් කිරීම ජනමාධ්‍ය කලාවේ විශාල පාපයක් ලෙස සැලකේ. එසේ වුවද, අන්තර්ජාලයේ අතිවිශාල තොරතුරු සම්භාරයක් ඇති නිසාත්, පරිගණකයෙන් තොරතුරු කපා අලවාගැනීමේ හැකියාව ඇති නිසාත් මෙම දුෂ්ට කටයුත්ත තව දුරටත් සිදු වේ. ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රාදේශීය වාර්තාකරුවෝ කාලය ඉතිරි කර ගැනීම සඳහාත් තරගකරුවන් අබිබවා යෑම සඳහාත් මෙසේ අදහස් සොරකම් කරති.

මත සොරකම වංක වනවා පමණක් නොව වෘත්තීය වශයෙන් අනතුරුදායකද වේ. වෙනත් පුවත්පත්වලින් වාක්‍යාංශයන් සහ උද්ධෘතයන් සොරකම් කිරීම නිසා *යූඑස්ඒ ටුඩේ, ලොස් ඇන්ජලිස් ටයිම්ස්* සහ *නිව් යෝක් ටයිම්ස්* පුවත්පත්වල වාර්තාකරුවන් සේවයෙන් පහ කරනු ලැබූ අවස්ථා තිබේ. එසේම, එසේ සොරකම් කරන්නන් තමන්ගේ කතා තුළට වැරදි තොරතුරු ඇතුළත් කරගැනීමේ අනතුරක්ද ඇත.

වෙනත් මූලාශ්‍රවල තොරතුරු පාවිච්චි කරන ගවේෂණාත්මක වාර්තාකරුවන් අඩු තරමින් ඒවායේ නිරවද්‍යතාව පරීක්ෂා කළ යුතුය. එසේ කළ නොහැකි නම් එම තොරතුරු පාවිච්චි නොකළ යුතුය. *එලිමන්ට්ස් ඔෆ් ජර්නලිසම්* කෘතිය අවධාරණය කරන පරිදි, පහරකෑමකට ලක් වුවද වාර්තාකරුවන් තමන්ගේ මූලික කෘතිය මත පමණක් රැඳී කටයුතු කළ යුතුය. වෙනත් තැනකින් තොරතුරු හෝ උද්ධෘතයන් ලබාගත් විට හෝ ලබාගන්නේ නම් ගවේෂණාත්මක වාර්තාකරුවන් ඒ බව සඳහන් කිරීමට සැලකිලිමත් විය යුතුය. ඒ අනුව, එසේ ලබාගත් තොරතුරු වැරදි බව ඔප්පු වුව හොත් එය මෙම වාර්තාකරුගේ වරදක් නොවන බව පාඨකයාට හෝ ප්‍රේක්ෂකයාට ඒත්තු යනු ඇත.

සමහර ජනමාධ්‍යවේදීන් මත සොරකමටත් වඩා පහතට වැටී තොරතුරු හා උද්ධෘතයන්  ඇසුරු කරගෙන පුවත් ගොතති, නැත්නම් නිර්මාණය කරති. මේ පිළිබඳ වඩා හොඳ උදාහරණයක් නම් ගරු කටයුතු ඇමරිකානු සඟරාවක් වන *ද නිව් රිපබ්ලික්* හි ස්ටීවන් ග්ලාස්ය. වසර ගණනාවක් තිස්සේ ග්ලාස් එම සඟරාවට ලියා ඉදිරිපත් කළ ලිපි 27 ම හෝ ඒවාහි යම් යම් කොටස් ගොතන ලද ඒවා බව සඟරාවේ කර්තෘවරයා විසින් සොයාගනු ලැබීමෙන් පසු ඔහු සේවයෙන් පහ කරනු ලැබීය. මෙම වංචාව නිසා සඟරාවේ කීර්තිනාමය පලුදු වූ අතර, එහි කාර්ය මණ්ඩලයේ සහ හරිවැරදි බලන්නන්ගේ විශ්වසනීයභාවයටද හානි සිදු විය.

කතාවක් සඳහා යම්දෙයක් ගෙතීම ජනමාධ්‍ය කලාවේ පිළිගත් මූලික ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීමකි. ජනතාව වෙනුවෙන් නිවැරදිව වාර්තා කිරීමට එම ප්‍රතිපත්ති කැප වී සිටී. කතා ගෙතීම යනු ප්‍රබන්ධ ලිවීමක් පමණක් නොව, කතාවේ ආවේගකාරී

බව වැඩි කිරීම සඳහා තොරතුරුවල පිළිවෙළ වෙනස් කිරීමක්ද වේ. උදාහරණයක් වශයෙන්, ඉන් අදහස් කෙරෙන්නේ බලධාරියකු සැබැවින්ම මැතිවරණයට පසුව තම මිතුරකුට යම් කොන්තරාත්තුවක් භාරදී තිබියදී මැතිවරණයට පෙර එය දුන් බවට වාර්තා කිරීම වැනි දෙයකි.

ගවේෂණාත්මක වාර්තාකරුවෝ තම කතා සඳහා කිසිවක් ගොතා ඉදිරිපත් නොකරති. එසේ නැත්නම් තමන් වටහාගත් තොරතුරු විකෘත නොකරති.

## 'මර උගුල්' (sting) ජනමාධ්‍ය කලාව

'මර උගුල්', එසේ නැත්නම් දූෂණය හා වැරදි හෙළිදරව් කිරීම සඳහා රැවටිල්ල යොදාගන්නා රහසිගත මෙහෙයුම් තරම් ගවේෂණාත්මක වාර්තාකරණයේදී මතභේදයට තුඩු දුන් කරුණක් නැත.

1880 ගණන්වලදී, නිව් යෝක් නගරයේ මානසික රෝගීන් සඳහා වූ විශාලතම ආයතනයේ අක්‍රමිකතා සහ අප්‍රසන්න ජීවන තත්ත්වය පිළිබඳව කර්කශ වූ හෙළිදරව් කිරීමක් සඳහා ජනමාධ්‍යවේදී නෙලී බ්ලයි මානසික රෝගියකු මෙන් රඟපෑවේය. නව දිල්ලියේ සිට ක්‍රියාත්මක වන ගවේෂණාත්මක ජනමාධ්‍ය වෙබ් අඩවියක් වන *ටෙහෙල්කා* මගින් කරන ලද ප්‍රකට රහසිගත මෙහෙයුම් දෙකකට පසු මෙම 'මර උගුල්' දකුණු ආසියාවේ ජනප්‍රිය විය.

මුලින්ම ඉන්දීය ක්‍රිකට් ක්‍රීඩකයන් තරඟ පාවාදීම සඳහා අල්ලස් ගන්නා ආකාරය රූගත කිරීමට එම වෙබ් අඩවිය රහස් කැමරා යොදා ගත්තේය. දෙවැනි කතාව සඳහා, *ටෙහෙල්කා* වාර්තාකරුවෝ දෙදෙනෙක් ගෙන්ගෙට ගොස් මනඃකල්පිත 'තාපවිෂයික කැමරා' විකුණන ආරක්ෂක කටයුතු පිළිබඳ ව්‍යාජ සමාගමක නියෝජිතයන් ලෙස පෙනී සිටියහ. භාරතීය ජනතා පක්ෂයේ සභාපති බංගරු ලක්ෂ්මන්, ජ්‍යෙෂ්ඨ ඉන්දීය හමුදා නිලධාරියකු, සමතා පක්ෂයේ ප්‍රධාන ලේකම් ජයා ජයිට්ලි සහ ආරක්ෂක ඇමති ජෝර්ජ් ෆර්නැන්ඩස් යන අයට ඔවුන් අල්ලස් දෙනු පෙනිණි. ආරක්ෂක ඇමති ජෝර්ජ් ෆර්නැන්ඩස් ඇතුළු රජයේ බලධාරීහු ගණනාවක්, අල්ලස් හා කාන්තාවන් ඉල්ලන අයුරුත් ලබා ගන්නා අයුරුත් පටිගත කරනු ලැබ කොටු වූහ. මෙම මර උගුල නිසා ආරක්ෂක ඇමතිවරයාට ඉල්ලා අස්වීමට සිදු වූ අතර, අනෙකුත් නිලධාරීහු සේවයෙන් පහ කරනු ලැබූහ. අපරාධ නීතිය යටතේ ඔවුන්ට එරෙහිව පරීක්ෂණයක්ද ආරම්භ කෙරිණි.

මේ අතර, මෙම දූෂණ අනාවරණය වූ දිනවල *ටෙහෙල්කා* වෙබ් අඩවියට දිනකට පිවිසි පාඨක සංඛ්‍යාව කෝටි තුනක් පමණ විය. එහි ආරම්භකයන් වන තරුන් ටෙජ්පාල් හා අනිරුද්ධ බහාල් ජනමාධ්‍යවේදීන් අතර ජනප්‍රිය පුද්ගලයෝ වූහ. බහාල් ඉදිරියටම යමින් www.cobrapost.com වෙබ් අඩවිය ආරම්භ කොට තවදුරටත් මර උගුල් ජනමාධ්‍ය කලාව කරගෙන ගියේය. එහිදී, පාර්ලිමේන්තුවේ ප්‍රශ්න පැයේදී ප්‍රශ්න ඇසීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 11 දෙනකු සුළු අල්ලස් ගන්නා අයුරු ඔහු රූගත කළේය. ඒ සියලු දෙනාටම ඉල්ලා අස්වන්නට බල කෙරිණි.

රහස් මර උගුල් සාර්ථක වන බවට සැකයක් නැත. එහෙත් එයම ගවේෂණාත්මක වාර්තාකරුට හා ඔහුගේ ආයතනයට පාරාවළල්ලක් වීමේ අඳුරු පැත්තක්ද එහි ඇත.

ඇමරිකාවේ ඒබීසී රූපවාහිනී ජාලය, සුපිරි වෙළෙඳසල් ජාලයක සෞඛ්‍යයට අහිතකර අයුරින් ආහාර පරිහරණය කරන අයුරු හා කම්කරු නීති උල්ලංඝනය පෙන්වීම සඳහා රහස් කැමරා යොදා ගත්තේය. එහෙත් සුපිරි වෙළෙඳසල් ජාලය එම කතාව සම්බන්ධයෙන් නොව වංචා කිරීම සම්බන්ධයෙන් රූපවාහිනී ජාලයට හා එහි සේවකයන්ට එරෙහිව නඩු පවරා විශාල වන්දියක් ලබා ගත්තේය. මක්නිසාදයත්, එම සේවකයන් එම සුපිරි වෙළෙඳසල්වල ගබඩා සේවකයන් වශයෙන් බඳවා ගන්නා විට ඔවුන් තමන් පිළිබඳව වැරදි තොරතුරු ලබා දීම නිසාය.
ඒ හා සමානවම, *ටෙහෙල්කා* වෙබ් අඩවියේ මර උගුලට හසු වූ රාජ්‍ය පාලනය ඔවුන්ගේ එදිනෙදා කටයුතු දුෂ්කර වන අයුරින් නෛතික ප්‍රහාර එල්ල කරන්නට විය. බහාල් අත්අඩංගුවට ගනු ලැබ පසුව ඇප පිට නිදහස් කෙරිණි. වෙබ් අඩවියේ මූල්‍ය අනුග්‍රාහකයන් පසුපස බදු නිලධාරීන් හඹා යන්නට වූ අතර, වෙබ් අඩවිය වසර දෙකකට නවතා දැමීමට සිදු විය. ඉන් පසු එය මුද්‍රිත සඟරාවක් වශයෙන් පළ කෙරිණි. මෙවැනි දේශපාලන, නෛතික හා ආර්ථික ප්‍රතිප්‍රහාර නිසා, මර උගුල් පිළිබඳව බොහෝ ප්‍රවෘත්ති කාමර කළමනාකරුවන්ගේ උනන්දුව හීන විය.

වඩාත් කරදරකාරී වන්නේ මෙම මර උගුල් නිසා මතු වන වෘත්තීය හා ආචාරධර්ම පිළිබඳ ප්‍රශ්නයි. සත්‍යයට ළඟා වීම සඳහා එය විශ්වාසය තබන්නේ රැවටිල්ල මතය. එහෙයින් මෙය විශ්වසනීයත්වයට හානි කරන්නක් බවත් කල් යාමේදී අසාර්ථක කටයුත්තක් වන බවත් බොහෝ ජනමාධ්‍යවේදීහු විශ්වාස කරති.

එසේම, මෙහිදී පෞද්ගලිකත්වයට එබී බැලීම හා උගුල් ඇටවීම පිළිබඳ ප්‍රශ්නයද මතු කෙරේ. මන්දයත්, මෙතැනදී සිදු වන්නේ සාමාන්‍යයෙන් මිනිසුන් නොකරන්නට ඉඩ තිබෙන දෑ කරන්නට පෙලඹවීමයි. මේ අතර, සාමාන්‍යයෙන් පුවත්පත්වල පසු පිටුවල පළ වන හෝ ප්‍රවෘත්ති විකාශයක බොහෝ දුරට ඉස්මතු නොකෙරෙන කතිකාවක් පුම්බා දැක්වීම සඳහා බොහෝ අලස ජනමාධ්‍යවේදීහු මෙම මර උගුල් කෙටි මාර්ගයක් ලෙස යොදා ගනිති. මර උගුල් යනු ගවේෂණාත්මක කටයුත්තකට වඩා ඉතා පහසු මාර්ගයකි.

**පක්ෂව**

"උපායන්ට වඩා මා ලබන ප්‍රතිඵල බෙහෙවින් සාධාරණය."

අනිරුද්ධ බහාල්,
ප්‍රසිද්ධ 'මරඋගුල්'
ජනමාධ්‍යවේදී.

**විපක්ෂව**

"වාර්තාකරුවන් තමන් පිළිබඳව වැරදි තොරතුරු සැපයිය යුතුයැයි මම නොසිතමි. එය නතර කළ යුතුය."

බෙන් බ්‍රැඩ්ලි,
හිටපු විධායක සංස්කාරක
- *ද වොෂිංටන් පෝස්ට්*

*එලිමන්ට්ස් ඔෆ් ජර්නලිසම්* කෘතිය මර උගුල් ප්‍රතික්ෂේප කරන්නේ නැති වුවද වාර්තාකරුවන් එය තෝරා බේරා යොදාගත යුතු බව අවධාරණය කරයි. එය යොදා ගත යුත්තේ කුමන අවස්ථාවේදීද යන්න හා එය පාඨකයන්ට හා ප්‍රේක්ෂකයින්ට ඉදිරිපත් කරන්නේ කෙසේද යන්න පිළිබඳව එම කෘතිය පියවර තුනක ක්‍රියාවලියක් ඉදිරිපත් කරයි.

එම පියවර නම්:

- මහජන සුභසිද්ධියට වැදගත් වන කතාවක් ලබාගැනීමට වෙනත් මාර්ගයක් කොහෙත්ම නැති අවස්ථාවකදී පමණක් එය යොදාගන්න.
- රැවටිල්ලක් කෙරුණු බවට කතාවට පසුව අනාවරණය කරන්න.
- රැවටිල්ල අවශ්‍ය වූයේ මන්දැයි පාඨකයන්ට හෝ ප්‍රේක්ෂකයන්ට හේතු දක්වන්න.

දීවිතීය භාගය

# ගවේෂණාත්මක කතා ගොඩනැගීම

## තෙවැනි පරිච්ඡේදය

# ගවේෂණාත්මක කතා වස්තුබීජ

ගැමියන්ට කිරි ගවයන් ලබාදීමේ රජයේ වැඩසටහනක කුමක්දෝ අවුලක් ඇති බව අනුරාධපුරයේ ප්‍රාදේශීය වාර්තාකරුවකු වන අසෝක සේනාරත්නට පෙනී ගියේය. ඒ 2006 වසරයි. සමහර ගවයන් රෝගී බවත්, වයස්ගත බවත්, කිරිදෙන්නට තරම් බරකින් යුක්ත නොවන බවත් ඔහු දුටුවේය. ගවයෝ කිහිප දෙනෙක් ගම්මුන්ට ලබා දෙනු ලැබ දින කිහිපයකින්ම මිය ගියහ.

සම්මුඛ සාකච්ඡා කිහිපයක් පදනම් කරගෙන කතාවක් ලියනවාට වඩා සේනාරත්න ප්‍රශ්නයේ වඩා ගැඹුරට බැස්සේය. රජය විසින් බෙදා දෙන ලද එළුවන් සම්බන්ධයෙන්ද ඔහු මෙවැනිම තත්ත්වයක් දුටුවේය. ගම්මුන්ට ලැබුණේ තමන්ට පොරොන්දු වූ ආකාරයේ සතුන් නොව රෝගී වූ හෝ වයස්ගත සතුන්ය. මෙය වඩා විශාල ප්‍රශ්නයක කොටසක්ද කියාත්, රජය මේ බව දන්නේද කියාත් ඔහු සැක කළේය.

ඔහුගේ මෙම සොයා බැලිල්ලේ ප්‍රතිඵලය වූයේ විගණකාධිපතිවරයාගේ කාර්යාලයට අනුයුක්ත මූලාශ්‍රයක් සොයා ගන්නට ඔහුට හැකි වීමය. එම මූලාශ්‍රයට මෙම ප්‍රශ්නය එම ප්‍රදේශයෙන් පමණක් නොව මුළු රටෙන්ම දැනගන්නට ලැබී තිබුණු අතර, ඒ සෑම කරුණක්ම ලේඛනගත වී තිබිණි.

ඉන් පිටපතක් ලබාගත් ඔහු රජයේ පාලනය යටතේ පවතින *දිනමිණ* පුවත්පතට වාර්තාවක් ලියා යැවීය. ප්‍රතිඵලය වූයේ ප්‍රාදේශීය සත්ව කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයා තනතුරෙන් පහ කිරීමයි.

ගවේෂණාත්මක වාර්තාකරුවන් සිය කතාවලට වස්තුබීජ සොයා ගන්නේ කෙසේද යන්නට සේනාරත්නගේ කතාව ඉතා හොඳ උදාහරණයකි. ඔවුහු ඉතා උනන්දුවෙන් තම වටපිටාව දැන සිටිති. ඔවුහු අක්‍රමිකතාවන් ගැන සැලකිලිමත් වෙති. තම සහජ බුද්ධිය යොදා කල්පනා කරති. සාවධානව ඇහුම්කන් දෙති.

නිරීක්ෂණයට අමතරව ගවේෂණාත්මක කතා සඳහා වෙනත් බොහෝ මූලාශ්‍රයන්ද ඇත. ඒ අතර පහත සඳහන් ඒවාද වේ:

- **තමන්ට භාරදී ඇති අංශය (බීට්ටුව) පිළිබඳව වාර්තා කිරීම.** ප්‍රකට ඇමරිකානු විකට නළුවකු වන වුඩි ඇලන් තමාගේ සාර්ථකත්වයේ 90%ක්ම ලබා ගත්තේ හුදු පෙනී සිටීමෙන්ම පමණකැයි උපහාසයෙන් කියයි. ගවේෂණාත්මක කතා

වස්තුබීජ සොයා ගැනීම සම්බන්ධයෙන්ද මෙය සත්‍ය වේ. නිශ්චිත අංශ පිළිබඳව වාර්තා කරන වාර්තාකරුවෝ එම අංශවලට අදාළ තැන්වලට නිතර යන එන විට තමන් ලියන දේට වඩා වැඩි යමක් අසති, දකිති. එහිදී ඔවුහු සොයා බැලිය යුතු තරම් වූ චර්යා රටා දකිති. ගවේෂණාත්මක කතා තේමා සඳහා එසේ වාර්තා කරන අංශ හොඳ මූලාශ්‍රයකි.

- **පසුවිපරම් කතා.** පසු විපරම් කතා ගවේෂණාත්මක වාර්තා සඳහා ඇති ස්වාභාවික පාලමකි. අලුතින් මාර්ගයක් ඉදි කළ පසු මාස හයකින් යළිත් එය අලුතින් ඉදි කළ යුතු වේ නම් එතැන ප්‍රශ්නයක් තිබේ. තවත් මෙවැනි වැරදියට තැනූ මාර්ග කීයක් තිබේද? මේ මාර්ගවල අතුරා ඇති ගල්වල ස්වභාවය කෙබඳුද? ඒවා භාවිතයට සුදුසුයැයි අනුමත කළේ කවුද? කොන්ත්‍රාත්තුව ලැබුණේ කාටද?

- **ඉඟි සපයන්නෝ.** 'ඇටමැස්සෝ' යනු බොහෝ විට නොතකා හැරෙන විවේචකයෝය. 'උරුහන්බාන්නෝ' නම් වැරදි නිසා සිත් රිදවාගන්නා අභ්‍යන්තර සේවකයෝය. සමහර විට නිලධාරීහුය. මේ දෙපිරිසම ගවේෂණාත්මක කතා තේමාවලට මුල පුරන විශිෂ්ට ගණයේ කතා මූලාශ්‍ර වෙයි.

- **ක්ෂණික පරීක්ෂා.** බලධාරියකු ප්‍රකාශයක් කරන විට හෝ පොරොන්දුවක් දෙන විට ඒ පිළිබඳව ලිපිලේඛන හා වෙනත් මූලාශ්‍ර මගින් පරීක්ෂා කර බලන්න. ඔහුගේ ප්‍රකාශය ප්‍රතිවිරෝධී හෝ මුළුමනින්ම වැරදි බව පෙනේ නම් එය ඔබට එදිනට කතාවක් වනවා පමණක් නොව වඩා ගැඹුරු කතාවකට මුල පිරීමක්ද වනු ඇත.

- **පෞද්ගලික අත්දැකීම්.** වාර්තාකරුවෝද සාමාන්‍ය මිනිස්සු වෙති. ඔවුහුද බදු ගෙවති. ව්‍යාපාරික සමාගම් සමග ගනුදෙනු කරති. එමෙන්ම රජයේ සේවා ලබාගනිති. නිලධාරීන් සමග වාර්තාකරුවකු කරන ගනුදෙනු බොහෝ විට ගවේෂණාත්මක කතාවකට මග පාදනු ඇත. වාර්තාකරු තමන් අවට වෙනස් වන දෑ ගැන සැලකිලිමත් විය යුතු අතර, "එසේ වන්නේ මන්දැ"යි ප්‍රශ්න කළ යුතුය.

- **'ඔත්තු පළවල්' (Listening Posts).** මේ පොදු වුවමනා එපාකම් ඇති පිරිස් නිල නොවන මට්ටමින් රැස් වී අල්ලාප සල්ලාපයේ යෙදෙන තැන්ය. උදාහරණයක් වශයෙන් පාර්ලිමේන්තු ලොබිය ගවේෂණාත්මක කතාවලට හොඳ හෝඩුවා සපයිය හැකි, බොහෝ වුවමනා එපාකම් මුණගැසෙන සැබෑ සන්ධිස්ථානයකි.

- **ප්‍රාදේශීය රැස්වීම්.** බොහෝ විට විවෘත රැස්වීම්වල කෙරෙන සාකච්ඡාවලදී ගවේෂණාත්මක වාර්තා කිරීම් සඳහා හෝඩුවා ලැබේ. ප්‍රාදේශීය වාර්තාකරුවන්ට කතා වස්තුබීජ සොයාගත හැකි රැස්වීම් වර්ග ගණනාවකි. ඒවා නම්:

  - පළාත් සභා, මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා
  - දේශීය/විදේශීය රාජ්‍ය නොවන සංවිධාන එකමුතුව
  - ස්ත්‍රී-පුරුෂයන් අතර ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම පිළිබඳ දිස්ත්‍රික්ක කමිටුව
  - දිස්ත්‍රික්ක සංවර්ධන කමිටු

## ගවේෂණාත්මක කතා සඳහා පොදු මාතෘකා

ගවේෂණාත්මක වාර්තාකරණය සෑම විටම පාහේ මහජන මුදල් අපයෝජනය පිළිබඳව අවධානය යොමු කරන හෙයින්, රජයේ වැඩසටහන්වලින් කතා සඳහා විශාල වශයෙන් අවස්ථාව උදා වේ. එසේම ඉහතින් දක්වන ලද සේනාරත්න මහතා පිළිබඳ උදාහරණයේදී මෙන්ම මෙම කතා හොඳින්ම දැකගත හැකි වන්නේ පිට පළාත්වලදීය. දූෂණවල සහ වැරදි ප්‍රතිපත්තිවල ප්‍රතිඵල පැහැදිලිව පෙනෙන්නේ එහිදීය.

සමහර වැඩ සටහන් ගවේෂණාත්මක වාර්තාකරණය සඳහා වඩා ප්‍රයෝජනවත්ය. ඒවා නම්:

- පොදු කටයුතු. මාර්ග, මළ මාර්ග සඳහා කොන්ත්‍රාත්තු දීමේදී හා ඒවා ඉදි කිරීමේදීද වෙනත් පොදු පහසුකම් සැපයීමේදීද පුරුද්දක් වශයෙන් දූෂණය, අල්ලස් හා ගසාකෑම් සිදු වීමට තිබෙන ඉඩකඩ වැඩිය.

- සෞඛ්‍යය. රෝග බෝ වීම්, පානීය ජල හිඟය, රෝහල්වල කාර්ය මණ්ඩල හිඟය ආදි සියල්ල ගවේෂණාත්මක ප්‍රයත්නයන් සඳහා ප්‍රධාන ඉලක්ක බවට පත් වේ.

- මැතිවරණ. ඡන්ද දූෂණ, හොර ඡන්දකරුවන්, බිය ගැන්වීම් සහ මැතිවරණ දින ප්‍රචණ්ඩ ක්‍රියා ගවේෂණාත්මක කතාවලට හොඳ වස්තුබීජ වේ.

- අධ්‍යාපනය. පාසල් ආශ්‍රිත මාතෘකා ගවේෂණ සඳහා යෝග්‍ය වේ. ගුරු හිඟය හා පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම සඳහා අල්ලස් දීමට මව්පියන්ට සිදු වීම වැනි දුෂ්කර තත්ත්වයන්ද මේවාට ඇතුළත්ය. පාසල් වේලාවෙන් පසු ළමයින් අමතර පන්තිවලට යාමට බල කෙරෙන අයුරින් ගුරුවරුන් තම කටයුතු හසුරුවා ගැනීම බහුල වශයෙන් සිදු වන බව පෙනේ.

- රජයේ කටයුතු. සේවාවන්, ප්‍රාග්ධන වර්ධනයන්, ආහාර, මුදල් ආදිය ලබා දෙන බවට පුරවැසියන්ට පොරොන්දු දෙන ඕනෑම රජයේ වැඩසටහනක් ප්‍රතිපත්ති, ප්‍රත්‍යක්ෂයන් හා ප්‍රතිඥා සැබෑ කාර්යඵලය සමග සසඳන 'P-4' සූත්‍රය මගින් විභාග කර බැලීමට සුදුසුය.

## ප්‍රශ්නය: දූෂණය

බොහෝ ගවේෂණාත්මක කතා පොදු රැහැනකින් බැඳී තිබේ. එනම්, දූෂණ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයි. එහෙයින්, දූෂණය ඇති වන්නේ කුමක් නිසාද? ජනතාවගේ තීන්දු විකෘත කෙරෙන්නේ කුමකින්ද? බදු ගෙවන්නන්ගේ මුදල් නාස්ති කෙරෙන්නේ කුමකින්ද? සංවර්ධනයට ඇති බාධක මොනවාද? ජීවිතවලට තර්ජන බවට පත්වී ඇත්තේ මොනවාද? මහජන සුභසිද්ධියට තර්ජනයක් වී ඇත්තේ මොනවාද? සහ ප්‍රජාතන්ත්‍රවාදය නිෂ්ඵල කෙරෙන්නේ කුමකින්ද? යනාදිය පිළිබඳව ගවේෂණාත්මක වාර්තාකරුවන් පැහැදිලි අවබෝධයකින් යුක්ත වීම අවශ්‍ය වේ.

සාමාන්‍යයෙන් ගත් කල දූෂණය යනු කෙනකු තම තත්ත්වය හෝ බලය තමන්ගේ හෝ තම පවුලේ හෝ තම මිතුරන්ගේ හෝ පෞද්ගලික ප්‍රයෝජන සඳහා අයුතු ලෙස යොදා ගැනීමයි. මහජන සුභසිද්ධිය සඳහා ක්‍රියා කරනු වෙනුවට පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා දූෂිත නිලධාරීහු මහජන මුදල් ගසාකති. ජනතාව අසරණ කරති. එසේ නැත්නම් රජයේ පරිපාලන ක්‍රමයට වංචා කරති.

මෙම කාරණයේදී නොවැළැක්විය හැකි කරුණක් නම් අවශ්‍යතා අතර ගැටුමයි. මින් අදහස් කෙරෙන්නේ, නිලධාරියකු මහජනයා සම්බන්ධයෙන් සාධාරණවත්, සමානවත්, ඵලදායකවත් කළ යුතු රාජකාරිය සමග ඔහුගේ පෞද්ගලික වුවමනා එපාකම් ගැටේ යන්නයි. උදාහරණයඃ දූෂිත නිලධාරියකු සමස්ත ප්‍රජාවටම අවශ්‍ය කරන පාලමක් ඉදිකරනු වෙනුවට තමන්ගේ නිවසට යන මාර්ගය සකස් කර ගැනීම මේ සඳහා දැක්විය හැකිය. එසේත් නැත්නම් දුප්පතුන් සඳහා සහල් මිලදී ගැනීමට තිබෙන මුදල එම නිලධාරියා ගසා කෑම දැක්විය හැකිය. එසේත් නැත්නම් ඔහු එම සහල් පෞද්ගලික ව්‍යාපාරිකයකුට ලබා දෙයි. එම වෙළෙන්දා එම සහල් දස ගුණයකින් මිල වැඩි කර කළු කඩයේ විකුණයි. ඉන් උපයන මුදලින් කොටසක් පෙර කී නිලධාරියාටද ලැබේ. තවත් මෙවැනි නොයෙක් උදාහරණ දැක්විය හැකියි.

පරිපාලනය පිළිබඳ බරපතළ ප්‍රශ්න ඇති රටවල දූෂණය ඉතා පහසුවෙන් මුල් බැස ගත හැකිය. පවුල්වාදය හා හිතමිතුරු සංග්‍රහය සංස්කෘතියටම සම්බන්ධ කොට දූෂණය එක්තරා නම්‍ය සංකල්පයක් ලෙසද සමහර සමාජයන්හි සැලකේ.

අපි උදාහරණයක් ගනිමු. පොදු වැඩ පිළිබඳව කටයුතු කරන නිලධාරියෙක් වඩා සුදුසුකම් ලත් තරගකරුවන් නොතකා හැර, යම් පොදු කටයුත්තක් කිරීමේ කාර්යය තමාගේ පවුලට අයත් සමාගමකට දෙයි. මෙමගින් ව්‍යාපෘතිය පිළිබඳව තමාට දැඩි පාලනයක් පවත්වාගෙන යා හැකි බවත්, ඒ අනුව ව්‍යාපෘතියේ වැඩ කටයුතු වඩා හොඳින් කරගත හැකි බවත් එම නිලධාරියා තර්ක කරයි. මේ අතර, ඉතා අඩු වැටුපක් ලබන, එනිසාම සිය ජීවනෝපාය සඳහා අශෝභන කටයුතුවල යෙදෙන්නට සිදුව ඇති රජයේ නිලධාරීන්ට, විශේෂයෙන්ම පොලීසියට හිතවාදීවද ඇතැම්හු අදහස් පළ කරති.

මෙවැනි සිතුවිලි වැරදිය. මෙවැනි සාධාරණීකරණය කිරීම් නිසා, ප්‍රජාතන්ත්‍රවාදය යටතේ රජයේ සේවකයන්ගේ වැටුප් ආදිය විවෘත විෂයයන් විය යුතුය යන කරුණ ප්‍රතික්ෂේප වේ. ඒ අතරම, දූෂණය මධ්‍යම පන්තියට හා ධනවතුන්ට රාජකාරි කිරීම සඳහා වූ පිරිවැයක් ලෙසත්, දූෂණයේ යෙදෙන්නට නොහැකි දුප්පතුන්ට එය අපරාධයක් ලෙසත් සැලකිය හැකිය යනුවෙන් වැරදි සාධාරණීකරණය කළ හැකිය. එහෙත්, විදුලිය, ජලය, පොලිස් ආරක්ෂාව සහ රජයෙන් ලබා දෙන ආහාර සඳහා අල්ලස් දීමට සිදු වීම නිසා දුප්පත් පවුල්වලට තම දරුවන්ට ආහාර, ඇඳුම් හෝ අධ්‍යාපනය ලබා දෙන්නට නොහැකි විය හැකිය.

දූෂණය දුප්පතුන් හා පොහොසතුන් අතර පරතරය වැඩි කරමින් දරිද්‍රතාව වැඩි කරයි. රාජ්‍ය සේවයේ නීත්‍යනුකූලභාවය බිඳ දමයි. එසේම එය මානව සංවර්ධනයට ඇති ප්‍රධාන බාධකයයි.

## දූෂණ වර්ග

මත් ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) දක්වන පරිදි දූෂණය පිළිබඳ පුළුල්තම වර්ගීකරණය පහත දැක්වේ:

- මහා දූෂණ. මහා දූෂණ යනු යහපාලනය, නීතියේ පාලනය හා ආර්ථික ස්ථාවරත්වය පිළිබඳ විශ්වාසය මහා පරිමාණයෙන් බිඳදමන අයුරින් ජාතික ආණ්ඩුවේ ඉහළම මට්ටමේදී සිදු වන දූෂණයි.

- සුළු දූෂණ. සුළු දූෂණවලදී ඉතා සුළු ප්‍රමාණයෙන් මුදල් හුවමාරු වේ. එනම්, විශේෂ සැලකිලි බලාපොරොත්තු වන්නන් කරන සුළු සුළු උදව් හෝ සුළු තනතුරුවලට තම හිතවතුන් පත් කිරීම ආදියයි.

- ක්‍රියාකාරී/වින්දිත අල්ලස. 'ක්‍රියාකාරී අල්ලස' යනු අල්ලසක් දීමට ඉදිරිපත් වීම හෝ අල්ලස් දීමයි. 'වින්දිත අල්ලස' යනු අල්ලස ලබා ගැනීමයි.

- දේශපාලන දූෂණය. එනම් රජයේ නිලධාරීන්, සේවකයන් පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා රාජ්‍ය බලය, තනතුරු හෝ සම්පත් අයුතු ලෙස යොදා ගැනීමයි. එනම්, ගසා කෑම, අල්ලස් ඉල්ලීම හෝ දීමයි.

- ව්‍යාපාරික දූෂණය. ව්‍යාපාරික ක්ෂේත්‍රයේ නිලධාරීන් විසින් ඇතුළතින් හෝ පිටින් කරනු ලබන සාපරාධී ක්‍රියා සහ බලය අයුතු ලෙස යොදාගැනීම මෙනමින් හැඳින්වේ.

## දූෂිත ක්‍රියාකාරකම්

- අල්ලස. අනෙක් අයට බලපාන යම් ක්‍රියාවක හෝ තීරණයක ප්‍රතිඵලයට බලපාන අයුරින්, එම ක්‍රියාවට හෝ තීරණයට අයුතු ලෙස බලපෑම් කිරීම සඳහා යම් ප්‍රතිලාභයක් ලබා දීමයි.

- වංචනික ලෙස විශ්වාසය හා වගකීම් කඩ කිරීම. අනුන්ගේ මුදල් හා දේපළවලට අතගැසීමට ඉඩ සලසන තම තනතුර හෝ වෘත්තිය උපයෝගී කරගෙන, තමන්ගේ භාරයට පත්කොට ඇති එම මුදල් හෝ දේපළ වංචනික ලෙස අත්පත් කරගැනීම මෙයින් අදහස් කෙරේ.

- වංචාව. ලාභ ලැබීම හෝ අසාධාරණ හෝ වංක ප්‍රයෝජනයක් ලබා ගැනීම සඳහා සිතාමතා කරන රැවටිලි, කපටිකම් හෝ විශ්වාසය කඩ කිරීමයි. එනම්, වචනයෙන් හෝ ක්‍රියාවෙන් කිසියම් දෙයක් හෝ කරුණක් සාවද්‍ය ලෙස විස්තර කිරීමයි.

- බලෙන් ලබාගැනීම. මුදල් හෝ වෙනත් සම්පත් ගසාකෑම සඳහා ප්‍රචණ්ඩත්වය උපයෝගී කරගන්නා බවට හෝ හානිකර තොරතුරු හෙළි කරන බවට තර්ජනය කිරීමයි.

- **පක්ෂග්‍රාහී සැලකිල්ල.** යම් පුද්ගලයකුට හෝ කණ්ඩායමකට විශේෂ සැලකිල්ලක් දැක්වීම මගින් බලය හා අභිමතය අයුතු ලෙස භාවිත කිරීමයි.

- **ඥාති සංග්‍රහය.** තම ඥාතීන්ට දක්වන පක්ෂග්‍රාහී සැලකිල්ලයි.

- **හිතමිත්‍ර සංග්‍රහය.** සුදුසුකම් නොසලකා තම හිතවතුන් හා තමන්ට සම්බන්ධ වෙනත් අය බලතල සහිත තනතුරුවලට අයුතු ලෙස පත් කිරීමයි.

- **බලපෑමේ හැකියාව විකිණීම.** රාජ්‍ය, දේශපාලන හා ව්‍යාපාරික ආයතනවල අභ්‍යන්තරිකයන්, සාමාන්‍යයෙන් පිටස්තරයන්ට නැති, තම නිලබලයෙන් ලබාගත් වරප්‍රසාද පෙන්වා ප්‍රයෝජන ගැනීම මින් අදහස් කෙරේ.

- **අභ්‍යන්තර තොරතුරු වෙළඳාම.** තම ආයතනයේ අප්‍රකට තොරතුරු විකිණීමෙන් ලාභ ඉපැයීමයි.

- **අභිමත බලය අයුතු ලෙස යොදාගැනීම.** තමන්ට ලැබී ඇති නිල අභිමත බලය පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා යොදාගැනීමයි.

## අවසන් වදන: සුළුවෙන් සිතන්න

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් ගවේෂණාත්මක කතාවලින් වැළකී සිටින්නේ ඔවුන් ලොකුවට සිතන හෙයිනි. ඔවුන් විශ්වාස කරන්නේ ගවේෂණාත්මක කතාවලින් ඉලක්ක කරගත යුත්තේ ජනාධිපතිවරයා, ඔහුගේ පවුලේ උදවිය, ඔවුන්ගේ දේශපාලන සගයන් සහ මධ්‍යම රජයේ ඉහළ පෙළේ නිලධාරීන්ය කියාය. 1970 ගණන්වලදී ඇමරිකානු ජනාධිපති රිචඩ් නික්සන්ට ඉල්ලා අස් වීමට මග පෑදූ වෝටර්ගේට් අක්‍රමිකතාව හෙළිකළ *වොෂිංටන් පෝස්ට්* පුවත්පතේ බොබ් වුඩ්වර්ඩ් හා කාල් බර්න්ස්ටයින්ලා වන්නට සෑම කෙනකුටම නොහැකිය.

එවැනි බලවතුන්ට එරෙහිව ඉහළ මට්ටමේ ගවේෂණාත්මක කතා පෙළක් ලිවීමට ශ්‍රී ලංකාවේ වාර්තාකරුවන් වෙත ඊට අවශ්‍ය විශ්වාසය, කුසලතාව හා සම්පත් නැතුවා පමණක් නොව, එවැනි දෙයක් නිසා ගෙවිය යුතු පෞද්ගලික මිල පිළිබඳව ඔවුහු කල්පනා කරති. ආරක්ෂාව පිළිබඳ පරිච්ඡේදයේද සඳහන් පරිදි, ලොකු කතා ලිවීම නිසා වාර්තාකරුවන් බිය ගැන්වීම, ඔවුන්ට පහරදීම, නඩු පැවරීම, ඔවුන් අතුරුදන් වීම, සිරගත කිරීම සහ ඝාතනයටද ලක් වීම පිළිබඳ උදාහරණ විශාල සංඛ්‍යාවක් ඇත.

එසේ වුවද, ගම්බද ප්‍රදේශවල ජීවිතය ගැටගසාගැනීමට උත්සාහ කරන බොහෝ පාඨකයන්ට සහ ප්‍රේක්ෂකයන්ට මෙය හොඳම දේ හෝ අවශ්‍යම දේ නොවිය හැකිය. ඔවුන් වඩාත් පීඩාවට පත් වන්නේ මාර්ග, පාලම්, පාසල්, සේවා හා රජයේ සහනාධාර ආදියේදී සිදු වන ගසාකෑම් හරහා සිදු වන දූෂණය මගිනි. මෙම සිදුවීම් හඳුනාගැනීම හා ලේඛනගත කිරීම පහසුය. ඒවා වඩා විශාල ප්‍රශ්නවල රෝග ලක්ෂණ පෙන්නුම් කරන ඒවාද වේ. ඉදිරියට කටයුතු කරගෙනයාමට අවශ්‍ය කරන සම්බන්ධතාවලින් හා හැකියාවෙන් යුත් කොළඹ සිට ක්‍රියාත්මක වන ජනමාධ්‍යවේදීන් සමග එක්ව, පසුව එම විශාල ප්‍රශ්න ගැන සොයා බැලිය හැකිය.

එහෙයින්, ගවේෂණාත්මක කතාවලදී කුඩා දේ අලංකාර බව ශ්‍රී ලංකාවේ වාර්තාකරුවන් සිහි තබාගත යුතුය. ක්ෂුද්‍ර කතා ඔවුන්ගේ ගවේෂණාත්මක කුසලතා ඔප් නංවන අතර, ඔවුන් සේවය කරන ප්‍රජාව කෙරෙහි ක්ෂණික බලපෑමක්ද ඇති කරයි.

## සිව්වැනි පරිච්ඡේදය

# කතා වස්තුබීජය ඔපවත් කරගැනීම සහ කතාවට පිළිගැනීමක් ලබාගැනීම

### පසුබිම් තොරතුරු සෙවීම

ගවේෂණාත්මක කතා වස්තුබීජයක් පිළිබඳ ඡායාවක් දුටු වහාම එය රැගෙන කර්තෘවරයා හමුවට යාමට පෙර වාර්තාකරු එහි පසුබිම ගැන ක්ෂණික සොයා බැලීමක් කළ යුතුය. පසුබිම ගැන සෙවීමේදී 'පිටත සිට ඇතුළත බැලීමක්' කළ යුතු වේ. එනම්, වාර්තාකරු ක්ෂණිකව ඉලක්කය සමග ගැටුමක් ඇති කරගන්නේ නැත. එසේ නැත් නම් ප්‍රධාන හෝ අනිවාර්ය සාක්ෂිකරුවන් හා අදාළ පුද්ගලයන් හමු වී තොරතුරු ගැනීම ආරම්භ කරන්නේ නැත. වාර්තාකරු ඉක්මන් නොවෙයි. එසේම, වරද පිළිබඳ සාක්ෂි සැඟවීමට හෝ මූලාශ්‍ර විය හැකි අයට තර්ජනය කිරීමට හෝ තම කතාවේ ඉලක්කවලට කාලය ලබා නොදෙයි.

ඒ වෙනුවට, ගවේෂණාත්මක වාර්තාකරු ද්විතීයික මූලාශ්‍ර මගින් තමන්ට අත්කරගත හැකි දේ විමසා බලයි. ARIJ අත්පොත යෝජනා කරන පරිදි, වාර්තාකරුවකු සොයන 'රහස්වලින්' වැඩි සංඛ්‍යාවක්, පළ කරන ලද කතා (speeches), අධ්‍යයන වාර්තා, ආයතනික රෙගුලාසි හා රජයේ වාර්තා වැනි විවෘත ලේඛනගත මූලාශ්‍රවලින් ලබාගත හැකිය.

**මූලික පසුබිම් තොරතුරු සෙවීම.** මේ සඳහා ඉලක්කගත නිලධාරියා හෝ ආයතනය වර්තමානයේ මුහුණ දෙන ප්‍රශ්න හා මීට කලින් කරන ලද හෙළිදරව් කිරීම් පිළිබඳව වාර්තාකරුට දළ අදහසක් ඇති කරගැනීමට අවශ්‍ය කරන කාලය පමණක් ගත කළ යුතුය. මෙවැනි පසුබිම් තොරතුරු සෙවීම වෙනත් රාජකාරි කරන අතරතුර කල් මරන වේලාවල්වලදී කළ හැකිය. එවැනි ක්‍රම කිහිපයක් නම්:

- **පුවත්පත් එකතු පිරික්සුම්.** පැරණි කියමනකින් කියැවෙන අන්දමට මහ පොළොවේ කිසිම දෙයක් අලුත් නැත. එක් ප්‍රවෘත්ති ආයතනයක්වත් ඉලක්ක ගත නිලධාරියා හෝ මාතෘකාව පිළිබඳව කුමක් හෝ ලියා තිබීමේ ඉඩක් තිබේ. ගවේෂණාත්මක වාර්තාකරු ප්‍රසිද්ධියේ ප්‍රකාශ කෙරුණු සියල්ල දැන සිටිය යුතු අතර, කලින් පළ වූ ලිපිවල ඇතුළත් වී තිබුණද පසු විපරමට ලක් නොවූ, වක්‍රව දක්වන ලද අදහස් තිබේදැයි සොයා බැලිය යුතුය.

- පරිගණක ආශ්‍රිත පිරික්සුම්. ඇමරිකාවේ ඇති නෛතික හා ප්‍රලේඛන පිරික්සුම් සේවා සලසන ලෙක්සිස්-නෙක්සිස් වැනි සමාගම් මගින් දැන් වාර්තාකරුවන්ට අන්තර්ජාලයේ විවිධ ප්‍රලේඛන පිරික්සා බැලිය හැකිය (2006 දී ලෙක්සිස්-නෙක්සිස් සතුව නෛතික හා පොදු ලේඛන ආශ්‍රිත තොරතුරු ඇතුළත් ලෝකයේ විශාලතම දත්ත ගබඩාව තිබුණු බව කියැවේ).

- ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය. යම් ජනමාධ්‍යයක් සතුව හොඳ ප්‍රලේඛන පුස්තකාලයක් නැත්නම් වාර්තාකරුවකුට ජාතික පුස්තකාලයෙන් කරුණු පිළිබඳ පුවත්පත් වාර්තා ඉල්ලා සිටිය හැකිය.

- ගූගල් (Google). පසුබිම් තොරතුරු සෙවීම සඳහා ඇති පහසුම ක්‍රමයක් වන්නේ ඉලක්කය ගූගල් පිරික්සුම් යන්ත්‍රයට ඇතුළත් කර මුලින්ම ඇති පිටු දෙකක් හෝ තුනක් කියවා බැලීමයි.

**වඩා ගැඹුරින් පසුබිම් තොරතුරු සෙවීම.** කතාවකට අනුමැතිය ලැබුණු විගස වාර්තාකරු වඩා ගැඹුරින් කරුණු විමසා බැලීම ආරම්භ කරයි. වාර්තාකරු මෙසේ කරන්නේ ඉලක්කයේ අතීත වාර්තා, ප්‍රතිපත්ති හා නෛතික බාධක ගැන දැන ගැනීම සඳහාය. ගවේෂණාත්මක වාර්තාකරු අදාළ ඉලක්කගත නිලධාරියා හෝ ආයතනය හසුරුවන නීතිරීති හා රෙගුලාසි පිළිබඳ කෙටි කාලීන විශේෂඥයකු වීමට උත්සාහ කරයි. ඔහු ආයතනයේ ප්‍රතිපත්තිමය මූලධර්ම, පටිපාටි හා නිලධාරි සංස්කෘතිය ආදිය පිළිබඳව සියලු දේ උගනියි.

එතරම් දුර යන්නේ කුමකටද? එසේ ගැඹුරින් පසුබිම විපරම් කිරීමට ඉතා හොඳ හේතු ඇත. ක්ෂේත්‍ර වාර්තාකරණය සම්බන්ධයෙන් ගත් විට, එය

- ශක්තිමත් තත්ත්වයක සිට වාර්තා කිරීම ආරම්භ කිරීමට වාර්තාකරුට ඉඩ සලසයි.
- තමන්ට අදාළ පුද්ගලයන් බොරු කියන්නේ කුමන මොහොතේදීදැයි දැනගැනීමට වාර්තාකරුට උදව්වෙයි.
- රවටනු ලැබීමෙන් වාර්තාකරු වළකාලයි.
- ඔහුට ලැබෙන ලියකියවිලි සම්බන්ධයෙන් ඉතා හොඳ පසුබිම් විස්තර ලබාදෙයි.
- සිදු විය හැකි දූෂණ සම්බන්ධයෙන් ඔහුගේ ඇස් අරවයි. ආයතන නීතිරීති හා පටිපාටිවලින් පිට පනින ඕනෑම අවස්ථාවක් වරදක් පිළිබඳව රතු කොඩිය වනයි.

## උපකල්පන

වාර්තාකරුවා තම නිරීක්ෂණයන් සිදු කර, කතා වස්තුබීජයක් ගැන සිතා, පසුබිම් තොරතුරු මගින් හිස්තැන් පුරවාගැනීම ආරම්භ කරනවිට ඔහුට යම් තේමාවක්, යම් මතයක් හෝ තමා සොයන දේ පිළිබඳ බලාපොරොත්තුවක් ඇති කරගැනීම හැර කරන්නට අන් දෙයක් නැත. උපකල්පනය යනුවෙන් හැඳින්වෙන්නේ මෙයයි.

විද්‍යාඥයෝ පාලනයකට නතු කරන ලද පර්යේෂණ මගින් තමන්ගේ උපකල්පන පරීක්ෂණයට ලක් කරති. ඒ අයුරින්ම ගවේෂණාත්මක වාර්තාකරුද උපකල්පනයකට එළැඹ ලිපිලේඛන ගොන්නක් හා සම්මුඛ සාකච්ඡා මගින් එය පූර්ණ පරීක්ෂාවකට ලක් කරයි. උපකල්පනයන්ට එළැඹීමේ එක් සරල ක්‍රමයක් නම්, P-4 සූත්‍රය යොදාගැනීමයි. උපකල්පන ඉලක්කගත නිලධාරියාගේ ප්‍රතිපත්ති, ප්‍රතිරූපය හෝ ප්‍රතිඥා පිළිබඳ 'නිල ප්‍රකාශයක්' බවට පත් වන අතර, පසුව එය සැබෑ ජීවිතයේ අත්දැකීම් (සම්මුඛ සාකච්ඡා) හා ලිපිලේඛන මගින් පෙන්නුම් කෙරෙන කාර්යඵලය මගින් පරීක්ෂාවට ලක් වේ.

කිරි ගවයින් පිළිබඳ ප්‍රශ්නයේදී, වාර්තාකාර සේනාරත්න හට වැඩසටහන පිළිබඳ නිල විස්තරය පදනම් කරගෙන උපකල්පනයකට එළැඹීමට හැකි වී ඇත. එය මෙබඳු දෙයකි:

උපකල්පනය: කිරි ගවයින් බෙදා දීමේ වැඩසටහන යටතේ සෑම ග්‍රාමීය පවුලකටම තම ගොවිපළ දියුණු කරගැනීමට ලබා දෙන සුළු පරිමාණ ණයක් වශයෙන් කිලෝග්‍රෑම් 100ට වැඩි නිරෝගී තරුණ එළදෙනක් සපයනු ලැබේ. එසේම, මසට එළුවන් විකිණීමට අදහස් කරන පවුල්වලට එමගින් කිලෝග්‍රෑම් 20ට වැඩි නිරෝගී තරුණ එළුවෝ සැපයෙති.

පසුව ඔහු තම නිරීක්ෂණයන් සිදු කරමින්, සතුන් පරීක්ෂා කරමින් හා ගොවීන් සමග සාකච්ඡා කරමින් තමන්ට දකින්නට ලැබෙන දේ තම උපකල්පනය සමග සසඳා පරීක්ෂණයට ලක් කරයි (කාර්යඵලයට එරෙහිව ප්‍රතිඥාව). අලුත් තොරතුරු ලැබෙන විට ඔහු සිය උපකල්පනය වෙනස් කරගනී. උදාහරණයක් වශයෙන්, කිරි ගවයින් සම්බන්ධයෙන් ගැටලුවක් ඇතත් එළුවන් සම්බන්ධයෙන් එවැන්නක් නැති බවක් ඔහුට පෙනී ගිය හොත් ඔහු එය මෙසේ වෙනස් කරගනී:

සංශෝධිත උපකල්පනය: අනුරාධපුරය අවට පදිංචිකරුවන්ට රජයේ වැඩසටහනක් මගින් පොරොන්දු වූ පරිදි නිරෝගී එළුවන් ලබා දී තිබුණද, ඔවුන්ට සපයන ලද කිරි ගවයෝ පොරොන්දු වූ තත්ත්වයේ නොවූහ. එම ගවයින් කිලෝ 100ට අඩුය, නැත්නම් රෝගීය, එසේත් නැත්නම් කිරි දිය නොහැකි තරම් වයස්ගතය.

උපකල්පන ක්‍රමය සාපේක්ෂ වශයෙන් අලුත් සංකල්පයක් ලෙස පෙනුණද, එය එසේ නොවේ. බොහෝ කාලයක් තිස්සේ ප්‍රධාන පුවත්පත් තම ගවේෂණාත්මක වාර්තාකරුවන්ට තමන් දන්නා දෑ ගැනත් සොයාගත හැකියැයි තමන් විශ්වාස කරන දෑ ගැනත් සටහන් හා කෙටි විස්තර ලියා තබාගන්නා ලෙස උපදෙස් දී ඇත.

කුමන නමකින් හැඳින්වුණද උපකල්පන ක්‍රමය කතාව කෙරෙහි අවධානය යොමු කරන කෙටි සටහනක් උපයෝගී කරගනී. ARIJ අත්පොත දක්වන ආකාරයට, උපකල්පනය අලුත් තත්ත්වයන්ට ගළපාගැනීම සඳහා වාර්තාකරු නිවැරදි විය යුතු නැත. අවශ්‍ය වන්නේ අවංක වීමයි. සුපරීක්ෂාකාරී වීමයි. එසේ, වාර්තාකරණ ක්‍රියාවලිය අවසානයේදී වාර්තාකරු කතාවක් ඉදිරිපත් කරනු ඇති බවත්, ඒ සඳහා ඔහු විද්‍යාත්මක ක්‍රමයක් වැනි ප්‍රබල ක්‍රමවේදයක් යොදාගනු ඇති බවත් සහතික කෙරේ.

## කතාවට පිළිගැනීමක් ලබාගැනීම

ගවේෂණාත්මක මට්ටමේ විය හැකි බොහෝ කතා, වාර්තාකරුවන්ට ඒවාට පිළිගැනීමක් ලබාගැනීමට නොහැකි වීම නිසා හෝ තම ප්‍රධානීන්ට ඒවා 'විකුණාගැනීමට' නොහැකි වීම නිසා උපන්ගෙයිම මැරී යයි. එහෙත්, පිළිගැනීමක් ලබාගැනීම මෙම කටයුත්තේ ඉතා වැදගත් අංශයකි. ගවේෂණාත්මක වාර්තාකරණය පිළිබඳ දීර්ඝ ඉතිහාසයක් ඇති ප්‍රධාන මාධ්‍යවලදීද, ගවේෂණාත්මක ව්‍යාපෘතියක් සඳහා දරන වෙහෙස ඵලදායක බව ජනමාධ්‍යවේදියා තම ප්‍රධානීන්ට ඒත්තු ගැන්විය යුතුය.

පිළිගැනීමක් ලබාගැනීම වාර්තාකරු තම කර්තෘවරයා සමග පවත්වන සබඳතාව මත රඳා පවතී. ප්‍රාදේශීය වාර්තාකරු ප්‍රධාන කාර්යාලයෙන් ඈත සිටින නිසාත්, තම ප්‍රධානියා සමග වැදගත් හමුවකට ඔහුට අවස්ථාව නොලැබෙන නිසාත් එවැනි හොඳ සබඳතාවක් ගොඩනගාගැනීම දුෂ්කර වේ. බොහෝ විට ප්‍රාදේශීය වාර්තාකරු ප්‍රධානීන් සමග ඉතා කෙටි කතාබහක පමණක් යෙදී තිබිය හැකිය. එයද ප්‍රාදේශීය ප්‍රවෘත්ති සම්බන්ධයෙන් කටයුතු කරන 'දොරටුපාලයා' සමග විය හැකිය. ගවේෂණාත්මක කතාවක් අනුමත කළ හැකි ඉහළ මට්ටමේ කර්තෘවරයකුට කතා කරන්නට ඔහුට අවස්ථාව ලැබෙන්නේ කලාතුරකිනි. එසේම, තම වාසිය සඳහා කර්තෘවරයා අදාළ දේශපාලනඥයාට හෝ ආයතනයට කතාව ගැන තොරතුරු හෙළිකරාවිදැයිද වාර්තාකරු බිය වෙයි.

එසේ වුවද, ප්‍රාදේශීය වාර්තාකරුට තම ගවේෂණාත්මක ව්‍යාපෘතිය සඳහා තම කර්තෘවරයාගේ සහාය අවශ්‍ය වේ. ප්‍රධාන පෙළේ බලධාරියකු සමග වාර්තාකරුට සම්මුඛ සාකච්ඡාවක් සූදානම් කර දෙන්නට කර්තෘවරයා මැදිහත් වීමේ අවස්ථාවක්ද උදා විය හැකිය. එසේම, වාර්තාකරු ගවේෂණාත්මක කතා සෙවීමෙන් ඉවත් කොට යළිත් දෛනික කතා ලියන්නට යෙදවිය යුතුයැයි ප්‍රවෘත්ති කාමරයෙන් ඇති වන බලපෑමෙන් ඔහු මුදාගැනීමටද කර්තෘවරයා කටයුතු කළ හැකිය. මෙසේ කුමන ආකාරයේ තත්ත්වයක් තිබුණද, තම ගවේෂණාත්මක ව්‍යාපෘතිය ඉදිරියට ගැනීම සඳහා වාර්තාකරුවන්ට ප්‍රවෘත්ති කාමරවල උදව් කරන්නකු සිටිය යුතු වේ.

කතාව සඳහා මුල් විය යුත්තේ ප්‍රාදේශීය වාර්තාකරුවාය. තම මාධ්‍ය ආයතනයේ කාලය හා අවධානය යොමු කිරීමට තරම් යෝජිත ගවේෂණාත්මක කතාව මහජන සුභසිද්ධියට අවශ්‍ය වන්නේත්, වැදගත් වන්නේත් මන්දැයි ඔහු පැහැදිලිව දැන සිටිය යුතුය.

ගවේෂණාත්මක කතාවකට අනුමැතිය ලබාගැනීම සඳහා වූ ස්ථිර සූත්‍රයක් නැති වුවද සමහර උපක්‍රම එම කටයුත්ත වඩා පහසු කරවයි.

- *උදව් වීම.* වාර්තාකරු සමග කටයුතු කරන දොරටුපාලයා හටද ප්‍රධානීහු සිටිති. ඔහු ඔවුන් ඒත්තු ගැන්විය යුතුය. මෙම ව්‍යායාමයෙන් තම මාධ්‍යයට බලාපොරොත්තු විය හැක්කේ මොනවාදැයි ඉතා පැහැදිලිවත් නිශ්චිතවත් සටහනක් මගින් දන්වමින් ඔහු කර්තෘවරයාට උදව් විය යුතුය.

- **පූර්ව වාර්තාකරණය.** තම කතාව පිළිබඳව කර්තෘවරයා මතු කළ හැකියැයි සිතිය හැකි ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා ගවේෂණාත්මක වාර්තාකරු ප්‍රමාණවත් තරම් පසුබිම් තොරතුරු රැස් කරගත යුතුය.

- **බලාපොරොත්තු වෙන් කොට දැක්වීම.** වාර්තාකරුවෝ බොහෝ විට තම කතා තේමාව සඳහා පිළිගැනීම නොලැබුණ හොත් එය මුළුමනින්ම ප්‍රතික්ෂේප වන ආකාරයට කතා තේමාව උලුප්පා දක්වති. එහෙත් බුද්ධිමත් වාර්තාකරුවා එසේ නොකොට කතාවේ 'අවම වාසිය' සහ 'උපරිම වාසිය' පිළිබඳව දොරටුපාලයා දැනුම්වත් කරයි. "අපට අඩුතරමින් X පිළිබඳ කතාවක් බලාපොරොත්තු වෙන්න පුළුවන්, හැම දේම හරියට කෙරුණොත් අපට X+Y+Z ගැන කතාවක් වුණත් ලැබෙන්න පුළුවන්" යැයි ඔහු කියයි. එහිදී දොරටුපාලයා මෙම යථාර්ථවාදී අදහස පිළිගෙන වාර්තාකරුගේ වැඩ කටයුතු බැරෑරුම් ලෙස සලකනු ඇත.

- **සීමා නිශ්චය කිරීම.** කාලය හා වෙනත් අවශ්‍ය දෑ පිළිබඳ විවෘත ඉල්ලීමක් නොකරන්න. කතාව හොඳ මට්ටමේ තිබේ නම් ඒවා ගැන පසුව කතා කරගත හැකිය. ඒ වෙනුවට, නිශ්චිත දිනයකට පෙර දළ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කැප වන්න. එය කාලාන්තයක් (deadline) ලෙස සලකා කටයුතු කරන්න.

- **එක්ව කටයුතු කිරීම.** කතාව හොඳ නම් දොරටුපාලයා කොළඹ පිහිටි ප්‍රවෘත්ති කාමරයේ සේවය කරන විශ්වාසවන්ත කෙනකු ප්‍රාදේශීය වාර්තාකරු සමග කටයුතු කරන ලෙසට යෙදවීමේ ඉඩකඩක් ඇත. එම සහයෝගිතාව පිළිගන්න. කතාවත් සමග කාගේ නම මුලට යෙදෙන්නේද යන්නට වඩා වැදගත් වන්නේ කතාව සකස් කරගැනීමයි. එසේම, කොළඹ කාර්යාලයේ අත්දැකීම් ලත් ජනමාධ්‍යවේදියකු සමග ඵලදායක ලෙස සම්බන්ධ වීම මගින් ප්‍රාදේශීය වාර්තාකරු තම ගරුත්වයද වැඩි කරගන්නා අතර, ප්‍රවෘත්ති කාමරය තුළද ගෞරවයට පාත්‍ර වෙයි.

- **දෘශ්‍ය සිතුවිලි ඇති කරගන්න.** ඡායාරූප, වීඩියෝ දර්ශන, ප්‍රස්තාර හා රූප සටහන් ආදිය යොදාගන්නේ නම් කතාව පිළිගැන්වීම වඩාත් සාර්ථක වේ.

## පස්වැනි පරිච්ඡේදය

# මානව මූලාශ්‍ර

සාමාන්‍යයෙන් ගවේෂණාත්මක කතා ආරම්භ වන්නේ හා අවසාන වන්නේ මානව මූලාශ්‍රවලනි.

ඒවා ආරම්භ වන්නේ, රජයේ වැඩසටහනක යම් වරදක් ගැන හෝ රජයේ නිලධාරියකුගේ අක්‍රමිකතාවක් ගැන හෝ ඔත්තුවක් ලබා දෙන මානව මූලාශ්‍රවලිනි. ඒවා අවසාන වන්නේ, කතාවේ ඉලක්කගත පුද්ගලයින්, විශේෂඥයින්, සාක්ෂිකරුවන්, ක්‍රියාකාරිකයන් හා පීඩාවට පත් වූවන් ආදි පුද්ගලයින් ගණනාවක් ප්‍රසිද්ධියේ කරන ප්‍රකාශවලිනි. දූෂණයේ සැබෑ පිරිවැය පෙන්නුම් කරන මිනිස් මුහුණු හා හඬවල් වන්නෝ මොවුහුය.

ගවේෂණාත්මක ජනමාධ්‍යකරණය සඳහා බහුවිධ මූලාශ්‍ර අවශ්‍ය වේ. තොරතුරු සසඳා බැලීම සඳහා ප්‍රවේසමෙන් අදාළ මානව මූලාශ්‍ර ගණනාවක් යොදාගැනීම කාලයක් තිස්සේ පවතින ගවේෂණාත්මක ජනමාධ්‍යවේදී සම්ප්‍රදායකි. තම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලය අතරතුර ගවේෂණාත්මක වාර්තාකරු මූලාශ්‍ර එකක් දෙකක් නොව මූලාශ්‍ර පෙළක් සමග සාකච්ඡා කිරීම අවශ්‍ය වේ. අදාළ විෂයය පූර්ණ වශයෙන් අවබෝධ කරගැනීම සඳහාත්, වැදගත් තොරතුරු තහවුරු කරගැනීම සඳහාත්, කතාව මගින් මිනිසුන් තුළ උපරිම බලපෑමක් ඇති කිරීම සඳහාත් වාර්තාකරුට බහුවිධ මූලාශ්‍ර අත්‍යවශ්‍ය වේ. රීතියක් වශයෙන්, ප්‍රබල ලිඛිත සාක්ෂි හා අමතර දත්ත මගින් කතාව තහවුරු වී ඇති විට පවා හොඳ ගවේෂණාත්මක කතාවක් සඳහා අඩු තරමින් ඉහළ වටිනාකමක් ඇති මානව මූලාශ්‍ර හතරක් හෝ තිබිය යුතුය.

ඇතුළත තොරතුරු දෙන්නෝ. 'ඉඟි සපයන්නෝ' හා 'උරුහන්බාන්නෝ' ආදි වශයෙන් හැඳින්වෙන මොවුහු නම් රජයේ දෙපාර්තමේන්තුවක් තුළ සිටින හෝ රජයේ නිලධාරියකුට සමීපව සිටින පුද්ගලයෝය. කරුණු ගණනාවක් මත ඔවුන් වාර්තාකරුවකුට කතා කරන්නට පෙලඹිය හැකිය. ඔවුන් සමහර විට තම වෘත්තීය තරගකරුවකුට දේශපාලනමය වශයෙන් හානිකර තොරතුරු රහසේ පිට කිරීමට උත්සාහ කරනවා විය හැකිය. සමහර විට උසස්වීමක් නොලැබීම නිසා හෝ වැරදි සම්බන්ධයෙන් ආයතනය තුළ අදහස් පළ කිරීම හේතුවෙන් තත්ත්වයෙන් පහළ දැමීම නිසා හෝ පලි ගැනීමට උත්සාහ කරනවා විය හැකිය.

එහෙත්, බොහෝ දෙනකු කටයුතු කරන්නේ සිතට එකඟවය. නැත්නම් කෝපයෙනි. තමන් අවට සිදු වන දූෂණ ගැන හෝ දූෂණ ක්‍රියාවකට සම්බන්ධ වීමට බල කෙරුණු විට හෝ ඔවුහු අවංකවම කැලඹෙති. එහෙත්, ඒවා ප්‍රසිද්ධ කිරීමෙන් හෝ අවසානයේදී දේශපාලන හේතු මත ප්‍රශ්නය යටපත් කළ හැකි රජයේ පරීක්ෂකයින්ට පැමිණිලි කිරීමෙන් හෝ තම ජීවනෝපාය අනතුරට පත් කරගැනීම ඔවුන්ට අවශ්‍ය නැත.

එහෙයින්, ජනමාධ්‍ය දූෂණ හෙළි කරනු ඇතැයිද එමගින් ප්‍රතිසංස්කරණ සඳහා බලපෑම් කරන මහජන මතයක් ඇති කරනු ඇතැයිද සිතා ඔවුහු වාර්තාකරුවකුගේ අවධානයට එම ප්‍රශ්න යොමු කිරීමට උත්සාහ කරති.

එසේ නම්, අරමුණ වැදගත් වන්නේද? පිළිතුර ඔව් හා නැහැ යන්නයි.

ඔව්, මන්දයත්, කෙනකු කතා කරන්නේ කුමක් සඳහාද කියාත්, ඔහු හෝ ඇය එම තොරතුරු පැත්තකට බර කරන්නට හෝ විකෘත කරන්නට හෝ පෙලඹී සිටීද කියාත් තේරුම් ගැනීමට එය උපකාරී වේ. වංචාවකට හසු වන්නට හෝ වෙනත් අයකුගේ අවශ්‍යතාවකට යට වන්නට හෝ වාර්තාකරුවකුට අවශ්‍ය නැත. මේ නිසා, ගවේෂණාත්මක වාර්තාකරුවෙක් ඔත්තුවක් දෙන හෝ තොරතුරක් පිට කරන තනි පුද්ගලයකු මත කතාවක් පදනම් කරගන්නවා වෙනුවට මූලාශ්‍ර ගණනාවක් ප්‍රයෝජනයට ගනියි. තොරතුරු රහසේ පිට කරන්නන් භයානක වන්නේ, ඔවුන් බොහෝ විට එසේ කරන්නේ ජනතාවට තොරතුරු ලබා දීමට වඩා පෞද්ගලික කෝන්තර පිරිමසාගැනීමට බැවිනි. මෙය අවසානයේදී සමස්ත වාර්තාකරණයම හෑල්ලු කරන විකෘති තොරතුරුවලට මග පෑදිය හැකිය.

නැහැ, මන්දයත්, අවසානයේදී ඉඟි සපයන්නකු ලබා දෙන තොරතුරුවල ගුණාත්මක බව තරම් ඔහුගේ අරමුණ වැදගත් වන්නේ නැත. නිවැරදි හා විශ්වසනීය තොරතුරු ලබා දෙන්නේ නම් හෝ ඊට මග පාදන්නේ නම් හෝ ඉඟි සපයන්නාගේ අරමුණ වැදගත් වන්නේ නැත. ගවේෂණාත්මක වාර්තාකරුගේ කාර්යය වන්නේ, තොරතුරු ලබාගෙන, අනෙකුත් ස්වාධීන මූලාශ්‍ර මගින් ඒවායේ හරිවැරදි සොයාබලා, ලිපිලේඛන හා සම්මුඛ සාකච්ඡා පදනම් කරගත් කතාවක් ගොඩනැගීමයි.

කතාවක් සම්බන්ධයෙන් අවධානය යොමු කරවීමට අමතරව ඇතුළත තොරතුරු සපයන්නන් වෙනත් කරුණු ගණනාවක් සඳහාද වැදගත්ය.

- ඉතිහාසඥයෝ. අදාළ ප්‍රශ්න හා ක්‍රියාවල ඉතිහාසය හා ඒවාට සම්බන්ධ පුද්ගලයන්ගේ තොරතුරු සඳහා මෙම ඇතුළතින් තොරතුරු සපයන්නෝ හොඳ මූලාශ්‍ර වෙති.

- මාර්ග සිතියම්. යම් ආයතනයක ඉහළ පහළ තනතුරු මට්ටම් ගැනත්, ලිපිලේඛන ගලා යන ආකාරය ගැනත් අවබෝධ කරගැනීමට මෙම ඇතුළතින් තොරතුරු සපයන්නන් වාර්තාකරුවකුට උපකාරී විය හැකිය.

- මග පෙන්වන්නෝ. මෙම තොරතුරු සපයන්නන් වාර්තාකරුවාට විශේෂිත ප්‍රශ්න පෙන්වා දිය හැකිය. ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කරන්නන් හඳුන්වා දිය හැකිය. එසේම, වාර්තාකරුවා ඉල්ලා සිටිය යුතු ලිපිලේඛන නම් කළ හැකිය.

- අදින්නෝ. මෙම තොරතුරු සපයන්නන්ට අභ්‍යන්තර ලියකියවිලි ලබා දීමේ හැකියාවද තිබේ.

මෙම අවසාන කටයුත්ත සමහර විට ගවේෂණාත්මක වාර්තාකරණයේදී ඉතාම වැදගත් කටයුත්ත විය හැකිය. මන්දයත්, ගවේෂණාත්මක වාර්තාකරණය සඳහා දූෂණ පිළිබඳ ප්‍රබල සාක්ෂි අවශ්‍යය. ඇත්ත වශයෙන්ම, ගවේෂණාත්මක

වාර්තාකරුවා මානව මූලාශ්‍ර ප්‍රධාන වශයෙන්ම යොදා ගන්නේ ලිපිලේඛන ලබාගැනීමේ මාර්ගයක් වශයෙනි. එමගින්, ඔහු එම මූලාශ්‍ර තවදුරටත් අවශ්‍ය නොවන තත්ත්වයට පත් කරන අතර, තම කතාව පළ වූ පසු ආයතනය තුළින්ම මතු වන ප්‍රතිප්‍රහාරයන්ගෙන්ද ඔවුන් ආරක්ෂා කරගනී.

එහෙත් මෙසේ කිරීමටද යම් යම් තහංචි තිබේ. තොරතුරු ලබාගැනීම සඳහා සොරකම් කරන ලෙස හෝ සාපරාධී නීතිය උල්ලංඝනය කරන ලෙස හෝ තම මූලාශ්‍රයට කියන්නට වාර්තාකරුට නොහැකිය. එසේම, තොරතුරු වෙනුවෙන් මූලාශ්‍රයට මුදල් ගෙවන්නටද වාර්තාකරුට නුපුළුවන. නිව්ස් ඔෆ් ද වර්ල්ඩ් වසාදැමීමට හේතු වූ මීඩියා කෝපරේෂන්හි දුරකථනවලට හොරෙන් සවන් දීමේ මගඩිය, ආචාර ධර්මීය හා නෛතික සීමා කඩ කිරීම කොතරම් භයානකදැයි පෙන්වන හොඳ අනතුරු ඇඟවීමකි.

**පිටස්තරයෝ.** මින් සාමාන්‍යයෙන් අදහස් කරන්නේ හිටපු සේවකයන්, සමාන ආයතනවල නිලධාරීන්, විද්‍යාර්ථීන්, 'ඇටමැස්සන්', පිටස්තර විශේෂඥයන් හා හිටපු කලත්‍රයන්ය. මොවුන් නිලධාරීන් සමග හෝ ආයතන සමග හෝ ඍජුව සම්බන්ධ නොවන නමුත්, ඔවුන් සතුව දූෂණ පිළිබඳව විස්තර කිරීමටත් ඒවා අදාළ පසුබිමට සම්බන්ධ කර ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය තොරතුරු, දැනුම හා විශේෂඥතාව තිබේ.

**මිනිසුන් කතා කරන්නට සැලැස්වීම.** සාම්ප්‍රදායික ජනමාධ්‍යකරණයේදී, නිල මූලාශ්‍ර ප්‍රධාන වශයෙන්ම තම න්‍යාය පත්‍ර හා අරමුණු උදෙසා වාර්තාකරුවන්ට බන්දේසියේ තබා තොරතුරු පිළිගන්වති. ප්‍රශ්න අනතුරුදායක නොවන විට හා ඒවා රජයේ ප්‍රචාරයට වාසිදායක වන විට මූලාශ්‍ර ඉතා කැමැත්තෙන් තොරතුරු බෙදාහදා ගනී. වාර්තාකරුවෝ එම ප්‍රකාශ ඒවායේ මතුපිට දැක්වෙන ආකාරයටම භාර ගනිති.

එහෙත්, එය ගවේෂණාත්මක වාර්තාකරණය සම්බන්ධයෙන් සත්‍ය නොවේ. තම මාධ්‍ය සාකච්ඡාවේදී ඉතා සැහැල්ලුවෙන් කතා කළ බලධාරියාම වාර්තාකරු ගවේෂණාත්මක කතාවක් සම්බන්ධයෙන් වැඩ කරගෙන යන බව හැඟී ගිය වහාම හදිසියේම මුනිවත රකී. වාර්තාකරුට දොර වැසී යෑමටද ඉඩ තිබේ.

දකුණු ආසියාව පුරා මෙන්ම ශ්‍රී ලංකාවේද මෙම කටයුත්ත වෙහෙසකරය. ඊට හේතු වන්නේ, බොහෝ රජයේ ආයතන හා නිලධාරීන් වසාගෙන සිටින රහස්‍යභාවයේ තිරයයි.

වඩාත් වටිනා මූලාශ්‍රවලින් සමහරකු සිටින්නේ ආයතනයක ප්‍රධානත්ව අනුපිළිවෙළේ මැද මට්ටමේ බව ගවේෂණාත්මක වාර්තාකරුවෝ දනිති. මෙම මැද මට්ටමේ නිලධාරීහු බිම් මට්ටමේ සිදුවන්නේ මොනවාදැයි දැනගත හැකි තරම් පහළින් සිටින අතරම, ප්‍රධානීන් කරන්නේ මොනවාදැයි දැනගත හැකි තරම් ඉහළින්ද සිටිති.

ප්‍රතිවිපාක පිළිබඳව ඇති බිය නිසා දූෂණ හා නරක කල්ක්‍රියාවන් පිළිබඳව ඇඟිල්ල දිගු කිරීමට ජනතාව මේ වන විටත් පසුබට වී සිටිති. මධ්‍යම මට්ටමේ නිලධාරීන් තම තනතුර හා තත්ත්වය ආරක්ෂා කරගැනීමට වැඩිම නැඹුරුවක් දක්වන හෙයින් ඔවුන් කතා කිරීමට පොලඹවාගැනීම අසීරු කටයුත්තකි. මෙම නිහඬභාවයේ පවුර බිඳදැමීමට, සමහර විට කාලය, නොසැලෙන බවක් හා විශ්වාසය ඇති කිරීමේ

හැකියාවක් අවශ්‍ය වේ. මේ පිළිබඳ විශිෂ්ට මූලික අධ්‍යයනයක් සඳහා, මෙම මාර්ගෝපදේශයේ උපග්‍රන්ථයේ ඇතුළත් ඇමරිකානු ගවේෂණාත්මක වාර්තාකරුවකු වන එරික් නැල්ඩර් විසින් රචිත 'ලූසනිං ලිප්ස්' බලන්න. දක්ෂ සම්මුඛ සාකච්ඡාකරුවෝ සම්මුඛ සාකච්ඡාවට ලක්වන්නාගේ මුනිවත බිඳීම සඳහා ප්‍රවේශ ගණනාවක් උපයෝගී කරගනිති.

- ගූගල් කිරීම. සම්මුඛ සාකච්ඡාවට පෙර සාකච්ඡා කරන්නට එන අය පිළිබඳව ප්‍රසිද්ධියේ ලබාගත හැකි තොරතුරු යමක්, එනම් පුවත්පතකට කළ ප්‍රකාශයක්, ඥාතියකුගේ මරණ දැන්වීමක් හෝ ඔහු ලියූ ශාස්ත්‍රීය ලිපියක් ඇත්දැයි ගූගල් කිරීම මගින් සොයා බලන්න.

- තේරුම් ගන්නට උත්සාහ කරන්න. තේරුම් ගනු ලැබීමේ අවශ්‍යතාවට වඩා වැඩි මානසික බලවේගයක් වෙනත් නැතැයි *ද ලූමිං ටවර්ස්* හි කර්තෘ ලෝරන්ස් රයිට් පහදයි. ගවේෂණාත්මක වාර්තාකරුවෙක් කෝපයෙන් හෝ ආක්‍රමණශීලීව හෝ කල්තබා සූදානම් කරගත් මනසකින් යුතුව මූලාශ්‍රයන් වෙත ළඟා වුව හොත් එම මූලාශ්‍රද මිටමොළවාගෙන එනු ඇත. මූලාශ්‍රයේ දෘෂ්ටිය, ක්‍රියාකලාපය හෝ අත්දැකීම් තේරුම් ගැනීමට වාර්තාකරු අවංක උනන්දුවක් දක්වන්නේ නම් ඔහුද සැහැල්ලුවට පත් වී විවෘත භාවයට පත් වනු ඇත. "ඇත්තටම, මෙහෙම වුණේ ඇයි කියල දැනගන්න මම කැමතියි" වැනි කියමනක් තොරතුරු සම්භාරයකට දොර විවෘත කළ හැකිය.

- කොළ එළිය, රතු එළිය. වාර්තාකරුවන් තම මූලාශ්‍ර සමග සම්මුඛ සාකච්ඡා කරන ආකාරයම ඔවුන්ට හානි කරන බව කැනේඩියානු ගවේෂණාත්මක ග්‍රන්ථකර්තෘ හා සම්මුඛ සාකච්ඡා විශේෂඥයකු වන ජෝන් සැවැට්ස්කි විශ්වාස කරයි. 'ඔව්' හෝ 'නැහැ' හෝ එවැනි තනි වචනයකින් පිළිතුරු දිය හැකි 'රතු එළිය' විහිදුවන සංවෘත ප්‍රශ්න අසන්නට වාර්තාකරුවන් පෙලඹෙන බව ඔහු කියයි. ඒ මුදල් ඔබ ගත්තාද කියා ඇසුව හොත් ලැබෙන පිළිතුර නැහැ යන්නයි. මෙසේ කරනු වෙනුවට, මූලාශ්‍රයන්ට කරුණ විස්තර කරන්නට සිදු වන ආකාරයට 'කොළ එළිය' විහිදුවන විවෘත ප්‍රශ්න අසන ලෙස ඔහු වාර්තාකරුවන්ගෙන් ඉල්ලා සිටියි. මෙම ප්‍රශ්න අවසාන වන්නේ, කෙසේද, මන්ද හෝ කුමක්ද? යන ප්‍රශ්නවලිනි. උදාහරණයක් වශයෙන්, "ඒ මුදල් අතුරුදන් වූයේ කෙසේද?" හෝ "ඔබ එය දන්නේ කෙසේද?" යනාදි වශයෙනි.

- සෙමෙන් යන්න. වාර්තාකරුවකු මූලාශ්‍රයක් සමග වහාම සම්මුඛ සාකච්ඡාව ආරම්භ කළ යුතුයැයි නියමයක් නැත. අදාළ පුද්ගලයා බලවත් නම් හෝ බියෙන් සිටී නම්, තවත් කෙනකුගෙන් ප්‍රේමය ඉල්ලා සිටින්නා සේ මෘදු ලෙස ඔහුගේ සිත ගන්න. සම්මුඛ සාකච්ඡාවේ මුල් කොටස පුද්ගලයා පිළිබඳව අවබෝධයක් ලබාගනිමින් සන්සුන් ලෙස ප්‍රශ්න අසමින් ගත කරන්න. සමහර විට මූලාශ්‍රයක් හරිහැටි කතා කරවන්නට සම්මුඛ සාකච්ඡා එකකට වැඩි ගණනක් කරන්නට සිදු වනු ඇත.

- පළමුව සබඳතාව, පසුව තොරතුරු. ARIJ අත්පොත දක්වා ඇති ආකාරයට, පළමුව මූලාශ්‍රය සමග හොඳ සබඳතාවක් ගොඩනගාගත් විට වැදගත් තොරතුරු පසුව එළියට එනු ඇත. සමහර විට වැදගත් මූලාශ්‍රයක විශ්වාසය දිනාගැනීම සඳහා වාර්තාකරුට පළමු සම්මුඛ සාකච්ඡා දෙක තුනක්ම කරන්නට සිදු විය හැකිය.

- කට වසාගැනීම. බොහෝ වාර්තාකරුවෝ, නිහඬතාව මකාදමමින් සහ මූලාශ්‍ර පුද්ගලයාගේ වාක්‍යාංශ සම්පූර්ණ කරමින්ද, තමන් දන්නා සියල්ල කියමින් සාකච්ඡාව තුළදී කැපී පෙනෙන්නට උත්සාහ දරමින්ද, තම ලොකුකම දක්වන්නට උත්සාහ කරති. මෙය හොඳ සම්මුඛ සාකච්ඡාවක ජීවය නැති කරදමයි. ප්‍රශ්න අසන්න, ඉන් පසු කට වසාගන්න.

- කතාව ගෙන එන්න. දෛනික කතාවක පසු විපරමක් වශයෙන් ගවේෂණාත්මක වාර්තාකරුවකු කරුණු හාරා අවුස්සන්නේ නම්, ඔහු එම මුල් පුවත රැගෙනවිත් මූලාශ්‍ර පුද්ගලයා සමග ඒ ගැන සාකච්ඡා කළ යුතුය.

- වචනවලින් ඔබ්බට. අංග චලන හා හඬ උස්පහත් කිරීම් මගින් බොහෝ දේ කිව හැකිය. ගවේෂණාත්මක වාර්තාකරුවා, මූලාශ්‍ර පුද්ගලයකු අසීරුවට පත් වන විට තම අසුනේ ඇඹරෙන ආකාරය, කෙළින් මුහුණ නොබලා මග හරින ආකාරය, එකම දේ නැවත නැවත කියන ආකාරය හා කටහඬේ තීව්‍රතාව අඩු වැඩි කරන ආකාරය නිරීක්ෂණය කරයි. දක්ෂ සම්මුඛ සාකච්ඡාකරුවා අනෙකාගේ හැඟීම් ගැනද අවධානයෙන් සිටී. ඒවාද වාර්තා කළ යුතු දේවල්ය.

- සම්මුඛ සාකච්ඡා පටිගත කිරීම. සාකච්ඡා කාලය පුරාම සටහන්පොත් කුරුටුගාමින් සිටින වාර්තාකරුවකු මූලාශ්‍ර පුද්ගලයාගේ අවධානය වෙනතක යොමු කළ හැකිය. එසේම, එය අදිමදි කරනසුලු මූලාශ්‍ර පුද්ගලයකු බියට පත් කිරීමටද පුළුවන. නියම සාකච්ඡාවට ආ විට පටිගත කිරීමේ යන්ත්‍රය පාවිච්චි කරන්න. ටික වේලාවකින් 'සම්මුඛ සාකච්ඡාවක්' බව අමතකව ගොස් මූලාශ්‍ර පුද්ගලයා සාමාන්‍ය සංවාදයක නිරත වනු ඇත.

- රෙකෝඩරය නතර නොකරන්න. බොහෝ විට, අනාවරණය කළ යුතු වැදගත් තොරතුරු එළියට එන්නේ පටිගත කිරීමේ යන්ත්‍රය ක්‍රියා විරහිත කොට, රාජකාරිය හමාරයැයි මූලාශ්‍ර පුද්ගලයාට සිතුණු විටය. එසේ නොකරන්න. ඔබ කතාව හමාර කර 'ආයුබෝවන්' කියා පිටත් වන විටත් යන්ත්‍රයට ක්‍රියා කරන්නට ඉඩ දෙන්න.

- ප්‍රතිවාදනය. නිරවද්‍යතාව පිළිබඳව සැලකිල්ලක් දැක්වීම නිසාත්, මූලාශ්‍ර පුද්ගලයාගේ විශ්වාසය රැක ගැනීම සඳහාත්, ගවේෂණාත්මක වාර්තාකරු තම කතාවේදී යොදා ගන්නට යන උද්ධෘතයන් ප්‍රතිවාදනය කරයි. ප්‍රතිවාදනය යන්නෙන් අදහස් කරන්නේ, ප්‍රකාශනයට පෙර වාර්තාකරු මූලාශ්‍ර පුද්ගලයාට කතා කොට එම පුද්ගලයාගේ සමහර ප්‍රකාශ (වචනයෙන් වචනය) ඔහුටම කියවා පෙන්වීමයි. මෙමගින්, තමන් ලියන උද්ධෘතය නිවැරදි බවට වාර්තාකරුට සහතිකයක් ඇති වනවා මෙන්ම, ප්‍රසිද්ධියට පත් කෙරෙන්නේ මොනවාද යන්න පිළිබඳව දැනගැනීමෙන් මූලාශ්‍ර පුද්ගලයාගේ සිතටද සැහැල්ලුවක් දැනේ. එහෙත් කිසිම අවස්ථාවක, මූලාශ්‍රයක් වෙනත් යමක් සිතා හෝ සිත වෙනස් වීම නිසා හෝ උද්ධෘතයක වචන වෙනස් කරන ලෙසට කරන ඉල්ලීමකට වාර්තාකරු එකඟ නොවේ.

එසේම, වෙනත් මූලාශ්‍රයකින් ලබාගත් සංවේදී උද්ධෘත වාර්තාකරු මෙතැනට සම්බන්ධ කර නොගනී.

- **සුප්‍රකට අවසාන වචන කිහිපයක්.** ගවේෂණාත්මක වාර්තාකරු සම්මුඛ සාකච්ඡාව අවසානයේදී ප්‍රශ්න තුනක් පාවිච්චියට ගත යුතුය:

  - "ඔබ එය දැනගත්තේ කෙසේද?"
  - "මට මොකුත් මගඇරුණාද?"
  - "මම වෙන කාටද කතා කරන්න ඕනෑ?"

**මූලාශ්‍ර ප්‍රයෝජනයට ගැනීම සහ හඳුන්වාදීම.** මූලාශ්‍ර ප්‍රයෝජනයට ගැනීමේ ආකාර තුනක් ඇති අතර, ගවේෂණාත්මක වාර්තාකරු මේ අවස්ථා තුනම, තම ව්‍යාපෘතියේදී සමහර විට සම්මුඛ සාකච්ඡාව තුළදීම පාවිච්චියට ගනී. කුමක් කළද, මූලික රීති පිළිබඳව ගවේෂණාත්මක වාර්තාකරු මූලාශ්‍රය සමග ඉතා පැහැදිලි එකඟතාවක සිටිය යුතුය. සම්මුඛ සාකච්ඡාව පසුබිම් තොරතුරු සඳහාය කියා වාර්තාකරුට ප්‍රශ්න අසාගෙන යා නොහැකිය. පසුබිමයැයි කී විට එය විවිධ අය විවිධ ආකාරයට තේරුම් ගන්නට ඉඩ තිබේ. විශේෂයෙන්ම ජනමාධ්‍ය කලාවේ ප්‍රායෝගික රීතීන් පිළිබඳව අවබෝධයක් නැති මූලාශ්‍ර මෙය නොයෙක් ආකාරයෙන් තේරුම් ගන්නට පුළුවන.

මූලාශ්‍ර ප්‍රයෝජනයට ගැනීමේ ආකාර තුන වන්නේ:

**වාර්තාවෙන් පිට (Off-the-record).** ගවේෂණාත්මක වාර්තාකරණය සඳහා බොහෝ විට මූලාශ්‍ර අමාරුවේ දමන බරපතළ තොරතුරු භාවිත කෙරේ. එසේ මූලාශ්‍ර අමාරුවේ වැටුණ හොත් සද්භාවයෙන් යුත් මූලාශ්‍ර හා 'උරුහන්බාන්නන්' තොරතුරු දීම පිළිබඳ දෙවරක් සිතනු ඇත. එහෙයින් මූලාශ්‍රය කතා කරන්නට සලස්වාගැනීම සඳහා ඔහුගේ තොරතුරු 'වාර්තාවෙන් පිට' තබන බවට එත්තු ගැන්විය යුතුය. වාර්තාකරු පැහැදිලිව තේරුම් ගත යුතු විශේෂිත අර්ථයක් මෙම පදයේ ඇත. 'වාර්තාවෙන් පිට' යනු අදාළ සම්මුඛ සාකච්ඡාවෙන් ලබාගන්නා තොරතුරු හෝ උද්ධෘත පාවිච්චි කිරීමට වාර්තාකරුට නොහැකිය. එසේම, මෙම මූලාශ්‍ර සමග සාකච්ඡා කළ බව හෝ වෙනත් කෙනකු සමග කීමට වාර්තාකරුට අවසර නැත. එය හරියට එවැනි සම්මුඛ සාකච්ඡාවක් නොපැවැත්වුණා වැනිය.

වාර්තාකරුට කළ හැකි එකම දේ වන්නේ, එසේ ලබාගන්නා තොරතුරුවල නිරවද්‍යතාව වෙනත් මූලාශ්‍රයන් මගින් සොයා බැලීමයි. සාකච්ඡාව හා මූලාශ්‍ර පිළිබඳව තම ප්‍රධානියාට දැනුම් දීමේ අයිතියක් වාර්තාකරුට ඇතත්, ඔහුගේ අනන්‍යතාව හෙළි නොකිරීමේ පොරොන්දුව මුළු මාධ්‍ය ආයතනයම රැකිය යුතුය.

එහෙත්, මෙසේ වාර්තාවෙන් පිට තොරතුරු ලබාගැනීම විශේෂ තත්ත්වයක් විනා රීතියක් නොවේ. අනන්‍යතාව හෙළි නොකිරීම යනු වරප්‍රසාද ලත් සබඳතාවකි. සමහර රටවල මෙය වාචික ගිවිසුමක් ලෙස සැලකෙන අතර, වාර්තාකරු තම අනන්‍යතාව හෙළි කළ බවට මූලාශ්‍රය විශ්වාස කරන්නේ නම් ඔහුට ඒ පිළිබඳව අධිකරණය හමුවට යාමට හැකියාව තිබේ.

එහෙයින්, වාර්තාවෙන් පිට යන්නට එකඟ වන විට වාර්තාකරු පළමුව සිතිය යුතු කරුණක් තිබේ: එනම්, මෙය සිරගත වීමට තරම් වැදගත් ආරංචියක්ද? මට මෙය වෙනත් ආකාරයකින් ලබා ගත නොහැකිද? යන්නයි ඒ.

ශ්‍රී ලංකාවේ වාර්තාකරුවෝ, බොහෝ විට 'වාර්තාවෙන් පිට' යන පොරොන්දුව මත තොරතුරු ලබාගෙන පොරොන්දුව අමතක කොට කිසිවකුගේ නමක් සඳහන් කර තොරතුරු පාවිච්චි කරති. සමහර විට, මූලාශ්‍රය ආරක්ෂා කිරීම සඳහා 'විශ්වාස කටයුතු ආරංචි මාර්ග' ආදි පද භාවිත කරමින් එම තොරතුරු පාවිච්චි කරති. මෙය මෙම සංකල්පය පිළිබඳව ඇති දුරවබෝධය පෙන්වන්නකි.

පුවත්පත් මෙවැනි රහස් මූලාශ්‍ර පිළිබඳව ආචාර ධර්මානුකූලව කටයුතු කරන අවස්ථාද තිබේ. 1995දී, එවකට ජනාධිපතිව සිටි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය අපකීර්තියට පත්කළායැයි සමහරුන් විසින් කියන ලද ඕපාදූප කොලමක මූලාශ්‍ර ආරක්ෂා කිරීම සඳහා *සන්ඩේ ටයිම්ස්* කර්තෘවරයා දැඩි දුෂ්කරතාවකට මුහුණ දුන්නේය.

ඔහුට චෝදනා පත්‍ර භාර දෙනු ලැබ කොළඹ මහාධිකරණය හමුවට ඉදිරිපත් කෙරිණි. කොලම ලියුවේ ඔහු නොවූවද ඔහු ඒ පිළිබඳ වගකීම භාර ගත්තේය. එහෙත් ඔහු මූලාශ්‍ර හෙළි කිරීම ප්‍රතික්ෂේප කළේය. මෙවැනි දේ ජනමාධ්‍ය නිදහසේ ඉතා වැදගත් අවස්ථා සේ සටහන් වී ඇත.

පසුබිම මත (On Background). මින් අදහස් කෙරෙන්නේ, තොරතුරු හා උද්ධෘත පාවිච්චි කළ හැකි වුවත් මූලාශ්‍ර හෙළි කළ නොහැකිය යන්නයි. එහෙත් වාර්තාකරු මූලාශ්‍රයේ අනන්‍යතාව හෙළි නොවන ආකාරයට එම මූලාශ්‍ර පුද්ගලයා පිළිබඳව යම් විස්තරයක් කරයි. එමගින් ඔහු මෙම මූලාශ්‍රය අදාළ කාරණය පිළිබඳ බලයක් සහිත, විශ්වාස කටයුතු පුද්ගලයකු බව පාඨකයාට කියයි. උදාහරණයක් වශයෙන්, මූලාශ්‍රය "අදාළ වැඩ සටහන පිළිබඳව ඍජු දැනුමක් ඇති අභ්‍යන්තර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ නිලධාරියකු" ලෙස හැඳින්විය හැකිය.

වාර්තාගත (On-the-record). මෙහිදී, තොරතුරු හා උද්ධෘතයන් පාවිච්චි කළ හැකිවා මෙන්ම මූලාශ්‍රය පූර්ණ වශයෙන් හඳුන්වා දීමද කළ හැකිය.


මූලාශ්‍ර දැක්වීමේ අනුපිළිවෙළ. ගවේෂණාත්මක හෝ වෙනත් ආකාරයක වාර්තාකරණයේදී හොඳම පිළිවෙත වන්නේ කතාවල මානව මූලාශ්‍ර නමින් හා තනතුරින් හැඳින්වීමයි. ජනතාවක් හමුවේ තබන තොරතුරුවල විශ්වසනීයත්වය සඳහා මූලාශ්‍ර හඳුන්වා දීම අත්‍යවශ්‍යය.

එසේවුවද, මෙය කියන තරම් පහසු දෙයක් නොවේ. දකුණු ආසියාවේ ජනමාධ්‍යවල කිසිදු උපද්‍රවකාරී බවක් නොවන කතාවලද නම් සඳහන් නැති උද්ධෘත බෙහෙවි. රජයේ නිලධාරීන් බොහෝ අවස්ථාවලදී 'වාර්තාවෙන් පිට' ආකාරයේ තොරතුරු දෙන්නට පෙලඹෙන අතර, වාර්තාකරුවෝද තමන්ගේ මූලාශ්‍ර අමනාප කරගැනීමට නොකැමැත්තෙන් ඊට එකඟ වෙති. ජීවිතවලට නැතත් ජීවනෝපායට තර්ජනයක් විය හැකි හෙයින් මිනිසුන් ගවේෂණාත්මක කතාවලදී තමන් පූර්ණ වශයෙන් හඳුන්වා දෙනවාට කැමති නැත. එමෙන්ම, මානව මූලාශ්‍ර යනු මනුෂ්‍යයන් බැවින් ඔවුන් බොහෝ විට ගැටුම්කාරී විය හැකිය. ඔවුන් සමග ගනුදෙනු කිරීම දුෂ්කර විය හැකිය. විශේෂයෙන්ම, තමන්ට වාර්තාකරුවා කෙරෙහි කොතරම් බලපෑමක් කළ හැකිදැයි ඔවුන්ට වැටහුණ හොත් එවැනි තත්ත්වයන් ඇති විය හැකිය. මූලාශ්‍රයන් තොරතුරු ලබාදීමට හිළව් වශයෙන් නිර්නාමිකත්වය ඉල්ලා සිටිනු ඇත.

මේ ගැන දන්නා වාර්තාකරුවා, තම මූලාශ්‍රයන් මූලාශ්‍ර අනුපිළිවෙළේ ඉහළට තල්ලු කිරීමට උත්සාහ කරයි.

වාර්තාකරු කිසිවකු සම්මුඛ සාකච්ඡාවට ලක් කරන්නේ 'පසුබිම මත' නම්, ඔහු එම පුද්ගලයා නැවත හමු වී, ප්‍රකාශවලින් සමහරක් හෝ සියල්ලම 'පසුබිම මත' ඉදිරිපත් කරන ලෙස ඒත්තුගැන්වීමට උත්සාහ කරයි. 'පසුබිම මත' සම්මුඛ සාකච්ඡාව සිදු වුව හොත් ඔහු ඉන් සමහරක් 'වාර්තාගත' කරගැනීමට උත්සාහ කරයි. මෙය වාර්තාකරුවා සම්බන්ධයෙන් හොඳ දෙයක් නොවුවද සරල කාරණයකදී එය ප්‍රයෝජනයට ගත හැකිය. බොහෝ මූලාශ්‍රයන් වාර්තාගත වන පරිදි කතා නොකරන්නේ, ඔවුන් පවසන්නට යන දේ නිසා නොව, තමන් කරන ප්‍රකාශවලට සිදු වන දෙය පාලනය කිරීමට හැකියාවක් නැති බැවිනි. මූලාශ්‍රයන් තමන් පූර්ණ වශයෙන් හඳුන්වා දෙනවාට අකැමැති වන්නේ, නොදන්නා දෙය පිළිබඳව නැත හොත් කැලඹීමට පත් වන්නට සිදු වෙතැයි පවතින මෙම බිය නිසයි. වාර්තාකරුවා ඉන් කුමක් ප්‍රයෝජනයට ගනීද නැත හොත් පුවත්පත හෝ විකාශය තුළ එය කෙසේ පළ වේද යන්න ඔවුහු නොදනිති.

එහෙත්, මූලාශ්‍ර අනුපිළිවෙළේ ඉහළට යන විට මූලාශ්‍රය තම පාලනය අත් කර ගන්නා අතර, පුවත්පතේ හෝ විකාශයේ පළ විය හැකි දෙයින් කැලඹීමට පත් වන්නට සිදු වෙතැයි තවදුරටත් කනස්සල්ලට පත් නොවේ. මෙම කනස්සල්ලෙන් නිදහස් වූ විට, ඔහු සැහැල්ලු වන හැටි දැන ගනී. හැඟීමෙන් යුතුව කතාවට දායක වන්නට වුව පෙලඹෙයි. සමහර කරුණු වාර්තාගත විය යුත්තේ මන්දැයි පහසුවෙන් වටහා ගනියි.




http://ClipartOf.com/439457 වෙබ් පිටුවෙහි ඇති රොන් ලෙෂ්මාන් ඇඳි රූප සටහනකි

## ළමයි සහ පීඩාවට පත් විය හැකි අනෙකුත් පිරිස්

යුද්ධයෙන්, ස්වාභාවික ආපදාවලින් හෝ රජයේ ක්‍රියාකාරකම්වලින් අවතැන් වූවන් වැනි පීඩාවට පත් පුද්ගලයන් හා ළමයින් පිළිබඳ ඛේදවාචකවලින් ප්‍රයෝජන ලැබීමේ නැඹුරුවක් දකුණු ආසියානු වාර්තාකරුවන් තුළ ඇත.

උදාහරණයක් වශයෙන්, සිය සැමියා දෙවැනි විවාහයක් කරගැනීමට විරෝධය දැක්වීමක් වශයෙන් දිවිනසාගැනීමට උත්සාහ කළ බංග්ලාදේශ කාන්තාවක විසින් ගිනි තබන ලද ඇගේ ළමයින් දෙදෙනකු සමග කතා කරන්නටත්, ආවේග දනවනසුලු වීඩියෝ දර්ශන ලබාගැනීමටත්, එරට වාර්තාකරුවෝ සහ කැමරා කණ්ඩායම් රෝහලකට රොක් වූහ. එම ළමයින් දෙදෙනා මිය ගිය අතර, ඔවුන්ගේ දැවී ගිය සිරුරුවල දර්ශන එරට රූපවාහිනී සේවා මගින් ප්‍රදර්ශනය කෙරිණි. ඩකාහි පළ වන ගරුකටයුතු ඉංග්‍රීසි පුවත්පතක් වන *ඩේලි ස්ටාර්* ද වරක් දෙවරක් නොව තුන්වරක්ම එම ඡායාරූප පළ කළේය. ඒ පසු විපරම් කතා හා කතුවැකියක් සමගිනි.

ඛේදවාචකයක් සිත් කාවදින ලෙස දැනුම්දීම සඳහා මෙය අත්‍යවශ්‍ය බව සමහරුන් තර්ක කළ හැකි වුවද, මෙය ජනමාධ්‍ය ආචාරධර්ම මෙන්ම යහපත් රුචියද උල්ලංඝනය කිරීමකි. පෙට්‍රල් දමා ගිනි තබනු ලැබූ විට අසරණ වූ එම ළමයින් පිළිබඳ ආවේග දනවනසුලු වාර්තාකරණය ජනමාධ්‍ය විසින් ඔවුන් තව දුරටත් විපතට හෙළීමකි.

නෛතික වශයෙන් කැමැත්ත ප්‍රකාශ කිරීමට නොහැකි ළමයින් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී වාර්තාකරුවන් විශේෂයෙන්ම සැලකිලිමත් විය යුතුය. අඩු තරමින් ළමයාගේ ප්‍රකාශ හා ඡායාරූප පාවිච්චි කිරීම පිළිබඳව ඔවුන් ළමයාගේ මව්පියන්ගෙන් අවසර ගත යුතුය. ළමයාගේ නමේ කොටසක් හෝ අන්වර්ථ නාමයක් පාවිච්චි කිරීම ගැන ඔවුන් සලකා බැලිය යුතුය. එවිට පාඨකයා හෝ ප්‍රේක්ෂකයා එම උපක්‍රමය ගැන දැන ගනු ඇත. ළමයා ජීවත් වන ගමේ නම සඳහන් නොකළ යුතුය. එවිට ළමයා පහසුවෙන් හඳුනාගත නොහැකි වනු ඇත.

ස්ත්‍රී දූෂණ, ගෘහස්ථ අපයෝජන, යුද්ධය හා රජයේ ක්‍රියාකාරකම් මගින් පීඩාවට පත් වන්නන් සම්බන්ධයෙන්ද මෙම රීති අදාළ වේ. විපතට පත් පුද්ගලයින් තමන්ගේ නම හෙළි කිරීමට කැමැති වන්නේ නම්, ඔවුන්ගේ නම් භාවිත කිරීමට පෙර එසේ කිරීමේ ආදීනව ගැන වාර්තාකරු ඔවුන්ට හොඳින් පැහැදිලි කොට දිය යුතුය. මෙම පුද්ගලයාගේ නම හෙළි කිරීමෙන් ඔහු පලිගැනීමට ලක් වීමට හෝ අනවශ්‍ය ලෙස ලජ්ජාවට පත් කරනු ලැබීමට ඉඩ තිබේදැයි වාර්තාකරු තමන්ගෙන්ම ප්‍රශ්න කරගත යුතුය. වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සමාජය (The Society of Professional Jornalists - SPJ), අනෙක් අයට ගෞරවය දැක්වීමත්, ඔවුන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමත්, අප්‍රසන්න කුතූහලයට ඉඩ නොදීමත් දැඩි ලෙස අවධාරණය කරන ජනමාධ්‍ය ක්‍රියාකාරික ආචාරධර්ම පද්ධතියක් සකස් කොට තිබේ.

එය http://www.spj.org/pdf/ethicscode.pdf වෙබ් පිටුවෙන් ලබාගත හැකිය.

## මානව මූලාශ්‍ර: ශ්‍රී ලාංකික සිද්ධි අධ්‍යයනයක්

2008 වසරේදී *සන්ඩේ ලීඩර්* පුවත්පතේ පළ වූ ගවේෂණාත්මක කතා මාලාවක්, මූලාශ්‍ර ජාලයක් මාස ගණනාවක් පුරා වාර්තාකරණ ව්‍යාපාරයකට පවතින්නට උපකාරී වූයේ කෙසේද යන්නට විශිෂ්ට උදාහරණයක් ලබා දී තිබේ.

කොළඹ සිටින එක්තරා කණ්ඩායමක් කප්පම් ගැනීම සඳහා දෙමළ ව්‍යාපාරිකයන් පැහැරගෙන ගොස් රඳවා තබාගන්නා බවට සඳහන් පුවතකින් මෙම ව්‍යාපාරය ආරම්භ විය. කතාවට මුල පෑදුණේ නිර්නාමික ඔත්තුවකිනි. කප්පම් ගන්නා කල්ලියකින් තම වර්ගයා ආරක්ෂා කිරීමට රජය කිසිවක් නොකරන බවට කැබිනට් ඇමතිවරයකු ජනාධිපතිවරයාට පැමිණිලි කොට ඇති බවට එම ඔත්තුවෙන් කියවිණි.

මේ පිළිබඳ පළමු වාර්තාව කිසිදු සෘජු උද්ධෘත හෝ නම් ගම් නැතිව පළ විය. එහෙත් කතාව සත්‍ය වූ අතර, කප්පම් මුදල් තැන්පත් කිරීමට යොදාග න්නා ලද බැංකු ගිණුම් කිහිපයක් පිළිබඳ තොරතුරු එහි සඳහන් විය.

මෙම මූලික ප්‍රවෘත්තියෙන් පසු, මේ ආකාරයටම පීඩාවට පත් වූවන්ගේ ඥාතීහු, විශේෂයෙන්ම කොළඹ සිටින ස්වර්ණාභරණ වෙළෙඳාමේ නිරත දෙමළ ව්‍යාපාරිකයන්ගේ ඥාතීහු, රහසිගත තොරතුරු හා පොලීසියට කරන ලද පැමිණිලිවල පිටපත් සමග *ලීඩර්* පුවත්පත් ආයතනයට එන්නට වූහ. මෙමගින්, ප්‍රසිද්ධියේ කතා කරන්නට තරම් පීඩාවට පත් අයගේ පවුල්වල සාමාජිකයෝ දිරිමත් වූහ. අවසානයේදී මෙය, *ලීඩර්* සහ වෙනත් මාධ්‍ය බස්නාහිර පළාතේ හා ශ්‍රී ලංකාවේ වෙනත් ප්‍රදේශවල කෙරෙන මෙවැනි වූ පැහැරගෙන යෑම් හා මුදල් පැහැරගැනීම් පිළිබඳව වැඩි වැඩියෙන් පුවත් පළ කරන්නට මග පෑදීය.

මෙසේ මිනිසුන් පැහැරගෙන යන කණ්ඩායමේ ප්‍රධාන පුද්ගලයකු විශ්‍රාමලත් ගුවන් හමුදා නිලධාරියකු බවත්, ඔහුට ප්‍රබල දේශපාලන සබඳතා ඇති බවත්, මෙම කටයුතු සඳහා යම් යම් බලවතුන්ගේ සහාය ඔහුට ලැබෙන බවත්, මාස කීපයකට පසු තම ආරංචි මාර්ග මගින් *ලීඩර්* පුවත්පතට දැනග න්නට ලැබිණි. කාලයත් සමග, මූලාශ්‍ර ගණනාවක් මගින්, එනම් එම පීඩාවට පත් අයගේ ඥාතීන්, දේශපාලනඥයන් හා වෙනත් ක්‍රියාකාරිකයන් මගින් මෙම පුද්ගලයාගේ අනන්‍යතාව ඉතා හොඳින් තහවුරු කෙරිණි.

එහෙත්, එක්තරා නිර්නාමික මූලාශ්‍රයක් එම පුද්ගලයා එක්තරා හෝටලයක සිටින බවට දැනුම් දෙන තෙක් ඔහු සිටින්නේ කොහිදැයි යන්න අනාවරණය නොවීය. වාර්තාකරුවෝ දෙදෙනෙක් හෝටලයට ගොස් අදාළ පුද්ගලයා සිය කාමරයෙන් එළියට එනු ඡායාරූප ගත කළහ. මෙම පුද්ගලයාගේ අනන්‍යතාව හෙළි කරමින්ද, අදාළ හෝටලය වටලන ලෙසට රජයට අභියෝග කරමින්ද විපක්ෂ දේශපාලනඥයකු පාර්ලිමේන්තුවේදී ප්‍රබල කතාවක් පවත්වා දෙදිනකට පසු පුවත්පතද සිය හෙළිදරව්ව කළේය. එවැනි පුද්ගලයකු සිටින බව හෝ ඔහු සිටින තැනක් පිළිබඳව හෝ කිසිවක් නොදන්නා බව රජය කීවේය. එහෙත්, මෙම හෙළිදරව්වෙන් පසු රහස් පොලීසිය එම පුද්ගලයා අත්අඩංගුවට ගත්තේය. මෙම අත්අඩංගුවට ගැනීමෙන් පසු කොළඹ පැහැරගෙන යෑම් නැවතුණු බව ජ්‍යෙෂ්ඨ කැබිනට් ඇමතිවරයෙක් නිල ප්‍රකාශයක් කළේය.

මූලාශ්‍ර නොකළ යුතු දේ. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යකරණය මුහුණ දී ඇති එක් ගැටලුවක් නම්, බලගතු මූලාශ්‍ර 'කතා අනුමත කරන්නන්' තත්ත්වයට පත්වීමයි. තමන් සමග කරන ලද සම්මුඛ සාකච්ඡාවෙන් කුමන කොටස පාවිච්චි කළ හැකිද, කුමන කොටස පාවිච්චි කළ නොහැකිදැයි ඔවුහු වාර්තාකරුට උපදෙස් දෙති. මෙසේ වී ඇත්තේ වාර්තාකරුවන් සතු අඩු විශ්වසනීයත්වය හා වෘත්තීයභාවය නිසාය. ඔවුහු මූලාශ්‍රවලට රිදවීමට බිය වෙති. 'පූර්ව සංස්කරණ' අයිතිය ඉල්ලා සිටින්නේ දේශපාලනඥයන් පමණක් නොවේ. ව්‍යාපාරික ක්ෂේත්‍රයද නිතරම පාහේ ප්‍රකාශයට පත් කිරීමට පෙර කතා හෝ වීඩියෝ පිටපත ඉල්ලා සිටිති. උද්ධෘත තෝරාගැනීම ජනමාධ්‍යවේදියාගේ කාර්යයක් බව මූලාශ්‍රවලට සිහිපත් කොට දිය යුතුය. එම වරප්‍රසාදය කිසිම මූලාශ්‍රයකට පැවරිය යුතු නැත.

මූලාශ්‍ර පිළිබඳ නෛතික හා ආචාරධර්මීය කරුණු. ආරක්ෂක නීති හෝ 'උරුහන්බාන්නන්' ආරක්ෂා කිරීමේ නීති හෝ ශ්‍රී ලංකාවේ නැත. එහෙයින් බොහෝ විට ගවේෂණාත්මක වාර්තාකරුවෝ රහස් පොලිසියේ ප්‍රශ්න කිරීම්වලට ලක් වෙති. පොලිසිය එවැනි අවස්ථාවලදී යම් යම් කතාවල මූලාශ්‍ර හෙළි කරන ලෙස බල කරයි. එම මූලාශ්‍ර හෙළි කරන ලෙසට හා සටහන් පොත් භාර දෙන ලෙසට අධිකරණය පවා වාර්තාකරුට නියෝග කළහැකිය.

ශ්‍රී ලංකාවේ තොරතුරු මූලාශ්‍ර ආරක්ෂා කිරීම පිළිබඳ නීති දුර්වල වුවද, 'චන්ද්‍රිකා කුමාරතුංගට එරෙහිව *ලක්බිම*' නම් විශේෂ නඩුවේදී මූලාශ්‍ර ආරක්ෂා කිරීම පිළිබඳ මූලධර්මය අධිකරණය විසින් පිළිගනු ලැබ ඇත.

මෙම නඩුවේදී, *ලක්බිම* සිංහල පුවත්පතට ජනාධිපතිනිය අපකීර්තියට පත් කිරීමේ චේතනාවක් නොතිබූ බව මහාධිකරණය තීන්දු කළේය. ඊට පෙර එම පුවත්පත ඇය පිළිබඳව ප්‍රශංසා කරමින් ලිපි පළකොට ඇති බවත්, අපහාසාත්මක ලිපියේ මූලාශ්‍රය ඒ තාක් විශ්වාස කටයුතු ලෙස ක්‍රියා කොට ඇති බවත්, එම මූලාශ්‍රය මෙහිදීද අවශ්‍ය මූලාශ්‍රයක් ලෙස සැලකෙන බවත් අධිකරණය පිළිගත්තේය. වඩා වැදගත් වන්නේ, තම තොරතුරු මූලාශ්‍රය හෙළි කිරීමට *ලක්බිම* කර්තෘවරයා අදිමදි කිරීම අධිකරණය පිළිගැනීමය. කර්තෘවරුන්ට හා ප්‍රකාශකයන්ට තම තොරතුරු මූලාශ්‍ර හෙළි කිරීමට බල නොකළ යුතුය යන පූර්වාදර්ශයද මෙහිදී ගොඩ නැගිණි.

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන්ට අධිකරණයේදී යම් යම් අයතීන් නොමැති වුවද, සමහරුන් අධිකරණයේදීත් රහස් පොලිසිය හමුවේත් තම මූලාශ්‍රය හෙළි කිරීම ප්‍රතික්ෂේප කොට ඇත. ඔවුහු ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් ඉදිරිපත් කරනු ලැබ ඇති වෘත්තීය ප්‍රතිපත්ති මාලාවේ සඳහන් මූලික ජනමාධ්‍ය ප්‍රතිපත්ති අනුගමනය කරති. එම ප්‍රතිපත්ති මාලාවේ 5.1 වගන්තියේ පැහැදිලිව මෙසේ සඳහන් වේ: "රහසිගත මූලාශ්‍රය අවසර දුන හොත් විනා සෑම ජනමාධ්‍යවේදියකුටම එම මූලාශ්‍රය ආරක්ෂා කිරීමේ සදාචාරමය වගකීමක් ඇත." ජනමාධ්‍ය ක්‍රියාකාරිකයන් සඳහා වූ ස්වර්ණමය නීතිය එයයි.

## සවැනි පරිච්ඡේදය

# ලේඛන ඔස්සේ ගවේෂණය

ගවේෂණාත්මක වාර්තාකරුවන් නිරතුරුවම මිනිස් මූලාශ්‍ර වර්ධනය කරගන්නේ ඉන් ලැබිය හැකි තවත් වාසියක් සිතේ රඳවාගෙනය. අදාළ ලේඛන තමන් අතට පත් කරගැනීමේ චේතනාවෙන්ය.

ඇත්තටම, ගවේෂණාත්මක වාර්තාකරණයත් සාම්ප්‍රදායික ජනමාධ්‍ය කලාවත් අතර වෙනසක් වශයෙන් සඳහන් කළ හැකි මූලික කාරණයක් නම්, ගවේෂණාත්මක වාර්තාකරණය ලේඛනවලට වැඩි අවධානයක් යොමුකිරීමයි. එක් ඇමරිකානු මාධ්‍යවේදියකු එම වෙනස විශේෂ කොට දැක්වූයේ මෙසේය:

"ගවේෂණාත්මක වාර්තාකරණයේ සුවිශේෂත්වය නම්, අප ලබාගන්නා ප්‍රවෘත්තිවල ගැඹුරත්, අප පරීක්ෂා කර බලන වාර්තාවල ප්‍රමාණයත්ය."

මෙහි සත්‍යයක්ද තිබේ. වාර්තා කිරීමට වැඩි වශයෙන් ලේඛන එක්රැස් කරගත් විට, තමන් කියන කතාව විටින් විට වෙනස් කරන මිනිස් මූලාශ්‍ර මතම විශ්වාසය තැබීම හෝ බර තැබීම අඩු වෙයි. අනෙක් අතට ලේඛන වෙනස් නොවේ. ලේඛන යනු ගවේෂණාත්මක වාර්තාකරුවකුට දූෂණය හෝ වැරදි වැඩ පිළිබඳ ප්‍රවෘත්තියක් ගොඩනැගීමට ඉවහල් වන වැදගත් මූලාශ්‍රයකි. පරිගණක දත්ත පද්ධති (Database) වැඩසටහන් භාවිත කරමින් නිල වාර්තා අධ්‍යයනය කොට, විශ්ලේෂණය කොට, පෙළ ගැස්වීම කළ හැකිය. එමගින් මිනිස් මූලාශ්‍රවලට හෙළි කළ නොහැකි වැරදි හැසිරීම් පිළිබඳ රටාවන් අනාවරණය කරගැනීමට හැකි වේ. ලේඛන යනු මාධ්‍යවේදීන්ගේ බල සම්පන්න ආයුධයකි.

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීතිවල අභිප්‍රාය වන්නේ, වාර්තාකරුවන්ට හා අනෙක් පුරවැසියන්ට රාජ්‍ය ලේඛනවලට ප්‍රවේශ වීමට උදව් වීමයි. එමගින් විනිවිදභාවය හා වගවීම වැඩිදියුණු කිරීමයි. එසේ වුවත්, නිල වාර්තා පිළිබඳ බොහෝ දීර්ඝ සම්ප්‍රදායක් ඇති රටවල පවා වාර්තාකරුවන්ට නිල වශයෙන් අයැදුම් කිරීමෙන් ලේඛන ලබාගැනීම අසීරු කරුණක් වේ. වාර්තාකරුවන්ගේ උනන්දුව අඩු වී ඔවුන් අත්හැරදමා යතියි බලාපොරොත්තුවෙන් නිලධාරීහු වාර්තාකරුවන් කරන එබඳු ඉල්ලීම් ඉටු කිරීම පමා කරති. මේ නිසා, දැඩි ස්ථාවරයක එල්බ සිටින වාර්තාකරුවන්ට පවා, ඔවුන්ට ඕනෑ කරන නිල ලේඛන ලබාගැනීමට විශාල අරගලයකට මැදි වන්නටත් බොහෝ අමාරුකම් අත්විඳින්නටත් සිදු වේ. *ලොස් ඇන්ජලිස් ටයිම්ස්* පුවත්පතේ වාර්තාකරුවකුට, 1970 සිදු වූ ආන්දෝලානාත්මක මිනීමරුමක් පිළිබඳ ලේඛන එෆ්බීඅයි ආයතනයෙන් මෑතකදී ලබාගැනීමට හැකි වූයේ වරින් වර ඉල්ලීම් කොට අවුරුදු 6ක් පමණ කල් පසු වීමෙන් අනතුරුවයි. *නිව් යෝක් ටයිම්ස්* පත්තරයට එක්සත් ජනපදයේ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් උද්ධෘත ලේඛනයක් ලබාගැනීමට අවුරුද්දක පමණ කාලයක් සටන් වදින්නට සිදු වූ

අතර, අන්තිමේදී අභියාචනාධිකරණයේද පිහිට පතන්නට සිදු විය. අවසානයේ එම ලිපි මාලාව 2009 පුලිට්සර් ත්‍යාගය ජයග්‍රහණය කළේය.

ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීතියක් නොමැත. රජයේ නිලබලධාරීන් විසින් වසන්කොට තබාගෙන සිටින තමන්ට අවශ්‍ය යම් යම් ලේඛන ලබාගැනීමට, තමන්ගේ බුද්ධියත්, ජාලගත වීමේ කුසලතාවත් මත විශ්වාසය තැබීමට වාර්තාකරුවන්ට සිදු වේ.

එසේ වී නමුත්, ගවේෂණාත්මක ව්‍යාපෘතීන්ට ප්‍රයෝජනවත් යැයි සනාථ විය හැකි රාජ්‍ය ලේඛන කිහිපයක් ඇත්තේය.

- පාර්ලිමේන්තුව. හැන්සාඩ් යනු පාර්ලිමේන්තු රැස්වීම් වචනයෙන් වචනයට වාර්තාගත කළ, මහජනයාට ලබාගත හැකි, සංස්කරණය කරන ලද ලේඛනයකි. කාරක සභා වාර්තා වැඩි හරියක් රහස්‍ය වන අතර, සමහර වාර්තාවලට මහජනයාට ප්‍රවේශ විය හැකිය. වාර්තාකරුවන්ට අයවැයෙහි පූර්ව ඇස්තමේන්තුද ලබාගත හැකිය.

- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. ජනගහනයේ ප්‍රවණතා හා ජන විකාශයට අදාළ දත්ත ඇතුළත් වේ.

- සමාගම් රෙජිස්ට්‍රාර්. සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල, කොටස් ප්‍රාග්ධනය, සමාගම් පත්‍ර පිළිබඳ වාර්තා.

- ශ්‍රී ලංකා මහ බැංකුව. සංඛ්‍යාලේඛන, දේශන සහ වෙනත් සමාජ ආර්ථික දත්ත ඇතුළත් මාසික තොරතුරු ප්‍රකාශනයක් සහ වාරික වාර්තා ප්‍රකාශයට පත් කරයි.

- ජාත්‍යන්තර සංවිධාන/ණය දෙන ආයතන. ලෝක බැංකුව (WB), ආසියානු සංවර්ධන බැංකුව (ADB), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ තවත් සංවිධාන ගණනාවක් ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා ප්‍රකාශයට පත් කරයි.

- පළාත් පාලන අධිකාරී. අයවැය ලේඛන, වාර්ෂික සංවර්ධන සැලසුම් හා සැසි වාර්තා ලබාගත හැකිය.

- දිස්ත්‍රික්ක ලේකම් කාර්යාල. මේ කාර්යාලවල සේවයේ නිරත ප්‍රවෘත්ති නිලධාරීහු බොහෝ විට ලේඛන සොයාගැනීමට උපකාරී වෙති.

- රජයේ ප්‍රකාශන දෙපාර්තමේන්තුව. සියලු රජයේ ප්‍රකාශන පරිශීලනය කිරීමේ හැකියාව පවතී.

ලේඛන පරිහරණය. ලේඛනයක් ඔබ අතට පත් වූ විට ඒවා මත කිසිවක් ලියන්න එපා. පිටපතක් ලබාගෙන මුල් ලේඛනය ලිපිගොනුවක තැන්පත් කරන්න. ඉන් පසු ලේඛනයේ අයිනේ සටහන් ලියමින්, වැදගත් ඡේද ඉරි ගසමින් හෝ සලකුණු කරමින් පිටපත ක්‍රමානුකූලව කියවන්න. වරින් වර නැවත නැවත ලේඛනය කියවන්න. වාර්තාකරු ඔහුගේ කතාවේ ගැඹුරටම යන විට ලේඛනය විවිධ වේලාවන්හිදී විවිධ දේවල් කියාපානවා ඇත. මුලදී තේරුමක් නැතිවා සේ පෙනෙන වාක්‍යාංශ හා මූලාශ්‍ර ටිකෙන් ටික නව අර්ථ කථනයන්ගෙන් අර්ථවත් වනු ඇත.

ලේඛන සංවිධානය කිරීම. ප්‍රධාන පෙළේ කතාවන්ට සම්බන්ධ පර්යේෂණයක නියැළීමේදී මාධ්‍යවේදියකුට ලේඛන දසදහස් ගණනක්, මධ්‍යස්ථ කතන්දරවලදී දුසිම් ගණනක් ඒකරාශි කරගැනීමට සිදු වන අතර, මේ ලේඛන කිසියම් නිරවුල් හා තර්කානුකූල ක්‍රමයකට අනුව සංවිධානය කරගැනීම අවශ්‍ය වේ. එවැනි ලේඛන පහසුවෙන් යළි සොයාගැනීම හා විශ්ලේෂණය කිරීම කළ හැකි එවිටයි. අප මෙහිදී 'ක්‍රමයකට' යනුවෙන් හඳුන්වන්නේ, සාර්ථක ගවේෂණාත්මක වාර්තාකරුවකු එකම ලේඛනයේ පිටපත් විවිධ ප්‍රතිඵල ලබාගැනීමට හැකි වන අයුරින් විවිධ ක්‍රමවලට අනුව සංවිධානය කරන නිසාය.

එක් ක්‍රමයක් නම් කාල වකවානුව අනුව පෙළ ගැස්වීමයි. කාලානුරූපීව සිද්ධි පෙළගැස්වූ විට, වාර්තාකරුවන්ට අගනා විනිවිද දැක්මේ නුවණකින් යුක්තව, දූෂණ සංවර්ධනය වූයේ කෙසේද? ඒවා සිදු වූ වකවානු දැනසිටියේ කවුරුන්ද? මේ දූෂණ නතර කිරීමට යමක් කළේ වී නම් ඒ කවුද, කවදාද? යන කරුණු විමර්ශනය කළ හැකි වේ. වාර්තා කිරීමට මුළු ලේඛනම ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය නැති විට, ප්‍රයෝජනවත් කාල රාමුවකට අනුව ඒවා පෙළ ගැස්විය හැකිය.

තවත් ප්‍රයෝජනවත් ශිල්ප ක්‍රමයක් නම් විෂය අනුව අකාරාදි පිළිවෙළට ලේඛන සංවිධානය කිරීමයි.

ලේඛන සංවිධානය කිරීම අවසානයේදී කතාව ගොඩනැගීමට රුකුලක් විය යුතුයි. උදාහරණයක් විදියට: ගම්බද දෙමාපියන් සිය දරුවන් රජයේ පාසලකට ඇතුළු කිරීමට අල්ලස් ලබාදිය යුතු වීම පිළිබඳ කතන්දරයක්යැයි සිතමු. තමන්ගේ දරුවන් විවිධ ප්‍රාථමික පාසල්වලට ඇතුළු කිරීමට බලාපොරොත්තු වූ දෙමාපියන් 30 දෙනකු සමග සම්මුඛ සාකච්ඡා කර, එම සාකච්ඡා වෙනවෙනම ලියාගනු ලැබේ. මෙසේ ලියාගත් එක් සාකච්ඡාවක් මගින් එක් ලේඛනයක් ගොඩනැගේ.

මෙම ලේඛන දෙමාපියන්ගේ නම් අනුව සංවිධානය කළ හැකිය. ඊට වඩා හොඳ ක්‍රමයක් නම්, එක එක පාසලකට වෙන වෙනම ලිපිගොනු සකස් කර, අදාළ සම්මුඛ සාකච්ඡා එම ලිපිගොනු තුළට බහාලීමයි. ගොනුගත කළ විට, ඒවා වඩා හොඳින් පිරික්සා වඩා කාර්යක්ෂමව කරුණු අධ්‍යයනය කිරීමට වාර්තාකරුට හැකි වේ.

එක් එක් ලිපිගොනුව තුළ එක් එක් සම්මුඛ සාකච්ඡාවේ වඩාත්ම වැදගත් උද්ධෘත කැපී පෙනෙන ලෙස සලකුණු කොට (හයිලයිට් කොට), ඒ අතරින් කතාව ගොඩනැගීමේදී පාවිච්චි කළ හැකියැයි සිතෙන උද්ධෘත ඉදිරියෙන් තරු ලකුණ යෙදිය හැකිය.

පාසල් අනුව ලේඛන ගොනුගත කිරීමෙන්ද කතාවේ තවත් ඉඟියක් නැති නම් රටාවක් අනාවරණය කරගත හැකි වේ. උදාහරණයක් විදියට: පාසල් දෙකක දෙමාපියන් තමන්ට රුපියල් 1,000 බැගින් අල්ලස් දීමට බල කළේයැයි කියන අතර, ඉතිරි පාසල් තුනේ දෙමාපියන් තමන්ට බල කෙරුණේ රුපියල් 50 බැගින් අල්ලස්දීමට කියා අපි සිතමු. වැඩි අල්ලස් ඉල්ලූ පාසල් දෙක එකම දිස්ත්‍රික්ක නිලධාරියකු යටතේ පිහිටා ඇති බවත්, ඒවා වඩාත් හොඳ පහසුකම් භුක්තිවිඳින පාසල් බවත් හඳුනාගන්නට වාර්තාකරුවාට හැකි වේ. මෙමගින් තවත් ඔත්තුවක් ඉස්මතු කරගත හැකි වේ. නොඑසේ නම් මෙම කාරණා යටපත් වීමට ඉඩ තිබිණි.

| අකාරාදි පිළිවෙළට | කාල වකවානුව අනුව |
|---|---|
| A | 2011 ජූලි 30 (ඉතා මෑතකදී) |
| B | 2011 ජූනි 3 |
| C | 2010 දෙසැම්බර් 1 |

පරිගණකගත දත්ත පද්ධති. ලේඛන සංවිධානය කිරීමේදී භාවිත කළ හැකි ඉතා කාර්යක්ෂම හා අනාවරණකාරී ක්‍රමය නම්, දැනටමත් භාවිතයේ පවතින දත්ත පද්ධති වැඩසටහනක් භාවිත කිරීමයි. එසේ නැති නම් තමාගේම දත්ත පද්ධතියක් ගොඩනගාගැනීමයි. ලේඛන රාශියක් භාවිත කරමින් පුළුල් පරාසයක ව්‍යාප්ත වූ ගවේෂණයක් කිරීමට නම් දත්ත පද්ධතිය නැතුවම බැරි අවශ්‍යතාවකි. නොයෙකුත් විදියේ ලේඛනවලින් තොරතුරු එකතු කරගෙන ඒවා ඒකරාශී කිරීමට හා කිසියම් ප්‍රවණතාවකට අනුව තොරතුරු තෝරා බේරාගැනීමට වාර්තාකරුට අවශ්‍ය නිදහස, දත්ත පද්ධතියක් ගොඩනගාගැනීමෙන් ලබාගත හැකි වේ.

බෙහෙවින් සම්මතව ඇත්තා වූ පරිගණක මෘදුකාංග කට්ටලවල මයික්‍රොසොෆ්ට් එක්සෙල් වැනි වැඩසටහන් ඇතුළත් වේ. මේ වැඩසටහන් පාවිච්චි කරන තැනැත්තාට, විවිධ ක්ෂේත්‍රවලට සම්බන්ධ තොරතුරු වෙනවෙනම තීරුවල (columns) ඇතුළත් කළ හැකිය. මෙසේ තොරතුරු ඇතුළත් කිරීම වෙහෙසකර වුත්, පරිස්සමෙන් කළ යුතු වුත් කටයුත්තකි.

පාසල් සම්බන්ධ අල්ලස් ගැනීම් පිළිබඳව කළ සම්මුඛ සාකච්ඡාවලින් එක්රැස් කළ තොරතුරු පාදක කරගනිමින් දත්ත පද්ධතියක් සකස් කිරීම උදාහරණයට ගනිමු. එක් එක් සම්මුඛ සාකච්ඡාවෙන් තමන්ට එකතු කරගැනීමට ඕනෑ වී තිබෙන්නේ කවර අංගලක්ෂණද, තවත් විදියකින් කිව්වොත් දත්තද නැති නම් පරාමිතීන්ද යන්න වාර්තාකරු තීරණය කරගැනීම අවශ්‍ය වේ. මාපිය නම, පාසලේ නම, ඉල්ලූ අල්ලසේ ප්‍රමාණය, අල්ලස් දුන්නේද, දරුවා පාසලට ඇතුළත් කරගත්තේද වැනි කාරණා වීමට පිළිවන.

එම දත්ත පද්ධතිය පහත සටහන වැනි විය හැකිය:

| නම | පාසල | නගරය | අල්ලස රු. | දුන්නාද? | ඇතුළත් කර ගත්තාද? |
|---|---|---|---|---|---|
| අනිෂ්කා | 1 | ගාල්ල | 500 | ඔව් | ඔව් |
| අරවින්ද | 4 | යාපනය | 400 | ඔව් | ඔව් |
| ආරියදාස | 2 | නුවර | 1000 | නැත | නැත |
| ආරියපාල | 5 | මාතලේ | 350 | ඔව් | නැත |
| ආරියරත්න | 3 | කෑගල්ල | 200 | ඔව් | ඔව් |
| ආරියසිරි | 3 | කෑගල්ල | 200 | ඔව් | ඔව් |
| අර්ජුන | 2 | නුවර | 800 | ඔව් | ඔව් |
| අසංක | 6 | අනුරාධපුරය | 150 | නැත | ඔව් |
| අශාන් | 5 | මාතලේ | 300 | ඔව් | නැත |
| අතුල | 1 | ගාල්ල | 500 | ඔව් | ඔව් |
| භෂිනි | 1 | ගාල්ල | 500 | ඔව් | ඔව් |
| හෙමි | 1 | ගාල්ල | 500 | ඔව් | ඔව් |
| භසරංගනී | 2 | නුවර | 1000 | ඔව් | ඔව් |
| චන්ද්‍රිකා | 4 | යාපනය | 400 | ඔව් | ඔව් |
| බම්බි | 2 | නුවර | 1000 | නැත | නැත |
| මහින්ද | 3 | කෑගල්ල | 200 | ඔව් | ඔව් |

විවිධ ක්ෂේත්‍රවලට අනුව පෙළගැස්වීම නැති නම් වර්ග කිරීම කළ විට, විවිධ කෝණයන්ගෙන් ඉස්මතු වන විවිධ රටා වාර්තාකරුවාට දැකගත හැකි වේ. එමගින්, තව තවත් වාර්තා කිරීමට මෙහෙයවීමකුත් අන්තිමේදී වඩාත් හොඳ කතාවකුත් ලබාගැනීමට හැකි වේ.

ලබාගත් අල්ලස් ප්‍රමාණය කොපමණද යන්න ගැන දැන් අපි අපේ අවධානය යොමු කරමු:

| නම | පාසල | නගරය | අල්ලස රු. | දුන්නාද? | ඇතුළත් කර ගත්තාද? |
|---|---|---|---|---|---|
| ආරියදාස | 2 | නුවර | 1000 | නැත | නැත |
| භසරංගනී | 2 | නුවර | 1000 | ඔව් | ඔව් |
| බම්බි | 2 | නුවර | 1000 | නැත | නැත |
| අර්ජුන | 2 | නුවර | 800 | ඔව් | ඔව් |
| අනිෂ්කා | 1 | ගාල්ල | 500 | ඔව් | ඔව් |
| අතුල | 1 | ගාල්ල | 500 | ඔව් | ඔව් |
| භෂිනි | 1 | ගාල්ල | 500 | ඔව් | ඔව් |

| | | | | | |
|---|---|---|---|---|---|
| හෙම් | 1 | ගාල්ල | 500 | ඔව් | ඔව් |
| අරවින්ද | 4 | යාපනය | 400 | ඔව් | ඔව් |
| චන්ද්‍රිකා | 4 | යාපනය | 400 | ඔව් | ඔව් |
| ආරියපාල | 5 | මාතලේ | 350 | ඔව් | නැත |
| අශාන් | 5 | මාතලේ | 300 | ඔව් | නැත |
| ආරියරත්න | 3 | කෑගල්ල | 200 | ඔව් | ඔව් |
| ආරියසිරි | 3 | කෑගල්ල | 200 | ඔව් | ඔව් |
| මහින්ද | 3 | කෑගල්ල | 200 | ඔව් | ඔව් |
| අසංක | 6 | අනුරාධපුරය | 150 | නැත | ඔව් |

කවර නගරයේ අධ්‍යාපන නිලධාරීන්ද වඩාත් කෑදර යන්න ඉතා පැහැදිලිව දැකිය හැකියි. මෙම දත්තපද්ධති තුළ තිබෙන ගණිත වැඩසටහන භාවිත කිරීමෙන් එක් එක් නගරයෙන් ඉල්ලා ඇති අල්ලස් ප්‍රමාණයේ සාමාන්‍යය වාර්තාකරුට පහසුවෙන් ගණන් බැලිය හැකිය. උදාහරණයක් වශයෙන්, මහනුවර සාමාන්‍යය රු. 950කි. මෙය ප්‍රශ්න ගණනාවක් ඉස්මතු කරයි.

වෙනත් අන්දමේ පෙළගැස්වීම් හෙවත් වර්ගකිරීම් මගින් වෙනත් ආකාරයේ හෝඩුවා මතු වනු ඇත. මෙවැනි දත්ත පද්ධති මගින් වාර්තාකරුට විද්‍යාඥයකු සේ පරීක්ෂණ පවත්වමින් ඔහුගේ කතන්දරයේ උපකල්පනය විස්තාරණය කළ හැකිය. තමන්ගෙන්ම ප්‍රශ්න අසාගැනීමෙන් වාර්තාකරුවාට විවිධ වර්ගීකරණ ක්‍රම උපදවාගත හැකි වේ. උදාහරණයක් ලෙස, අල්ලසක් ලබාදුන් විට ඔබේ දරුවා ඉබේටම පාසලට ඇතුළත් කරගනු ලබන්නේද?

ඇතුළත් කිරීම අනුව පෙළගැස්වීම පහත දැක්වේ:

| නම | පාසල | නගරය | අල්ලස රු. | දුන්නාද? | ඇතුළත් කර ගත්තාද? |
|---|---|---|---|---|---|
| ආරියදාස | 2 | නුවර | 1000 | නැත | නැත |
| බම්බි | 2 | නුවර | 1000 | නැත | නැත |
| ආරියපාල | 5 | මාතලේ | 350 | ඔව් | නැත |
| අශාන් | 5 | මාතලේ | 300 | ඔව් | නැත |
| හසරංගනී | 2 | නුවර | 1000 | ඔව් | ඔව් |
| අර්ජුන | 2 | නුවර | 800 | ඔව් | ඔව් |
| අනිෂ්කා | 1 | ගාල්ල | 500 | ඔව් | ඔව් |
| අතුල | 1 | ගාල්ල | 500 | ඔව් | ඔව් |
| හෂිනි | 1 | ගාල්ල | 500 | ඔව් | ඔව් |
| හෙම් | 1 | ගාල්ල | 500 | ඔව් | ඔව් |
| අරවින්ද | 4 | යාපනය | 400 | ඔව් | ඔව් |

| | | | | | |
|---|---|---|---|---|---|
| චන්ද්‍රිකා | 4 | යාපනය | 400 | ඔව් | ඔව් |
| ආරියරත්න | 3 | කෑගල්ල | 200 | ඔව් | ඔව් |
| ආරියසිරි | 3 | කෑගල්ල | 200 | ඔව් | ඔව් |
| මහින්ද | 3 | කෑගල්ල | 200 | ඔව් | ඔව් |
| අසංක | 6 | අනුරාධපුරය | 150 | නැත | ඔව් |

බලාපොරොත්තු වූ සැටියෙන්ම, මහනුවර පදිංචි අල්ලස් ලබා නොදුන් දෙමාපියන් දෙදෙනකුගේ දරුවන් පාසලට ඇතුළත් කරගැනීම ප්‍රතික්ෂේප විය. එමෙන්ම, මාතලේ පදිංචි දෙමාපියන් දෙදෙනකු අල්ලස් ලබා දුන්නේ වී නමුත් ඔවුන්ට ඔවුන්ගේ දරුවන් පාසලට ඇතුළත් කරගැනීමට නොහැකි විය. එයින් හැඟෙන්නේ එම දෙමාපියන් දෙදෙනා දෙවතාවක්ම අසාධාරණයට ගොදුරු වී ඇති බවයි. මෙය තමන් සම්මුඛ සාකච්ඡාවන්ගෙන් එක්රැස් කළ තොරතුරු ඇතුළත් සටහන් පොත් හෝ පරිගණක ලිපිගොනු පිරික්සා බැලුවත් වාර්තාකරුවකුගේ ඇසට හසු නොවිය හැකි කාරණයකි.

තවත් හෝඩුවාවක් මෙසේය: දත්ත පද්ධතියෙන් අනාවරණය වන කරුණු අනුව, අනුරාධපුර නගරයට අයත් එකම පියා අල්ලස් ලබා නොදුන් නමුත් ඔහුට ඔහුගේ දරුවා පාසලට ඇතුළත් කරගැනීමට හැකි විය. ඉල්ලුම් කළ අල්ලසද අඩුම අල්ලසයි. රු. 150 යි. මෙමගින්, වාර්තා කිරීම සාතිශය වැදගත් අලුත්ම ගවේෂණාත්මක සිද්ධීන් දෙකක් ඔබට ඉස්මතු කර දෙයි.

දත්ත පද්ධතිය පිරික්සීමේදී, දත්තයන් විසින් කියා නොපාන කරුණු ගැනද අවධානය යොමුකිරීම වැදගත් වේ. එය මේ හිස් තැන පුරවාගැනීමට අනෙක් දත්ත පද්ධතීන්ට යොමුවිය යුතු අවස්ථාවක් ඉස්මතු කරයි. වෙනත් දත්ත පද්ධති නොමැති නම්, වාර්තාකරුවා තම කතාව කරුණුවලට ගැළපෙන පරිදි හැකිළවිය යුතුය. තම දරුවන් පාසල්වලට ඇතුළත් කරගැනීම සඳහා, ශ්‍රී ලංකාවේ සියලු මව්පියන්ටම පාහේ පාසල් පරිපාලකයන්ට අල්ලස් දීමට සිදුව ඇතැයි පවසමින් හැඳින්වීමක් ලිවීම (සමහර විට ප්‍රත්‍යක්ෂය එය විය හැකිය) අතිශයෝක්තියක් වනු ඇත. අපගේ මනඃකල්පිත දත්ත පද්ධතියේ තිබෙන සාම්පල සංඛ්‍යාව සීමිතය.

## මාරක බස් රියැදුරෝ: සිද්ධි අධ්‍යයනයක්

පුවත්පත්කලාවේදය හා නව මාධ්‍ය පිළිබඳ ඉන්දීය ආයතනයේ (Indian Institute of Journalism & New Media - IIJNM) ගවේෂණාත්මක වාර්තාකරණයේ නියැළි ශිෂ්‍යයෝ, විද්‍යුත් දත්ත පද්ධතියක් බොහෝ ඵලදායක අයුරින් භාවිත කරමින්, බැංගලෝරයේ බස් සේවයට සම්බන්ධ නිලධාරීන් මහජනයා නොමග යවන ආකාරය පෙන්නුම් කළහ. පයින් ගමන් කරන තැනැත්තන් හා බයිසිකල්කරුවන් මරාදමන බස් රියැදුරන්ට සිදු වන්නේ කුමක්ද කියන කාරණය පිළිබඳව මෙම නිලධාරීන් ඇත්ත වසන් කොට මහජනයා නොමග යවන බව මේ ගවේෂණාත්මක වාර්තාකරණයෙන් හෙළිදරව් විය.

බස් රියැදුරන් නොව, වෙනත් වාහන පදවන රියැදුරන් අනතුරු වැඩි හරියකට වගකිව යුතු බව මේ නිලධාරීහු මෙම ශිෂ්‍යයන්ට කියා සිටියෝය. කිසියම් බස් රියැදුරකුගේ වරදින් එවැනි අනතුරක් සිදු වුව හොත් ඔවුන් එම රියැදුරන් සේවයෙන් පන්නාදමන බවද වැඩිදුරටත් ඔවුහු කියා සිටියෝය.

ඉන්දියාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත හරහා බස් අනතුරු පිළිබඳ වාර්තා ලබාගත් මෙම ශිෂ්‍යයෝ බස් සමාගම්වල නියෝජිතයන් පැවසූ කරුණු එම වාර්තාවල අඩංගු කරුණු හා සසඳා බැලූහ. ඉන්පසු මේ ශිෂ්‍යයෝ රියැදුරන්ගේ නම්, ඔවුන්ගේ සේවා අංක, අනතුරු සිදු වූ දිනවකවානු, ඔවුන් වරදකරු කරනු ලැබුවේද, එසේ නම් ඔවුන්ට ලබාදුන් දඬුවම කුමක්ද යන තොරතුරු පෙන්නුම් කරන දත්ත පද්ධතියක් සකස් කළහ. මේ ශිෂ්‍යයන් අවුරුදු 8ක් පමණ කාලයක් තුළ සිදු වූ 650කටත් වැඩි අනතුරුවලට අදාළ තොරතුරු එක් රැස් කළ අතර, මේ තොරතුරු තෝරාබේරාගෙන පෙළගැස්වූ විට නිලධාරීන් පුරවැසියන් නොමග යවනසුලු ව්‍යාජ චිත්‍රයක් මවා පා ඇති බව අනාවරණය විය.

සිදුව ඇති සියලු මාරක අනතුරුවලින් සියයට 75%කට වගකිව යුත්තේ බස් රියැදුරන් බව සංඛ්‍යා ලේඛනවලින් අනාවරණය විය. වැරදි කරන රියැදුරන් ගැන ඉහළ නිලධාරීන් බොහෝ විට තදට කතා කළත් වැරදි කළ අය ගැන බෙහෙවින් ලිහිල් පිළිවෙතක් අනුගමනය කර ඇති බව අනාවරණය විය. ඔවුන් කියා සිටි කරුණු කෙසේ වුවත් සේවයෙන් පහකොට ඇත්තේ සියයට 9ක් බවත්, වැඩිදෙනකු පරිවාස කාලයකට යටත් කොට ඔවුන්ගේ වැටුප අත්හිටුවා පසුව නැවත බස් පැදවීමට යොදා ඇති බවත් හෙළි වූයේය.

තද කම්පනයක් ඇති කරන එක්තරා කාරණයක්ද තිබුණේය. එනම්: පුද්ගලයන් දෙදෙනකු හෝ ඊට වඩා වැඩි ගණනක් මරාදැමීමට හේතු වූ මාරක අනතුරුවලට වගකියන බස් රියැදුරන් 28 දෙනකු නිලධාරීන් ඔවුන් සේවයෙන් පහ කිරීමට පෙර මෙම මාරක අනතුරු සිදුකොට තිබිණ. තවත් එක් සිද්ධියක් නම් එක් රියැදුරකුට දඬුවම් පැමිණවීමට පෙර එක් මාසයක් තුළ පුද්ගලයන් දෙදෙනකු මාරක අනතුරුවලින් මරාදමා තිබීමයි.

ලේඛන සම්පාත කිරීම. මුලහිට තොරතුරු එකතු කර තමන්ගේම දත්ත පද්ධතියක් සකස් කරගැනීම අවශ්‍ය නොවන අතර, දැනටමත් පවතින එකිනෙකට වෙනස් දත්ත කට්ටල දෙකකින් ලබාගත් තොරතුරු සම්පාත කළ හැකිය. මෙය තම්බා පොඩි කරගන්නවා වැනි පොඩි කරගැනීමක් ලෙස හඳුන්වනු ලැබේ.

නව මාධ්‍ය ශිල්පීය ක්‍රම භාවිත කරමින් තොරතුරු පොඩි කරගැනීමේ මෙම ක්‍රමය මගින් ගවේෂණාත්මක වාර්තාකරුවන්ට ප්‍රවණතා හා රටා හඳුනාගැනීමට හැකි වේ. විශේෂයෙන්ම, සිතියම් හෝ වෙනත් දෘශ්‍ය ආධාරක මගින් මෙය කළ හැකි වේ.

උදාහරණයක් වශයෙන් 2010 වර්ෂයේදී විශ්වවිද්‍යාලවල වරින් වර ඇති වූ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන ශ්‍රී ලංකාවේ මාධ්‍ය වාර්තා කළේය. එක්තරා කාලවකවානුවක් තුළ තැනින් තැන ඇතිවූ මේ සිද්ධීන් එකිනෙකට සම්බන්ධ නැති නිතරම සිදු වන දේවල් ලෙස සලකනු ලැබුවේය. එබැවින් පුවත්පත් පිටුවල නොයෙක් තැන්වල ඒ තොරතුරු පළ විය. ප්‍රවෘත්ති විකාශවල නොයෙක් තැන්වල ඒ තොරතුරු නිවේදනය විය. නමුත් විශ්වවිද්‍යාල මණ්ඩපවල සැබැවින්ම සිදු වන්නේ කුමක්ද යන්න පැහැදිලි වූයේ පුරවැසි පුවත් වෙබ් අඩවියක් වන http://www.groundviews.org ගූගල් සිතියම් උපකාර කරගෙන කළ පැහැදිලි කිරීමෙන් පසුවය. එය ගූගල් සිතියම් උපකාර කරගෙන හැම විශ්වවිද්‍යාල මණ්ඩපයකම සිදුවූ සෑම සිද්ධියක්ම විද්‍යුත් කොඩියකින් සලකුණු කර දැක්වූවේය.

මෙම අභ්‍යාසයෙන් විද්‍යමාන පුළුල් චිත්‍රය මාධ්‍යවේදීන්ට හා ඔවුන් ඉදිරිපත් කළ තොරතුරු පරිශීලනය කළ අයට මගහැරුණු බව පෙනී ගියේය. එම ප්‍රචණ්ඩ ක්‍රියා ශ්‍රී ලංකාවේ සෑම විශ්වවිද්‍යාල මණ්ඩපයකම උද්ගතව තිබූ සිද්ධියක් වූ අතර, ශිෂ්‍යශිෂ්‍යාවෝ දසදහස් සංඛ්‍යාවක්ද බෞද්ධ භික්ෂූහුද මේ සිද්ධීන්ට සම්බන්ධ වී සිටියෝය. මෙය දන්නා තොරතුරු වෙනත් ආකාරයකට සම්බන්ධ කර කරුණු හෙළිදරව් කරගැනීමෙහි නිරත වූ ගවේෂණාත්මක වාර්තාකරණයකි.

විශ්වසනීය ලේඛන. යම් කිසිවකු කඩදාසි කැබැල්ලක් ඉදිරිපත් කළ පමණින් හෝ වෙබ් අඩවියක් නිර්මාණය කළ පමණින් එය සැබෑවකැයි සිතිය නොහේ. ප්‍රතිපත්තියක් නැති පොලිස් නිලධාරීන්, රජයේ නිලධාරීන්, ප්‍රෝඩාකාරයන් හා වෙනත් එවැනි අය සියවස් ගණනාවක් තිස්සේ ව්‍යාජ ලේඛන පාවිච්චි කර තිබේ.

මේ නිසා තමා රැඳී ඇත්තේ විශ්වසනීය ලේඛන මතද යන්න සහතික වශයෙන්ම සනාථ කරගැනීම ගවේෂණාත්මක වාර්තාකරුවකුට බෙහෙවින් තීරණාත්මකය. පදනමකින් තොර ලේඛන මත රැඳී කතාවක් ප්‍රසිද්ධියට පත් කිරීම අන්තරායකට අතවැනීමක් බඳුය.

ලේඛන තහවුරු කරගැනීමට අදාළ මූලික රීති මෙසේය:

- මූලාශ්‍ර ගැන සැලකිලිමත් වෙන්න. මේ පුද්ගලයාට එම ලේඛනය ලබාගත හැකිව තිබුණේයැයි සාධාරණව සිතිය හැකිද? ඔහු හෝ ඇය මෙම විෂයයෙහි විශේෂඥයෙක්ද? අපක්ෂපාතිත්වය කෙබඳුද? මූලාශ්‍ර සපයන්නා බොරු කීම ගැන ඉතිහාසයක් ඇත්තෙක්ද? වෙනත් මානව මූලාශ්‍රයක් ලේඛන ගැන වගකියනවාද? මේ ලේඛන ලැබුණේ කොහෙන්ද? ඒවා පාවිච්චි කරන්නේ හෝ අයත් වන්නේ කවුරුන්ටද යන්න සොයා දැනගත යුතුය.

- තොරතුරු ගැන සැලකිලිමත් වෙන්න. මෙම ලේඛනය අලුත්ද? එහි අන්තර්ගතය නිවැරදිව තහවුරු කරගත හැකිද?

- අභ්‍යන්තර හෝඩුවාවල්. පරිසමාප්ත ව්‍යාජ ලේඛන තිබෙනුයේ ස්වල්පයකි. ඔබ සාවද්‍ය කරුණුවලින් පිරුණු ලේඛනයක් දෙස ප්‍රමාණවත් කාලයක් විමසුමින් බලා සිටියහොත් ඔබට වැරදි අක්ෂර යෙදීම්, අමුතු භාෂා රටා ආදි නොගැළපෙන තැන් දැකගත හැකිය. හැකි නම් ආයතනයෙන් ලේඛනයේ හිස් පිටපතක් ලබාගෙන එහි තිබෙන කොටු හා පරතරයන් ව්‍යාජ ලේඛනයේ කොටු හා පරතරයන්ට ගැළපෙන්නේ දැයි බලන්න.

- **පිටස්තර විශේෂඥයකුට පෙන්වීම.** දූසමාන තොරතුරුවලින් යුත් ලේඛන ඇත් නම් ඔබේ ගවේෂණය නිමවන තුරු බලාගෙන ඉන්න එපා. මේ වර්ගයේ ලේඛන සම්බන්ධයෙන් කටයුතු කරන අපක්ෂපාතී විශේෂඥයකුට පෙන්වා එම ලේඛන නිවැරදිදැයි තහවුරු කරගන්න.

- **ඉලක්ක කරගන්නා තැනැත්තන්ට ඒවා ඉදිරිපත් කරන්න.** ලේඛනවල වලංගුභාවය තහවුරු කරගැනීමට භාවිත කළ හැකි හොඳම ක්‍රමයක් නම් සම්මුඛ සාකච්ඡා පවත්වන අතරතුර එම ලේඛන ලියුවේයැයි කියන නිලධාරීන්ට හෝ එය උත්පාදනය කළේයැයි කියන ආයතනවලට පෙන්වීමයි. “ඔබට මේ ලේඛනය හඳුනාගන්න පුළුවන්දැ”යි නිලධාරියාගෙන් අසන්න. ඔහුගේ හෝ ඇයගේ ප්‍රතිචාරය අනුව එම ලේඛනය විශ්වාසදායක ලේඛනයක්දැයි ඔබට කියන්නට පුළුවන්.

- **අපක්ෂපාතිත්වය පිරික්සීම.** විද්‍යාඥයෝ ඔවුන්ගේ පර්යේෂණ ප්‍රතිඵල තහවුරු කිරීමට පක්ෂග්‍රාහීව අරගල කරති. තමන්ගේ න්‍යාය වලංගු කරගැනීමේ වටිනාකම දිහා පමණක් බලමින් එසේ කරනු ලැබේ. මාධ්‍යවේදීහුද, විශේෂයෙන් ගවේෂණාත්මක වාර්තාකරුවෝද මෙයම කරති. ඔබේ පක්ෂග්‍රාහිත්වය මුල්කොට ඔබ කටයුතු කළේදැයි සැකහැර ගැනීමට ඔබේ ලේඛනය ඔබේ කතුවරයාට පෙන්වන්න. ඔහු හෝ ඇය බොහෝ පරිස්සමෙන් සැක දුරු කරගැනීමට කටයුතු කරනු ඇත.

- **කාලහුරුව.** විවිධ දූසමාන ආරංචිවලින් යුත් ලේඛනයක් හිටි හැටියේම නිසි කලට ඉස්මතු වුව හොත් දෙසැරයක් හිතන්න. එය අතේ ගෙතූවක් විය හැකිය.

- **නෛතික පටිපාටිය.** අවසාන වශයෙන්, ගවේෂණාත්මක වාර්තාකරුවාගේ නෛතික ආරක්ෂාව තහවුරු වීමට නම් ලේඛන ඔහු සතුව තිබිය යුතුයි. කතන්දරය ප්‍රසිද්ධ කිරීමෙන් පසු අදාළ ලේඛන අඩු කරමින් අවුරුදු දෙකක කාලයක් පරෙස්සම් කර තැබිය යුතු වේ. අපහාස නඩුවක් සඳහා එපමණ කාලාවරෝධයක් තිබීම එයට හේතුවයි. ලේඛන වඩාත්ම සංවේදී නම් ඒවා ප්‍රවෘත්ති ආයතනයේ නීතිඥයාගේ භාරයේ තබන්න.

## සත්වැනි පරිච්ඡේදය

# විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ගවේෂණය

කඩදාසි ලේඛනවලට නිශ්චිත කාලයක් හා ස්ථානයක් තිබේ. එහෙත් තාක්ෂණයේ හාස්කම් තුළින් ගවේෂණාත්මක වාර්තාකරුවකුට කාලය, අවකාශය, ජාත්‍යන්තර දේශ සීමා, මුදල් ආදි සීමා ඉක්මවා යමින් අතිවිශාල තොරතුරු සමුද්‍රයකට සමීප විය හැක්කේය.

**නව මාධ්‍ය/ ඔන්ලයින් පිරික්සුම්.** නව මාධ්‍යය යන පදය, වචන, ඡායාරූප, වීඩියෝ, ඕඩියෝ, ග්‍රැෆික්, සිතියම් සහ වෙනත් දෘශ්‍ය සම්පත් සංයෝජනය කර ඩිජිටල් ක්‍රමයෙන් නොහොත් පරිගණකයෙන් උත්පාදිත තොරතුරු හැඳින්වීමට පුළුල් අර්ථයෙන් භාවිත කරනු ලබන යෙදුමකි. රූපවාහිනිය, සිනමාව, සඟරා, පුවත්පත් හෝ පොත් මෙම නිර්වචනයට අනුව නව මාධ්‍ය ගණයට අයත් නොවේ.

ජනප්‍රිය පිරික්සුම් යන්ත්‍රයක් වූ ගූගල් හා එවැනි වෙනත් පිරික්සුම් යන්ත්‍රවලට වාර්තාකරුවෝ තොරතුරු එකතු කරගැනීමට හා මූලාශ්‍ර පිළිබඳ විෂය පථය පුළුල් කරගැනීමට බොහෝ සේ යොමුවෙති. මේවා භාවිත කිරීම සඳහා වෙබ් අඩවි පිළිබඳ දැනුම හා අන්තර්ජාලය පිළිබඳ කුසලතා අවශ්‍යතාව අවමය. එනම් පිරික්සුම් යන්ත්‍රයක් පාවිච්චි කරන්නේ කෙසේද? ඊමේල් යවන්නේ කෙසේද? යන කාරණා පිළිබඳ අවම දැනුම ප්‍රමාණවත්ය. ඔන්ලයින් පිරික්සුම සඳහා ඉවසීම, සුපරීක්ෂාකාරීවීම හා භාවිතය අවශ්‍ය වේ. හරියටම කිව්වොත්, බයිසිකල් පැදීම හා පිහිනීම පුහුණු වීමට මෙන්ම නව මාධ්‍ය භාවිතයට හුරු වීමටද හොඳම ක්‍රමය ඒවා භාවිත කිරීමයි.

මුල සිට තේරුම් ගෙන සිටිය යුතු කාරණයක් තිබේ. එනම්, මෙම නව, සමාජ මාධ්‍ය ශිල්පයට අයත් මෙවලම් හා වේදිකා නිරන්තරව වෙනස් වන බවයි. නිරතුරුවම වාගේ නව මෙවලම් හා ක්‍රියාකාරිත්වයෝ අලුතෙන් එකතු වෙති. එතෙක් තිබුණු ඒවා ඉවත් කිරීම නැති නම් සංශෝධනය කිරීමද නිතරම සිදු වේ. මෙය මෙසේ වන්නේ අඛණ්ඩව සිදු වෙමින් පවතින තාක්ෂණික විප්ලවය නිසාය.

අන්තර්ජාලය ඔස්සේ පිරික්සීම පිළිබඳ මූලික කරුණු මෙසේය:


- අවශ්‍යතා. වෙබ් අඩවිවල සැරිසරන්නට විශේෂිත උපකරණ (දෘඩාංග) හා යෙදුම් (මෘදුකාංග) අවශ්‍ය වේ. දෘඩාංගය, හොඳ අන්තර්ජාල සබඳතාවකින් යුත් ඩෙස්ක්ටොප් හෝ ලැප්ටොප් පෞද්ගලික පරිගණකයක් විය හැකිය. මෘදුකාංග විවිධාකාර වේ. ඒවා මගින් පරිගණකය ක්‍රියාකරවීම හා ඉන් අවශ්‍ය කටයුතු කරගැනීමටත්, අන්තර්ජාලයට සම්බන්ධ වී දත්ත ගොනු කිරීම නැති නම් බ්‍රවුසරයකින් තොරතුරු පීරාබැලීමටත් හැකි වේ.

- පිරික්සීම. පරිගණකය පණ ගන්වා වෙබ් අඩවියකට සම්බන්ධ කරගෙන, නිවැරදි 'පිරික්සුම් යෙදුම්' භාවිත කරමින් වාර්තාකරුවා අන්තර්ජාල පිරික්සුම්වල නියැළෙයි. පිරික්සුම් යෙදුම් නමින් හැඳින්වෙන ඉඟි වචනය නැතිනම් සංඥා වචනය (key word) මගින් තමන් උනන්දුව දක්වන මාතෘකාව සාරාංශ කොට දක්වයි. උදාහරණයක් වශයෙන්, වාර්තාකරුවා අක්මාව අක්‍රිය වීමේ රෝගයට කාරක ප්‍රදේශයේ පානීය ජලයේ තිබෙන ෆ්ලුවොරයිඩ් පිළිබඳ වාර්තා පිරික්සන්නේ නම්, ඔහු මුලින්ම ගූගල් පිරික්සුම් පිටුවට පිවිස "Kidney failure" (අක්මාව අක්‍රිය වීම) හා fluoride යන පද දෙක ඇතුළත් කළ යුතුය. එවිට ඔහුට ෆ්ලුවොරයිඩ් අඩංගු පානීය ජලය අක්මාවේ නිරෝගීභාවයට අනතුරු පමුණුවන්නේ කෙසේද යන්න ගැන සාකච්ඡා කරන වාර්තා, පුවත් කතා හා වෙනත් අමුද්‍රව්‍යවලට මග පෙන්වන, ඒවාට සම්බන්ධ පුරුක් (link) ලැයිස්තුවක් ලැබේ.

- ඇත්ත නැත්ත විමසීම. කඩදාසි ලේඛන සම්බන්ධව මෙන්ම වෙබ් අඩවි තුළින් ලබාගන්නා තොරතුරු පිළිබඳවද ගවේෂණාත්මක වාර්තාකරුවා මුහුණ දෙන අභියෝගයක් නම් එම තොරතුරුවල සත්‍යභාවය ඔප්පු කරගැනීමයි. කෙසේ වුවත්, පෙර පැවති මූලාශ්‍රවලින් ලබාගත් තොරතුරුවලට වඩා ඔන්ලයින් ක්‍රමයට ප්‍රකාශයට පත් කරනු ලබන තොරතුරුවල නිරවද්‍යතාව හා අපක්ෂපාතිත්වය සහතික විය හැකි යැයි බොහෝවිට සැලකේ. එසේ වුවත්, ඔන්ලයින් හරහා ලබාගන්නා තොරතුරු පෙරටත් වඩා පක්ෂග්‍රාහී, එක පැත්තකට බරවූ, සාවද්‍ය තොරතුරු විය හැකිය. උදාහරණයක් වශයෙන්: 'විකිපීඩියා' (Wikipedia) වැනි වෙබ් අඩවි 'විවෘත මූලාශ්‍රිත'ය. එනම්, ඕනෑම කෙනකුට අලුතෙන් තොරතුරු එකතු කළ හැකිය. තිබෙන තොරතුරු වෙනස් කළ හැකිය. මෙයින් පෙනී යන්නේ මතුපිට වටිනාකම මතම රැඳී වාර්තාකරුවාට තොරතුරු එක්රැස් කරගැනීමට නොහැකි බවයි. ඔන්ලයින් ඡායාරූපද පහසුවෙන්ම විකෘත කළ හැකිය. මේ නිසා, අනෙක් දේවල් සම්බන්ධව අනුගමනය කළ යුතු රීතිය වාර්තාකරු විසින් විද්‍යුත් මූලාශ්‍රවලටද එනයින්ම භාවිත කළ යුතු වේ. එනම්, ඔබට නිවැරදිභාවය තහවුරු කරගත නොහැකි නම් එය භාවිතයට නොගත යුතුය.

- ගූගල්. තොරතුරු සොයාගැනීම හා ඒවා පිළියෙළ කරගැනීම සම්බන්ධයෙන් ගූගල් පිරික්සුම් යන්ත්‍රය සිදු කර ඇත්තේ විප්ලවකාරී වූ වෙනසකි. ඒ කොයිතරම්දයත් 'ගූගල්' යන්න ක්‍රියා පදයක් බවට පත් වී තිබේ. දැන් පුද්ගලයෝ ඔවුන්ගේ පරිගණකයට ළංවී, ගූගල් තුළින්, තම පළමු හමුවටත් පෙර පවා අනෙකා දැන හඳුනාගනිති. නිල ලේඛනවල, පුවත් වාර්තාවල හා කිසියම් විෂයකට අදාළව අන්තර්ජාලයට බහාලූ තොරතුරුවල සඳහන් ඕනෑම දෙයක් සොයාබලති.

කිසියම් කාරණයක් පිළිබඳව කී වාරයක් සොයාබලා ඇතිදැයි දළ වශයෙන් ගණන් බලා තොරතුරු ශ්‍රේණිගත කිරීමට ගූගල් එක්තරා සමීකරණයක් භාවිත කරයි. මේ මගින්, වඩාත්ම ජනප්‍රිය නැති නම් වැදගත් තොරතුරු පළමුව දිස් වෙයි. ගූගල් පිරික්සුම් විශ්වාස කළ නොහැකි තරම් වේගවත් වන අතර, අතිවිස්මයජනක වූ ප්‍රතිඵල ප්‍රමාණයක් ලබාදීමටද සමත් වේ. උදාහරණයක් වශයෙන්, 'මහින්ද රාජපක්ෂ' යන්න ගූගල් කළ විට ප්‍රතිඵල 5,650,000ක් ලැබේ. එම ප්‍රතිඵලය ලැබෙන්නට ගත වන්නේ තත්පර 0.06ක් තරම් වූ නිමේෂයකි.




කිසියම් නිශ්චිත මාතෘකාවක් හෝ ගැටලුවක් පිළිබඳව තොරතුරු මුවහත් කරගැනීමට වුවමනා කරන ගවේෂණාත්මක වාර්තාකරුවකුට වැඩි දියුණු කළ ගූගල් පිරික්සුම් අංග අතිශයින්ම උපකාරී වේ. ඔබේ සංඥා වචනය වඩාත් නිශ්චිත වන්නට වන්නට ඔබ බලාපොරොත්තු වන ප්‍රතිඵලයද වඩාත් හොඳින් ලබාගත හැකි වේ.

මුලින්ම ගූගල් පිරික්සුම භාවිත නොකොට කිසිම ගවේෂණාත්මක වාර්තාකරුවකුට සිය ව්‍යාපෘතිය ආරම්භ කිරීම උගහටය. තමන්ගේම වූ අන්තර්ජාල සම්බන්ධතා ඇති පරිගණකයක් නැති වාර්තාකරුවකුට, සයිබර්කැෆේ නමින් හඳුන්වනු ලබන පරිගණක පරිහරණය මිලදී ගත හැකි 'සයිබර් අවන්හලකට' ගොස් ගූගල් වෙත ප්‍රවිෂ්ට විය හැකිය. මුලින්ම ඇස ගැසෙන පිටු පෙරළා බලනවා වෙනුවට සියලු වැදගත් පිටුවලට ප්‍රවේශ වීමට අවශ්‍ය කාලය වාර්තාකරු විසින් වෙන් කරගත යුතුයි. බොහෝ වේලාවට ගූගල් පිරික්සීමේ අග්ගිස්සේ ඇති අඩුවෙන් නරඹන තොරතුරු බොහෝ දේ අනාවරණය කරයි. බෙහෙවින් ප්‍රයෝජනවත් වෙයි.

සිතියම්, ඡායාරූප, වීඩියෝ, විවිධ විෂයයන් පිළිබඳව දැනුමැති අයගේ ලිපි ආදියටද ගූගල් මග පෙන්වයි. අතිවිශාල දත්ත කන්දරාවකට පිවිස වඩාත් නිශ්චිත දේ තෝරාබේරාගැනීමට ගූගල්හි වැඩි දියුණු කළ පිරික්සුම් ක්‍රියාකාරිත්වය උදව් වේ. නම් හා ස්ථාන නාමවල නිවැරදි අක්ෂර වින්‍යාසය දෙවරක් පරීක්ෂා කර බැලීමටද ගූගල් විශිෂ්ට මාර්ගයක් වේ.

දැන් දැන් ගූගල් ඔබට වඩාත් සමීප වී ඇත. ගූගල් අක්ෂර පරිවර්තක මෘදුකාංගයෙන් (Google Transliteration IME) මේ වන විට භාෂා 22කට ප්‍රයෝජන ලැබිය හැකිය (ඇමරික, අරාබි, බෙංගාලි, ෆාසි (පර්සියානු), ග්‍රීක, ගුජරාටි, හීබ්‍රෑ, හින්දි, කන්නඩා, මලයාලම්, මරාටි, නේපාල, ඔරියා, පන්ජාබ, රුසියානු, සංස්කෘත, සර්බියානු, සිංහල, දෙමළ, තෙලිඟු, ටිග්‍රින්යානු සහ උර්දු). වැඩි විස්තර සඳහා http://www.google.com/ime/transliteration වෙබ් පිටුවට පිවිසෙන්න. ගූගල් සිංහලෙන් පරිහරණය කිරීමට http://www.google.com/transliterate/Sinhalese වෙබ් පිටුවට පිවිසෙන්න.

විකිපීඩියා. ගූගල් ඔස්සේ ඕනෑම විෂයයක් හෝ පුද්ගල නාමයක් ගැන පිරික්සීමේදී මුලින් ම ලබා දෙන ප්‍රතිඵලය විකිපීඩියාවය. විකිපීඩියා සයිබර් විශ්වකෝෂය විවෘත වෙබ් අඩවියක් ලෙස හඳුන්වනු ලැබේ. ඒ මක්නිසාදයත්: 'ජනයාගේ ප්‍රඥාව' නම් සංකල්පය මත රැඳී සිටින එම වෙබ් අඩවියට ඕනෑම කෙනෙකුට ලිවිය හැකිය. ලියා ඇති දේවල් සංස්කරණය කළ හැකිය. එමගින් දැනුම ඒකරාශි කෙරේ. ඒ වුවත්, දායක වන්නන්ට සාවද්‍ය කරුණු මෙන්ම ඕනෑකමින් අසත්‍ය තොරතුරු ද ඇතුල් කළ හැකිය. මේ නිසා, කිසියම් විෂයයක් පිළිබඳව සාමාන්‍ය අදහසක් ඇති කරගැනීමට නිරතුරුවම විකිපීඩියාව කියවන වාර්තාකරුවන් දෙසැරයක් හරිවැරදි බලන්නේ නැතිව කිසිම දෙයක් එම වෙබ් අඩවියෙන් ලබා නොගත යුතුය. බොහෝ වාර්තාකරුවෝ මුල් මූලාශ්‍රය කුමක්දැයි සොයා ගැනීමට ආරම්භයේදීම පාද සටහන්වලට යොමුවී බලති.

නිල වෙබ් අඩවි. නිල වෙබ් අඩවි නොතකා හරින්නට එපා. *සවුත් ෆ්ලෝරිඩා සන්-සෙන්ටිනෙල්* පුවත්පතේ ගවේෂණාත්මක වාර්තාකරුවෝ, සුළි සුළං සහානාධාර මගඩියක් පිළිබඳ ඔවුන්ගේ කතා ගොඩනගාගැනීමට ෆෙඩරල් හදිසි අවස්ථා කළමනාකරණ ආයතනයේ (Federal Emergency Management Agency - FEMA) වෙබ් අඩවියෙන් (http//www.fema.gov) කුතුහලය දනවන තොරතුරු හා හෝඩුවාවල් සපයාගැනීමට සමත් වූහ.

ශ්‍රී ලංකාවේ හා වෙනත් දකුණු ආසියාතික රටවල ආයතනික වෙබ් අඩවිවල බොහෝ විට නිලබල ධුරාවලිය සකස් වී ඇති සැටි පෙන්වන ව්‍යුහ සටහනක් විදහා දැක්වෙයි. සබඳතා ඇති කරගත යුත්තේ මැදි මට්ටමේ කළමනාකරණයේ කවුරුන් සමගදැයි තෝරාබේරාගැනීමට මෙය කදිම උපකරණයකි. බොහෝ විට මෙම ව්‍යුහ සටහන්, වැටුප්, රෙගුලාසි, අතීත ක්‍රියාකාරිත්වය හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ තොරතුරු ලබා දෙයි.

විදේශීය වෙබ් අඩවි. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතුවල නියැළී සිටින සමාගම් හා තනි පුද්ගලයන් පිළිබඳව අදාළ තොරතුරු ලබාගැනීමටත්, විදේශවල ව්‍යාපාරික කටයුතුවල නියැළි ශ්‍රී ලංකාවේ සමාගම්වල ව්‍යුහය දැනගැනීමටත් මෙම වෙබ් අඩවි පිරික්සිය යුතු වේ. ශ්‍රී ලංකාව තුළ තොරතුරු දැනගැනීමේ අයිතිය නැතිකම ජයගැනීමට මෙය හොඳ උපක්‍රමයකි. උදාහරණයක් වශයෙන් ශ්‍රී ලංකාවේ සමාගමක් එක්සත් ජනපදයේ ව්‍යාපාරික කටයුතුවල නිරත වී සිටින්නේ නම්, එක්සත් ජනපදයේ ව්‍යාපාර වස්තු හා විනිමය කොමිසමේ එඩ්ගා දත්ත පද්ධතියෙන් අගනා තොරතුරු සම්භාරයක් වාර්තාකරුවකුට එක්රැස් කරගත හැකිවේ (http://www.sec.gov/edgar/searchedgar/webusers.htm).

විශ්වසනීය වෙබ් අඩවි. වාර්තාකරුවන් කඩදාසි වාර්තාවල විශ්වසනීයත්වය තහවුරු කරගත යුතු වන්නා සේම වෙබ් අඩවි හා ඒවායේ අන්තර්ගත කරුණුවල විශ්වසනීත්වයද තහවුරු කරගත යුතුය. ඒ සඳහා මගපෙන්වීම් සමහරක් පහත දැක්වේ:

## වෙබ් අඩවියක අව්‍යාජත්වය පරීක්ෂා කිරීම
(Reality Checks)

| | |
|---|---|
| අධිකාරිත්වය: | අඩවිය ක්‍රියාත්මක කරන්නේ පිළිගත් විශේෂඥයෙක්ද? නම් දැරූ සංවිධානයක්ද? |
| නිරවද්‍යතාව: | කරුණු හා අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි ඇති අඩවි මග හැරිය යුතුවේ. |
| පෙනුම: | අඩවිය මැනවින් ගොඩනගා තිබේද? බොළඳ හා ආධුනික නිෂ්පාදන කරදර ගෙන දෙයි. |
| අභිප්‍රාය: | අඩවිය තම මෙහෙවර ඉටු කරයිද? |
| කාලීනතාව: | තොරතුරු යාවත්කාලීනද? |
| රෙකමදාරු: | විශ්වාසදායක විශේෂඥයන් හා සංවිධාන මෙම අඩවිය රෙකමදාරු කර ඇත්ද? |
| සම්බන්ධතා: | මෙම අඩවිය අනෙක් විශ්වාස කටයුතු හා කීර්තිමත් අඩවි සමග බැඳී පවතිනවාද? |
| ගැඹුර: | එම වෙබ් අඩවිය කිසියම් විෂයයක් හෝ ගැටලුවක් ආවරණය කරමින් පරිපූර්ණ කාර්යභාරයක් ඉටු කර තිබේද? |
| වටහාගත හැකි බව: | එහි අන්තර්ගතය තේරුම් ගත හැකිද? සරලද? |
| විශ්වාසවන්තභාවය: | සපයන තොරතුරුවල යම්කිසි වටිනාකමක්, අර්ථයක් තිබේද? ප්‍රකාශ තහවුරු කර තිබේද? |

## ජාල මිතුරන්ගෙන් පුංචි උදව්වක්

සමාජ මාධ්‍ය (Social Media). සමාජ මාධ්‍ය යනුවෙන් නිර්වචනය කෙරෙන්නේ මෑතකදී ඉස්මතු වෙමින් පවතින විද්‍යුත් සන්නිවේදන නාළිකා විශේෂයකි. පහසුවෙන් ප්‍රවේශ විය හැකි වෙබ් අඩවි විශේෂයක් වන මේවා මගින්, යම් යම් කරුණු ගැන එක සමානව උනන්දුව දක්වන දක්වන අයට එකට එක්වීමටද අදහස්, දත්ත, ශ්‍රව්‍ය දෘශ්‍ය තොරතුරු බෙදාහදාගැනීමට ද අවස්ථාව සලසයි. එමෙන්ම, දැවෙන ප්‍රශ්න පිළිබඳ කෙටි තොරතුරු හෝ මත 'පරිවාර පිරිසක්' වෙත යැවීමටද මේ වෙබ් අඩවි ප්‍රයෝජනවත් වේ. ඉතා බලසම්පන්න මෙන්ම බොහෝ දෙනා වැඩි වශයෙන් දැන සිටින අඩවිය Facebook ය. Twitter, Flickr, Wordpress, Blogger හා YouTube ද මෙම ගණයට අයත් වෙබ් අඩවි වේ.

සමාජ මාධ්‍ය ඉතා ප්‍රබල අයුරින් මාධ්‍ය කලාව වෙනසකට පත් කරයි. සමාජ මාධ්‍යයට පෙර පැවති මාධ්‍යකරණ ක්‍රියාවලිය බොහෝදුරට නළ මාර්ගයක් බඳු විය. වාර්තාකරුවෝ හා කතුවරු ප්‍රවෘත්ති සකසා, එක දිශාවකට ගලා යන නළ මාර්ගය දිගේ එම පුවත් නිෂ්ක්‍රිය පාඨකයන්ට, අසන්නන්ට හා නරඹන්නන්ට යැවූහ.




නමුත් සමාජ මාධ්‍ය නිසා, පරිශීලනය කරන්නන් අතිමහත් සංඛ්‍යාවක් අතර තොරතුරු වේගයෙන් ගුවනේ එහාටත් මෙහාටත් දිවෙන, එකිනෙක ඡේදනය වන මාර්ග ජාලයක් වැනි දෙයක් බවට මාධ්‍ය කලාව පත් වී ඇත්තේය. බොහෝ විට මෙය ප්‍රවෘත්ති 'ප්‍රජාතාන්ත්‍රීකරණය' ලෙස හඳුන්වනු ලැබේ. මේ හේතුකොට, මාධ්‍ය කලාව ආත්ම භාෂණයේ සිට සංවාදයක් බවට පරිවර්තනය වී තිබේ.



නව සහ සමාජ මාධ්‍ය 'පුරවැසි මාධ්‍ය කලාව' (Citizen Journalism) පහළවීමටද හේතු වූයේය. මෙම පුරවැසි මාධ්‍ය කලාව තුළ සාමාන්‍ය පුරවැසියෝ කෙටි පණිවුඩ යවති. ඔවුහු තමන් දකින හෝ අසන දේ ගැන කෙටි විස්තර ලියති, ඡායාරූප යවති. මේ නිසා, වාර්තාකරණය යනු තවදුරටත් සිය වෘත්තීය සම්මතයන් ගැන පාසල්වලදී පුහුණුව ලැබූ නොඑසේ නම් රැකියාව තුළදීම පුහුණුව ලැබූ වෘත්තීය මාධ්‍යවේදීන්ට සීමා වූ බල ප්‍රදේශයක් නොවේ.

එක්තරා කාලයකදී වාර්තාකරුවන් ඇසින් දුටු සාක්ෂිකරුවන් පසු පස්සෙන් හඹා යමින් සම්මුඛ සාකච්ඡා ලබාගත්තද, දැන් ඇසින් දුටු සාක්ෂිකරුවන්ට මාධ්‍ය අතරමැදියන් කපාහැරීමට පුළුවන් වී තිබේ. ඔවුහු මේ සඳහා බොහෝ විට ජංගම දුරකථන පාවිච්චි කරති. එම දුරකථන මගින් ඡායාරූප ගෙන, වීඩියෝ කර, පාඨ පණිවුඩ (Text Messages) සමග Twitter වෙත තොරතුරු ඇතුළු කිරීමට හැකි වී තිබේ. ඉරානය, ඊජිප්තුව, ලිබියාව, සිරියාව වැනි රටවල උද්ගත වූ මහජන නැගීසිටීම්වලදී, වෘත්තීය වාර්තාකරුවන්ට සැම තැනකම පෙනීසිටීමට බැරිවන ලෙස රජය විසින් ඔවුන්ගේ ප්‍රවේශය සීමාකිරීම නිසා ඔවුන්ගේ ආරංචි හිරවී තිබියදී පුරවැසියන් පුවත් ගලා යෑමට ඉඩ සැලැස්වූ ආකාරය අපි දුටුවෙමු.

දැන් වාර්තාකරුවෝ පුරවැසියන් විසින් උත්පාදනය කරන මෙම නව මූලාශ්‍රවල අස්වැන්න නෙළාගන්නේ කෙසේදැයි වටහාගනිමින් සිටිති. ඇතැම් අවස්ථාවලදී මේ අස්වනු විශාල වශයෙන් ප්‍රයෝජනයට ගැනේ. නව සමාජ මාධ්‍ය භාවිත කිරීම පිළිබඳ පාඩමක් ඇතුළත් කිරීම මෙම අත්පොතෙහි විෂය පථය ඉක්මවා යාමකි. එහෙත්, වාර්තාකරුවන් මෙම ප්‍රබල නව ශිල්පීය ක්‍රම වහ වහා දැන ඉගෙන, ගවේෂණාත්මක මාධ්‍යකරණය ඵලදායක අයුරින් භාවිත කිරීමට හැකියාව ලබාගත යුතුය.

## අටවැනි පරිච්ඡේදය

# කතාව සූදානම් කිරීම

මෙන්න මේක නම් වරද්දාගන්න එපා: වර්ෂයේ ඉතාම චිත්තාකර්ෂණීය වූ කතන්දරය ගවේෂණාත්මක වාර්තාකරුවකු සතුව තිබිය හැකිය. එහෙත් ඒ කතාව ඔහුගේ සටහන් පොත්වල, එහෙම නැත්නම් ලිපි ගොනුවල හා දත්ත පද්ධති තුළ පමණක් රඳවාගෙන සිටින්නේ නම් එයින් ඇති පලක් නැත. එමෙන්ම, ඒ කතාව පටලැවිලි ගොඩක් වූ තොරතුරු ප්‍රමාණයක් ලෙස පිටුවලින් නැති නම් ගුවනින් එළිදැක්වුව හොත් එයින්ද පලක් නැත.

මේ නිසා, පාඨකයන්ගේ හා නරඹන්නන්ගේ සිත් ඇදගන්නා විදියට ගවේෂණාත්මක කතන්දරය කියාපෑමට නිවැරදි මගක් සොයාගැනීම ගවේෂණාත්මක වාර්තාකරුවකුට පැවරී ඇති දැවැන්ත කාර්යභාරයකි. කතාව සාතිශය වැදගත් වූ පමණින්ම, කතාවේ තොරතුරු රාශියක් ඇතුළත් වූ පමණින්ම, එය නීරස කතාවක් වන්නට ඉඩ තිබෙනවායැයි සිතිය නොහැකිය.

ඔබේ පාඨකයාට හෝ ඔබේ නරඹන්නාට ඉතා පහසුවෙන් කළ හැකි දෙයක් නම් කියවීම හෝ නැරඹීම පසෙකට දමා වෙන වැඩක් කිරීම බව හැමවිටම සිතේ තබාගත යුතු කාරණයකි.

මේ නිසා, සිය කතාව කියන්නේ කෙසේද යන්න ගැන ගවේෂණ වාර්තාකරු හැමවිටම කල්පනා කිරීම අවශ්‍ය වේ. සමහර වාර්තාකරුවෝ වාර්තා කිරීම පටන් ගත් මොහොතේ සිටම මුල් කෙටුම්පත ලිවීමද පටන් ගනිති. මෙසේ කිරීම නිසා, අලුත් අලුත් කරුණු සොයාගන්නා විට ගැළපෙන ලෙස කතාව වෙනස් කිරීම හා හැඩගැස්වීම කළ හැකිය. මෙලෙස ආරම්භයේ සිටම කතාවේ කෙටුම්පත ලිවීම පටන් නොගත්තොත්, වාර්තාකරුවන්ට හිස් කඩදාසියක් ඉදිරියෙන් තබාගෙන, කරුණු රාශියකින් සිත පුරවාගෙන විශාල පීඩාවකට මුහුණදෙන්නට සිදුවන අතර, දොරටුපාලයෝ මහා දැවැන්ත හෙළිදැක්වීමක් සිදු වෙතැයි මහ ඉහළින් බලාපොරොත්තු රඳවාගෙන බලාගෙන සිටිති. මෙහි ප්‍රතිඵලය ලේඛකයා හිරවීමයි.

මාධ්‍යවේදී 'රක්ෂණය'. ශක්තිමත් කෙටුම්පතක් ලිවීමට බල කරන තවත් හේතුවක් තිබේ. වාර්තාකරු පිටත සිට ඔහුගේ වැඩ කටයුතු කරගෙන යන විට, ඔහු ඔහුගේ 'ඉලක්ක' නිලධාරියාට හෝ ආයතනයට සමීප තැනැත්තන් සමග සම්මුඛ සාකච්ඡා පටන් ගනියි. සිදු වෙමින් පවතින දෙය ගැන ඉලක්කය දැනුම්වත් වීමට හොඳටම ඉඩකඩ තිබේ. සමහර සිද්ධීන්වලදී උද්ගතව තිබෙන කාරණය පිළිබඳව මාධ්‍ය සාකච්ඡාවක් පවත්වා ඉලක්කය මෙම කතාව වාර්තාකරු අතින් ඩැහැගැනීමට වෑයම් කළ හැකි වේ. එමෙන්ම, ප්‍රතිසංවිධානයක් කරන බවට නිවේදනයක් කළ හැකිවේ. එම තේමාව සම්බන්ධයෙන්ම වරදට හසු විය හැකි තොරතුරු බැහැර කළ විකෘත කතාවක් කාන්දු කරන්නට වුව ඉඩ තිබේ. එසේත් නැතිනම්, ඉලක්කය මාධ්‍ය ආයතනයට කනේ පහරක් ගසමින් නඩුවක් පවරන්නටද ඉඩ තිබේ.

මෙය මගහරවාගැනීමට නම්, වාර්තාකරු ඉලක්කය සමග මුහුණට මුහුණලා සම්මුඛ සාකච්ඡාවක් කිරීමට පෙර පිටපතක් ලියා සකස් කරගැනීම අවශ්‍ය වේ.

මෙම පිටපත, කෙටි විස්තරයකට වැඩි යමක් විය යුතුයි. කටු සටහනකට වැඩි යමක් විය යුතුයි. ඉලක්ක කරගනු ලබන පුද්ගලයා අදාළ ප්‍රවෘත්තිය ඩැහැගනු ඇතැයි ඉවෙන් දැනගැනීමට ලැබෙන මොහොතේ පුවත්පතට එය රිංගවීමට හෝ ගුවන් මගින් ප්‍රචාරය කිරීමට හෝ හැකි ආකාරයේ ප්‍රවෘත්තියක් විය යුතුයි. 'රක්ෂණ' කටු සටහන ලිවීමෙන් ප්‍රවෘත්තියක ඇති අඩුලුහඬුකම් එළිදරව් වනවා පමණක් නොව, ඉලක්කගත පුද්ගලයාගෙන් විමසිය යුත්තේ මොනවාදැයි ඇත්තෙන්ම සිතා බැලීමටද ඉඩකඩ ලැබේ.

රක්ෂණ කෙටුම්පතක් ලිවීම හෝ රක්ෂණ වාර්තාවක් සකස් කිරීම සහජ ඥානයට එරෙහි වීමක් හා සුළු ප්‍රමාණයක අසාධාරණයක් ලෙස පෙනී යන්නට පුළුවන. ඉතාම වැදගත් තොරතුරුවලින් තොරව ඔබ කතාවක් ලියන්නේ කෙසේද? උදා: ඉලක්කය කුමක් කියාවිද? වාර්තා කිරීම නිම කිරීමට පෙර ඔබ පූර්ව විනිශ්චයන්ට එළඹී තිබෙනවා නේද? ඇත්තටම එය එසේ නොවේ. එය හරියට මෝටර් වාහන නිපදවන්නන් අලෙවියට ඉදිරිපත් කිරීමට පෙර ඔවුන්ගේ මොඩල අත්හදා බැලීමට ලක් කිරීම වැනි කටයුත්තකි. වාර්තාකරුවා සිය කතාව පිළිබඳ අත්හදාබැලීමේ ගමනක යෙදෙයි. පූර්ව විනිශ්චය ගැන කියනවා නම්, කතාව ඕනෑම වේලාවක වෙනස් කරන්නට පුළුවන. අවශ්‍යතාවක් ඇත් නම් එය විනාශ කරන්නටද පුළුවන. මෙය අත්හදාබැලීමට කරන දිවිල්ලක්යැයි අපි සිතාගනිමු.

පහත සඳහන් දේවල්ද කර බලන්න වෑයම් කරන්න:

- කතාබහ කිරීම. දොරටුපාලයා හෝ ඔබේ සගයන් සමග නිකමට වාගේ කතාව ගැන කතා කිරීම, කතාව ලිවීමට වාර්තාකරුට උදව්වක් වෙනවා ඇත. අසන්නා දක්වන ප්‍රතිචාර, මේ කතාව පිළිබඳ වෙනත් ප්‍රවේශයක් අවශ්‍යද?, තවත් අමුද්‍රව්‍ය අවශ්‍යද? යන්න පිළිබඳව වාර්තාකරුට කියාපානවා ඇත. වර්තමානයේ *නිව් යෝක් ටයිම්ස්* පත්තරයේ සේවය කරන, තුන්වරක් පුලිට්සර් ත්‍යාගය දිනූ වෝල්ට් බොග්ඩනිච්, තමා නිතරම වාගේ තමාගේ සගයන් සමග තම කතාව ගැන කතා කරන බව පැවසුවේය. කතාව අසන මිතුරන්ගේ දෑසේ දීප්තියක් නොමැති නම් කතාව හරිහැටියට ලියා නැති බව ඔහු දැනගනියි.

- මවට කීම. පළමුවන කටු සටහන් ලියන විට වාර්තාකරුවෝ තමන් කෑම මේසයේදී තමන්ගේ මව්වරුන්ට මේ කතාව කියන බව සිතින් මවාගත යුතුයි. මිත්‍රශීලී සහ අනුබල ලැබෙන පුද්ගලයකු හෝ පිරිසක් වෙත තම කතාව කියාපෑමෙන් වාර්තාකරුවා තුළ මානසික පහසුවක් ඇති වී සාමාන්‍ය පාඨකයාට වටහාගත හැකි සංවාදමය ස්වරූපයකින් කතාව කීමට පෙලඹීමක් ඇති වේ.

- මතක් කරදීම. මතක් කර දීම නම් කතාව ආරම්භ කිරීමට වාර්තාකරු තුළ උද්‍යෝගයක් ඇති කරන වචන සමූහයකි. එක් ප්‍රයෝජනවත් මතක් කිරීමක් නම් "මේ කතාව මගේ පාඨකයන්ට හා නරඹන්නන්ට කියන්නේ ..." මේ හිස් ඉඩ පිරවීමෙන් ඔබගේ කතාවට හැඳින්වීමක් ලැබේ. උදාහරණයක් වශයෙන්, "මේ කතාව මගේ පාඨකයින්ට/නරඹන්නන්ට කියන්නේ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මහනුවර අවට ජලය පිළිබඳව කළ පරීක්ෂණවලදී,

එම ජලයේ ඇති ෆ්ලුවොරයිඩ් ප්‍රමාණය විද්‍යාඥයන් විසින් මිනිස් පරිභරණයට සුරක්ෂිතයැයි දක්වන ප්‍රමාණයට වඩා පස් ගුණයකින් වැඩි බව සොයාගෙන ඇති බවයි.

- කතාපොඩි (Anecdotes). රුචිය ඇතිකරන පුංචි කතාවකින් ගවේෂණාත්මක කතාවක් ඇරඹීම ඉතා අගනා ක්‍රමයකි. එමගින් සංකීර්ණ විෂයයක් හද බැඳග න්නා විදියට පැවසිය හැකිය. දූෂණය, බලය අනිසි ලෙස පාවිච්චි කිරීම නැති නම් රජයේ නොහැකියාව වැනි කරුණු නිසා පීඩා විඳින්නන් මුහුණපාන අවාසනාවන්ත තත්ත්වය බොහෝ විට පෙන්නුම් කළ හැකිය.

- නිරායාසයෙන් ලිවීම. සිත ඉතාමත් ප්‍රබලය. ගවේෂණාත්මක ලේඛකයෝ තම මනස විසින් උකහාගනු ලබන ප්‍රමාණයේ අගය කොතරම්දැයි නොදනිති. එම නිසා, භාවිත කළ හැකි එක් ක්‍රමයක් වන්නේ සිය සටහන් ඉවතලා මතකයෙන් ලිවීමයි. වැඩි විස්තර තහවුරු කරගැනීම හෝ වෙනස් කිරීම පසුව සිදුවන නමුදු, කතාවේ අවසාන ස්වරූපයට හා කතාවේ වඩා වැදගත් සිද්ධීන්ට ඉඩ ලැබීමක් ඉන් සිදු වෙයි.

ලේඛන ශෛලිය. උණුසුම් පුවත් කතා මෙන්ම, ගවේෂණාත්මක ලිපිද පැහැදිලි, සරල ආකාරයෙන් ඉදිරිපත් කරන්නේ නම් ඉතා මැනවි.

  - ගද්‍ය රචනා. සරල මෙන්ම අවධාරණාත්මක වාක්‍ය භාවිත කරන්න. පැටලිලි සහිත බසක් පමණක් ඉතිරිවන අවුල් සහගත වාක්‍යාංශ භාවිතයෙන් වළකින්න.

  - ක්‍රියාව. වාක්‍ය තැනීමේදී කර්මකාරක ශෛලියේ නොව කර්තෘකාරක ශෛලියේ ක්‍රියා පද සහ වාක්‍ය භාවිත කරන්න.

  - කතා ධ්වනිය. තොරතුරු ඔබ වෙත තිබේ නම් හැඟීම් අවුස්සාලීමේ අවශ්‍යතාවක් නැත. ඇත්ත වශයෙන්, යමක් ගැන මඳක් අඩුවෙන් සඳහන් කිරීම මාධ්‍යවේදියාගේ අනාවරණය තියුණු කරයි. බරසාර ගද්‍යවලින්, අලංකාරෝක්තිවලින් හෝ නිගමන සහිත ප්‍රකාශයන්ගෙන් සිදු වන බාධාවලින් තොරව, වඩා ප්‍රබල ලෙස කරුණු ඉස්මතුවීමක් එයින් සිදු වේ. අලංකාරය ගෙන දෙන නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද අත්හරින්න. තමාගේ කතාව අතිශයෝක්තියෙන් ඉදිරිපත් කර ඇත යන චෝදනාව එල්ල වීමට ඉඩ නොදෙන්න.

පාරිභාෂික වචන සහ වචනවල මුලකරු පමණක් යෙදීම. කුමන හේතුවක් නිසා වුවද, පාරිභාෂික වචන සහ පොදුවේ භාවිත නොවන වචනවල මුලකුරු පමණක් එකතු කර ලිවීමෙන් වළකින්න. විශේෂඥයෝ විශේෂ භාෂාවක් ලෙස සලකා මේවා භාවිත කරති. එනමුදු ගුවන්විදුලියේ හෝ පුවත්පතක මෙම විශේෂ බස යෙදීමෙන් වන්නේ අසන/කියවන ජනතාව කලකිරීමට පත් වීමයි.

එසේ වුවද හැමවිටම වාර්තාකරුවන් කරන්නේද මෙයමයි. යමක් 'ගෙදර සාදන ලද බෝම්බයක්' යයි නොකියා, ඒ වෙනුවට 'නිර්මාණය කරන ලද පුපුරණ මෙවලම්' යයිද නැත හොත් තවදුරටත් අන්තගාමී වී IEDs (Improvised Explosive Devices) යයිද යොදති. හරියට ලෝකයේ හැමදෙනාම 'IEDs' යන්න දැනගත යුතුවාක් මෙනි. නමුත් ඔවුහු නොදනිති. ලිවීම පිළිබඳව *රොයිටර්ස් ඇලර්ට්නෙට්* උපදෙස් මාලාවේ මේ වැදගත් මූල ධර්මය හොඳින්ම පැහැදිලි කර තිබේ. 'Stakeholder' වැනි වචන කතාවක නොයෙදිය යුතුය. ඔබගේ ආච්චි අම්මාට මෙය නොතේරෙයි. ස්වර්ණමය නීතිය මෙහිදීද බල පැවැත්වේ: චාම් බසින් ලියන්න.

මිණි කැට. පාඨක ජනතාවට කතාවෙහි තේමාව හොඳින් වටහාගැනීමට උපකාර වන උද්ධෘත, කතාපොඩි, උදාහරණ සහ විශේෂ පින්තූර යන දෑ මේ ගණයට වැටේ. හුදෙක්ම කරුණු ගෙනහැර දැක්වීමකට ජීවය ලැබෙනුයේ මේවායිනි. අගනා මැණික් මෙන් පරිස්සමින් මේවා තෝරාගත යුතු අතර, කරුණුවලට අලංකාරය ලබාදීම සඳහා ඉඳහිට භාවිත කළ යුතුය.

මහින්ද රාජපක්ෂ ජනපතිවරයාගේ දෙවැනි පදවි ප්‍රාප්තිය අවස්ථාව සැමරීමට කිලෝග්‍රෑම් 12,000ක වාර්තා බිඳ හෙළූ කිරිබතක් පිසීම පිළිබඳව වාර්තා කිරීමේදී, www.groundviews.org නමැති පුරවැසි පුවත් වෙබ් අඩවිය අගනාම මිණි කැටයක් භාවිත කළාය (http://groundviews.org/2010/11/19/record-breaking-rice-cakes-but-at-what-cost). ලෝක ආහාර වැඩපිළිවෙළෙහි (WFP) දත්ත ආශ්‍රයෙන් 'ග්‍රවුන්ඩ්වීව්ස්' දළ වශයෙන් ගණන් බැලුවේ ඒ කිරිබත සඳහා වැය වූ මුදල නියම සරණාගතයකුට අවුරුදු 165ක් ජීවත්වීම සඳහා නැතහොත් සරණාගතයන් පස්දෙනකුගෙන් යුත් පවුලකට අවුරුදු 41ක් ජීවත් වීම සඳහා ප්‍රමාණවත් බවයි.

කතා රාමුව. ගවේෂණාත්මක ව්‍යාපෘතීන්හි විපුල ප්‍රයෝජනය සඳහා වසර ගණනාවක් පුරා ගවේෂණාත්මක වාර්තාකරුවන් විසින් භාවිත කරනු ලැබූ මූලික කතා රාමු කිහිපයකි. ඒවායින් බෙහෙවින් ජනප්‍රිය එමෙන්ම ඵලදායක කතා රාමු දෙකක් පහත දැක්වේ:

- බුලට් ලකුණ. ගවේෂණාත්මක කතා සඳහා පුවත්පත් විසින් වඩාත්ම පොදුවේ යොදා ගනු ලබන්නේ මෙම අච්චුවයි. මෙහි ඇති අලංකාරය නම්, ඔබ බුලට් ලකුණු හෝ සොයා ගැනීම් මොනවා විය යුතුදැයි තීරණය කළ පසුව, ඒවා කතාවේ ඒ ඒ කොටස්වල සාරාංශයක් ලෙස යොදාගත හැකි වීමයි. සෑම බුලට් ලකුණකින්ම කතාවේ ප්‍රධාන කොටසක් නියෝජනය වන අතර, අනතුරුව නැවත ඒවා විස්තර වශයෙන් සොයා බැලිය හැකිය.

පිළිගත් මූලාවයව මෙසේය:

- සාරාංශගත හැඳින්වීමක්.
- කියවන්නා බැඳ තබාගැනීමට නැත හොත් කතාවේ ජවය ගොඩනැංවීමට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා ඡේදයක් හෝ දෙකක් මගින් කතා හරය නිරාවරණය කිරීම.
- අසාධාරණයට භාජන වූ තැනැත්තාගෙන්, කතාවට වස්තු වන තැනැත්තාගෙන් හෝ ගැටලුව පිළිබඳ විශේෂඥයකුගෙන් ලබාගත් උද්ධෘතයක්.
- කතාවට වස්තු වන තැනැත්තාගේ ප්‍රතිචාරය. මෙයට කතාවේ වැදගත් තැනක් හිමි විය යුතුය.
- මහජනයා උනන්දුව දැක්විය යුත්තේ ඇයිද යන්න පැහැදිලි කරන, කතාවේ ප්‍රවෘත්තිමය වටිනාකම පිළිබඳ ඡේදයක්.
- ගවේෂණයෙන් දැනගත් වැදගත් කරුණු පිළිබඳව ලුහුඬින් කියැවෙන බුලට් ලකුණු.

මෙය ගැටලු සහිත බව පෙනී යා හැකි වුවද ඇත්තෙන්ම එය නිරායාසයෙන් ගලා යයි. උදාහරණයක් ලෙස, වයස්ගත රෝගී කිරිගවයන්ගේ කතාවේ හරය ගනිමු:

කලම්බො මක්රේකර්ස් සංවිධානය විසින් කරන ලද පිරික්සීමකට අනුව, ගැමි ජනතාව නගාසිටුවීමට උපකාර කිරීම සඳහා ඔවුන්ට නොමිලයේ එළුවන් සහ කිරි ගවයන් ලබාදීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පොරොන්දු වූ නමුදු ලබා දී ඇත්තේ රෝගී, වයස්ගත හෝ කිරි ලබා ගැනීමට හෝ මසට ගත නොහැකි තත්ත්වයක පසු වන දුර්වල ගවයන් සමූහයකි.

**කතාව නිරාවරණය කිරීම**. සම්මුඛ සාකච්ඡාවන්ගෙන් හා වාර්තාවන්ගෙන් පෙනී යන අන්දමට, කිරි සඳහා වැඩුණු දෙනුන් හා මස් සඳහා එළුවන් කොළඹින් පිටස්තර ගැමි පවුල් 400,000කට ලබාදීමට පොරොන්දු වෙමින්, පසුගිය දෙවසර තුළ දෙපාර්තමේන්තුව විසින් සිය 'නිරෝගී කිරිගව සහ එළු ව්‍යාපෘතිය' සඳහා රුපියල් මිලියන 1,000කට වඩා වැය කොට තිබේ.

**කතාව නිරාවරණය කිරීම.** එනමුදු මෙම සතුන් පරීක්ෂා කොට බැලීමේදී පෙනී යන්නේ, නියම බරින් අඩු, රෝගාතුර හෝ දුර්වල ගවයන් හා එළුවන් සමූහයක් සඳහා දෙපාර්තමේන්තුව ඉතා නොවටිනා මිලක් ගෙවා එකී සතුන් ගැමියන් අතර බෙදා දී ඇති බවයි. තවද, වාර්තාවලින් පෙනී යන්නේ මෙකී සතුන් සැපයූ එකම පුද්ගලයා සහ මෙම ව්‍යාපෘතිය පරිපාලනය කරන්නා අතර මූල්‍යමය සබඳතා පැවති බවයි.

**අසාධාරණයට බඳුන් වූ තැනැත්තාගේ ප්‍රකාශය.** නුවර ප්‍රදේශයේ දුගී ගොවියකු වූ සෝමපාල හේවගේ පවසන්නේ, සුළු පරිමාණ ණයක් වශයෙන් ක්‍රියාත්මක කළ මෙම වැඩසටහන නිසා තමාට තවත් වැඩිපුර මුදල් වැය කිරීමට සිදුවූ බවයි. ඔහු කියා සිටින්නේ, රජය රෝගී එළදෙනක තමාට ලබා දීම නිසා ඇයගේ ජීවිතය රැකගැනීම සඳහා පමණක් තමාට රුපියල් සිය ගණනක් ගෙවන්නට සිදුවූ බවයි.

හේවගේ තවදුරටත් මෙසේ කියයි:

"නැගිටගන්නත් බැරි ලෙඩ එළදෙනෙක් ගෙනත් දාලා ආණ්ඩුවෙ සේවකයො හිනා වෙවී වාහනේ එළවගෙන යන්න ගියා. එදා ඉඳලා අපට එළදෙනට බෙහෙත් දෙන්න සෑහෙන මුදලක් වියදම් කරන්න සිද්ධ වුණා. මගේ ළමයින්ට ඉස්කෝලෙ ඇඳුම්වත් අරන් දෙන්න සල්ලි නැහැ. උන්ට හරිහමන් දෙයක් කන්න දෙන්න විදියකුත් නෑ. විකුණගන්නත් බැරි තරමට එළදෙන කැහැටුගැහිලා."

**කතාවේ ප්‍රවෘත්තිමය වටිනාකම පිළිබඳ ඡේදය.** නව ආරක සුළු පරිමාණ ණය වැඩසටහන ගැන සලකන කල කිවයුත්තේ, කිරිගව සහ එළු ව්‍යාපෘතිය මධ්‍යම ආණ්ඩුවේ විශාලතම ග්‍රාමීය සුභසාධන වැඩසටහන වන අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අයවැයෙන් 1/3කට එය වගකියන බවය. දුගීභාවය 20%කින් අවම කරන බවට පොරොන්දු වෙමින් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා 2009දී මෙම ව්‍යාපෘතිය මහත් උත්සවශ්‍රීයෙන් ඇරඹුවේය. විශේෂඥයන්ගේ අදහස වන්නේ, මෙම ව්‍යාපෘතිය මගින් ග්‍රාමීය ප්‍රදේශ තුළ ජනාධිපතිතුමාගේ ජනප්‍රියභාවය ඉහළ නැංවුණු අතර, නැවත තෝරා පත් කරගැනීමේදී අතිවිශාල ඡන්ද ගණනකින් ජයග්‍රහණය ලබා ගැනීමට එය හේතුකාරක වූ බවයි.

**සොයාගත් කරුණු.** මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය විමර්ශනය කිරීම සඳහා කලම්බො මක්රේකර්ස් සංවිධානය රජයේ ලියකියවිලි දුසිම් ගණනක් පිරික්සා බැලුවේය. ගැමි පවුල් සිය ගණනක් මුණගැසී කතා බහ කළේය. තවද එළදෙනුන් සියයක් සහ එළුවන් සියයක් පරීක්ෂා කරන්නැයි ස්වේච්ඡා පශු වෛද්‍යවරුන්ගෙන් ඉල්ලා සිටියේය. එයින් සොයාගත් තොරතුරු මෙසේය:

- එළදෙනුන්ගෙන් 80%කටත් වඩා කිරි එරෙන වයස ඉක්මවා මහලු වූවෝය. එළුවන්ගෙන් 75%ක් විවිධ රෝගයන්ගෙන් පෙළුණු නිසා උන්ගේ මස් කෑමට නුසුදුසු විය. සත්තු සියලු දෙනාම පාහේ රජයෙන් නියම කළ බරට වඩා අඩු බරකින් යුක්ත වූහ.

- රජය, සෞඛ්‍ය සම්පන්න සතකු සඳහා ගෙවන මුදල මෙන් දෙගුණයක් වූ රුපියල් 500ක මුදලක් හැම සතකු වෙනුවෙන්ම ගෙවා ඇත.

- සතුන් සපයන එකම පුද්ගලයා කොළඹ සිමෙන්ති මෝලක මෙහෙයුම්කරුවෙකි. වැඩ සටහන් පරිපාලක පීටර් සිල්වා පදිංචිව සිටින්නේ ඉහත කී තැනැත්තාට අයත් නිවාස සංකීර්ණයක නිවසකය.

**ප්‍රතිචාරය.** සිල්වා විසින් කලම්බො මක්රේකර්ස් සංවිධානයේ සොයාගැනීම් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත. ඔහු කියන්නේ, 'යටිකූට්ටු දිනුමක් ලැබූ' මේ විවේචනාත්මක ක්‍රියාදාමය පිටුපස රාජපක්ෂ ජනාධිපතිවරයාගේ දේශපාලන විරුද්ධකරුවන් සිටින බවයි.

**ප්‍රතිචාරය.** තමාගේ නිවෙස් හිමියා මෙහි එකම සැපයුම්කරු බව ඔහු පිළිගත්තේය. මෙම සිමෙන්ති මුදලාලි මිල ගණන් ඉදිරිපත් කළ ආයතන 15 අතුරින් කොන්ත්‍රාත්තුව සඳහා පහළම මිල ගණන් ඉදිරිපත් කළ තැනැත්තා බවද ඔහු තවදුරටත් පැවසුවේය.

**කතාපොඩි ස්වරූපය.** පෙනී යන ආකාරයටම, කුඩා දර්ශනයකින් හෝ කතාවකින් ඇරඹී මෙම ගවේෂණාත්මක රචනය, ගැටලුව විචිත්‍රවත් කොට, අවසන ගැටලුව සාරාංශගතව දක්වන ප්‍රවෘත්තිමය වටිනාකම පිළිබඳ ඡේදයක් බවට වර්ධනය වෙයි. මෙම ස්වරූපයේදී සාමාන්‍යයෙන් බුලට් ලකුණු භාවිත නොකරන්නේ, එය දරදඬු ස්වභාවයෙන් අඩු, එමෙන්ම වැඩිපුර සාකච්ඡාමය ස්වරූපයක් වන බැවිනි. ජලයෙහි ෆ්ලුවොරයිඩ් ප්‍රශ්නය යොදාගනිමින් ඉදිරිපත් කරන උදාහරණයක් මෙහි දැක්වේ.

**කතාපොඩිය.** වයස නවයක දැරියක වූ සේපාලිකා, 'ඩයලිසිස් ප්‍රතිකර්මය' සඳහා තමන්ගේ වාරය එන තෙක් හලාවත ග්‍රාමීය රෝහලේ (Health Care Rural Hospital) වේදනාවෙන් වැතිරී බලා සිටී. සෑම සතියකදීම එකම කොරිඩෝරයේ මෙසේ බලා සිටීමට හුරු වී සිටින අෑ නළලට දහඩිය දමද්දී නිහඬව හිඳින්නීය.

**කතාපොඩිය.** වෛද්‍යවරුන් පවසන්නේ සේපාලිකාගේ වකුගඩු දැඩිලෙස හානි වී ඇති වගයි. එකම හේතුවක් නිසා, එනම් බීමට ලැබෙන ජලය නිසා දුස්සාධ්‍යව 'ඩයලිසිස් ප්‍රතිකාරය' සිදු කළ යුතු දුසිම් ගණනක් වූ ළමයින් අතුරින් සේපාලිකා එක් අයෙකි.

**කතාවේ ප්‍රවෘත්තිමය වටිනාකම පිළිබඳ ඡේදය.** පරීක්ෂණවලින් පැහැදිලි වන්නේ, ප්‍රජා ජල සම්පාදනයේ තිබෙන ෆ්ලුවොරයිඩ් ප්‍රමාණය, සේපාලිකා වැනි ළමයකුට පානය කිරීමට සුදුසු ජලයේ ඇති ෆ්ලුවොරයිඩ් ප්‍රමාණය මෙන් පස් ගුණයක් බවයි. තවද, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් කළ පරීක්ෂණයකින් පෙන්නුම් කරන්නේ ...

අවසන් කිරීම. නිතරම අමතක කරන්නක් නමුත් සාරාංශගත හැඳින්වීම තරම්ම අවසානයද වැදගත් වේ.

ගවේෂණාත්මක රචනය කතාවේ වැදගත්ම කරුණු එකින් එක රැස් කරගනිමින් ගොඩනැගෙන විට එය යම් නිගමනයක් කරා යොමු වේ. කතාව නිම වන තෙක්ම පාඨකයා/ප්‍රේක්ෂකයා ගවේෂණාත්මක වාර්තාකරුවා සමග රැඳී සිටියේ නම්, ඔහුට මනෝමය තිළිණයක් පුද කිරීමට වාර්තාකරුට වුවමනා වෙයි. ඔහු මෙය කරනුයේ, පාඨකයා තුළ මානසික තෘප්තියක් පිළිබඳ හැඟීමක් හෝ ඔහුගේ මොළයෙහි සදාකාලික ප්‍රතිරූපයක් ඇති කිරීමෙනි. නිතරම මෙය සඳහා කතාවේ මුල් කතාපොඩිය කරා පෙරළා යෑමට සිදු වෙයි. එසේ කර එය නිමාවට පත් කරයි.

ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රතිරූප. දැන් වෙන කවරදාකටවත් වඩා, ගවේෂණාත්මක වාර්තාකරුවන් සිය කතාව ඡායාරූප, කුඩා වීඩියෝ හා හඬ පට සහ ග්‍රාපික චිත්‍ර මගින් ඉදිරිපත් කිරීම ගැන කල්පනා කළ යුතුය. ප්‍රාදේශීය වාර්තාකරුවන්ද මෙයින් බැහැර කළ නොහැකියි. ශ්‍රී ලංකාවට සම්බන්ධ වෙබ් අඩවිවල බොහෝ කතන්දර පළ වන බැවින් මේ ප්‍රතිරූප හා ශබ්ද භාවිත කිරීම වැඩිවෙමින් පවතියි. මේ ප්‍රතිරූප තෝරා

ගැනීම, සැලසුම් කොට, කල්තියා සිතා මතා කළ යුතු කටයුත්තකි. බොහෝ විට දොරටුපාලයා පෙරමුණ ගන්නා නමුත්, සාමාන්‍යයෙන් හොඳම යෝජනා තිබෙන්නේ වාර්තාකරුවා අතය. ඉතා බලසම්පන්න දෘශ්‍ය මෙවලම් කිහිපයක් මෙසේය:

- **සිතියම්.** කිසියම් සිද්ධියක් ලියා විස්තර කරනවාට වඩා පහසුවෙන් ගූගල් සිතියම් මගින් එහි ස්ථානය සලකුණු කළ හැකිය. එමෙන්ම, ගැටලුව බලපවත්වන භූගෝලීය ප්‍රදේශය පහසුවෙන් පෙන්නුම් කළ හැකිය. උදාහරණයක් ලෙස: ජල දූෂණය ගැන. මෙමගින් සංසිද්ධීන් වැඩි දෘශ්‍ය භාවයකින් යුතුව සමූහගත කර, පුවත සිතේ ඇඳෙන අන්දමට ඉදිරිපත් කළ හැකිය.

- **ප්‍රස්තාර හා ග්‍රාපික චිත්‍ර.** කිසියම් කතාවකදී හෝගුවන්විදුලිය වැනි විකාශයකදී, තේරුම්ගැනීමට දුෂ්කර වන අයුරින් ඉලක්කම් ගොඩක් ඉදිරිපත් කරනවා වෙනුවට සංඛ්‍යාත්මක තොරතුරු පෙන්නුම් කළ හැකි අනගි ක්‍රමයකි.

- **ඡායාරූප.** තමාගේ කතාව සකස් කිරීමේදී ගවේෂණාත්මක වාර්තාකරුවකු මුල සිටම ඡායාරූප ශිල්පියකු සහාය කරගත යුතුය. ප්‍රධාන සම්මුඛ සාකච්ඡාවලදී සහ විශේෂයෙන් ම අභියෝගාත්මක සම්මුඛ සාකච්ඡාවලදී එකම ඡායාරූප ශිල්පියෙකු යොදාගැනීමට වගබලා ගත යුතුයි. ඡායාරූප ශිල්පියා ඔහුට භාර කටයුත්ත කිරීමට පමණක් සීමා නොවිය යුතු අතර, සිද්ධියේ නිරවද්‍යතාව පිළිබඳ ගැටලුවක් පසු කාලයක ඇති වුව හොත් ඔහු ඇසින් දුටු සාක්ෂිකරුවකු ලෙස වාර්තාකරුට සහාය විය යුතුයි. කිසියම් ව්‍යසනයකදී එම ව්‍යසනයට පෙර හා පසු තත්ත්වය ඡායාරූප මගින් විස්තර කළ හැකි නම් ඒ අතිශයින්ම නාට්‍යාකාරය.

- **වෙබ් ඉදිරිපත් කිරීම්.** දෘශ්‍ය හා ශ්‍රව්‍ය ඵල එකතු කර දැක්විය හැකි මාර්ගයක් ලෙස වෙබ් අඩවි අතිවිශිෂ්ටය. 2011 සුනාමියෙන් ජපානයේ ප්‍රදේශ සෝදාපාළු වී ගිය ආකාරය ඉතා බලවත් දර්ශනවලින් දැක්වූ විලස, වාර්තාකරුවකුට වීඩියෝ ක්ලිප්ස් භාවිත කරමින් කතාවක් ඉදිරිපත් කරන්නට පුළුවන.

## නවවැනි පරිච්ඡේදය

# 'අභියෝගාත්මක සම්මුඛ සාකච්ඡා'

බහුවිධ මූලාශ්‍ර සම්මුඛ සාකච්ඡාවට බඳුන් කර එකතු කරගත් දුසිම් ගණන් ලියකියවිලි සංවිධානය කර විශ්ලේෂණය කිරීමෙන්ද, ගොඩ නැගූ උපන්‍යාසය වෙනස් කර නැවත සකස් කිරීමෙන්ද, 'රක්ෂණ' කතා පුවත හෝ 'පුරුක' සැකසීමෙන්ද අනතුරුව ගවේෂණාත්මක වාර්තාකරුවා 'අභියෝගාත්මක සම්මුඛ සාකච්ඡාව' පැවැත්වීමේ අදියරට එළඹෙයි.

වාර්තාකරුවා තමා සොයාගත් කරුණු අදාළ පුද්ගලයා වෙතට මුහුණට මුහුණලා ඉදිරිපත් කර ඔහුගේ ප්‍රතිචාර ලබාගන්නා අවස්ථාව වන්නේ මෙයයි. එය අභියෝගාත්මක සම්මුඛ සාකච්ඡාව ලෙස හඳුන්වනු ලබන්නේ, එහිදී වාර්තාකරුවා බොහෝ විට නඩුවක චෝදනා ගොනු කරන නීතිඥයකුගේ ස්වරූපය ගන්නා බැවිනි. හෙතෙම ස්වකීය සාක්ෂි ඉදිරිපත් කරමින් ස්ථිරසාර පිළිතුරු ලබාගැනීමට වෑර දරයි.

මෙම ක්‍රියාවලිය වෙහෙසකර හා දෙපාර්ශ්වයම පරීක්ෂාවට ලක් කරවන්නක් වුවත් අභියෝගාත්මක සම්මුඛ සාකච්ඡා සෑම විටම ගැටුම්කාරී විය යුතු නොවේ. එය සත්‍ය වශයෙන්ම ජනමාධ්‍යවේදයේ උදාරතර අපේක්ෂාව, එනම් සාධාරණත්වය හා නිරවද්‍යතාව සපුරාලයි. අදාළ තැනැත්තාට කීමට ඇති දේ පිළිබඳව අවංක කුතුහලයක් පෙන්නුම් කරමින්, ස්වකීය ආවේග යටපත් කරගෙන 'පෙන්වන්න සහ කියන්න' යන්න ඉස්මතු කිරීම ඔස්සේ වාර්තාකරුට වුවමනා පිළිතුරු ලබාගත හැකි ය.

එහෙත් දකුණු ආසියානු මාධ්‍ය ආයතන තවමත් නිර්නාමික මූලාශ්‍ර පදනම් කරගෙන, චෝදනා කරුණු වශයෙන් වාර්තා කිරීමට උනන්දුවක් දක්වයි. නරකම තත්ත්වය නම්, චෝදනාවට ලක් වන පුද්ගලයන්ගේ හෝ ආයතනයේ ප්‍රතිචාරයක් නොමැතිව අයථා හෝ දූෂිත ක්‍රියා වාර්තා කිරීමයි. ඇතැම් විට මෙය, වාර්තාකරු බලධාරියා සෘජුව අභියෝගයකට ලක් කිරීමට හෝ පෞද්ගලිකව අපහසුතාවට පත් කිරීමට ඇති නොකැමැත්ත මත සිදු කරන්නක් විය හැකිය. සමහර විට මෘදු ගැටුමක් පවා, 'හොඳ නම' ආරක්ෂා කිරීමේ වැදගත්කම, වැඩිහිටියන්, බලවතුන් හා 'හොඳ අයට' වෙනස් ලෙස සැලකීම ආදි සංස්කෘතික පිළිගැනීම්වලට හරස් වෙයි. මූලික මිනිස් ස්වභාවයන්ට අනුව, ඇතැම් විට රළු ප්‍රතිචාර, කෝපාවිෂ්ට හැසිරීම්, නෛතික තර්ජන හා ප්‍රචණ්ඩත්වය පිළිබඳ තර්ජන නිසා වාර්තාකරුවන්ට සම්මුඛ සාකච්ඡා පැවැත්වීම අසීරු වෙයි.

නමුත් අභියෝගාත්මක ස්වරූපයේ සම්මුඛ සාකච්ඡාවක් මග හැරීම යනු වෘත්තීය වරදකි.

එමගින් කතා පුවත සම්පූර්ණ වීම මගහැරෙනවා පමණක් නොව, වාර්තාකරු සියල්ල නොදැන සිටින අවස්ථාවක එසේ නොවන බවට උපකල්පනය කිරීමක්ද වේ. බැලූ බැල්මටම පෙනෙන දූෂිත ක්‍රියාවකට අදාළව ඇතැම් විට අහිංසක නිදහසට කරුණක්, වාර්තාකරුට දක්නට නොලැබුණු සිහි කැඳවීමේ සටහනක් හෝ දැනගැනීමට නොලැබුණු නියෝගයක් තිබීමට පිළිවන. ඇතැම් විට අදාළ පුද්ගලයා වාර්තාකරුවාගේ සොයාගැනීම් තහවුරුකර වැදගත් උද්ධෘතයන් ලබාදීමටද ඉඩ තිබේ. විශාල කාලයක් හා ශක්තියක් වැය කර ගවේෂණාත්මක ව්‍යාපෘතියක් සම්පූර්ණ කරන ජනමාධ්‍යවේදියෙකුට, අභියෝගාත්මක සම්මුඛ සාකච්ඡාවක් මගහැර සිටීම යනු වෘත්තීය අකුසල කර්මයකි. විවිධ තර්ජනවලට මුහුණපාමින් බලවතුන්ගේ අයථා ක්‍රියා වාර්තා කිරීමට ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීහු විශාල පරිශ්‍රමයක් දරති. මේවා වාචික හා කායික තර්ජනවලට අමතරව සිරගත කිරීම් හා ද්වේෂසහගත නඩු පැවරීම් දක්වා වූ පුළුල් පරාසයක විසිර පවතී.

## සූදානම් වීම

සාර්ථක අභියෝගාත්මක සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික සාධක වන්නේ සූදානම හා වෘත්තීයභාවයයි.

සූදානම් වන්න. මතකය මත හෝ වාචාල කතා මත හෝ යැපෙන්නට නොයන්න. හැම විටම සියලු තොරතුරු ඒ පිළිබඳව නිපුණතාවක් ලැබෙන තුරු හදාරන්න. අදාළ පුද්ගලයා හමුවට ඉදිරිපත් කිරීම සඳහා පැහැදිලි (සලකුණු කළ හෝ මූලාශ්‍රය හඳුනාගැනීමට ඉඩ ඇති ඉඟිවලින් තොර) ලිපිලේඛන පිටපත් තෝරාගන්න. ප්‍රබල ලියකියවිලි කිහිපයක් තිබෙන විට, වාර්තාකරු පුළුල්ව කරුණු සොයා බලා ඇති බවත්, ඔහු/ඇය මුළා කිරීමට නොහැකි බවත් එත්තු යනු ඇත. එමෙන්ම, එමගින් නිහඬ බලවත් පණිවුඩයක් ලබා දෙයි. එනම්: අදාළ පුද්ගලයා බොරුවක් කියන්නේ නම් වාර්තාකරුට එය වැටහෙනු ඇති බවයි.

ලිවීම. ස්වකීය ඉලක්ක පුද්ගලයන්ගෙන් පිළිතුරු ලබාගැනීමට ලැබෙන්නේ ඇතැම් විට එක් වරක් පමණක් බව ගවේෂණාත්මක වාර්තාකරුවෝ දනිති. ඇතැම් විට එම පුද්ගලයන් සම්මුඛ සාකච්ඡාව නවතාදමන්නටත් පසු විපරම සඳහා කරන විමසීම් මගහරින්නටත් ඉඩ තිබේ. අමතක වීම නිසා කිසිවක් අත්හැරදැමීමට වාර්තාකරුවන්ට ඉඩක් නැත. ඔවුන් සිය ප්‍රශ්න ඉදිරිපත් කිරීමේදී ඉතා නිරවුල් විය යුතුය. එම නිසා, ගවේෂණාත්මක වාර්තාකරුවෝ ඔවුන්ගේ ප්‍රශ්න ලියා තබාගන්නවා පමණක් නොව, සිය ඉලක්කය විසින් ලබාදෙනු ඇතැයි අනුමාන කළ හැකි පිළිතුරුවලට පසුවිපරම් ප්‍රශ්න ද සකසාගනිති. ඒවා පිළිවෙළකට සංවිධානය කරගනිති. සම්මුඛ සාකච්ඡාව පිළිබඳව තනිවම හෝ වෘත්තීය මිතුරකු සමග පෙරහුරුවකද යෙදෙති. ප්‍රධාන පෙළේ මාධ්‍ය ආයතනවල නම්, ජනමාධ්‍යවේදීහු සම්මුඛ සාකච්ඡා පෙරහුරු සඳහා දින ගණන් වැය කරති. එසේ කරනුයේ, කිසිවිටකදීත් කලබල නොවීමටත්, ඇසීමට ඇති කිසිවක් මගහැරීම වළකනු පිණිසත්ය.

මරුවැල්. මෙය අපරාධ පරීක්ෂකයන් විසින්ද පොදුවේ යොදාගනු ලබන ක්‍රමයකි. සම්මුඛ සාකච්ඡාව ආරම්භයේදී, වාර්තාකරුවෝ තැතිගැන්මක් ඇති නොවන මෙන්ම කතාවට තීරණාත්මකද නොවන ප්‍රශ්න රාශියක් අසති. ඒ ඒවාට පිළිතුරු මොනවාදැයි පැහැදිලිවම දන්නා පසුබිමකය. මෙම ප්‍රශ්න කිරීම් එක්තරා ආකාරයකට අවංකභාවය පිළිබඳව සිදු කරන 'ලිට්මස් පරීක්ෂාවකි'.

සාකච්ඡාවට ලක් වන්නා බොරු පිළිතුරක් ලබා දුනි නම් ඔහු 'මරු වැලේ' පැටලී ඇත. එමගින්, ඔහුගේ පිළිතුරු එහෙම්පිටින්ම භාරගත යුතු නැති බවට අනතුරු ඇඟවීමක් වාර්තාකරුට ලැබේ. උදාහරණයකට: ග්‍රාමීය ප්‍රදේශයක ජලයේ ගුණාත්මක භාවය පිරික්සීම පිළිබඳව දිස්ත්‍රික්ක ඉංජිනේරුවා විසින්ම අත්සන් තැබූ ලියකියවිලි වාර්තාකරුට කල්තියා පරීක්ෂා කිරීමට ලැබී තිබෙන විටක, එම වාර්තා නිතිපතා ලැබෙනවාදැයි ඔහුගෙන් විමසීමට වාර්තාකරුට පුළුවන. ඔහු ඊට 'නැත' යනුවෙන් පිළිතුරු දෙන්නේ නම්, ඔහු විශ්වාස කළ නොහැකි බව පැහැදිලිය.

මූලික එකඟතා. සම්මුඛ සාකච්ඡාව පවත්වන්නේ ඉදුරාම වාර්තා කිරීම සඳහා බව ඊට සහභාගි වන්නා අවබෝධ කරගෙන සිටින බව තහවුරු කරගන්න. පසුබිම මත හෝ වාර්තාවෙන් පිට තොරතුරු ලබා ගැනීමට අභියෝගාත්මක සම්මුඛ සාකච්ඡාවලදී අවසර නොලැබේ. මාධ්‍ය පිළිබඳව තෙම්පරාදු වූ සමහර පුද්ගලයන් වාර්තාවෙන් පිට කෙරෙන කතා බහකට ඔබට ආරාධනා කිරීමට පුළුවන. ඒ වාර්තාකරු නම්මාගැනීමටත්, තමන්ට එරෙහිව ඔහු/ඇය දන්නා දේ මොනවාද දැනගැනීම සඳහාත්ය. ඊට හසු නොවී දැඩිව සිටින්න. ඇතැම් විටෙක ඉලක්කගත පුද්ගලයා, කිසියම් 'ආකර්ෂණීය' යමක් කියා "එය කීවේ වාර්තාවෙන් පිට" යැයි කීමට පුළුවන. එවැනි මොහොතක ඊට එකඟ විය නොහැකි බව එකහෙළාම ප්‍රකාශ කරන්න. "කණගාටුයි, අපගේ එකඟතාව සියලු දේ වාර්තා කිරීමේ පදනම මත මේ සාකච්ඡාව කෙරෙන බවයි. ඔබ කියූ කරුණු මවිසින් භාවිත කරනු ලැබීමට ඉඩ තිබෙනවා" යැයි අවධාරණය කරන්න.

පටිගත කිරීමේ යන්ත්‍ර. විශේෂයෙන්ම පුවත්පත් වාර්තාකරුවන් අභියෝගාත්මක සම්මුඛ සාකච්ඡා සඳහා පටිගත කිරීමේ යන්ත්‍ර භාවිත කළ යුතුමය. විද්‍යුත් මාධ්‍යවල වාර්තාකරුවෝ නිතැතින්ම මෙය සිදු කරති.

සම්මුඛ සාකච්ඡාවක විද්‍යුත් පටිගත කිරීමක් සිදු කිරීමට හේතු කිහිපයකි.

- සාක්ෂි. පළමු සහ ප්‍රධාන දෙය නම් පටිගත කිරීමක් මගින් කුමක් කෙසේ කීවේද යන්න පිළිබඳ බලගතු සාක්ෂියක් සැපයේ. පටිගත කරගත් අදහස්වලින් රිසි කොටස් පමණක් පළ කර නොමග යැවීමක් නොකරන්නේ නම්, එමගින් ඉලක්කගත පුද්ගලයන් තමන් වැරදි ලෙස උපුටා දැක්වූ බවට හෝ තමා එවැන්නක් නොකී බවට කීමට ඇති ඉඩ කඩ ඇහිරේ. අවශ්‍ය වුව හොත් පටිගත කිරීම උපයෝගී කරගෙන සාක්ෂියක් ලෙස සාකච්ඡාවේ පිටපත පළ කිරීමටද මාධ්‍ය ආයතනයට අවස්ථාව තිබේ.

- නිදහස. පටිගත කිරීම, සටහන් ලියාගැනීම නිසා ඇති විය හැකි ව්‍යාකූලතාවෙන් සම්මුඛ සාකච්ඡාව මෙහෙයවන වාර්තාකරු හා ඊට බඳුන් වන ඉලක්කගත පුද්ගලයා මුදා ලයි. එය වාර්තාකරුට මානසික ඒකාග්‍රතාවෙන් සාකච්ඡාව තුළ රැඳී සිටීමටත්, අනෙක් තැනැත්තා කෙරෙහි නිරන්තර අවධානය යොමා සිටීමටත්, පසු විපරම් ප්‍රශ්න මතු කිරීමටත් ඉඩ සලසයි.

- ප්‍රායෝගිකත්වය. පටිගත කරගන්නා හඬපටවලින් MP3 හඬපට තනාගෙන ගුවන් විදුලි හා වෙබ් විකාශන සඳහා භාවිත කළ හැකිය.

වැදගත්: පටිගත කිරීමේ යන්ත්‍රය විශ්වසනීයව ක්‍රියාත්මක වන බවටත්, දෝෂ රහිත බවටත් වගබලාගන්න.

විනාඩි 90ක ධාවන කාලයක් ඇති කැසට් පට යෙදිය හැකි පටිගත කිරීමේ යන්ත්‍ර භාවිත කිරීමට වාර්තාකරුවන්ට නිර්දේශ කෙරේ. මිනි කැසට් යොදාගන්නා, සාක්කුවේ ගෙන යා හැකි කුඩා ප්‍රමාණයේ යන්ත්‍ර භාවිත කිරීමෙන් වළකින්න. ඒවායේ දෝෂ මතු වීමට ඇති ඉඩකඩ වැඩිය. හිර විය හැකිය. ඇනහිටිය හැකිය.

අභියෝගාත්මක සම්මුඛ සාකච්ඡාවක් පවත්වා සියලු දේ මතු කරගෙන, ප්‍රධාන කරුණු අකමැත්තෙන් හෝ පිළිගෙන නැතිනම් ඒවා ගැන කරුණු දක්වා තිබූ අවස්ථාවක, පටිගත කිරීමේ යන්ත්‍රය හිර වී ඇති බව පසුව පෙනී ගියහොත් ඊට වඩා සිදු විය හැකි නරක දෙයක් නැත. එනිසා සම්මුඛ සාකච්ඡාව අතරතුර නිතර පටිගත කිරීමේ යන්ත්‍රය පරීක්ෂා කරන්න. නැතිනම් වඩාත් ආරක්ෂිත වීමට අතිරේක පටිගත කිරීමේ යන්ත්‍රයක් භාවිත කරන්න.

## වෘත්තීයභාවය

පටිගත කිරීම. අවසර ඉල්ලීමෙන් වළකින්න. සම්මුඛ සාකච්ඡාව පටිගත කරන බව ඊට සහභාගි වන්නාට දන්වා පටිගත කිරීමේ යන්ත්‍රය විවෘතව පෙනෙන ලෙස තබන්න. ආරම්භයේදීත් සාකච්ඡාව අතරතුරදීත් එය නිවැරදිව ක්‍රියාත්මක වන්නේදැයි වරින් වර පරීක්ෂා කර බලන්න. සම්මුඛ සාකච්ඡාවට ලක් වන පුද්ගලයාට එය අතපත ගෑමට ඉඩ නොදෙන්න. ඔහු ඊට උත්සාහ දැරුවොත් ඊට විරෝධය දක්වන්න: "මා ඔබගේ කාර්ය උපකරණ අතපත ගාන්නේ නැති නිසා, කරුණාකර මගේ දෑ අතපත ගෑමෙන් වළකින්න."

කාර්යයට ඇලී සිටින්න. සම්මුඛ සාකච්ඡාව තුළදී තර්ක කිරීමටත්, විවාද කිරීමටත්, තම තත්ත්වය ප්‍රදර්ශනය කිරීමටත් යෑමෙන් වළකින්න. සම්මුඛ සාකච්ඡාව තුළ පවතින උද්වේගී ගතිස්වභාවය හොඳටම ප්‍රමාණවත්ය. සිනා සීමෙන්, ඇනුම්පද කීමෙන්, තර්ජනය කිරීමෙන් හා ප්‍රශ්න ඉදිරිපත් කිරීම් මැද සිදුකරන බාධා කිරීම්වලින් වාර්තාකරුගේ ඒකාග්‍රතාව බිඳීමට සම්මුඛ සාකච්ඡාවට බඳුන් වන තැනැත්තා උත්සාහ කරනු ඇත. ඊට හසු නොවන්න. එය රාජකාරියයි. කාරණයට අදාළව කටයුතු කළ යුතු නමුත් කරුණු විමසීම සඳහා ප්‍රමාණවත් තරමට විවෘත වන්න. සාකච්ඡාවට බඳුන් වන්නාද ක්‍රමයෙන් ඒ අනුව විවෘත වනු ඇත.

වචන හැරුණු විට. මිනිසුන්ගේ අංග චලනයෙන්, හැඟීම්වලින්, අක්ෂි චලනයන් මගින්, පැකිලීම් මගින්, ඉඟි පිට වන ප්‍රකාශ මගින් (මිනිසුන්ගේ යටි සිතේ තැන්පත්ව ඇති සත්‍ය කරුණු හදිසියේ, නොදැනුවත්වම කටින් එළියට පනින අවස්ථා ඇත) බොහෝ දේ කියවේ. පටිගත කිරීමේ උපකරණය සම්මුඛ සාකච්ඡාවට බඳුන්වන්නා දෙන වාචික පිළිතුරු පටිගත කරගන්නා බැවින්, සියුම් ප්‍රශ්නවලට පිළිතුරු දෙද්දී ඔහුගේ අනෙකුත් ඉහත කී ප්‍රකාශන හරහා කියවෙන දෑ සටහන් කර ගැනීමට වාර්තාකරුට ඉඩ ලැබේ. හැඟීම් යනු තොරතුරු ය. සම්මුඛ සාකච්ඡාවට බඳුන් වන්නා සිය හඬ වැඩි කරයිද?, මේසයට ගසයිද?, හඬයිද?, බියාදුව හැකිළේද?, වරින් වර නවතියිද?, කෑගසයිද?, සම්මුඛ සාකච්ඡාව නවත්වයිද? මේ සියල්ල වාර්තා කළ හැකි තොරතුරුය.

සටහන් තබාගැනීම. පටිගත කිරීමේ යන්ත්‍රයක් භාවිත කරන නමුදු වාර්තාකරු සරල සටහනක් තබාගැනීමට කටයුතු කිරීම සුදුසුය. වැදගත් යමක් කී විට හෝ ප්‍රතිචාරයක් දක්වන ලද ආකාරය විස්තර කිරීමට හෝ පසු විපරම් ප්‍රශ්න ලෙස සිතට එන දෑ සටහන් කරගැනීමට එසේ කළ හැකිය. නමුත් සටහන් තබා ගැනීම

කළ යුත්තේ අවම වශයෙනි. එමෙන්ම, වාර්තාකරු තමන් සටහන් කරගන්නා දෙය කුමක්දැයි හැඟී නොයන ආකාරයට, එකවර එය සිදු නොකර, තත්පර කිහිපයක් ගත කර සිදු කිරීම යෝග්‍යය. වාර්තාකරු එකවරම සම්මුඛ සාකච්ඡාවට ලක්වන්නා කියූ ආකර්ෂණීය යමක් සටහන් කරගැනීමට යුහුසුලු වුව හොත් ඔහු තමන් කියන්නට යන දේ ගැන යළි සිතා බලා එසේ නොකියා සිටීමට ඉඩ ඇත.

නිහඬතාව. සෑම වාර්තාකරුවකුම මේ මොහොත කුමක්දැයි දනී. සම්මුඛ සකච්ඡාවට ලක් වන තැනැත්තා කතාව නවතා රවා බලා සිටී. නිහඬතාව නුහුරු හා අසහනකාරී තත්ත්වයක් සෑම අයකුටම ඇති කරයි. සාමාන්‍යයෙන් මෙවැනි අවස්ථාවල වාර්තාකරු හිස්තැන් පිරවීමට කලබල වෙයි (ප්‍රශ්නයට පිළිතුරු තමාම දීම හෝ කිසියම් ප්‍රකාශයක් කිරීම මගිනි). එසේ කිරීමෙන් වළකින්න.

නිහඬතාව මනාව යොදාගැනීමෙන් අදාළ පුද්ගලයා තවත් වැඩිදුර කතා කිරීමට පෙලඹවීමට පුළුවන. ඔහු අපැහැදිලි හෝ අසම්පූර්ණ හෝ ප්‍රකාශයක් කළ විට, තත්පර කිහිපයක් නිහඬව සිට “මට වැටහුණේ නැහැ”, නැති නම් “ඔබ අදහස් කළේ කුමක්ද?”යි සරලව විමසන්න. යළිත් බලා සිටින්න. නමුත් තත්ත්වය තව දුරටත් රවා බලා සිටීමට පමණක් සීමා වන්නේ නම් ඊළඟ ප්‍රශ්නයට යොමු වන්න.

ප්‍රතිරාව. අභියෝගාත්මක ස්වරූපයේ සම්මුඛ සාකච්ඡාවලදී, අදාළ පුද්ගලයාට ඉදිරිපත් කරන ප්‍රශ්නවලට ඔහුගේ සන්නිවේදන උපාය ශිල්පියා පිළිතුරු දීමට පුළුවන. එවැනි අවස්ථාවල, එම ප්‍රශ්නය සම්මුඛ සාකච්ඡාවට ලක් කරන තැනැත්තාට යළිත් වරක් ආචාරශීලීව යොමු කර “එය ඔබගේත් අදහසද?”යි නැති නම් “ඔබට දැනෙන්නේත් එලෙසද?”යි අසන්න.

සන්නිවේදන උපාය ශිල්පීහු. ඉහළ පෙළේ රජයේ නිලධාරීන් සහ රාජ්‍ය ආයතන සාමාන්‍යයෙන් නිල ප්‍රකාශකයන් හෝ බාහිර මහජන සම්බන්ධතා නිලධාරීන් ගවේෂණාත්මක වාර්තාකරුවන් හා තමන් අතර බෆරයක් හා පලිහක් ලෙස යොදාගනී. මෙවන් උපාය ශිල්පීහු වැදගත්කමින් අඩු ප්‍රශ්නවලට පිළිතුරු ලබාගැනීම සඳහා යෝග්‍ය වන නමුත්, අදාළ ඉලක්කගත පුද්ගලයන් වෙනුවට ඔවුහු ආදේශකයෝ නොවෙති.

සන්නිවේදන උපාය ශිල්පීන්ගේ ප්‍රධාන කාර්යයක් වන්නේ ස්වකීය ස්වාමියා වෙත යොමු විය හැකි දෑ පිළිබඳව ඔහු කල්තියා දැනුම්වත් කර සූදානම්ව තැබීමයි. එය එක් අතකට ප්‍රයෝජනවත්ය. ස්වාමියා ඔහුගේ උදව්වෙන් සොයාගන්නා ලිපිලේඛන හා වෙනත් තොරතුරු ගවේෂණාත්මක වාර්තාකරුවන්ටද ප්‍රයෝජනවත්ය. නමුත් බොහෝ විට එය උපායශීලී ප්‍රයෝජනය සඳහා කරන්නකි. මෙම උපාය ශිල්පීහු සම්මුඛ සාකච්ඡාවට බලාපොරොත්තු වන ප්‍රශ්න ලිඛිතව දෙන්නැයි වාර්තාකරුගෙන් ඉල්ලති. ඊළඟට සිය ස්වාමියා වෙනුවෙන් ඊට දිය යුතු පිළිතුරු පිළියෙළ කරති. ඇතැම් විට, අදාළ ප්‍රශ්න නිසා ඇති විය හැකි නරකම තත්ත්වයන්ට කෙසේ මුහුණ දිය යුතුදැයි ලියා දක්වති. ඊළඟට මෙම තරගය, වාර්තාකරුගේ සොයාගැනීම් බිඳදමන්නේ හෝ සමනය කරන්නේ කෙසේද යන්න සැලසුම් කිරීමට යොමු වෙයි.

අභියෝගාත්මක ස්වරූපයේ සම්මුඛ සාකච්ඡාවට බඳුන් කරන්නේ කුමන කරුණුදැයි යන්න හෝ සමහර විට ඊට අදාළ ප්‍රශ්න කිහිපයක් පවා, සාකච්ඡාවට බඳුන්වන්නා වෙත කලින් යොමු නොකර සිටීම බොහෝ විට අසීරුය. අවසානයේදී වාර්තාකරු සාකච්ඡාවට බඳුන් වන්නාට සාකච්ඡාවට ගනු ලබන්නේ කවරේදැයි යන්න පිළිබඳ

හොඳ අවබෝධයක් ඇතිදැයි විපරම් කර බැලිය යුතුය. මෙය ශ්‍රී ලංකාව වැනි සමීප බැඳීම් සහිත සමාජයකට බෙහෙවින් සත්‍ය වූවකි. නමුත්, ගවේෂණාත්මක වාර්තාකරුවා සිය සාරය පිටාර ගැලීමට සැලැස්විය යුතු බව හෝ තමා සොයාගත් වැදගත්ම තොරතුරු හෙළි කළ යුතුය යන්න මින් අදහස් නොකෙරේ. හොඳ හිත පළ කිරීමක් වශයෙන්, ඇසීමට අපේක්ෂා කරන ප්‍රශ්නවල නියෝජනයක් යොමු කිරීම සිදු කළත්, වඩාත් වැදගත් ප්‍රශ්න වාර්තාකරු තමා වෙත රඳවාගත යුතු ය. සාමාන්‍යයෙන් සාකච්ඡාවට ලක් කිරීමට යන තේමා මොනවාදැයි සන්නිවේදන උපායශිල්පීන්ට දන්වා තිබීම ප්‍රමාණවත් ය.

## අනතුරුව

ඔබගේ මනස සැහැල්ලු කරගන්න. සමහර වාර්තාකරුවන්ගේ නිර්දේශය නම් වහාම කාර්යාලයට පැමිණ පටිගත කරගත් දෑ පිටපත් කළ යුතු බවයි. නමුත් අප කල්පනා කරනුයේ කැලඹුණු සිතුවිලි නිසල වීමට කාලයක් අවශ්‍ය බවයි. අභියෝගාත්මක සම්මුඛ සාකච්ඡා පැටලිලි සහිත විය හැකි ය. සාකච්ඡාවට බඳුන් වන්නා සපයන පරස්පර විරෝධී පිළිතුරු හා කාරණයෙන් පිට පනින ප්‍රතිචාර මීට හේතුවයි. ඒ අතර, වාර්තාකරුගේ මනස, නිරීක්ෂණවලින් හා පසු විපරම් ප්‍රශ්නවලින් පිරී තිබේ. සාකච්ඡාවෙන් මතු වූ කරුණුවල සමස්ත වැදගත්කම මේ ඔස්සේ පහසුවෙන් මගහැරීමට පුළුවන. ලැබුණු සමහර වඩාත්ම ආක්‍රමණශීලී නොවන පිළිතුරු ගැන නැවත සිතා බැලීමේදී ඒවාද වාර්තාවට සාධක විය හැකිය. ඒ නිසා, කාලය තිබේ නම් දිනක් හෝ කිහිපයක් සැහැල්ලුවෙන් සිට මනස නිරවුල් හා සන්සුන් කරගැනීම වාර්තාකරුට වාසිදායකය. ව්‍යාපෘතියේ වෙනත් පැතිකඩක් හෝ වාර්තාවට මුළුමනින්ම පරිබාහිර වෙනත් වාර්තාවක් ගැන ඔහුට/ඇයට අවධානය යොමු කළ හැකිය.

අත්පිටපත් කිරීම. වෙහෙසකර කටයුත්තක් වුවත් මෙය අතිශයින්ම තීරණාත්මක හා ඥානය උපදවන්නක් වේ. සම්මුඛ සාකච්ඡාවේදී ඊට ලක් වූ පුද්ගලයා පළ කළ සෑම වචනයක් පාසාම ලියා පිටපත් කරගැනීම/ටයිප් කරගැනීම වාර්තාකරු විසින්ම සිදු කළ යුතුය. වැදගත් උද්ධෘත තද කළු පැහැති අකුරින් පසු විපරම් සඳහා සලකුණු කළ යුතුය. සාකච්ඡාව අතරතුර අතින් සටහන් කරගත් දේ ලොකු අකුරින් වරහන් තුළ ලියා හෝ ටයිප් කරගත හැකිය.

## අදහස් නොදැක්වීම

සෑම කෙනෙක්ම අභියෝගාත්මක සම්මුඛ සාකච්ඡාවලට එකඟ නොවේ. ඇත්තෙන්ම බහුතරයක් එකඟ නොවනු ඇත. එහෙත් වෘත්තීය හා නෛතික හේතු මත, තම සොයාගැනීම් ඉදිරිපත්කර අදහස් ලබාගැනීම සඳහා තමන් සාධාරණ පරිශ්‍රමයක් දැරූ බව වාර්තාකරු පෙන්නුම් කළ යුතුය. එබැවින්, වාර්තාව ප්‍රකාශනයට හෝ විකාශයට පෙර වාර්තාකරු යහපත් චේතනාවෙන් එවැනි උත්සාහයන් තුන් වරක්වත් දැරිය යුතුය. යහපත් චේතනාව යනු දුරකථන ඇමතුමක් ගෙන ඇමතුම් නාද දෙකකට පසු අතහැරදැමීම නොවේ. වාර්තා කර තබාගැනීම සඳහා එම වෑයම් ලිඛිතව, දිනය හා වේලාව සහිත මුද්‍රා ඇතිව කළ යුතුය. සම්මුඛ සාකච්ඡාවක් සඳහා ලිඛිත ඉල්ලීමක් භාර දී, එය භාරගත් බවට නිල මුද්‍රාවක් නිලධාරියාගේ ලේකම්වරයාගෙන් හෝ වෙනත් අදාළ නිලධාරියකුගෙන් ලබා ගත යුතුය. නැති නම්, ඊමේල් පණිවුඩයක් මගින් දන්වා එහි පිටපතක් ව්‍යාපෘති ලේඛනයක් ලෙස සුරක්ෂිතව තබාගත යුතුය. එමගින්, තමාගේ ප්‍රතිචාරයක් ලබා නොගෙන වාර්තාකරණය කළ බවට අදාළ පුද්ගලයාට ගතු කීමට ඉඩක් නොලැබෙනු ඇත.

## දසවැනි පරිච්ඡේදය

# හරිවැරදි බැලීම හා සංස්කරණය

ගවේෂණාත්මක වාර්තාකරු අඩුලුහුඬුකම්වලින් තොරව ස්වකීය වස්තුබීජය පරිපූර්ණ ලෙස ඉදිරිපත් කිරීමට උත්සාහ දරන්නකු විය යුතුය.

වාර්තාකරුවන් තමන් කළ හරි දෙය නොව වැරදි දෙය නිසා අමාරුවේ වැටෙන බව ඔවුහු දනිති. අකුරු වැරදීමකට, දිනය වැරදීමකට, වැරදි උපුටා දැක්වීමකට හෝ අතිශයෝක්තියෙන් කරුණු දැක්වීමකට වුවද මාධ්‍යවේදියාගේ ප්‍රතිරූපය බිඳවැටී වෘත්තීය ගරුත්වය කෙලෙසිය හැකිය.

ගවේෂණාත්මක ව්‍යාපෘති ඉතා සැකිලිමත්ව පරීක්ෂා කළ යුත්තේ ඒ නිසාය. සෑම දෙයක්ම දෙවතාවක් හෝ තුන්වතාවක් වුවද පරීක්ෂා කළ යුතුය. සත්‍ය වචනය මගහැර යෑම් හෝ වාර්තාව තුළදී උපකල්පන කිරීම් නොතිබිය යුතුය. ඉතා දැඩි ලෙස නැවත නැවත පරීක්ෂා කිරීමත්, ඉතා දැඩි ලෙස සංස්කරණ කටයුතු කිරීමත් මගින් මෙවැනි ගුණාත්මක පාලනයක් කළ හැකි වනු ඇත. ඇමරිකාවේ ප්‍රධාන පුවත්පත්වල ප්‍රධාන ගවේෂණාත්මක ව්‍යාපෘති, මට්ටම් කිහිපයක සංස්කරණ කර්තෘවරුන්ගේ පරීක්ෂාවට ලක් වන අතර, ලියන්නන් ගණනාවක් විසින් නැවත නැවතත් ලියනු ලැබේ. *නිව් යෝකර්* සඟරාව ආක්‍රමණශීලී හරිවැරදි බලන්නන් සේවයේ යෙදවීමට ප්‍රසිද්ධය. සෑම නොගැළපීමක් ම, සෑම අවධාරණය කිරීමක් ම සහ සෑම උපුටා දැක්වීමක්ම ප්‍රශ්න කිරීම ඔවුන්ගේ කාර්යයයි. සමහර ශ්‍රී ලාංකික ප්‍රකාශනයන්ද මෑතකදී හරිවැරදි බලන්නන් යොදාගෙන ඇත.

ඊනියා 'විනිශ්චයකාර' (forensic) සංස්කරණය දීර්ඝ සහ වේදනාකාරී ක්‍රියාවලියක් විය හැකිය. පළමුවන වටයේදී, වාර්තාකරුගේ ආසන්නම කර්තෘවරයා සෑම සිද්ධියක්ම අභියෝගයට ලක් කරයි. "ඔබ මෙය දන්නේ කෙසේද?"යි වාර්තාකරුගෙන් ප්‍රශ්න කරයි. සනාථ කිරීම සඳහා, සටහන්ද පටිගතකිරීම්ද ලියකියවිලිද ඉල්ලුම් කරයි. තොරතුරුවල ගුණාත්මක භාවය තක්සේරු කිරීම සඳහා, සමහර විට කර්තෘවරයාට නිර්නාමික මූලාශ්‍රවල අනන්‍යතාව ද අවශ්‍ය වනු ඇත.

කතාව ප්‍රවෘත්ති කාමරයේ එක් එක් අංශ ඔස්සේ නියෝග දාමය පසු කරමින් ඉදිරියට යන විට, සෑම සංස්කරණ කතුවරයකු විසින්ම තම යෝජනා සහ නිරීක්ෂණයන් පදනම් කර ගෙන එය කිරා මැන බලනු ලැබේ. අරමුණ වන්නේ ඔපවත් සහ සැබෑ ලෙසම නිවැරදි කතාවකි. අවසානයේදී, සමහර විට ප්‍රවෘත්ති ආයතනයේ නීති නිලධාරියා එය නීතිය මගින් අභියෝගයට ලක් විය හැකිදැයි සමාලෝචනය කර, එවැනි ඉඩප්‍රස්තා අවම කිරීම සඳහා වෙනස් කිරීම් යෝජනා කිරීමට ද පිළිවන.

කෙසේ නමුත්, සිදුවිය යුතු නියම ක්‍රමය එයයි. යථාර්ථය නම් ප්‍රාදේශීය වාර්තාකරුවන්ට මෙවැනි සංස්කරණ පහසුකම් නොතිබීමය. ගවේෂණාත්මක රචනය නිකුත් කිරීමට සුදුසු තත්වයේ පවතීදැයි සහතික කරගැනීම සඳහා තමා විසින්ම තදබල විවේචනයක යෙදීමට ඔවුන්ට සිදු වේ. පහත සඳහන් කරුණු ගැන සැලකිලිමත් වන්න:

- අංක සහ නම්. මාධ්‍යවේදීන් නිවැරදි අංක සටහන් කිරීම ගැන සැලකිලිමත් නොවන බව කුප්‍රකටය. ගවේෂණාත්මක වාර්තාකරුවන්ට එවැනි දුර්වලතාවක් නොතිබිය යුතුය. සෑම අංකයක්ම තුන්වතාවක් පරීක්ෂාකර නිවැරදිභාවය සනාථ කරගත යුතුය. එක්තරා ඇමරිකානු වාර්තාකරුවකු තම වාර්තාවන් රතු පැන්සලක් උපයෝගි කරගෙන පරීක්ෂා කරන අතර, සෑම අංකයක්ම රවුම් කරනු ලැබේ. නැවත ගණනය කිරීමෙන් සහ පරීක්ෂා කිරීමෙන් පසු ඒවා කපාහරිනු ලැබේ. නම් සම්බන්ධයෙන්ද වාර්තාකරුවන් එවැනි සැලකිල්ලකින් කටයුතු කළ යුතුය. ඒවායේ අකුරු වරදවා ලිවීමෙන්, වාර්තාවේ විශ්වසනීයත්වය නැතිවී දෝෂ දර්ශනයට ලක් විය හැකිය.

- කතා ධ්වනිය. ප්‍රවෘත්ති වාර්තාකරු හෝ ප්‍රවෘත්ති ආයතනය බොහෝ විට දුෂ්කරතාවට පත්වන්නේ, කතා ධ්වනිය හරියාකාරව ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම නිසාය. මේ නිසා, ප්‍රවෘත්ති අන්තර්ගතය ඉදිරිපත් කරන ආකාරය ඉතා වැදගත් වේ. ගවේෂණාත්මක වාර්තාකරු තම රාජකාරිය හරියට කළේ නම්, සොයාගනු ලැබූ වැරදි නිරායාසයෙන් පෙන්වා දිය හැකිය. 'ප්‍රධාන', 'දරුණු', 'තැති ගන්වන', 'පුදුම කරවන' ආදි උද්වේගකාරී වචන යෙදීමෙන් වැළකිය හැකිය. ARIJ අත්පොත අවධාරණය කර සිටින්නේ, හරිවැරදි බැලීමේදී වාර්තාවල ඇති 'චිත්තවේගික හිංසාකාරී' අදහස් දෙන වචන ඉවත් කළ යුතු බවය.

- සන්දර්භය. සම්මුඛ සාකච්ඡාවේ දී සටහන් කරගත් සම්පූර්ණ කරුණු නොදක්වා ආකර්ෂණීය උපුටාගැනීම් හුවාදැක්වීමට වාර්තාකරුවන් පෙලඹිය හැකිය. මෙම කෙටි මාර්ගය අනුගමනය නොකරන්න. අපවාද කිරීම පසෙකලා ලියකියවිලි සහ සම්මුඛ සාකච්ඡා ඇති සැටියෙන්ම දක්වන්න. එසේ නොමැති වුව හොත්, වැරදි ලෙස උපුටා දැක්වීමේ චෝදනාව මත සම්පූර්ණ වාර්තාවම සැකයට බඳුන් වීමට පිළිවන.

- සාධාරණත්වය. මාධ්‍යවේදියා කිසියම් ඉලක්ක පුද්ගලයෙකු පෙරදැරි කරගෙන ඉදිරිපත් කළ වාර්තාවකට ඔහුගෙන් විවේචන කිහිපයක් එල්ල වුව හොත්, බොහෝ ප්‍රවෘත්ති ආයතන ඒවා බහාලන්නේ දීර්ඝ, චෝදනාත්මක වාර්තාවේ අවසන් ඡේද කිහිපයෙහි ය. මෙයට සමාවක් දිය නොහැකිය. වාර්තාකරුවන් සහ කතුවරුන් එවැනි උපුටාදැක්වීම් කතාව හෝ විකාශය තුළ ඉහළට ගෙන, ඒවාට නිසි තැන ලබාදීමට කටයුතු කළ යුතුය.

- ප්‍රතිවාදනය. නිවැරදිතාව උපරිම කර, පැමිණිලි අවම කර, විධිමත් වාර්තාවක් ලබාගැනීම සඳහා මෙම ක්‍රමය උචිතය. විශිෂ්ට ගවේෂණාත්මක වාර්තාකරුවෝ තමන් පටිගත කරගත් දෑ මූලාශ්‍රවලට හා ඉලක්ක පුද්ගලයන්ට යළි වාදනය කර පෙන්වති. වචන යොදා ඇති අන්දම පිළිබඳව කෙස් පැලෙන තර්ක ඉදිරිපත් කිරීමට ඔවුන්ට අවශ්‍ය වුවත්, මෙම ක්‍රමය බොහෝ දෙනෙක් අගය කරති.

ඔබ සැබවින්ම වරදවා වටහාගෙන ඇතැයි ඔබට ඒත්තු නොයන්නේ නම් හෝ ඔබ ටේප් පටියෙන් ඔබට වුවමනා දේ පමණක් උපුටා නොගත්තේ නම් එවැනි තර්ක කිරීම්වලට නොයන්න. මූලාශ්‍ර ඉතා වැදගත් වුවද ඔවුහු 'කතා අනුමත කරන්නෝ' නොවෙති.

- නීතිඥයකු ලෙස ක්‍රියා කිරීම. විශේෂ සංවේදී බවක් සහිත වාර්තාවලදී, තම වාර්තාව නීතිමය කටයුතුවලින් ආරක්ෂා කරගැනීමට ගවේෂණාත්මක වාර්තාකරුවා බෙහෙවින් සැලකිලිමත් වෙයි. ඔහු තමන් සතු අදාළ ලිපිලේඛන සංවිධානය කරන ආකාරය උදව් වන්නේ මෙහිදීය. සෑම කරුණකටම, සෑම සම්මුඛ සාකච්ඡාවකටම අදාළව ඔහු ළඟ ලිපි ගොනුවක්, අනුපිටපතක්, යොමුවක් හෝ ලේඛනයක් ඇත. ඒවායෙහි උචිත තොරතුරු යටින් ඉරි ඇඳ හෝ ඉස්මතු කර දක්වා ඇත.

නැවත ලියන්න, නැවතත් ලියන්න, නැවත නැවතත් ලියන්න. සත්‍යය ලිවීම සඳහා වෙහෙස වී කැප වීමෙන් වැඩකිරීම අවශ්‍යය.

එසේ කිරීමට හැකි වන්නේ, අතිරේක කටු සටහන් ගණනාවක් ලියා කතාව දක්ෂ ලෙස හැසිරවීමෙන්, වාර්තාව කපා කොටා හරිහැටි සකස් කරගැනීමෙන්, කරුණු එහාට මෙහාට මාරු කිරීමෙන්, වෙනස් කර යළි ලිවීමෙන් සහ ඔපවත් කර ගැනීමෙන්ය. ඔබ විශ්වාස කරන තරමටම ඔබගේ කතාව වැදගත් යැයි ඔබ සිතන්නේ නම්, එය හරිහැටි ඔප වීම සඳහා අඩුතරමින් දෙවරක් වත් එය නැවත ලියන ලෙස කතුවරයා ඔබට පවසනු ඇත. තවද, අනෙක් දොරටුපාලයන් අතිරේක වෙනස් කිරීම් කරන ලෙස, පැහැදිලි කිරීම සඳහා මෙහි අතිරේක පේළියක් ඇතුළත් කරන ලෙස ඔබට පවසනු ඇත.

*ලොස් ඇන්ජලිස් ටයිම්ස්* හි ප්‍රධාන ව්‍යාපෘතිවලදී, වාර්තාකරුවන්ට ඔවුන්ගේ කතා දස වතාවක්, සමහරවිට විසි වතාවක් ලිවීමට සිදු වීම එතරම් අමුතු දෙයක් නොවේ. ඒ ඒවා පරිපූර්ණ හා ඔපවත් වාර්තා බවට පත් කරවීම සඳහාය. බොහෝ ප්‍රවෘත්ති ආයතනවලට එතරම් කාලයක් මිඩංගු කළ නොහැකි වනු ඇත. නමුත් දෙතුන් වතාවක් වත් නැවත නැවත ලියන්නේ නම් යහපත් ප්‍රතිඵල ලබාගත හැකි බව පෙනී යනු ඇත. මූර්තියක් කලාත්මක ලෙස හැඩගන්වන හැටි සිතන්න. නැවත නැවත ලිවීම සමග උරන වන්නට එපා.

ඇසීම සහ බැලීම. වාර්තාකරු සිය කතාව මැනවින් දන්නා බැවින්, ඔහු තම වාර්තාව කියවන විට සිතින් එහි අඩු තැන් පුරවයි. නැති නම් වැරදි ඉබේම සාදාගනියි. මෙම මානසික නිවැරදි කිරීම වැළකීම සඳහා තමන්ටම හෝ සහෝදර සේවකයකුට ඇසෙන්නට ශබ්ද නගා එය කියවීම අවශ්‍ය වනු ඇත. වේදනාව ඇති කරමින්, තර්ක, භාෂාව සහ කාලය පිළිබඳ ගැටලු පැහැදිලි වනු ඇත.

ප්‍රවෘත්ති ආයතනයද ප්‍රධාන ගවේෂණාත්මක කතාවක් අඩු තරමින් ඇස් යුගල තුනකින්වත් කියවා බැලිය යුතුව ඇත. ඔවුන් නම්, වාර්තාකරුගේ සහෘද සේවකයන්, දොරටුපාලයන් සහ සමහරවිට කතුවරයාද විය හැකිය. කතාව බොහෝ අය කියවා බලන්නේ නම්, එය තර්ක හෝ කරුණු පිළිබඳ ගැටලු සොයාගැනීමට උදව්වක් වනු ඇත. සමහර මාධ්‍ය ආයතන, කාරණාකාරණ දත්, ඇසූ පිරූ තැන් ඇති පුද්ගලයන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ලෙස පත් කරගන්නේ කතා සැකිල්ලේ අඩුපාඩු සොයා බැලීමට හැකි වනු පිණිසය.

ප්‍රවෘත්තිය පිටවීමෙන් පසු. කිසියම් බලවත් අධිකාරියක් හෝ ආයතනයක් එක මාධ්‍ය පුවතකින් යටත් කළ නොහැකි විය හැකිය. ගවේෂණාත්මක මාධ්‍යකරණයේ අරමුණ වන්නේ වැඩි දියුණුව ඇති වන පරිදි වෙනසක් ඇති කිරීමයි. එය පද්ධතිමය වෙනසක් හෝ අපරාධ චෝදනාවක් හෝ විය හැකියි. එබැවින් සියලු වාර්තාකරුවන් තම වාර්තා සම්බන්ධයෙන් වගකිව යුතුය. කිසිම වාර්තාකරුවකු මුල් පුවත පළ වීමෙන් පසු ගිමන් නොහැරිය යුතුය.

ගවේෂණාත්මක වාර්තාකරු තම කතාවට 'රුකුල්දීම' සඳහා තමන්ට කළ හැකි සෑම දෙයම කළ යුතු වන්නේ, එය මහජනතාව අතර කතාවට භාජන වන මාතෘකාවක් විය හැකි නිසාය. එය වැදගත් සංවිධානයකට හෝ වැදගත් පුද්ගලයකුට විපාක ගෙන දෙන්නක් සහ සමාජ වෙනස් වීමකට හේතු වන්නක් විය හැකිය.

තම කතා ප්‍රවෘත්තීන්ට රුකුල්දීම සඳහා වාර්තාකරුවන් පහත පියවරයන් අනුගමනය කළ යුතුය:

- පසු විපරම් කතා. හොඳම ක්‍රමය නම් ගවේෂණාත්මක වාර්තාකරු තමා විසින්ම පසු විපරම් කතා ලිවීමයි. මෙම කාර්යය කිරීමේදී, වෙනස ඇති කිරීම සඳහා සහාය දීමට ඉඩ තිබෙන ගොදුරු වූ අයගෙන්, පුරවැසි කණ්ඩායම්වලින්, අසල්වැසි නායකයන්ගෙන්, සෞඛ්‍ය සංවිධානවලින් සහ රාජ්‍ය නොවන සංවිධානවලින් හෙළිදරව්ව සඳහා ලැබෙන ප්‍රතිචාර ගැන සැලකිලිමත් වීමෙන් ඔහුට මෙම 'තල්ලුව' ලබාගත හැකිය. එසේත් නැති නම්, වගකිව යුතු නිලධාරියකු එම හෙළිදරව්ව සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන බවට පොරොන්දුවක් ලබා දුන හොත් වාර්තාකරුට ඒ පිළිබඳව පසු විපරමක් ලිවිය හැකිය. නමුත් ඔහු එයින් නැවතිය යුතු නැත. කෙටි කාලයක් බලාසිටීමෙන් පසු, නිලධාරියා පොරොන්දුව ඉටු කළේදැයි සොයාබැලීම සඳහා පසු විපරමක් ලිවිය හැකිය. වාර්තාකරු සහ ඔහුගේ ප්‍රවෘත්ති ආයතනය මෙම ප්‍රවෘත්තිය සජීවී තත්ත්වයෙන් පවත්වාගෙන යාමට උනන්දු නොවන්නේ නම් කිසිවකු ඒ සඳහා උනන්දු නොවනු ඇත.

- කලින් දැනුම් දීම. පුරවැසි කණ්ඩායම්, ජාත්‍යන්තර සංවිධාන හෝ රජයේ නියාමකයන් මෙම ප්‍රවෘත්තිය පළවීමට දිනකට හෝ දෙකකට පෙර හමු වන්න. කතාව පිළිබඳ දළ විශ්ලේෂණයක් දෙන්න. ආකර්ෂණීය විස්තර නොපවසන්න. මේ මගින් පසු විපරම් කතාව සඳහා පසුබිමක් සකස්වන අතර, කතාව පිළිබඳ 'දූසමාන ආරංචි' පැතිරවීමට මෙය කදිම ක්‍රමයකි.

- ප්‍රචාරණය. ප්‍රවෘත්ති ආයතනයට සම්පත් තිබේ නම්, එය ලොකු කතා සහ කතා මාලා සඳහා බොහෝ විට ප්‍රචාරණයක් ලබාදෙයි. මෙය ප්‍රවෘත්ති ආයතනයේ කීර්තිනාමය වැඩි වීමටද ඉවහල් වේ.

- හමුවීමේ අවකාශය. ගවේෂණාත්මක වාර්තාකරුගේ කතාව හඹායෑම සඳහා අනෙකුත් ප්‍රවෘත්ති ආයතනවලට ඔහු හමුවීමට, කතාබහ කිරීමට අවස්ථාව සලසා තිබිය යුතුය.

## තෘතීය භාගය

# සංස්කාරකවරුන්ගේ සහ වාර්තාකරුවන්ගේ ආරක්ෂාව

## එකොළොස්වැනි පරිච්ඡේදය

# ගවේෂණාත්මක වාර්තාකරණ ව්‍යාපෘති කළමනාකරණය

ගවේෂණාත්මක මාධ්‍යකරණය කණ්ඩායම් ක්‍රීඩාවක් බඳුය. ඕනෑම ප්‍රවෘත්ති ආයතනයක් තුළ ඉතා දක්ෂ සහ මහත් චුවමනාවක් ඇති ක්‍රීඩකයන් සිටිය හැකිය. එහෙත් කළමනාකරු හෝ අයිතිකරු ඔවුන් තරගයට නොයොදවයි නම් කිසිවකු හෝ ජය ලබන්නේ නැත.

ඒ නිසා ශ්‍රී ලංකාවේ මාධ්‍ය දොරටුපාලයන්, කර්තෘවරුන් සහ මාධ්‍ය ආයතන හිමිකරුවන්, මෙම මාධ්‍යකරණ විශේෂයට අනුබලදීම ඔස්සේ සැලසෙන දීර්ඝකාලීන ප්‍රයෝජන හඳුනාගැනීම ඉතා වැදගත් වේ. ගවේෂණාත්මක මාධ්‍යකරණය මගින් සිවිල් සමාජයීය අත්‍යවශ්‍යතා, මාධ්‍යවේදී යහප්‍රතිපත්ති සහ ප්‍රවෘත්ති කළමනාකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලනු ලබයි. ගුණාත්මකභාවයට වඩා ප්‍රමාණාත්මකභාවයට වටිනාකමක් ලබාදෙන සංවර්ධනය වෙමින් පවතින මෙන්ම යුද සමයකින් පසු වාතාවරණයක් පවතින ශ්‍රී ලංකාව වැනි රටවල, ප්‍රවෘත්ති කාමරයේ පවත්නා සංස්කෘතිය වෙනස් කළ හැක්කේ මාධ්‍ය අයිතිකරුවන්ට සහ පරිපාලකයන්ට පමණි.

ARIJ අත්පොතේ විශිෂ්ට පෙරවදන ලියූ අල් ජසීරා රූපවාහිනී සේවාවේ ගවේෂණාත්මක ලියුම්කරු යොස්රි ෆවුඩා පහත නිරීක්ෂණය සිදු කරයි:

> ... මාධ්‍ය කර්මාන්තය පිළිබඳ දෘෂ්ටියෙන් බලන කල, ගුණාත්මකභාවය පිළිබඳ සංස්කෘතිය සමග අපගේ බොහෝ ප්‍රවෘත්ති ආයතනවලට එතරම් සමීපතාවක් නොපවතින බව පෙනේ. ඔවුන් වැඩි නැඹුරුවක් දක්වන්නේ ප්‍රමාණාත්මකභාවයටය. අනෙකුත් කරුණු අතර, ගුණාත්මකභාවය සඳහා ඉතා ඉහළ අධ්‍යාපනයකින් යුත් කළමනාකාරිත්වයක්, අඛණ්ඩ පුහුණුවක්, එකට බැඳුණු කණ්ඩායමක්, යථාර්ථවාදී අයවැයක් මෙන්ම - මම නිවැරදි යැයි සිතමි - කාලයක්ද අවශ්‍යය. ඉතා ගැඹුරෙන් අධ්‍යයනය කර ඉදිරිපත් කරනු ලබන වාර්තා අගැයීමට ලක් නොකරන කළමනාකරුවකු හෝ කර්තෘවරයකු සොයාගත නොහැකි තරම්ය. නමුත් මේ අගැයීම යථාර්ථයක් බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය හැකියාව සහ උනන්දුව එකසේ තිබෙන පුද්ගලයන් සොයාගත හැකි වන්නේ කලාතුරකිනි. ඔවුහු සාම්ප්‍රදායිකවම මෙම අර්බුදයේ කොටස්කරුවෝය. එහෙත් මෙම සංස්කෘතිය වෙනස් කිරීමේ පුළුල් විසඳුම් පියවරක කොටස්කරුවන් ලෙස ඔවුන් දකින්නට ලැබෙන්නේ නම් එය ඉතා වටනේය....

එබැවින්, ශ්‍රී ලංකාව තුළ පවතින ගුණාත්මකභාවයට වඩා ප්‍රමාණාත්මකභාවය පිළිබඳව සැලකිලිමත් වන මෙම සංස්කෘතිය වෙනස් කිරීම ආරම්භ කිරීමට, ප්‍රවෘත්ති කළමනාකරුවන්ට බලකරන හේතු පවතී.

එකිනෙකින් බැහැර නොවේ. ගවේෂණාත්මක මාධ්‍යවේදය දෛනික ප්‍රවෘත්තිවල වටිනාකම පැහැරගන්නේය යන මතය කෙටිකාලීන දැක්මකින් ඇති කරගත් මිථ්‍යා මතයක් බව පළමුව කිව යුතුය. ඇත්තටම බොහෝ අවස්ථාවලදී, කෙටිකාලීනව ප්‍රවෘත්ති කාමරවල සම්පාදනය වන සාමාන්‍ය දෛනික ප්‍රවෘත්තිවලට වඩා ඉතා ඉහළ මට්ටමේ කතා ගවේෂණාත්මක මාධ්‍යවේදය හරහා ලබාගත හැකිය.

ප්‍රජා වගකීම. මාධ්‍ය ආයතනය පෞද්ගලික ව්‍යාපාරයකට වඩා ඉහළින් පවතින්නකි. ප්‍රජාතන්ත්‍රවාදය තුළ ජනතාව වෙනුවෙන් හඬක් වනුයේ ඔවුහුය. මාධ්‍ය ආයතන මහජන සුභසිද්ධිය සඳහා අත්‍යවශ්‍ය වන අතර, දේශපාලනික හා සංස්කෘතික අන්තර්ක්‍රියාව සඳහා පොදු ජන වේදිකාවක් නිර්මාණය කරලීමේ ඉතා වැදගත් සමාජ කර්තව්‍යය ඒවා වෙතින් සිදු වේ. වඩාත් අවබෝධාත්මක තීරණ ගැනීම සඳහා වන දැනුම ලබාගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීමේ වටිනා මහජන කර්තව්‍යය ඒවා විසින් ඉටු කරනු ලැබේ. මෙමගින් පැහැදිලි වන කරුණක් වනුයේ, ප්‍රවෘත්ති සම්පාදකයන් ප්‍රවෘත්ති නිෂ්පාදනයට, කළමනාකරණයට හා මැවීමට වැඩි දෙයක් කරන බවයි. නවතම මහජන න්‍යාය පත්‍රයන් සකසන සහ පද්ධතිය දූෂණයෙන් තොර කිරීම ඉලක්ක කරගත් කතා සකස් කිරීම සඳහා අවශ්‍ය සොයා බැලීම් සිදු කිරීමේ මහජන වගකීමක් මාධ්‍යවේදීන් සතුව ඇති බවයි.

ජනමාධ්‍යවේදී යහප්‍රතිපත්ති. අලුතින් ප්‍රජාතාන්ත්‍රීකරණය වූ රටවල ගවේෂණාත්මක මාධ්‍යකරණය පැතිර යාමෙන් පෙන්නුම් කෙරෙන්නේ මෙරට මාධ්‍ය ආයතන තම ප්‍රවෘත්ති කාමරවලට ඇතුළත් කරගත යුතු යහප්‍රතිපත්ති මොනවාද යන්නයි. ගවේෂණාත්මක මාධ්‍යවේදය කර්තෘ මණ්ඩල නිදහස ශක්තිමත් කරන අතර, ප්‍රවෘත්ති කාමරවල වෘත්තීයභාවය ඉහළ නංවයි.

යහපත් ව්‍යාපාරය. මාධ්‍ය ආයතනවල දැනට පවත්නා සාම්ප්‍රදායික නුවණ හා කෙටිකාලීන චින්තනය, මාධ්‍ය ආයතනවල මූලික පදනමට කිසි හානියක් සිදු නොවන පරිදි සම්පූර්ණයෙන් වෙනස් වූ මගකට පිවිසවීමට ගවේෂණාත්මක මාධ්‍යවේදය උපකාරී වේ.


ඒ කෙසේද? ඇමරිකානු මාධ්‍ය විශේෂඥයන් දෙදෙනකු වන බිල් කොවැච් සහ ටොම් රොසෙන්ටයිල් පවසන්නේ, ප්‍රවෘත්ති ආයතන පුවත්පත්වල වැඩි ඉඩකඩකුත් ගුවන් තරංගවල වැඩි කාලයකුත් දැන්වීම් පළ කරන්නන්ට අලෙවි කරන බවයි.

"තම පාරිභෝගිකයන්ට තොරතුරු අලෙවි කරනවා වෙනුවට, ප්‍රවෘත්ති සම්පාදකයෝ තම වටිනාකම්, තීරණ, අධිකාරය, ධෛර්යය, වෘත්තීයභාවය සහ ප්‍රජාව සඳහා වන කැපවීම හරහා තම පාඨකයන් සමග සමීප සබඳතාවක් ගොඩනගාගනිති. අනතුරුව ප්‍රවෘත්ති ආයතන දැන්වීම් පළ කරන්නන්ට කුලියට දෙන්නේ මෙලෙස මහජනතාව සමග ඇති කරගන්නා බැඳීමයි" යනුවෙන් *එලිමන්ට්ස් ඔෆ් ජර්නලිස්ම්* නමැති ග්‍රන්ථයේ ඔවුන් සඳහන් කර ඇත.

මාධ්‍යයේ නිරවද්‍යභාවය පිළිබඳව ගැඹුරු අධ්‍යයනයක යෙදුණු, සමාජ විද්‍යාඥයකු බවට පත් ජනමාධ්‍යවේදී පිලිප් මේයර් මහතාද එම නිගමනයටම පැමිණියේය. තමන් විසින් රචිත *ද වැනිෂින් නිවුස්පේපර්* හරහා තර්කයක් ගොඩනගන මේයර් මහතා, මාධ්‍ය ආයතනයක පිබිදීමට හා කඩාවැටීමට පදනම් වනුයේ එම මාධ්‍ය

ආයතනයට තම පාඨකයන්ට කළ හැකි බලපෑම මේ යැයි දැන්වීම් පළ කරන්නන් හඟින ආකාරය මත බව සඳහන් කර සිටී. එම බලපෑම හටගන්නේ, මාධ්‍ය ආයතනයේ විශ්වසනීයත්වය පිළිබඳව ගොඩනැගී පවතින විශ්වාසය සහ එය මහජන අවශ්‍යතාවන් වෙනුවෙන් ක්‍රියා කරන බවට පවත්නා හැඟීම අනුවය.

රූසටහනක් ලෙස එය මෙලෙස දැක්විය හැකිය:




යහපත් ගවේෂණාත්මක මාධ්‍යකරණයේදී ඉතා ඉහළම නිරවද්‍යතාවක් පවතින අතර, එමගින් මාධ්‍ය ආයතනය මහජන සුභසිද්ධිය වෙනුවෙන් කරන කැප වීම දෘශ්‍යමාන වේ. ඉන් මාධ්‍ය ආයතනයේ බලපෑම පුළුල් වන අතර, එය දීර්ඝකාලීන ආර්ථික ශක්තියකට මගපාදයි. එමෙන්ම, දකුණු ආසියාවේ ප්‍රවෘත්ති පාරිභෝගිකයන් අතර පවත්නා විශ්වාසයක් වන මාධ්‍ය අයිතිකරුවන් ක්‍රියා කරනුයේ ඔවුන්ගේ මූල්‍ය හා දේශපාලන වුවමනාවන් සඳහා පමණක්ය යන මතය දුරලීමටද එය මහෝපකාරී වේ.

උදාහරණයක් ලෙස, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිත ආයතනය (USAID) මගින් මෑතකදී තම ව්‍යාපෘතියක් සඳහා බංග්ලාදේශයේ ඩකා නුවර සිදු කරන ලද සමීක්ෂණයකට අනුව බංග්ලාදේශ ජාතිකයන් බහුතරයක් විශ්වාස කරන්නේ, තම රටේ ජනමාධ්‍ය වෙනත් කාලසීමාවන්ට වඩා වගකීම් සහිතව හා අරමුණක් ඇතිව ක්‍රියාත්මක වීමට යොමු වී ඇති නමුත් එම ආයතන තවමත් ඉතා බහුල වශයෙන් තම හිමිකරුවන්ගේ දේශපාලන, මූල්‍යමය හා පෞද්ගලික න්‍යාය පත්‍රයන්ට යටත්ව ක්‍රියාත්මක වන බවයි. සමීක්ෂණයේදී අදහස් පළ කළ පුද්ගලයන්ගෙන් 80%කට වඩා ප්‍රකාශ කර තිබුණේ, මාධ්‍ය අයිතිකරුවන් මාධ්‍ය ආයතන ආරම්භ කර ඇත්තේ ප්‍රධාන වශයෙන්ම ව්‍යාපාරික හේතූන් මත පමණක් බවය. මුදල් ඉපැයීමත්, පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය යොදාගනිමින් තමන්ගේ අනෙකුත් ව්‍යාපාරයන්ට ප්‍රසිද්ධියක් ලබාදීමත් හැර, විශ්වසනීය ප්‍රවෘත්ති මහජනතාවට ඉදිරිපත් කිරීමේ වුවමනාවක් ඔවුන් තුළ නොමැත. තවත් 54%ක් ප්‍රකාශ කර තිබුණේ, මාධ්‍ය හිමිකරුවන්ට මාධ්‍ය ආයතන වුවමනා කරන්නේ තම දේශපාලන අදහස් ප්‍රචලිත කිරීමට බවය. බංග්ලාදේශ ජනමාධ්‍ය ජනතා අවශ්‍යතාවන් වෙනුවෙන් පෙනී සිටින බවට පවත්නා මත මෙම සංඛ්‍යා ලේඛන මගින් නිෂේධනය වේ.

## ගවේෂණාත්මක මාධ්‍යවේදය අභිවර්ධනය කළ හැක්කේ කෙසේද?

අනෙකුත් සෑම තැනකම හා සමානව ශ්‍රී ලංකාව තුළද, ගවේෂණාත්මක මාධ්‍යවේදය ප්‍රචලිත කිරීම සඳහා නව අවබෝධයක් සහ කැප වීමක් දොරටුපාලයන් සහ වාර්තාකරුවන්, විශේෂයෙන් ප්‍රාදේශීය වාර්තාකරුවන් අතර ඇති විය යුතුය. කොළඹ ප්‍රවෘත්ති කාමරවල සිටින නිලධාරීන් තම ප්‍රවෘත්ති වාර්තා පිරිහෙළීමට හා ඉවත දැමීමට ක්‍රියා කරන බවට දැඩි විශ්වාසයක් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් තුළ පවතී. ඒ අතරම, තමන් වටිනා ගවේෂණාත්මක කතා වස්තුබීජයක් සකස් කර එවූ විට කොළඹ කන්තෝරුවේ සිටින දොරටුපාලයා එය තමන්ගෙන් හෝ ගවේෂණයේ යෙදුණු කණ්ඩායමෙන් පැහැරගෙන, කොළඹ සිටින වාර්තාකරුවකු යොදා එයට තවත් කරුණු එකතු කර එහි ගෞරවය කොළඹ කර්තෘ මණ්ඩලයට ලබාගැනීමට කටයුතු කරනු ඇතැයි බියක්ද ප්‍රාදේශීය මාධ්‍යවේදීන් තුළ පවතී. එමෙන්ම, තම ජනමාධ්‍ය ආයතනවල දොරටුපාලයන්, ගවේෂණාත්මක මාධ්‍යවේදයක නියැළීමට අවශ්‍ය මූල්‍යමය හා ආයතනික සහයෝගය ලබානොදෙන බවට ඔවුහු බහුතරයක් විශ්වාස කරති.

ප්‍රාදේශීය මාධ්‍ය වාර්තාකරුවන්ගේ සංවිධානයක සභාපති ලෙස කටයුතු කරන එක් මාධ්‍යවේදියකු පැමිණිලි කළේ, තමන් ග්‍රාමීය වෛශ්‍යාවන් පිළිබඳව කළ අනාවරණයකින් පසු තමන්ට අවශ්‍ය සහයෝගය ලබාදීමට අදාළ මාධ්‍ය ආයතනයේ නිලධාරීන් කටයුතු නොකළ බවය. මෙම වාර්තාවෙන් පසු, කිසියම් පුද්ගලයකු ඔහුගේ වාහනයේ වීදුරු සියල්ල බිඳදමා, ටයර් සියල්ල කපාදමා, යකඩ කූරුවලින් වාහනයේ දෙපැත්ත සිදුරු කර අලාභ හානි කර තිබිණි. වාහනය අලුත්වැඩියාව සඳහා ඔහුට වැය කිරීමට සිදු වූ මුදල රුපියල් 150,000කට ආසන්නය. එහෙත් මාධ්‍ය ආයතනයෙන් කිසිදු සහයෝගයක් නොලැබිණි.

“මා මරාදැමුවා නම් ඔබලා මොකද කරන්නේ? අඩුම තරමින් මිනී පෙට්ටියක්වත් එවනවාද?” ඔහු තම දොරටුපාලයාගෙන් විමසා තිබිණි. එහෙත්, එයට ඔහුට ලැබුණු පිළිතුර වූයේ, “අපේ ආයතනයේ මේ වගේ ගැටලු ගැන හොයල බලන්න නිලධාරියෙක් නැහැ” යන්නයි.

## අන්‍යෝන්‍ය අපේක්ෂා

කර්තෘවරුන් හා වාර්තාකරුවන් යන දෙපිරිසටම අපේක්ෂාවන් ඇත. මාධ්‍ය ආයතනයට ප්‍රයෝජනවත් වන්නේ මෙම අපේක්ෂාවන් ගැළපීමයි.

කර්තෘවරු. ප්‍රවෘත්ති කළමනාකරුවන් ගවේෂණාත්මක කතාවක් ලිවීමට වුවමනා කරන ප්‍රාදේශීය වාර්තාකරුවන්ගෙන් අපේක්ෂා කළ යුත්තේ මේවාය:

- ගවේෂණාත්මක කතාවකින් ලැබිය හැකි ‘උපරිම වාසිය’ සහ ‘අවම වාසිය’ පිළිබඳ යථාර්ථවාදී තක්සේරුවක්.
- වාර්තාකරණයේ ප්‍රගතිය පිළිබඳ කාලාන්තර යාවත්කාල කිරීම්.
- ප්‍රවෘත්ති ආයතනයට පමණක් සීමා වීම - කිසි විටෙක ගවේෂණාත්මක කතා බෙදාහදා නොගැනීම.

- අවශ්‍ය නම්, කතාව පුළුල් කිරීම සඳහා සහ එහි බලපෑම ගැඹුරු කිරීම සඳහා අනෙකුත් ප්‍රාදේශීය වාර්තාකරුවන් හා කොළඹ වාර්තාකරුවන් සමග සහයෝගී වීම.
- ආචාර ධර්මීය මාර්ගෝපදේශ පිළිපැදීම.
- ඡායාරූප, ග්‍රාපික චිත්‍ර හා වෙනත් දෘශ්‍ය අංග පිළිබඳ අදහස්.
- නිවැරදි ආකෘතිය තුළ කතාව ඉදිරිපත් කිරීම.
- තොරතුරුවල විශ්වසනීයත්වය.

වාර්තාකරුවෝ. ප්‍රාදේශීය වාර්තාකරුවන් ගවේෂණාත්මක කතාව හඹා යද්දී ප්‍රවෘත්ති ආයතනයෙන් අපේක්ෂා කළ යුත්තේ මේවාය:

- කතාව ප්‍රකාශයට පත් කිරීමට කැප වීම.
- කතාව සඳහා කාලය හා සම්පත් ලබාදීම.
- ප්‍රවෘත්ති කාමර නියෝග දාමයේ ඉහළ මට්ටම්ද ඇතුළුව ප්‍රවෘත්ති කාමරය තුළ සහාය.
- කොළඹ වාර්තාකරුවකු සමග හවුලේ වැඩ කරන අවස්ථාවල කතාවත් සමග තම නමද පළ කිරීම.
- ප්‍රාදේශීය වාර්තාකරුවාට උදව් වීමට හා ඔහු ගැන සහතික වීමට ඇති කැමැත්ත.
- වැදගත් සම්මුඛ සාකච්ඡා නියම කර ගැනීමට සහාය වෙමින් අවස්ථානුකූලව උපකාර කිරීම.
- ප්‍රවාහන, ෆැක්ස්, සටහන් පොත් හා අන්තර්ජාල ප්‍රවේශය සඳහා යන වියදම් ආවරණය කිරීම.
- දුෂ්කර කතා සඳහා අතිරේක ගෙවීමක් කිරීම.
- ගවේෂණාත්මක වාර්තාකරණ ශිල්පීය ක්‍රම සහ විශේෂයෙන්ම කතාවක් පිළිබඳව මාධ්‍ය ආයතනය තුළදී හා ඉන් පිටතදී උපදෙස් ලබාදීම.

## දොළොස්වැනි පරිච්ඡේදය

# ආරක්ෂාව

ආරක්ෂාව යනු සෑම මාධ්‍ය වාර්තාකරුවකු හටම සිය වෘත්තිය සඳහා අත්‍යවශ්‍යම සාධකයකි.

'සීමා රහිත මාධ්‍යවේදියෝ' (Reporters Sans Frontiers) සංවිධානයේ මාධ්‍ය නිදහස පිළිබඳ වාර්ෂික දර්ශකයට අනුව, මාධ්‍ය නිදහස පවතින රටවල් අතරින් ශ්‍රී ලංකාවට හිමිවන්නේ 158 වන ස්ථානයයි. යුද ගැටුම් අවසන් වන අවදියේ මාධ්‍යවේදීන් ඉලක්ක වෙමින් සිදු වූ හිරිහැර සහ ඝාතන, මෙලෙස මාධ්‍ය නිදහස පිළිබඳ වර්ගීකරණයේ ශ්‍රී ලංකාව ඉතා පහළ මට්ටමක පැවතීම කෙරෙහි හේතු වී ඇත.

එදිනෙදා තත්ත්වය වාර්තා කිරීමේදී පවා මාධ්‍යවේදීන් මුහුණ පෑ හිරිහැරවල භයානකකම එවැනි විය. බලවතුන් හා බලවතුන්ගේ අවශ්‍යතාවන් අභියෝගයට ලක් කරන ගවේෂණාත්මක මාධ්‍යකරණය ඊටම ආවේණික උපද්‍රවයන්ට මුහුණ දෙයි. විවිධ බල අධිකාරීන් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම නිසා සිරගත වූ, රටින් බැහැර වීමට සිදුවූ සහ අතුරුදන් වූ මාධ්‍යවේදීන් පිළිබඳව මෙරටින්ද වාර්තා වේ.

මෙම තත්ත්වයේ උච්චතම අවස්ථාව එළඹුණේ, ආන්දෝලනාත්මක ලෙස ගවේෂණාත්මක මාධ්‍යකරණයේ නියැළි පෙරටුගාමියකු වූ, *සන්ඩේ ලීඩර්* පුවත්පතෙහි ප්‍රධාන කර්තෘ ලසන්ත වික්‍රමතුංග මෝටර් රියෙන් සිය කාර්යාලය වෙත පැමිණෙමින් සිටින අතරතුර ඝාතනයට ලක් වීමයි. මෙම ඝාතනය ජාත්‍යන්තරව උද්වේගකර තත්ත්වයක් ඇති කරන ලද අතර, ඝාතනයෙන් දින 3කට පසුව සිදුවූ අනුවේදනීය සිදුවීම වූයේ, *සන්ඩේ ලීඩර්* පුවත්පතට ඔහු විසින් අවසන් වරට රචනා කරන ලද තීරු ලිපිය පළ වීමත්, එහි සිය මරණය ගැන සහ ඝාතකයා පිළිබඳව සඳහන් කර තිබීමත්ය. ලසන්ත ඝාතනයෙන් නොබෝ දිනකින්ම, වෘත්තීය මාධ්‍යවේදීන් 14 දෙනකුගෙන් සමන්විත ජාත්‍යන්තර ජූරි සභාවක් විසින්, ඔහුගේ ධෛර්යය සහ කැපවීම අගය කරමින් 2009 ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ යුනෙස්කෝ සම්මානය ලසන්ත වික්‍රමතුංගට ප්‍රදානය කරන ලදි.

"ඔහු භයානක බව දැන දැනත් නිර්භයව සිය හඬ අවදි කළා. එය ඔහුගේ මරණයෙන් පසුවද රැව් දුන්නා. ඒ මිනිසා පිළිබඳව ජූරි සාමාජික පිරිස ඒකමතික තීරණයකට එළඹුණා" යැයි ජූරි සභාවේ සභාපති සහ දකුණු අප්‍රිකා පුවත්පත් මණ්ඩලයේ මාධ්‍ය ඔම්බුඩ්ස්මන්වර ජෝ ත්ලොලෝ පැවසීය. ලසන්තගේ මරණින් පසු පළ වූ තීරු ලිපිය පිළිබඳව සඳහන් කළ ඔහු, "ලසන්ත වික්‍රමතුංග අඛණ්ඩව ලොව පුරා මාධ්‍යවේදීන් ධෛර්යවත් කරනු ඇතැ"යි කියාසිටියේය.

ලසන්ත වික්‍රමතුංග ඝාතනය හා සමාන අනෙක් සිදුවීම්වලදී මෙන් මෙහිදීද මතුවන ගැටලුව නම්, ඔහුට සිය ආරක්ෂාව සඳහා ගත හැකි අතිරේක පියවර නොතිබුණේද යන්නයි. පශ්චාත් යුද සමයේදී බෝල්කන් ප්‍රදේශයේදීද, අපරාධ ලොක්කන් සහ කළුකඩ ජාවාරම් අනාවරණය කිරීම හේතුවෙන් රුසියාවේ හා ඉතාලියේදීද මාධ්‍යවේදීන් මුහුණ දුන් ආරක්ෂක අවදානම හා සමාන තත්ත්වයකට ලසන්ත මෙන්ම අනෙක් ශ්‍රී ලාංකික මාධ්‍යවේදීහුද මුහුණ දී සිටිති.

නිව්යෝක් නගරය මූලික කොට පිහිටුවා ඇති මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමේ කමිටුවේ (Committee to Protect Journalists - CPJ) තක්සේරුව අනුව, ඝාතනයට ලක් වූ මාධ්‍යවේදීන්ගෙන් 76%ක් මරණයට පත් වූයේ වාර්තා කරන ලද ප්‍රවෘත්ති වෙනුවෙන් පලිගැනීමක් ලෙස වන අතර, ඉන් බහුතරයක් දෙනා සිය මව් රටේ මාධ්‍යවල සේවය කළ අය වූහ. ඝාතනයට ලක් වූ මාධ්‍යවේදීන් පිළිබඳ දත්ත විශ්ලේෂණයේදී හෙළි වූ කරුණක් නම්, ඉන් 55%ක් දේශපාලන වාර්තාකරුවන් බවත්, 27%ක් යුද ගැටුම් වාර්තාකරුවන් බවත්ය.

මේ හා සමානම ප්‍රවණතාවක් පිළිබඳව ජාත්‍යන්තර මාධ්‍යවේදී සාමූහිකය (International Federal of Journalists - IFJ) නම් සංවිධානයේ වාර්තාවක් වන "සජීව ප්‍රවෘත්ති: මාධ්‍යවේදීන්ගේ ජීවිතාරක්ෂාව සඳහා උපදෙස් මාලාව" (Live News: A Survival Guide for Journalists) සඳහන් කරන අන්දමට, 1990 ගණන්වල සහ 2000 ගණන්වල මුල් කාලයේ ඝාතනය කරන ලද 1,200කට ආසන්න මාධ්‍යවේදීන්ගෙන් 90%කට එම ඉරණම අත්වූයේ තමන් ඉපිද හැදී වැඩුණු මව් රටෙහිදීය. "වැඩි අවධානයකට ලක් වූ අනතුරුවලට මුහුණ පෑවේ විදේශීය මාධ්‍යවේදීන් වුවද ගොදුරු වූ බොහෝ දෙනා දේශීය මාධ්‍යවේදීන්යැ"යි වාර්තාව පැවසීය.

මාධ්‍යවේදීන් හට සහාය දෙන ආයතන පිළිබඳව දැනුම්වත් වීම යුද ගැටුම් පවතින කලාපවල සේවය කරන මාධ්‍ය වාර්තාකරුවන් හට අතිශයින්ම වැදගත් වේ. ලන්ඩන් නුවර මූලික කොට පිහිටුවා ඇති ජාත්‍යන්තර ප්‍රවෘත්ති ආරක්ෂක ආයතනය (International News Safety Institute - INSI), ප්‍රවෘත්ති ආයතනවලින්, මාධ්‍යවේදීන්හට සහාය දෙන කණ්ඩායම්වලින් සහ පුද්ගලයන්ගෙන් සමන්විත සුවිශේෂ සාමූහිකයකි. එය භයානක පරිසරයන්හි සිට ප්‍රවෘත්ති වාර්තාකරණයේ නියතු වූවන් හට ආරක්ෂාව සහිතව සිය වෘත්තියේ යෙදීමට සහාය දීම සඳහා කැප වී සිටින, ලාභ නොලබන සමාජසේවා ආයතනයකි.

මෙම ජාත්‍යන්තර ප්‍රවෘත්ති ආරක්ෂක ආයතනයේ අරමුණ, ජාත්‍යන්තර පැවරුමකදී හෝ තම රටවල් තුළදීම ප්‍රවෘත්ති ආවරණය කිරීමේදී බිහිසුණු තත්ත්වයන්ට මුහුණදෙන මාධ්‍ය වාර්තාකරුවන්ට හා පුවත් රැස් කරන්නන්ට, ලොව පුරා ක්‍රියාත්මක ජාලගත ආරක්ෂක සේවාවක් තුළින් උපදෙස් සහ සහාය ලබාදීමයි.

දේශීය මාධ්‍යවේදීන්ට පවතින අවදානම් මුළුමනින්ම ඉවත් කිරීම කිසිවිටෙක කළ නොහැක්කක් වුවත්, මාධ්‍ය ආයතනවල ද්වාර පාලකයන් සහ වාර්තාකරුවන් එක්ව නිසි සංවිධානගත ආරක්ෂාකාරී පියවර අනුගමනය කරන්නේ නම් ඒවා අවම කිරීමට හැකි වනු ඇත. අල් ජසීරා ආයතනයේ ප්‍රධාන ගවේෂණාත්මක වාර්තාකරු යොස්රි ෆවුඩා සිය අදහස් දක්වමින් මෙසේ කියයි:

...පෞද්ගලික ආරක්ෂාව පැත්තෙන් බලන විට, 'මාධ්‍යවේදියකු වීම යනු හිරිහැරවලට අතවැනීමකි' යන කියමන වඩාත් ගැළපෙන්නේ මේ කියන ගවේෂණාත්මක මාධ්‍යකරණයටයි. වාර්තා කරන ප්‍රවෘත්තිවල වටිනාකම මාධ්‍යවේදියාගේ ජීවිතයෙහි වටිනාකම හා කිසි ලෙසකින් හෝ සැසඳිය නොහැකිය. ඒ අනුව, අවදානම නිසි ලෙස වටහාගැනීම ගවේෂණාත්මක මාධ්‍යකරණයේ ඉතා වැදගත් සංකල්පයක් බවට පත් වේ.... මෙම තත්ත්වයට විසඳුම් සෙවීමේ වගකීමෙන් කොටසක් මාධ්‍ය අංශවලට හා මාධ්‍යකරුවන් පුහුණු කරන මධ්‍යස්ථානවලටද, තවත් කොටසක් මාධ්‍ය ආයතන කළමනාකාරිත්වයන්ටද පැවරෙන අතර, වැඩිම වගකීමක් පැවරෙන්නේ මාධ්‍යවේදියාගේම උර මතයි. මන්දයත්: ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදුවන්නේද, තවත් ප්‍රවෘත්තියක් වෙනුවෙන් ජීවත් වීමට තීරණය කළ හැක්කේද ඔහුට හෝ ඇයටයි.

1980 ගණන්වල සහ 1990 ගණන්වලදී ලෙබනනයේ අවුරුදු හතකට ආසන්න කාලයක් ප්‍රාණ ඇපකරුවකු ලෙස රඳවාගෙන සිටි බීරූට්හි ඇසෝසියේටඩ් ප්‍රෙස් කාර්යාලයේ හිටපු ප්‍රධානියා වූ ටෙරී ඇන්ඩසන්, තමන් මුහුණ දී සිටින අනතුරු අඛණ්ඩව තක්සේරු කරන ලෙස, විශේෂයෙන් යුද කලාප වැනි ඉහළ අන්තරායකර තත්ත්වයන් යටතේ සේවය කරන වාර්තාකරුවන්ගෙන් අවධාරණයෙන් ඉල්ලා සිටියේය:

හැමවිටම, නිරන්තරව, නිරන්තරව, හැම විනාඩියකදීම, ඔබ ගවේෂණය කරන ප්‍රවෘත්තිය හා බැඳි අවදානම් සහ ප්‍රතිලාභ සසඳා බලන්න. එම සැසඳීමෙන් ඔබට අපහසුවක් දැනුණු වහාම වාර්තා කිරීමේ කාර්යයෙන් ඉවත් වන්න, යන්න, එය අතහැර දමන්න. එය ජීවිතයෙන් වන්දි ගෙවීමට තරම් නොවේ. කිසිම පුවතක් ඊට තරම් නොවේ.

බොස්නියා හර්සගොවිනාහි පිහිටි ගවේෂණාත්මක වාර්තාකරණ මධ්‍යස්ථානයේ (Centre for Investigative Reporting - CIR) වාර්තාකරුවන් හා කර්තෘවරු, තමන්ට පෞද්ගලික තර්ජන එල්ල නොවූවත් තමන් තර්ජනයකට මුහුණපා සිටින්නේය යන අනුමානය සහිතව සිය වැඩ කටයුතුවල නිරත වෙති. මෙයට හේතුව, ඝාතනයට ලක් වූ මාධ්‍යවේදීන්ගේ සංඛ්‍යා ලේඛන විශ්ලේෂණය කිරීමේදී පෙනීයන්නේ ඉන් 3/4කටම කිසිම අවස්ථාවක තමා ගවේෂණය කළ ප්‍රවෘත්තිය නිසා පෞද්ගලික තර්ජන එල්ල නොවූ බවයි. ඒ අනුව, මෙම මධ්‍යස්ථානයේ ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තිය, වාර්තාකරුවන් සහ කර්තෘවරුන් අතර සමීප සහයෝගය නිරන්තරව අවධානයට ලක් කරයි.

පහත දැක්වෙන්නේ, ගවේෂණාත්මක වාර්තාකරණයේ නියුතු මාධ්‍යකරුවන්ගේ සහ ඔවුන්ගේ මූලාශ්‍රවල ආරක්ෂාව වැඩි කරගැනීමට අනුගමනය කළ යුතු උපදෙස් කිහිපයකි. මේ සඳහා පදනම් වී තිබෙන්නේ, CIR ආරක්ෂක අත්පොත සහ යංග්ස්ටීෂියා ටෙලිවිෂන් ආයතනය, ජාත්‍යන්තර මාධ්‍යවේදීන්ගේ එකමුතුව, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා 'ඉන්ටනිව්ස්' ආයතනය එක්ව නිකුත් කළ 'මාධ්‍ය වාර්තාකරුවන් සහ මාධ්‍ය වෘත්තිකයන්ගේ ආරක්ෂාව පිළිබඳ කරුණු' (Safety Matters for Journalists & Media Workers) නම් අත්පොතයි.

## ආරක්ෂක පියවර

වෘත්තීය භාවය. සෑම මාධ්‍ය වාර්තාකරුවකු හටම ආරක්ෂාව පිළිබඳව අනුගමනය කළ හැකි හොඳම උපාය මාර්ගය වන්නේ, වෘත්තීය භාවයෙන් යුතුව කටයුතු කිරීම සහ නිරවද්‍ය, සාධාරණ සහ පරිසමාප්ත වාර්තාකරණයයි.

- සාධාරණත්වය. ඔබ වාර්තා කරන ප්‍රවෘත්තියට ඉලක්ක වන පුද්ගලයාට, ඔබ සතු තොරතුරු නිසි ආකාරයෙන් වටහාගෙන ග්‍රහණය කිරීමටත්, සෑම කරුණකටම පිළිතුරු දීමටත් ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න. අදාළ පුද්ගලයා මුලදී සම්මුඛ සාකච්ඡාවක් ලබා දීම ප්‍රතික්ෂේප කළත්, ඔහු සමග කතාබහ කිරීමට අවශ්‍ය බව විශේෂයෙන්ම ඊමේල්, ලිපි හෝ ටෙලිග්‍රෑම් මගින් අඛණ්ඩව ඔහුට දැනුම් දෙන්න. ඔබට ලැබී ඇති නිශ්චිත කාල රාමුව අවසන් වන තුරුම උත්සාහ කරන්න. කාල රාමුවට අනුගත වෙමින් පුවත් වාර්තා කිරීම හෝ අදාළ සතිය සඳහා යමක් පළ කළ යුතු බැවින් පුවත් වාර්තා කිරීමට වඩා වැඩි අවධානයක් ලබා දිය යුත්තේ, ඔබේ ප්‍රවෘත්තියේ ඉලක්කගත පුද්ගලයාට පූර්ණ සහ සාධාරණ අසා සිටීමකට අවස්ථාව සලසා දීමටයි. මෙවැනි තත්ත්වයක් සඳහා ඔබ ඉඩප්‍රස්තා සලසන්නේ, අදාළ පුද්ගලයා අනවශ්‍ය ලෙස කල් මරමින් ඔබෙන් තොරතුරු මගහැරීමට උත්සාහ නොකරන්නේයැයි ඔබ අනුමාන කරන අවස්ථාවන්හිදී පමණක් විය යුතුයි.

- ප්‍රතිවාදනය. මෙම අත්පොතෙහි මෙයට පෙර අවස්ථාවකදී, සම්මුඛ සාකච්ඡාව සිදු කළ පසු ඒ සඳහා සහභාගි වූ පුද්ගලයාට තමා ඉදිරිපත් කළ ප්‍රකාශ නැවත අසන්නට ඉඩ ලබා දීමේ වැදගත්කම ගැන සඳහන් කරන ලදි. මෙසේ කිරීමේ ප්‍රධාන අවශ්‍යතාව වන්නේ, නිරවද්‍යතාව පවත්වාගැනීමේ අවශ්‍යතාව සහ අප ඉදිරිපත් කරන ප්‍රවෘත්තිය සඳහා තොරතුරු ලබා දුන් පුද්ගලයාට ප්‍රකාශයට පත් වන ප්‍රවෘත්තියේ ස්වභාවය පිළිබඳව දැනගැනීමට සලස්වා ආචාරශීලී වීමයි. මෙය විශේෂයෙන් වැදගත් වන්නේ, ඉලක්කගත පුද්ගලයාගෙන් අනතුරක් විය හැකියැයි අනුමාන කරන විටදී සහ අදාළ ප්‍රවෘත්තිය ප්‍රකාශයට පත් වූ පසු ඔහු එය නොපිළිගෙන, ඉන් පුදුමයට පත්ව ක්‍රියා කිරීමට ඉඩකඩ ඇති බැවිනි.

- ආකල්ප. ගවේෂණාත්මක වාර්තාකරණය සහ සම්මුඛ සාකච්ඡා සිදු විය යුත්තේ නිශ්චිත අරමුණක් උදෙසා මිස පෞද්ගලික කෝන්තර පිරිමසාගැනීම සඳහා නොවේ. ඔබේ ප්‍රවේශය තුළ ඇත්තේ 'වැරදිකාරයා අහු වුණු' බවක් හෝ අභියෝගයක් ඉදිරිපත් කරන බවක් නම්, එසේ කරන්නේ කෝපයෙන් යුතු, ආස්වාදයක් ලබන හෝ සුචරිතවාදී ධ්වනියකින් නම්, ඔබට ලැබෙන ප්‍රතිචාරයද ඒ හා සමාන වනු ඇත. නිශ්චිත වශයෙන් විෂය කරුණු මූලික කරගනිමින් ඔබ ඉලක්කගත පුද්ගලයා සමග පවත්වන සම්මුඛ සාකච්ඡාවට වඩා, හැඟීම් එළි වන අයුරින් ප්‍රශ්න කෙරෙන විට සහභාගි වන්නාගේ ප්‍රතිචාරය වඩාත් දැඩි වනු ඇත.

- ප්‍රවෘත්තියක සීමා. මාධ්‍යවලින් ලැබෙන අවධානය බොහෝ විට අපරාධකරුවන් වැනි පුද්ගලයන්ට නුපුරුදු දෙයක් නොවේ. එහෙත්, යම්කිසි වාර්තාකරුවකු අනවශ්‍ය ලෙස ඉලක්කගත පුද්ගලයාගේ පෞද්ගලික තොරතුරු අනාවරණය

කිරීමට යෑම හෝ ඔහුගේ පෞද්ගලික ජීවිතයට එබිකම් කිරීමට යෑම මගින්, අනවශ්‍ය ලෙස එම පුද්ගලයා එකටෙක කිරීමට පෙලඹවීමක් සිදු වනු ඇත. දූෂණ සහ අක්‍රමිකතා සිදු කර ඇති බවට මාධ්‍ය මගින් වාර්තා කිරීමේදී අදාළ පුද්ගලයා නිහඬව සිටියත්, ඔහුගේ බිරිඳ සහ දරුවන්, ඥාතීන් පිළිබඳ තොරතුරු ඇද ගත හොත් එමගින් එම පුද්ගලයා අනවශ්‍ය ලෙස කුපිත වනු ඇත.

- පෞද්ගලික තොරතුරු හෙළිදරව් කිරීමෙන් වළකින්න. විශේෂ සංවේදී කතා පුවත් වාර්තාකරණයේදී, මාධ්‍යවේදියා තම පවුලේ සාමාජිකයන්ගේ නම්ගම්, වයස ඇතුළු විස්තර, පදිංචි ලිපිනය, නිවසේ හෝ ජංගම දුරකථනයේ අංකය ආදිය කිසිවකුටත් හෙළි නොකිරීමට වගබලාගත යුතුය. එය තර්ජන, කප්පම් ඉල්ලීම් යනාදිය සඳහා ඉඩකඩ ලබාදීමක් විය හැකිය. යමකු සාකච්ඡාව පෞද්ගලික කාරණාවලට යොමු කරමින් ඔබගෙන් එවැනි පෞද්ගලික විස්තර ලබාගැනීමට උත්සාහ දරන බවක් හැඟෙන්නේ නම්, ඔහුගේ හෝ ඇයගේ අවධානය අදාළ කතා ප්‍රවෘත්තිය වෙත පමණක් විනීතව එහෙත් තිර ලෙස යළි යොමු කරන්න.

- පවුලේ අය සහ මිතුරන් සමග කතා ප්‍රවෘත්තියේ තොරතුරු පැවසීමෙන් වළකින්න. ඔබේ පවුලේ අය සමග කතා ප්‍රවෘත්තියට හෝ එහි මූලාශ්‍රවලට අදාළ කිසිවක් හෙළි කර සිටීමෙන් වළකින්න. මන්දයත්: අනවශ්‍ය පුද්ගලයන් වෙත පවුලේ අය නොදැනුවත්ව අදාළ කතා ප්‍රවෘත්තියේ තොරතුරු ලබා දීම සිදු විය හැකිය. එයින් එම කතා පුවතට හානි විය හැකි අතරම, පවුලේ අයද ප්‍රචණ්ඩ බියවැද්දීම්වලට හා තර්ජනවලට ගොදුරු වීමට ඉඩ තිබේ.

- මූලාශ්‍ර ආරක්ෂා කිරීම. මාධ්‍ය ආයතනයක ප්‍රවෘත්ති කාමරයට පහසුවෙන් පිවිස අවශ්‍ය තොරතුරු ලබාගැනීමට මාධ්‍යවේදියකුගේ අනුකම්පාව හෝ දූෂිත මාධ්‍යවේදීන් යොදාගැනීම බලය සහිත පුද්ගලයන්ගේ උපක්‍රමයයි. ඔබ භාවිත කරන පරිගණකයේ අදාළ ප්‍රධාන ලිපි ගොනු, මූලාශ්‍රවල සැබෑ නම හෝ හඳුනා ගත හැකි වෙනත් තොරතුරු සහිතව ගබඩා කිරීම මගින් තවෙකකුට පහසුවෙන් එම තොරතුරු පිටපත් කර ගැනීමට හෝ ලබාගැනීමට හැකි වනු ඇත. එනිසා, එවැනි තොරතුරු පරිගණකයේ ගබඩා කිරීමේදී, ඒ ඒ මූලාශ්‍රය වෙනුවෙන් රහස් අංකයක් හෝ නමක් යොදාගන්න. ඔබේ කඩදාසි ලිපි ගොනු ආරක්ෂාකාරීව යතුරු දමා වැසිය හැකි ස්ථානයක පමණක් තබන්න. හැකි නම් ඔබේ ආයතනයෙන් පිටත ස්ථානයක තබන්න. ඔබ තොරතුරු සපයන පුද්ගලයා එකම ස්ථානයකදී හෝ එකම වේලාවකදී හමු වීමෙන් වළකින්න.

- පිටපත් තබාගැනීම. පරිගණක ලිපිගොනුවේ පිටපත්, පෙන් ඩ්‍රයිව් එකක් හෝ ජංගම හාඩ් ඩ්‍රයිව් එකක් යොදාගෙන ගබඩා කර ආරක්ෂිතව තබාගන්න. කඩදාසි ලිපිගොනුවල පිටපත්ද ඒ ආකාරයෙන්ම ආරක්ෂාකාරීව තබාගන්න. ඔබ යම් පුද්ගලයකු හා සම්මුඛ සාකච්ඡාවක් සඳහා යන විට කිසි විටෙකත් මුල් පිටපත් රැගෙන යෑමෙන් වළකින්න.

## තර්ජන සහ භයානක පුද්ගලයෝ

වාර්තාකරුවන් සඳහා. ගවේෂණාත්මක වාර්තාකරණයේ යෙදෙන ඔබට, අදාළ පුද්ගලයන් හමු වීමට සිදු වනු ඇත. ඔබ කොතරම් වෘත්තීය භාවයෙන් හෝ මෘදු බවින් යුතුව ඔවුන් හමු වී කතාබහ කළත් බොහෝ විට ඔවුන් අනතුරුදායක විය හැකිය. ඒ තොරතුරු මාධ්‍ය මගින් වාර්තා කිරීම නතර කරන ලෙස තර්ජනය කරනු ඇත. මේ එවැනි අවස්ථාවන්හිදී ඔබේ ආරක්ෂාව සඳහා අනුගමනය කළ හැකි පියවර කිහිපයකි:

- දුරකථන ඔස්සේ සිදු කෙරෙන තර්ජනය කිරීම්. ඔබට දුරකථනය ඔස්සේ යමකු තර්ජනය කරන්නේ නම් වහාම එය පටිගත කිරීමට උත්සාහ ගන්න. ඒ හා සමගම, ඔබට තර්ජනය කිරීමේදී හුවමාරු වූ කතාබහ ඒ ආකාරයෙන්ම සටහන් කරගන්න. අදාළ පුද්ගලයන්ගෙන් හැකි තාක් දුරට තොරතුරු ලබාගැනීමට උත්සාහ කරන අතරතුර, කවර ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් ද යන වග සහ එම ප්‍රවෘත්තිය වාර්තා කිරීමට ඔහුගේ හෝ ඇයගේ විරෝධයට බලපාන හේතුව දැනගන්නටද උත්සාහ කරන්න. තර්ජනය කරන පුද්ගලයා හා තර්ක කිරීමට යෑමෙන් වළකින්න. ඒ සමගම ඔබට තර්ජනය කරන පුද්ගලයාට දැන්විය යුත්තේ, අදාළ ප්‍රවෘත්තිය පළ කිරීම හෝ නොකිරීම පිළිබඳ බලය තිබෙන්නේ කර්තෘට බවයි. වහාම ඔබේ කර්තෘට සහ පොලීසියට තර්ජනය පිළිබඳව දන්වන්න. ඒ සමගම, ඔබට තර්ජනයන්ට මුහුණ පාන්නට සිදු වූ බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට කටයුතු කරන්න. මන්දයත්, බල අධිකාරීන් වැනි අනෙක් අය කල්තියා අවදි කොට තැබුව හොත්, බොහෝ විට අපරාධකරුවන් එවැනි තත්ත්වයන් හමුවේ පසු බෑමට ලක් වනු ඇති බැවිනි.

- ලුහුබැඳීම්. බොස්නියා පරිපාලකයන් පවසන පරිදි, සේවයේ යෙදී සිටියදී ඝාතනයට ලක් වූ මාධ්‍යවේදීන් කිහිප දෙනකු කවුරුන් හෝ තමන් ලුහුබඳින බවට බිය පළ කර ඇත. ඔබ ලුහුබඳින බවක් ඔබට හැඟෙන්නේ නම්, හැකි ඉක්මනින් ඔබේ කර්තෘටත් පොලීසියටත් ඒ පිළිබඳව දන්වා, ඔබට තවදුරටත් ගත හැකි ක්‍රියාමාර්ග ගැන උපදෙස් ලැබෙන තුරු ආරක්ෂිත ස්ථානයකට යන්න.

- ජංගම දුරකථන. දුරකථන සිම්පත් මිල දී ගැනීම ශ්‍රී ලංකාවේදී අසීරු කටයුත්තක් නොවේ. ගවේෂණාත්මක වාර්තාකරණයේ යෙදෙන්නා, අනතුරුදායක බලවත් පුද්ගලයන් හා සබඳතා පැවැත්වීම සඳහාම භාවිත කිරීමට එබඳු වෙනම අංකයක් මිල දී ගෙන තබාගැනීම ආරක්ෂාකාරීය. කිසි ලෙසකින් පෞද්ගලික (නිත්‍ය) ජංගම දුරකථනය හෝ කාර්යාලීය ජංගම දුරකථනය මේ සඳහා භාවිත නොකරන්න. වෙනම බැටරියක්ද ළඟ තබාගන්න. මන්ද, බැටරිය මගින්ද දුරකථනයක තොරතුරු හා එය තිබෙන ස්ථානය අනාවරණය කරගත හැකි බැවිනි. තමා ගොදුරු කරගන්නට යමකු මාන බලන බව හැඟුණු වහා මේවා ගලවාදැමිය හැකිය.

- ඊමේල්. ඊමේල් සඳහාද මේ අනතුරු ඇඟවීම වලංගුය. ගවේෂණ කාර්යයේදී වෙනම 'යාහූ' හෝ 'ගූගල්' ඊමේල් ලිපිනයක් භාවිත කරන්න. එය අන් කිසි කාරණයකට අදාළව යොදාගැනීමෙන් වළකින්න.

- සම්මුඛ සාකච්ඡා සඳහා හොඳම තැන. අනතුරුදායක විය හැකි පුද්ගලයකු හා සම්මුඛ සාකච්ඡාවක් පවත්වන්නට තිබේ නම් දුරකථනය ඔස්සේ එය සිදු කරන්න. එසේ නැති නම්, සෙනග ගැවසෙන ප්‍රසිද්ධ ස්ථානයක් යොදාගන්න. එතැනට පැමිණීමේදී බසයක් හෝ කුලී රථයක් වැනි පොදු ප්‍රවාහන ක්‍රමයක් යොදාගන්න. අදාළ පුද්ගලයාගේ කාර්යාලයේදී සම්මුඛ සාකච්ජාව පැවැත්වීමට යෑමෙන් වළකින්න. ඔහු ඔබගේ ප්‍රවෘත්ති කාමරයට කැඳවා ගෙන යෑමෙන්ද වළකින්න. එවිට ඔහුට ලේඛනවලින්, පෞද්ගලික ඡායාරූපවලින් හෝ ඔහු ගැන සැක නොහිතන ඔබගේ සගයන්ගෙන් හෝ වටේපිටේ බැලීමෙන් හෝ තොරතුරු ඇහිඳ ගත හැකිය.

- සහාය ලබාගැනීම. ඔබ කා සමග, කුමන දිනයකදී, කුමන ස්ථානයකදී, කොපමණ වේලාවක් අදාළ සම්මුඛ සාකච්ඡාව පවත්වන්නේදැයි ඔබේ සමීප අධීක්ෂකවරයාට දැනුම් දෙන්න. ඔබ සම්මුඛ සාකච්ඡාව ආරක්ෂාකාරීව පවත්වා අවසන් කළ බව වහාම දැනුම් දෙන බව ඔබේ කර්තෘවරයාට දන්වන්න. ඔබට අනුගමනය කළ හැකි තවත් ක්‍රමයක් නම් ඔබ හා සේවය කරන හිතවතකු සම්මුඛ සාකච්ඡාව සිදු වන ස්ථානයේ අවට සිටින්නට සැලැස්වීමයි. යම් අනතුරක් පිළිබඳ සේයාවක් ඇත් නම්, සම්මුඛ සාකච්ඡාව සිදු කරන ඔබට සංඥාවක් යොදාගනිමින් ඔබේ හිතවතාට දැනුම් දිය හැකිය. එවිට ඔහුට ඒ බව බලධාරීන්ට දැනුම් දිය හැකිය.

- සම්මුඛ සාකච්ඡා අතරමග නැවැත්වීම. ඔබ සමග සම්මුඛ සාකච්ඡාවට සහභාගි වන්නා අහම්බයෙන් හෝ විහිළුවක් ලෙස ඔබට තර්ජනයක් හෝ අනතුරු ඇඟවීමක් සිදු කළ හොත්, ඔබ පැමිණි කාරණය පැහැදිලි කර, තර්ජනයක් සිදු වූ බව ප්‍රකාශ කර වහාම එම ස්ථානයෙන් ඉවත් වෙන්න.

- මඳක් ප්‍රමාද කරන්න, ඒත් අත හරින්න එපා. ඔබට භයානක තර්ජනයක් එල්ල වන්නේ නම්, 'උණුසුම අඩු වන තෙක්' මඳකට අදාළ ප්‍රවෘත්තිය වාර්තාකරණයෙන් ඉවත් වී සිටින්න. සාමාන්‍යයෙන් එවැනි අවස්ථාවක, තර්ජනය කළ පුද්ගලයා දීර්ඝ වශයෙන් ඔබ පිළිබඳව විමසිල්ලෙන් සිටීම නැවැත්වීමට ඉඩ ඇත. කෙසේ වෙතත්, වාර්තාකරුවා හෝ ප්‍රවෘත්ති ආයතනයේ වෙනත් කෙනකු අදාළ ප්‍රවෘත්තිය සම්පූර්ණ කිරීම වැදගත් වේ. මන්දයත්, බිය ගැන්වීම සාර්ථක වූ හෙයින් ඊළඟ වතාවේ එම තර්ජනයන් එයට වඩා දැඩි වනු ඇති බැවිනි.

- කර්තෘවරුන් සඳහා. ගවේෂණාත්මක වාර්තාකරණ ව්‍යාපෘතිය ආරම්භ කළ පළමු දිනයේ සිටම, ඊට සම්බන්ධ වාර්තාකරුවන් සහ මූලාශ්‍රවල ආරක්ෂාව පිළිබඳව දොරටුපාලයන්ගේ සහ මාධ්‍ය ආයතනයේ කර්තෘවරයාගේ උපරිම අවධානය සහ සැලකිල්ල පැවතිය යුතුය.

පහත දැක්වෙන්නේ, වාර්තාකරුවන්ගේ ආරක්ෂාව සඳහා කර්තෘවරුන්ට ගත හැකි පියවරයි:

- කල්තියා තක්සේරු කරන්න. කතුවරයා කළ යුතු පළමු කටයුතුවලින් එකක් නම්, අදාළ කතා ප්‍රවෘත්තිය ගවේෂණය නිසා තමාටත් තමාගේ වාර්තාකරුවන්ටත් ඇති අවදානම කෙබඳුදැයි වටහාගැනීමයි.

- කල්තියා සැලසුම් කරන්න. යම් ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාකරණ ව්‍යාපෘතියක් ආරම්භයේදීම ආරක්ෂාව පිළිබඳ උපායමාර්ගය සැලසුම් කිරීම වැදගත් වේ. ඒ සඳහා, අදාළ වාර්තාකරු සමග සෘජු සංවාදයක් පවත්වා එම අදාළ ප්‍රවෘත්තිය ආවරණය කිරීමේදී ඉලක්ක විය හැකි අනතුරුදායක පුද්ගලයන් හඳුනාගත යුතු අතර, හදිසි අවස්ථාවකදී දැනුම් දිය යුතු පුද්ගලයන් පිළිබඳ එකඟතාවක් ඇති කර ගත යුතුය. අදාළ වාර්තාකරුගේ පවුලේ අයට සහ හිතවතුන්ට, හදිසි අවස්ථාවකදී දැන්විය යුතු පුද්ගලයන්ගේ දුරකථන අංක, ලිපිනයන් ආදිය ලබා දෙන්න. හදිසි අවස්ථාවකදී අදාළ වාර්තාකරු ඒ පිළිබඳව දැනුම් දීමේදී යොදා ගත හැකි රහස් වචනයක් හෝ පාඨ පණිවුඩයක් පිළිබඳව එකඟතාවක් ඇති කරගන්න.

- ප්‍රමාණවත් කණ්ඩායමක් සම්බන්ධ කරගන්න. අදාළ ගවේෂණාත්මක වාර්තාකරණ ව්‍යාපෘතියට සම්බන්ධ කරගැනීමට වෙනත් වාර්තාකරුවන් කණ්ඩායමක්ද සූදානම් කර තබන්න. විවිධ වැඩ කටයුතුවලදී හා සම්මුඛ සාකච්ඡාවලදී ඔවුන් මාරුවෙන් මාරුවට යොදාගන්න.

- අධීක්ෂණය. සෑම වාර්තාකරුවකුටම වැඩ කරන ජංගම දුරකථනයක් තිබිය යුතු අතර, එමගින් තමතමන් නියුතු වී සිටින වැඩකටයුතු පිළිබඳව කණ්ඩායමේ අනෙක් අය වෙත දන්වා සිටීමද වැදගත්ය. සෑම දිනකම අදාළ වාර්තාකරුවන් අමතා, එදිනට ඔවුන්ට නියමිත කාර්ය භාරයන් සහ සම්මුඛ සාකච්ඡා පිළිබඳව කර්තෘවරයා දැනගැනීම වැදගත් වේ. රැස්වීම්, සම්මුඛ සාකච්ඡා ආදියට පෙර කර්තෘවරයාට දුරකථන ඇමතුමක් ලබා දීමටත්, නිශ්චිත කාලවකවානුවක් ඇතුළත කර්තෘ වන ඔබට නැවත කතා කළ යුතු බවටත් එකඟතාවක් ඇති කරගන්න. යම්කිසි ආකාරයකින් අදාළ නිශ්චිත කාල රාමුව ඇතුළත ඔබේ වාර්තාකරු ඔබට දුරකථන ඇමතුමක් ලබා නොදුන්නේ නම්, ඔහු හෝ ඇය අවදානමකට ලක්ව ඇද්දැයි සොයා බලන්න.

- තර්ජනය කිරීම්. තර්ජනය කිරීම් පවතින්නේ නම් ඒ පිළිබඳව අදාළ බලධාරීන් දැනුම්වත් කොට, වාර්තාකරුවා පොලීසිය හෝ වෙනත් ආරක්ෂාකාරී ස්ථානයක් වෙත යැවීම කර්තෘවරයකුගේ වගකීමයි. වාර්තාකරුවකු හට අවශ්‍ය නම් අතිරේක ආරක්ෂාවක් ලබා දීමට කටයුතු කරන අතරවාරයේ, අවශ්‍ය නම් ඔහුගේ පවුලේ අයටත් නිවසින් පිටව වෙනත් ස්ථානයකට යෑමට පහසුකම් ලබා දෙන්න. තර්ජනය වඩාත් දැඩි නම්, තත්ත්වය මඳක් සමනය වන තුරු අදාළ වාර්තාකරණය මඳකට නවත්වන්න.

- තර්ජන පිළිබඳව සොයා බැලීම. එල්ල වන සෑම තර්ජනයක්ම, කුමන කාරණයක් පදනම් කරගනිමින් සිදු වන්නේද සහ එහි ස්වභාවය කෙබඳුද යන්න සොයා බැලීමට පුද්ගලයකු අනුයුක්ත කරන්න. ඒ පිළිබඳව ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කරමින් අනෙක් මාධ්‍ය ආයතන දැනුම්වත් කරන්න. එම තර්ජනය පිළිබඳ ප්‍රවෘත්තිය පළ කරන්න.

- සංස්කරණය පිළිබඳව සැලකිලිමත් වන්න. වාර්තාකරණයට ඉලක්ක වන පුද්ගලයාට ප්‍රතිචාර දැක්වීමට ප්‍රමාණවත් කාලය සහ ඉඩකඩ ලබා දෙන්න. වාර්තාව සංස්කරණයේදී ආරක්ෂාව පිළිබඳව අවධානය යොමු

කරන්න. අදාළ ප්‍රවෘත්තිය නිසා නෛතික වශයෙන් ගැටලුකාරී තත්ත්වයන් පැනනැගිය හැකිදැයි ඔබ ආයතනයට නීති උපදෙස් ලබා දෙන පුද්ගලයාගෙන් විමසා බලන්න.

- ප්‍රවෘත්ති කාමරය වෙත පැමිණෙන අමුත්තෝ. ප්‍රවෘත්ති කාමරය වෙත අමුත්තන් පැමිණීමේදී හා ඔවුන් හමු වීමේදී ඔබේ අනුමැතිය අත්‍යවශ්‍ය කාරණයක් ලෙස පනවන්න. පැමිණෙන පුද්ගලයන් ප්‍රවෘත්ති කාමරයට නොව හමුවීම් පවත්වන කාමරයක් වෙත යෑමට සලස්වන අතරම, ප්‍රවෘත්තියට සම්බන්ධ අමුත්තන්ට අදාළ කණ්ඩායමේ වාර්තාකරුවන් පමණක් හමු වීමට ඉඩ සලස්වන්න.

- අවශ්‍ය අවස්ථාවලදී දැඩි බව. අදාළ වාර්තාකරු මුලින් එකඟ වූ ආරක්ෂාව පිළිබඳ උපදෙස් පිළිපැදීමට අසමත් වන්නේ නම්, ඒ ගැන විනය ක්‍රියාමාර්ග වෙත යොමු වන්න.

## මූලාශ්‍රයන්හි ආරක්ෂාව

ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් මුහුණ දී සිටින අනතුරුදායක තත්ත්වය වැනි තත්ත්වයකට ඔවුන්ට තොරතුරු සපයන මූලාශ්‍රයන්ට ද මුහුණ දීමට සිදු වේ.

මෙරට නෛතික රාමුව තුළ මූලාශ්‍රයන් සහ යමකට විරුද්ධව නැගී සිටින්නන් (උරුහන්බාන්නන්) ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් නීති නොතිබීම නිසා, මාධ්‍ය වාර්තාකරුවකුට තම මූලාශ්‍රයන් හෙළි නොකර සිටීමට නෛතික හිමිකමක් නැත. මෙය හේතුවෙන්, තම මූලාශ්‍ර හෙළිදරව් කිරීමට මාධ්‍යවේදීන්ට විවිධ බලඅධිකාරීන් විසින් බලපෑම් කරන ලද අවස්ථාවන් පිළිබඳව වාර්තා වේ.

ජීවිත තර්ජන පවතින අවස්ථාවන්හිදී මාධ්‍ය වාර්තාකරුවන් තම ආරක්ෂාව සඳහා අනුගමනය කරන මාර්ගෝපදේශ, තම මූලාශ්‍රයන්ගේ ආරක්ෂාව සඳහාද අනුගමනය කළ යුතු වේ. මාධ්‍යය සඳහා පමණක් භාවිතයට ගන්නා සිම් කාඩ්පතක් ඔබට තොරතුරු සපයන පුද්ගලයාටද දෙන්න. වහාම ඔබට කතා කිරීමට අවශ්‍ය විට හෝ හදිසි අවස්ථාවකට ඔහු හෝ ඇය මුහුණ දී සිටින විට, ඔබට ඒ පිළිබඳව දැනුම්දීමට යොදාගන්නා රහස්‍ය වචනයක් පිළිබඳව එකඟතාවකට පැමිණෙන්න. ඔබට තොරතුරු සපයන පුද්ගලයාට තර්ජනය කිරීම්, බියවැද්දීම් ආදියට මුහුණ දීමට සිදු වී ඇත් නම් ඒ පිළිබඳව ඔබේ කර්තෘවරයා දැනුම්වත් කරන්න. එකම ප්‍රසිද්ධ ස්ථානයකදී ඔහු හෝ ඇය දෙවරක් හමු වීමෙන් වළකින්න.

කෙසේ වෙතත්, අවසන් වශයෙන් වාර්තාකරුවන් සහ තොරතුරු සපයන පුද්ගලයන් අවදියෙන් සිටිය යුතු කාරණයක් වන්නේ තම ආරක්ෂාව පිළිබඳව නිශ්චිත සහතික වීමක් නැති බවයි. 2007 වසරේ *සන්ඩේ ලීඩර්* පුවත්පත වාර්තා කළ ප්‍රවෘත්තියක් මේ තත්ත්වය පිළිබඳව කදිම උදාහරණයක් සපයයි. මෙම කතා පුවතෙන් අනාවරණය වූයේ, උසස් පොලිස් නිලධාරීන්ගේ සහාය ඇතිව කොළඹ නගරයේ ක්‍රියාත්මක වූ මත්ද්‍රව්‍ය තිප්පොළවල් වැටලීමට එක් වූ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් අසත්‍ය චෝදනාවලට ලක් කරමින් වැරදිකරුවන් කළ ආකාරය පිළිබඳවයි. මෙම කතා ප්‍රවෘත්තියේ එලෙස චෝදනාවට ලක් වූ පොලිස් නිලධාරීන් කිහිප දෙනකුගේ උද්ධෘත පළ වූ අතර, එහි පොලිස් පරීක්ෂක ඩග්ලස් නිමල්ගේ උද්ධෘතයක්ද විය.

එම කතා ප්‍රවෘත්තිය පළ වූ දිනට පසු දිනම පොලිස් පරීක්ෂක ඩග්ලස් නිමල් අදාළ මාධ්‍යවේදිනියට ස්තූති කළ අතර, තමන්ගේ ඉහළ නිලධාරීන් කරන තවත් වැරදි පිළිබඳව තොරතුරු සැපයීමට ඇය හමු වීමට එන බවත්, තමා ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කිරීමට යමින් සිටින බවත් කියා සිටියේය. එහෙත් අනපේක්ෂිත ලෙස, නිමල් සහ ඔහුගේ බිරිය ඔවුන් අලුත්කඩේ උසාවියට යන අතරවාරයේ අතුරුගිරියේදී ඝාතනයට ලක් වූහ. දූෂණ පිළිබඳ හෙළිදරව් කිරීමට ඉදිරිපත් වීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කිරීම පොලිස් පරීක්ෂක නිමල්ගේ තීරණයක් වුවත්, අදාළ සිදුවීම වාර්තා කළ මාධ්‍යවේදිනියට මෙය පෞද්ගලික සහ වෘත්තිමය වශයෙන් අතිශය කනගාටුදායක මෙන් ම ප්‍රබල කම්පනයක් ඇති කිරීමටද හේතු වූ සිද්ධියක් විය. ගවේෂණාත්මක වාර්තාකරණයේදී ආරක්ෂාව පිළිබඳව කොතරම් සැලකිලිමත් විය යුතුද යන්න මෙයින් මනාව පැහැදිලි වේ.

# උපග්‍රන්ථය

## උපග්‍රන්ථය 1

# ගවේෂණාත්මක මාධ්‍යකරණය පිළිබඳ නිර්වචන

ගවේෂණාත්මක මාධ්‍යකරණය යනු බොහෝ විට අපරාධවලට, දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වන දූෂණවලට හෝ සමාගම්වල අක්‍රමිකතාවලට අදාළව තෝරාගත් එක් විෂයයක් පිළිබඳව වාර්තාකරුවන් ගැඹුරින් කරන සොයාබැලීමකි. ගවේෂණාත්මක වාර්තාකරුවකු හට සිය වාර්තාව සැකසීම සඳහා මාස ගණනාවක් හෝ වසර ගණනාවක් තොරතුරු ගවේෂණයේ යෙදීමට සිදු වනු ඇත. බොහෝ විට ගවේෂණාත්මක මාධ්‍යකරණයේ යෙදෙන්නේ පුවත්පත්, කේබල් හෝ විද්‍යුත් ප්‍රවෘත්ති ඒජන්සි සහ නිදහස් මාධ්‍යවේදීන් ය. මාධ්‍යවේදීන් අතර ගවේෂණාත්මක මාධ්‍යකරණය හැඳින්වීම සඳහා 'රැකවල් මාධ්‍යකරණය' (Watchdog Journalism) හෝ 'වගවීමේ වාර්තාකරණය' (Accountability Reporting) යන නම් භාවිත වේ.

- විකිපීඩියා

ගවේෂණාත්මක මාධ්‍යකරණය යනු විචාරාත්මක සහ සැබෑ මාධ්‍යකරණයයි.

- ගවේෂණාත්මක මාධ්‍යකරණය සඳහා ඕලන්ද සංසදය (Dutch Association for Investigative Journalism, VVOJ)

ගවේෂණාත්මක මාධ්‍යකරණය යනු ප්‍රවෘත්ති වාර්තාකරුවන් යම් පුද්ගලයකු සඟවාගෙන සිටින තොරතුරු පොදු යහපත උදෙසා ගවේෂණය කිරීමයි.

- කේම්බ්‍රිජ් ඔන්ලයින් ශබ්දකෝෂය (Cambridge Online Dictionary)

මෙවැනි වාර්තාකරණයකදී සිදු වන්නේ යමකු වසන් කිරීමට උත්සාහ කරන තොරතුරක්, බොහෝ විට හෙළාදැකිය යුතු යම් දෙයක්, වඩා විස්තරාත්මකව හෙළි කරගැනීම සඳහා මාධ්‍යවේදියා පුළුල් ගවේෂණයක යෙදීමයි.

- www.mediadictionary.com

ජනමාධ්‍යකරණයේ එක් ස්වභාවයක් වන මෙහිදී වාර්තාකරුවෝ දූෂණ හෝ රජයේ අක්‍රමිකතා පිළිබඳව සත්‍ය තොරතුරු සොයාගෙන, ඒවා මාධ්‍ය මගින් වාර්තා කිරීමට උත්සාහ කරති.

- www.publishingdictionary.com

ගවේෂණාත්මක වාර්තාකරණය යනු මතුපිටින් ඔබ්බට හාරා අවුස්සා, 'කවුද', 'කුමක්ද' 'කවදාද', කොතැනදීද' යන්න පමණක් නොව 'කෙසේද' සහ 'ඇයිද' යන්නද අවධාරණය කරමින්, සැබවින්ම සිදු වෙමින් තිබෙන දෙය පාඨකයාට පැවසීමයි. ප්‍රබල, පොදුජන හැඟීමෙන් යුතු ගවේෂණාත්මක මාධ්‍යකරණයට වඩා වැදගත් දායකත්වයක් අපට සමාජයට ලබා දිය නොහැකිය.

- ටෝනි බර්මන්, ප්‍රධාන කර්තෘ, සීබීසී නිවුස්

## උපග්‍රන්ථය 2

# ජනමාධ්‍යවේදයෙහි දස පනත

- පොදු බව (Universality) (සැමට ග්‍රහණය කරගත හැකි සහ ළඟා විය හැකි වීම)
- ආකර්ෂණීය බව (Being engaging) (ඉදිරිපත් කරන කරුණු පාඨකයාට හෝ ප්‍රේක්ෂකයාට රසවිඳීමට හැකි වීම)
- විවිධත්වය ආමන්ත්‍රණය කර තිබීම (Diversity) (සෑම පාඨකයකු සහ ප්‍රේක්ෂකයකුටම ග්‍රහණය කරගත හැකි යමක් තිබීම)
- බහුත්වය (Plurality of Expression) (වයස්, ලිංග, ජාති, ආගම් භේද නොසලකා සුළුතරය ද ආමන්ත්‍රණය කිරීම)
- විවිධ අනන්‍යතා පිළිබඳ සංවේදිත්වය (Identity) (දේශීය, කලාපීය අනන්‍යතාව සහ ප්‍රජාව පිළිබඳව, ඔවුන්ගේ සංස්කෘතික සහ භාෂාමය විවිධත්වය පිළිබඳව සංවේදී වෙමින් එම කණ්ඩායම් අතර සහජීවනය වෙනුවෙන් කටයුතු කිරීම)
- සංස්කරණයෙහි ස්වාධීනත්වය (Editorial Independence) (විවිධ යටි අරමුණු හෝ රජයේ බලපෑම්වලින් තොරව සංස්කරණ කටයුතුවල නියැළීම)
- ප්‍රමිතිය (Quality) (කරුණු ඉදිරිපත් කිරීමේ විලාසය, භාෂාව සහ ඡායාරූප යොදාගැනීම මගින් පලිගැනීම්, අපහාස ආදිය සිදු නොවිය යුතුය)
- නැවුම් බව (Originality) (එක ම කරුණු නැවත නැවත ලිවීම හෝ 'විකුණාගත හැකි කරුණු' ලිවීම නොව ඉදිරිපත් කරන තොරතුරුවල නව්‍යතාව)
- නිර්මාණශීලිත්වය (Innovative) (මෙතෙක් ගවේෂණය නොවූ ප්‍රවෘත්ති වාර්තාකරණය හෝ ඒ සඳහා නව ප්‍රවේශයන් අත්හදා බැලීම)
- සිතීමට පෙලඹවීම (Challenging) (පාඨකයා, ප්‍රේෂකයා හෝ අසන්නා අවසානයේ ඒ පිළිබඳව වැඩි දුර සිතීමට පොලඹවනසුලු වීම)

## උපග්‍රන්ථය 3

# ගවේෂණාත්මක වාර්තාකරණය සඳහා වූ සත්විධ නියම

**- ක්ලාක් මොලන්හොෆ් විසිනි**

### නියමය 01

දේශපාලන වශයෙන් ඔබ තුළ ඇති අනුගාමිකත්වය සහ පක්ෂපාතිත්වය ඈඳාගැනීමෙන් වළකින්න. ඔබ එක් දේශපාලන පක්ෂයක් පමණක් ගවේෂණය කිරීමෙන් හෝ ඒ සඳහා විශේෂ නැඹුරුවක් දැක්වීමෙන් වුවද ඔබ අපේක්ෂා කරන ප්‍රතිඵලය අහිමි වනු ඇත.

### නියමය 02

ඔබට තොරතුරු ගවේෂණයේදී වැඩිදුර විමසීම් සිදු කිරීමට හමු වන රාජ්‍ය නිලධාරීන් කෙරෙහි පවතින්නේ ප්‍රසාදයක් හෝ අප්‍රසාදයක් විය හැකිය. එහෙත් ඒ කවරකුට වුවත් සෘජුව සහ දැඩිව ඔබේ ප්‍රශ්න එල්ල කරන්න. මන්දයත්: අදාළ නිලධාරියා ඔබේ ප්‍රසාදය දිනාගත් හෝ හිතවත් අයකු නම්, ඔහුගෙන් සෘජුව හා දැඩිව ප්‍රශ්න කිරීම් සිදු කිරීමෙන් ඔබ ඔහුට වග වීම සඳහා අවස්ථාවක් ලබා දෙන බැවිනි.

### නියමය 03

ඔබ ගවේෂණය කරන ප්‍රවෘත්තියට අදාළ වන්නේ නගරයක, ගමක, රාජ්‍යයක හෝ සන්ධීය ආණ්ඩුවක ගැටලුවක් වුවත්, ඊට මහා කම්කරු ව්‍යාපාර හෝ මහා ව්‍යාපාරිකයන් සම්බන්ධ වී සිටියත් ඒ පිළිබඳව ඔබට මනා අවබෝධයක් තිබිය යුතුය. ඔබ සිටින්නේ බෙහෙවින් තාක්ෂණික හෝ දැඩි ලෙස සංකීර්ණ තොරතුරු සහිත වටපිටාවක නම්, ඔබට අසන්නට ලැබෙන දේ පිළිබඳ නිසි අවබෝධයකින් තොර වීම නිසා ඔබ සිදු කරන වාර්තාකරණයෙන් බලාපොරොත්තු නොවූ වැරදි සිදු විය හැකිය.

### නියමය 04

ඔබ වාර්තා කරන තොරතුරු සඳහා මූලික වන කරුණු අතිශයෝක්තියෙන් යුතුව හෝ විකෘත කොට දැක්වීමෙන් වළකින්න. හැඟීම්බර වාර්තාකරණය ඔබ කෙරෙහි ඇති විශ්වසනීයත්වය නැති වී යෑමට හේතු වනු ඇත.

### නියමය 05

ඔබට මූලාශ්‍ර වන පුද්ගලයන් සමග මෙන්ම ඉලක්ක වන පුද්ගලයන් සමග සම්බන්ධ වීමේදීද සෘජුව හා අවංකව කටයුතු කරන්න. පුද්ගලයන් ග්‍රහණයට ගැනීම සඳහා උපායන් හෝ රැවටිලි යොදා නොගන්න. විවිධ පුද්ගලයන් ලෙස පෙනී සිටිමින්, විශේෂයෙන් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ලෙස පෙනී සිටිමින් අදාළ පුද්ගලයන්

හා සම්බන්ධ වීමට උත්සාහ නොකරන්න. ඔබ අවංකව හා සෘජුව ඔබට තොරතුරු දැනගැනීමට අවශ්‍ය පුද්ගලයා සමග සම්බන්ධ වීමෙන්, බොහෝ විට පසු කාලීනව, අදාළ ආයතන පිළිබඳ අභ්‍යන්තර තොරතුරු ඔබට ලබාදෙන විශ්වාසවන්ත මූලාශ්‍රයක් ගොඩනැගීමට ඉඩ ඇත.

### නියමය 06

කිසි විටක නීතිය කඩ කිරීමෙන් වැළකී සිටිය යුතුය. එවැන්නකින් මතු විය හැකි ප්‍රතිඵලවලට මුහුණ දීමට සූදානම් නම් පමණක් ඔබට නීතිය අබිබවා කටයුතු කළ හැකිය. තොරතුරු ලබාගැනීම සඳහා නීතිය කඩ කරන සෑම අවස්ථාවකම ඔබ අවදානම් තත්ත්වයක් නිර්මාණය කරගන්නා අතර, ඔබගේ මෙන්ම ඔබ වාර්තා කිරීමට අපේක්ෂිත ප්‍රවෘත්තියේ විශ්වසනීයත්වයද කෙලෙසනු ඇත.

### නියමය 07

යමකුට දොස් පැවරෙන වාර්තාකරණයක් කරන බව ඔබ දන්නා සෑම අවස්ථාවකම ඒ සඳහා සෘජු සාක්ෂි යොදාගන්න. මතු කරන ප්‍රශ්නවලට පූර්ණ ලෙස ප්‍රතිචාර දැක්වීමට ප්‍රමාණවත් අවස්ථාවක් ඉලක්ක පුද්ගලයාට ලබා දෙන්න. ඔබට යමකු ලබා දෙන තොරතුරුවල සත්‍යතාව සම්බන්ධයෙන් ඇත්තේ දිවුරා සහතික වීමක් පමණක් නම්, එම පුද්ගලයාට ඉන් පෞද්ගලික වාසියක් නොලැබෙතත්, එහි විශ්වසනීයත්වය පිළිබඳව බොහෝ විට ගැටලු පැනනැගිය හැකිය. එසේම, ඔබගේ මූලාශ්‍රය අදාළ සිදුවීමෙන් ටිකෙන් ටික දුරස් වුව හොත් වාර්තාකරණය වැරදීමට තිබෙන ඉඩකඩ බෙහෙවින් වැඩි වේ.

**- උත්සුක වන මාධ්‍යවේදීන්ගේ කමිටුව**
(The Committee of Concerned Journalists)

## උපග්‍රන්ථය 4

# ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම අනුමත කළ, ශ්‍රී ලංකා කර්තෘ සංසදය විසින් සකසන ලද වෘත්තීය ප්‍රතිපත්ති මාලාව (ආචාරධර්ම සංග්‍රහය)

### 1. පූර්විකාව

සෑම පුවත්පත් ආයතනයක් සහ පුවත්පත් කලාවේදියකුම උක්ත වෘත්තීය ආචාරධර්ම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින අතර, මින් බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍ය කලාව නිදහස්ව කටයුතු කරමින් ජනතාවට වගකියන අතර, පාඨකයාගේ අවශ්‍යතාවලට සහ අපේක්ෂාවලට සංවේදී වෙමින් ඉහළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව පවත්වා ගෙන යෑමයි.

මෙම ආචාරධර්ම සංග්‍රහය අවශ්‍ය වන්නේ, පුවත්පත්වල නිරවද්‍යතාව සහ වෘත්තීය අවංකභාවය රැකගැනීමට වෑයම් කරන අතරම මහජන ශුභ සිද්ධිය උදෙසා ගවේෂණාත්මක වාර්තාකරණයේ විශිෂ්ට සම්ප්‍රදයන් සුරකිමින්, පුවත්පත් නිදහසට වළ කපන වාණිජවාදී විකෘත කිරීම්වලින් හෝ නොවිධිමත් පීඩනයන්ගෙන් හෝ පටු ආත්මාර්ථයෙන් තොරව ස්වාධීනව ක්‍රියා කිරීමයි. පුවත්පත්වලට සහ පුවත්පත් කලාවේදීන්ට නිදහසේ ප්‍රබල අදහස් දැරීමටත් ප්‍රකාශ කිරීමටත් හැකි අතර, අන් අදහස් නිසි ලෙස සැලකිල්ලට ගැනීමටත් සමාජ වගකීම ඉටු කිරීමටත් උත්සාහ දැරිය යුතු වේ.

මෙම ආචාර ධර්ම සංග්‍රහය, එක් එක් පුද්ගලයාගේ මෙන්ම මහජනයාගේත් තොරතුරු දැන ගැනීමේ අයිතිය ආරක්ෂා කරයි. මෙම වචනවලට පමණක් නොව එහි අර්ථයටද ගෞරව කළ යුතුය. එහෙත්, තනි පුද්ගලයකුගේ අයිතියට ගරු කිරීමට ඇති කැප වීම නිසා හෝ මහජන ශුභ සිද්ධිය වෙනුවෙන් ප්‍රකාශනය වැළැක්වීම ලෙස එය කිසිවිටෙකත් අර්ථ නිරූපණය නොකළ යුතුය.

### 2. නිරවද්‍ය වාර්තාකරණය

2.1 මාධ්‍ය මගින් සෑම විටම ප්‍රවෘත්ති සහ ඡායාරූප විකෘත නොකොට නිරවද්‍ය ලෙස වාර්තා කිරීමට වගබලාගත යුතුයි.

2.2 පුවත්පත් කලාවේදීන් මෙන්ම කර්තෘවරුන් ද යම් වාර්තාවක් ප්‍රසිද්ධ කිරීමට පෙර එහි නිරවද්‍යතාව පිළිබඳව සොයා බලා තහවුරු කිරීමට කටයුතු කළ යුතුයි. එසේ කළ නොහැකි අවස්ථාවලදී ඒ පිළිබඳව අදාළ ප්‍රවෘත්ති වාර්තාකරණයෙහිදී සඳහන් කළ යුතුයි.

2.3 කර්තෘවරුන්, ඔවුන්ගේ කාර්ය මණ්ඩලය සහ ලිපි සපයන පිටස්තර පුද්ගලයන්ද සාවද්‍ය සහ වැරදියැයි දන්නා තොරතුරු වාර්තා කිරීමෙන් වැළකී සිටිය යුතුය.

2.4 මහජන ශුභ සිද්ධිය වෙනුවෙන් සෑම ප්‍රකාශනයක්ම ගවේෂණාත්මක වාර්තාකරණයේ නිරත විය යුතුය.

## 3. නිවැරදි කිරීම් සහ සමාව අයැදීම්

3.1 කර්තෘවරයා ප්‍රකාශිත යම් ප්‍රවෘත්තියක වැරදි තොරතුරු ඇතුළත් බව දැනගත් වහාම එය නිවැරදි කර, අවශ්‍යතාව පරිදි පාඨකයාගේ සමාව අයැදීමින් නිසි ප්‍රමුඛත්වයක් සහිතව පළ කිරීමට කටයුතු කළ යුතුය. එම වැරදි තොරතුරුවලින් ඉලක්ක කරගන්නා පාර්ශ්වය එලෙස සමාව අයැදීමක් අවශ්‍ය නොවන බව දක්වා සිටින විට එවැනි සමාව අයැදීමක් සඳහන් කර සිටීම අවශ්‍ය නොවේ.

## 4. ප්‍රතිචාර දැක්වීම/පිළිතුරු දීම සඳහා අවස්ථා

4.1 යම් ආයතනයක හෝ පුද්ගලයකුගේ කීර්ති නාමය, අභිමානය, ගෞරවය, පෞද්ගලිකත්වය, හැඟීම් සහ තනතුර කෙරෙහි බලපෑමට හේතු වන වැරදි තොරතුරු වාර්තා වූ අවස්ථාවකදී, අදාළ පාර්ශ්වයට ඒ සඳහා පිළිතුරු දීමට ප්‍රමාණවත් අවස්ථාවක් ලබා දිය යුතුය. එම පිළිතුරට ඇතුළත් විය යුත්තේ අදාළ ගැටලුවට මුහුණ දුන් පාර්ශ්වය විසින්ම වාර්තාගත කරුණු පිළිබඳව දක්වන අදහස වන අතර, එය වැරදි නිවැරදි කිරීමට පමණක් සීමා විය යුතුය.

4.2 අදාළ ගැටලුවට මුහුණ දුන් පාර්ශ්වය දෙන පිළිතුරට ප්‍රතිචාර දක්වන පුවත්පත හෝ පුවත්පත් කලාවේදියා, වැරදි පිළිබඳව සමාව ගැනීමට හෝ කනගාටුව පළ කිරීමට අමතරව අදාළ පාර්ශ්වයට නැවත කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීමද කළ යුතුය.

## 5. රහසිගත මූලාශ්‍ර

5.1 සෑම මාධ්‍යවේදියකු හටම තමාට තොරතුරු ලබා දීමට ඉදිරිපත් වන රහසිගත මූලාශ්‍රවල අනන්‍යතාව හෙළි නොකිරීමේ සදාචාරාත්මක බැඳීමක් පවතින අතර, අනන්‍යතාව හෙළි කළ හැක්කේ ඔවුන් ඒ සඳහා අවසර ලබා දුන් විට පමණි.

## 6. සාමාන්‍ය කටයුතු වාර්තාකරණය

6.1 දරුණු අපරාධ, ප්‍රචණ්ඩත්වය, මත්ද්‍රව්‍ය භාවිතය, වධ බන්ධන, පරපීඩාකාමය, ලිංගික හිංසනය, අසභ්‍ය ක්‍රියා වැනි ඛේදජනක හෝ හද කම්පා කරවන සමාජ ගැටලුවක් වාර්තා කිරීමේදී පුවත්පත් ඊට අදාළ කරුණු, අදහස්, ඡායාරූප සහ ග්‍රාපික සටහන් ඉදිරිපත් කළ යුත්තේ නිසි සංවේදී බවින් සහ විචක්ෂණශීලී බවින් යුතුවය. එහිදී සිහි තබාගත යුතු ප්‍රධාන කාරණය නම් එය මහජන ශුභ සිද්ධිය උදෙසා සිදු කරන වාර්තා කිරීමක් බවයි.

6.2 අපරාධ සහ අපරාධ නඩු පිළිබඳ කතා පුවත් පළ කිරීමේදී, නීතියෙන් ඉඩකඩ නොලැබෙන්නේ නම් සහ මහජන ශුභ සිද්ධිය නොසැලසෙන්නේ නම් වාර්තා නොකළ යුතු කරුණු තුනකි. එනම්:

i. ලිංගික අපරාධවලට ගොදුරු වන පුද්ගලයන්ගේ නම්
ii. අපරාධයක් සඳහා ප්‍රථම වතාවට වරදකරුවකු වන අවුරුදු 16ට අඩු ළමයින්ගේ නම්
iii. අපරාධයකට චෝදනා ලබන හෝ අපරාධයකට වරදකරු ලෙස තීරණය වන පුද්ගලයාගේ ඥාතීන් අවසරයකින් තොරව හඳුන්වාදීම.

6.3 පුවත්පත් කලාවේදියා දැනුවත්ව හෝ හිතාමතා ජාති, ආගම් භේද, ප්‍රචණ්ඩත්වය ව්‍යාප්ත කිරීමට ක්‍රියා නොකළ යුතුය.

6.4 i) පුවත්පත් කිසිවිටෙකත් පුද්ගලයකුගේ ජාතිය, වර්ණය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය මෙන්ම ඔහුගේ හෝ ඇයගේ කායික, මානසික රෝගී භාවය හෝ ආබාධිත භාවය පිළිබඳව අගතිගාමීව, නින්දා සහගතව සඳහන් නොකළ යුතුය.

ii) යම්කිසි පුවත්පත් ආයතනයක් කතා පුවතක් පළ කිරීමේදී එම ප්‍රවෘත්තියට සෘජුවම අදාළ වන්නේ නම් පමණක් හැර එම කතා පුවතට අදාළ පුද්ගලයාගේ ජාතිය, ආගම, කුලය, ලිංගික නැඹුරුව හෝ කායික, මානසික, ආබාධිත බව පිළිබඳව සඳහන් කිරීමෙන් වැළකිය යුතුය.

6.5 i) නීතියෙන් බාධාවක් නැතත්, පුවත්පත් කලාවේදීන් යම් ප්‍රවෘත්තියක් පළ කිරීමට පෙර ඔවුන්ගේ අතට පත් වන මූල්‍ය තොරතුරු යොදාගෙන තමාට පෞද්ගලිකව ලාභ ප්‍රයොජන ලබාගැනීමට හෝ ඒවා අන් අයගේ ලාභ ප්‍රයෝජනය සඳහා ලබා දීමට කටයුතු නොකළ යුතුය.

ii) එසේම, තමන්ට හෝ තමන්ට සමීප පවුල්වලට සැලකිය යුතු මූල්‍ය ලාභ ප්‍රයෝජනයක් සැලසෙන බව දන්නා අවස්ථාවලදී, එම ලාභ ප්‍රයෝජනය පිළිබඳව පුවත්පතේ ප්‍රකාශකයාට, කර්තෘට හෝ මූල්‍ය සංස්කාරකවරයාට දැනුම් නොදී කොටස් හෝ සුරැකුම්පත් පිළිබඳව ලිවීමෙන් වැළකිය යුතුය.

## 7. පෞද්ගලිකත්වය

7.1 ප්‍රවෘත්ති වාර්තාකරණයේදී පුද්ගලයන්ගේ පෞද්ගලික හෝ පවුල් ජීවිතයට, නිවසට, සෞඛ්‍ය තත්ත්වයට හා ලියුම් ගනුදෙනුවලට බලපාන කරුණු අවසරයකින් තොරව වාර්තා කිරීම සාධාරණීකරණය වන්නේ ඒවා මහජන ශුභ සිද්ධිය සඳහා බලපාන කාරණයකට ප්‍රබලව අදාළ වන්නේ නම් පමණි.

7.2 මහජන ශුභ සිද්ධිය සඳහා බලපාන කාරණයකට හැර අන් කිසිම හේතුවක් නිසා, පෞද්ගලික හෝ පොදු ස්ථානයකදී අවසරයකින් තොරව යම් පුද්ගලයකුගේ පෞද්ගලික ජීවිතයට අදාළ තොරතුරු ඡායාරූපගත කිරීම සඳහා දිගු දුර කාච සහිත කැමරා හෝ වෙනත් කැමරා භාවිතය පිළිගත් සම්ප්‍රදායක් නොවේ.

7.3 දැඩි ශෝකය, කම්පනය වැනි තත්ත්වයන්ට මුහුණ දී සිටින පුද්ගලයන්ගේ තොරතුරු විමසීමේදී අතිශයින් සංවේදී හා විචක්ෂණශීලී වීම වැදගත් වේ.

7.4 තමන්ගේ පාසල් කාලය අනවශ්‍ය මැදිහත් වීම්වලින් තොරව ගත කිරීමට තරුණයන්ට නිදහස තිබිය යුතුය. දෙමාපියන්ගේ හෝ භාරකරුගේ කීර්තිය, අපකීර්තිය හෝ තත්ත්වය හැර මහජන සුභසිද්ධියට බලපාන විශේෂ කාරණයක් තිබේ නම් පමණක් පාසල් යන වයසේ දරුවකුගේ පෞද්ගලික ජීවිතයට අදාළ කරුණු වාර්තා කළ හැකි වේ.

7.5 රෝහල් හෝ එවැනි වෙනත් ආයතනගතව සිටින අවස්ථාවන්හිදී පෞද්ගලිකත්වය හෙළිදරව් කිරීමට අදාළ සීමාවන් විශේෂයෙන් අදාළ වන අතර, ඔවුන් පිළිබඳව වාර්තා කළ හැක්කේ එය මහජන සුභසිද්ධියට අදාළ කාරණයක් නම් පමණි.

## 8. හිරිහැර සහ ප්‍රයෝග

8.1 පුවත්පත් කලාවේදීන් - විශේෂයෙන්ම ඡායාරූප පුවත්පත් කලාවේදීන් - බියගැන්වීම හෝ හිරිහැර කිරීම මගින්, සාවද්‍ය ලෙස කරුණු විස්තර කිරීම හෝ ප්‍රයෝගය මගින් තොරතුරු හෝ ඡායාරූප ලබාගැනීමට උත්සාහ නොකළ යුතුය. මහජන සුභ සිද්ධියට අදාළ කාරණයක් නම් සහ තොරතුරු ලබාගත හැකි අන් ක්‍රමයක් නොමැති නම් පමණක් දුර රූප ගත හැකි කාච සහිත විශේෂිත කැමරා හෝ රහසින් සවන්දිය හැකි උපකරණ භාවිත කළ යුතුය.

## 9. ගෞරවය

9.1 සෑම පුවත්පත් කලාවේදියකුම සිය වෘත්තියෙහි ගෞරවය ආරක්ෂා කළ යුතුය.

## අර්ථ නිරූපණය

මහජන සුභසිද්ධියට අදාළ කාරණා වන්නේ:

1. (i) ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, අදහස් ප්‍රකාශනයේ නිදහස සහ ජනයාගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ජනයා කෙරෙහි සෘජුව හෝ වක්‍රව බලපෑම් ඇති කාරණා වන ඡන්ද බලයෙන් පත් කළ රජයේ, අපරාධ, දූෂණ සහ පරිපාලන අක්‍රමිකතා හෝ බරපතළ අපචාර ක්‍රියා පිළිබඳව ඔවුන් දැනුම්වත් කිරීම.

   (ii) මහජන සෞඛ්‍යය, සුරක්ෂිතභාවය, සමාජ, සංස්කෘතික සහ අධ්‍යාපනික ප්‍රමිති ආරක්ෂා කිරීම.

   (iii) යම් පුද්ගලයකු හෝ ආයතනයක් සිදු කරන ප්‍රකාශයක් හෝ ක්‍රියාවක් නිසා මහජනයා නොමග යාමෙන් ආරක්ෂා කිරීම.

2. එහෙත් මහජන සුභ සිද්ධියට අදාළ කාරණයකදී, අදාළ කර්තෘවරයාගෙන් හෝ ජනමාධ්‍යවේදියාගෙන් මහජන සුභසිද්ධිය වෙනුවෙන් දායක වූ ආකාරය පිළිබඳ පූර්ණ පැහැදිලි කිරීමක් කරන ලෙස ඉල්ලා සිටීමට ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමට අයිතියක් තිබේ.

## සමාලෝචනය

ශ්‍රී ලංකා කර්තෘ සංසදයට මෙම ආචාරධර්ම සංග්‍රහය වසරකට වරක්වත් සමාලෝචනය කිරීමේ හැකියාව පවතී.

# උපග්‍රන්ථය 5

# ජාත්‍යන්තර ජනමාධ්‍යවේදී සම්මේලනය ප්‍රකාශයට පත් කළ ජනමාධ්‍යවේදී චර්යා මූලධර්ම පිළිබඳ ප්‍රකාශනය

මෙම ජාත්‍යන්තර ප්‍රකාශනය ප්‍රසිද්ධ කෙරෙනුයේ, සිදුවීම් විස්තර කිරීම සඳහා ප්‍රවෘත්ති සහ තොරතුරු රැස් කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ, පතළ කිරීමේ සහ ඒවා පිළිබඳව අදහස් දැක්වීමේ නිරත මාධ්‍යවේදීන්ගේ වෘත්තීය චර්යාව සඳහා වන ප්‍රමිතියක් වශයෙනි.

1. ජනමාධ්‍යවේදියාගේ මූලික කාර්යභාරය විය යුත්තේ සත්‍යයටත් සත්‍ය දැනගැනීම සඳහා ජනතාවට ඇති අයිතියටත් ගරු කිරීමයි.

2. මේ සඳහා ක්‍රියා කරන සෑම අවස්ථාවකදීම, ජනමාධ්‍යවේදියා අවංකව තොරතුරු රැස් කරමින් සහ පළ කරමින් නිදහස පිළිබඳ මූලධර්මද, සාධාරණව අදහස් දැක්වීමේ සහ විවේචනය කිරීමේ අයිතිය පිළිබඳ මූලධර්මද ආරක්ෂා කළ යුතුය.

3. ජනමාධ්‍යවේදියා සෑම විටම වාර්තා කළ යුත්තේ මූලාශ්‍ර සහිත කරුණු පදනම් කරගෙනයි. ජනමාධ්‍යවේදියා කිසි විටෙකත් අත්‍යවශ්‍ය තොරතුරු වසන් කිරීමට හෝ තමන් රිසි පරිදි ලියකියවිලි වෙනස් කිරීමට කටයුතු නොකළ යුතුය.

4. ජනමාධ්‍යවේදියා සෑම විටම සිය ප්‍රවෘත්ති එක් රැස් කිරීමේදී සහ ඒවාට අදාළ ඡායාරූප සහ ලියකියවිලි ලබාගැනීමේදී භාවිත කළ යුත්තේ සාධාරණ ක්‍රමයි.

5. ප්‍රකාශයට පත් කර ඇත්තේ හානිකර ලෙස වැරදි තොරතුරු නම් ඒවා නිවැරදි කිරීම සඳහා ජනමාධ්‍යවේදියා උපරිම ක්‍රියාමාර්ග ගත යුතු වේ.

6. ජනමාධ්‍යවේදියා සෑම විටම තමාට රහසේ තොරතුරු සපයන මූලාශ්‍රයේ රහස්‍යභාවය ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුය.

7. ජනමාධ්‍ය තුළින් ජාතිය, ආගම, භාෂාව, ස්ත්‍රී-පුරුෂභාවය, ලිංගික නැඹුරුව, දේශපාලනික හෝ වෙනත් අදහස් සහ ජාතික හෝ සාමාජීය පසුබිම මූලික කරගනිමින් ඒ අදාළ පාර්ශ්වයන්ට වෙනස්කම් සිදු කිරීමට දායක වීම පිළිබඳව ජනමාධ්‍යවේදියා අවදියෙන් සිටීම ඉතා වැදගත් වන අතර, එවැනි තත්ත්වයන් සඳහා දායක වීමෙන් ඉවත් වී සිටීමට උපරිම අයුරින් කටයුතු කළ යුතුය.

8. ජනමාධ්‍යවේදියා සෑම විටම පහත සඳහන් කටයුතු සිය වෘත්තියට සිදු කළ හැකි බරපතළ වැරදි ලෙස සැලකිය යුතුය:

- අන් අය විසින් රචනා කරන ලද ලිපි සඳහා අයිතිවාසිකම් කීම හෙවත් අනුන්ගේ අදහස් සොරාගැනීම.
- ද්වේෂ සහගත ලෙස වරදවා විස්තර කිරීම.
- බොරු චෝදනා නැගීම.
- අපහාස කිරීම.
- අහේතුක ලෙස වැරදිකරුවන් කිරීම.
- යමක් පළ කිරීම හෝ පළ නොකර වසන් කිරීම වෙනුවෙන් අල්ලසක් ලබාගැනීම.

9. සැබෑ ජනමාධ්‍යවේදියා ඉහත සඳහන් මූලධර්මවලට පක්ෂපාතීව තම කාර්යභාරය ඉටු කිරීම සිය යුතුකමක් වශයෙන් සැලකිය යුතුය. තම රටේ සාමාන්‍ය නීතියට යටත්ව ජනමාධ්‍යවේදියා වෘත්තීය කාරණාවලදී පිළිගත යුත්තේ සිය සගයන්ගේ අණසක පමණක් වන අතර, රජයෙන් හෝ වෙනත් පාර්ශ්වයකින් කෙරෙන සියලු බාධා කිරීම් බැහැර කළ යුතුය.

## උපග්‍රන්ථය 6

# ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ කෙසේද?

### ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ රීති සහ පැමිණිලි කාර්ය පටිපාටිය

1. ශ්‍රී ලංකාව තුළ ප්‍රසිද්ධ කරනු ලබන පුවත්පතක හෝ සඟරාවක පළකරන ලද ප්‍රවෘත්ති වාර්තාවක්, ලිපියක්, ඡායාරූපයක් සහ/හෝ ග්‍රාපික නිර්මාණයකින් තමාට අහිතකර බලපෑමක් සිදුවී ඇතැයි සාධාරණ ලෙස විශ්වාස කරන යම් තැනැත්තෙකුට ඒ බව ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමට පැමිණිලි කළ හැකිය. අදාළත්වය අනුව ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම තෙවන පාර්ශ්වීය පැමිණිලි ද භාරගත යුතුය.

2. එකී පැමිණිලිකරුගේ පැමිණිල්ල ලියවිල්ලකින් විය යුතු අතර, නිසි ලෙස අත්සන් කොට, වඩා සුදුසු පරිදි නම් නියමිත ආකෘති පත්‍රයට අනුව සකසා, ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත පුද්ගලිකවම භාරදීම හෝ ලියාපදිංචි තැපෑලෙන්, ෆැක්ස් හෝ ඊමේල් මගින් හෝ වෙනත් විද්‍යුත් පණිවුඩ හුවමාරු ක්‍රමයකින් ලැබීමට සැලැස්වීම කළ යුතුය.

3. තමාට අහිතකර සේ බලපෑමක් සිදු වූයේ යැයි චුදිත පළකරන ලද අයිතමයේ පිටපතක් පැමිණිලිකරු විසින් එකී පැමිණිල්ලට ඇමිණිය යුතුය. ඊමේල් හෝ වෙනයම් විද්‍යුත් පණිවුඩ හුවමාරු ක්‍රමයක් මගින් පැමිණිල්ල යොමු කර ඇති අවස්ථාවක, නිසි ලෙස අත්සන් කළ පැමිණිලි ආකෘති පත්‍රය සමග පැමිණිල්ලේ සහ චුදිත පළකරන ලද අයිතමයේ පිටපතක්ද වැඩ කරන දින හත තුළදී ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත ඉදිරිපත් කළ යුතුය.

4. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සහ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම තත්කාලීනව පිළිගන්නා ශ්‍රී ලංකා කර්තෘ සංසද වෘත්තීය ප්‍රතිපත්ති මාලාව චුදිත පළකරන ලද අයිතමයෙන් කඩ වී ඇති බව පෙනී යන්නේ නම් පමණක්, ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ප්‍රධාන විධායක නිලධාරිවරයා විසින් නිසි ලෙස ලැබී ඇති පැමිණිල්ලක් ලෙස භාරගත යුතුය.

5. කිසියම් පළකරන ලද අයිතමයකට එරෙහිව එය පළකිරීමෙන් අවුරුදු දෙදකට පසුව කෙරෙන පැමිණිල්ලක් ප්‍රධාන විධායක නිලධාරිවරයා විසින් භාර නොගත යුතුය.

6. පැමිණිල්ල භාරගැනීමෙන් පසු ප්‍රධාන විධායක නිලධාරිවරයා විසින් ඒ බව පැමිණිලිකරුට පිටපතක් ද සහිතව උක්ත පුවත්පතේ හෝ සඟරාවේ කර්තෘවරයා වෙත දැනුම් දිය යුතු අතර, එකී කර්තෘවරයාගෙන් වැඩ කරන දින තුනක කාලයක් තුළ පිළිතුරක් එවන ලෙස ඉල්ලා සිටිය යුතුය.

7. තමාගේ පිළිතුරු නියමිත දිනයේදී ඉදිරිපත් කිරීමට එම පුවත්පතේ හෝ සඟරාවේ හෝ කර්තෘවරයා අපොහොසත් වීමේ ප්‍රතිඵලය වන්නේ එකී පැමිණිල්ල ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් සභාව විසින් විනිශ්චය කිරීම සඳහා සෘජුව ඒ වෙත යොමු කිරීමයි. එසේ වුව ද, කර්තෘවරයා හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් උත්තර දීම සඳහා කල් ඉල්ලා සිටියහොත් සහ ඒ ඉල්ලීම සාධාරණ ඉල්ලීමක් බව ප්‍රධාන විධායක නිලධාරිවරයා විසින් සලකනු ලබන්නේ නම්, ප්‍රධාන විධායක නිලධාරිවරයා විසින් එලෙස කාලය ලබා දීම කරනු ලැබිය හැකිය.

8. ඉතා කෙටිම කාලයක් තුළදී එහෙත් පැමිණිල්ල භාරගත් දිනයේ සිට සති දෙකකට වැඩිනොවන කාලයක් තුළදී, නිරවුල් කරගැනීමකට එළඹීමට දෙපාර්ශ්වයට පහසුවන පිණිස, සමාදාන කිරීමක් මගින් සහ/හෝ සමථයකට පත් කිරීමක් මගින් ප්‍රධාන විධායක නිලධාරිවරයා විසින් සියලු උත්සාහ දැරිය යුතුය. එවැනි නිරවුල් කරගැනීමකට නිවැරදි කිරීමක් සහ/හෝ සමාව අයැදීමක් සහ/හෝ පිළිතුරු දීමට ඇති අයිතිය හෝ ඇතුළත් විය හැකිය. එහෙත්, අවශ්‍ය නම් ප්‍රධාන විධායක නිලධාරිවරයාට එවැනි සමථයකට පත් කිරීමක් සඳහා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් සභාවේ සාමාජිකයකු යෙදවිය හැකිය.

9. පැමිණිල්ල කරන ලද්දේ කවර පුවත්පතකට හෝ සඟරාවකට හෝ එරෙහිවද ඒ පුවත්පත හෝ සඟරාව හෝ විසින් ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම ඉදිරිපිට කරන ලද සමථයක් ප්‍රකාරව නිවැරදි කිරීමක් සහ/හෝ සමාව අයැදීමක් සහ/හෝ පිළිතුරු දීමේ අයිතියක් පළකරන විට, ඒ පුවත්පතේ හෝ සඟරාවේ හෝ එම පළකිරීම කරන ලද්දේ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම ඉදිරිපිටදී එළඹුණු නිරවුල් කිරීමක් ප්‍රකාරව බව එකී පුවත්පතේ හෝ සඟාරාවේ හෝ විශේෂයෙන් සඳහන් කළ යුතුය.

10. සමාදාන කිරීම සහ/හෝ සමථයකට පත් කිරීම මගින් නිරවුල් කිරීමක් නොකළ හැකි අවස්ථාවක, සමාදාන කිරීම සහ/හෝ සමථයකට පත් කිරීම මගින් නිරවුල් කිරීමකට එළඹීමට නොහැකි වූ දිනයේ සිට සති දෙකක් ඇතුළතදී ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් සභාව විසින් පැමිණිල්ල විනිශ්චය කළ යුතුය.

11. එහෙත්, මහජන යහපත සහ/හෝ පුවත්පත් කර්මාන්තයේ යහපත සහ/හෝ පැමිණිලිකරුගේ යහපත සඳහා එවැනි විනිශ්චය කිරීමක් අවශ්‍ය කරන බව පෙනී යන්නේ නම්, ප්‍රධාන විධායක නිලධාරිවරයා විසින් භාරගන්නා ලද යම් පැමිණිල්ලක් විනිශ්චය කිරීම පිණිස කෙළින්ම ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් සභාව වෙත යොමුකළ හැක්කේය.

12. එවැනි විනිශ්චය කිරීමක් සඳහා වන ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් සභාවේ සාමාජිකයන් කවුරුන් විය යුතුද යන්න පිළිබඳව, එකී විනිශ්චයට සහභාගි වන පාර්ශ්වකරුවන් විසින් එකඟතාවකට පැමිණිය යුතුය.

13. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් සභාව විසින් කරනු ලබන යම් විනිශ්චය කිරීමක් සඳහා ගණපූරණය තුනක් විය යුතු අතර, එහිදී හැම විටම පුවත්වත්වලට සම්බන්ධයක් නැති සාමාජිකයන්ගේ බහුතරයක් පවත්වාගත යුතුය.

14. පැමිණිලි කරන ලද කාරණයට නිශ්චිත පුද්ගලික සම්බන්ධතාවක් ඇති ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් සභා සාමාජිකයෙකු වෙත් නම් ඔහු එවැනි විනිශ්චය කිරීමකට සහභාගි නොවිය යුතුය.

## සාක්ෂි

15. බේරුම්කාර විනිශ්චය මණ්ඩලය ඉල්ලා සිටි විට, ඔප්පු කිරීමට තමන් බලාපොරොත්තු වන්නේ කුමක්ද යන්න නිශ්චිතව දක්වමින් පාර්ශ්වකරුවන් තමන් තහවුරු කිරීමට අපේක්ෂා කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

16. බේරුම්කාර විනිශ්චය මණ්ඩලය ඉල්ලා සිටින පරිදි පාර්ශ්වකරුවන් තමන් විශ්වාසය තබන ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

17. බේරුම්කාර විනිශ්චය මණ්ඩලය විසින් උචිත යැයි සලකනු ලබන විට ලිඛිත දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස නියම කළ හැකිය.

18. බේරුම්කාර විනිශ්චය මණ්ඩලය, කිසියම් කාරණයක් සම්බන්ධයෙන් එවැනි සාක්ෂි අවශ්‍ය නොවන බව හෝ අදාළ නොවන බව හෝ එය වෙනත් මාර්ගවලින් වඩා සරලව ඔප්පු කළ හැකි බව හෝ සිතන්නේ නම්, ඊට තමන් වෙත ඉදිරිපත් කරන ලද සාක්ෂි පිළිගැනීම ප්‍රතික්ෂේප කළ හැකිය.

19. ආරාවුලට සම්බන්ධ පාර්ශ්වකරුවන් විසින් ඉහත සඳහන් නියමයන්ට අනුකූලව ඉදිරිපත් කරනු ලබන යම් ප්‍රකාශයක් හෝ සියලු ප්‍රකාශ පරිපූර්ණව ඉදිරිපත් කිරීම අවශ්‍යයැයි බේරුම්කාර විනිශ්චය මණ්ඩලය විසින් නියම කළයුතු අතර, එම නියමය අනුව ක්‍රියාකිරීමට පැමිණිලිකරු අපොහොසත් වුවහොත් නඩුව නිෂ්ප්‍රභ කරනු ලැබිය හැකිය. එහෙත්, ආරාවුලෙහි පාර්ශ්වකරුවකු වන ප්‍රකාශනය ඉහත සඳහන් නියමයන්ට අනුකූලව යම් ප්‍රකාශයක් හෝ සියලු ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, එම අපොහොසත් වීම හේතුවෙන් බේරුම් කිරීමේ කාර්ය පටිපාටිය අඛණ්ඩව පවත්වාගෙන යෑම වළකනු නොලැබිය යුතුය.

20. පාර්ශ්වකරුවන් අන්‍යාකාරයකින් එකඟ වුවහොත් මිස, බේරුම්කාර විනිශ්චය මණ්ඩලය විසින් යම් විශේෂ කාරණයක් සම්බන්ධයෙන් ස්වකීය මතය ප්‍රකාශ කිරීම පිණිස විශේෂඥයකු පත්කළ හැකිය.

21. පාර්ශ්වකරුවකු විභාග කිරීමකදී පෙනීසිටීම හෝ නියෝගයක් අනුව ක්‍රියා කිරීම හෝ පැහැර හැරියහොත් සහ ඒ පැහැර හැරීම සම්බන්ධයෙන් වලංගු හේතුවක් දක්වා නොසිටිය හොත්, එවිට ඒ පැහැර හැරීම හේතුවෙන් බේරුම්කාර විනිශ්චය මණ්ඩලය නඩු කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම හෝ ආරාවුල සම්බන්ධයෙන් තීරණයක් ලබාදීම වළකනු නොලැබිය යුතුය.

## තීරණය

22. වෙනත් යම් සහනයක් ප්‍රදානය කිරීම සඳහා ආරාවුලට සම්බන්ධ පාර්ශ්වකරුවන් විසින් ලියවිල්ලකින් බේරුම්කරු වෙත ප්‍රකාශිතවම බලය පවරන්නේනම් මිස, යම් බේරුම්කාර කාර්ය පටිපාටියකදී වෙනත් යම් සහනයක් ලබාදීමට බේරුම්කරුට ඇති බලතල, ආරාවුලෙහි පාර්ශ්වකරුවකු වන ප්‍රකාශනය ආරාවුලට භාජන වූ කාරණය පළකරන ලද්දේ කවර මාධ්‍යයකින් ද ඒ මාධ්‍යය ඔස්සේ පිළිතුරු දීමට හැකි අයිතියක් සහ/හෝ නිවැරදි කිරීමක් සහ/හෝ සමාව අයැදීමක් පළ කළ යුතු බවට නියෝගයක් කිරීමට සීමාවිය යුතුය.

23. කොමිසම් සභාව විසින් අන්‍යාකාරයකින් තීරණය කරනු ලබන්නේ නම් මිස, අයිතිවාසිකම් ප්‍රකාශය ඉදිරිපත් කරන ලද දිනයේ සිට එක් (01) මාසයකට නොවැඩි කාලයක් තුළදී බේරුම් තීරණය ගනු ලැබිය යුතුය.

24. යම් නිරවුල් කිරීමක් කරනු ලැබූ විට, පාර්ශ්වකරුවන් ඉල්ලා සිටියහොත් කොමිසම් සභාව විසින් එම නිරවුල් කිරීම තම තීරණය තුළදී තහවුරු කළ හැකිය.

25. කාර්ය පටිපාටියෙහි සියලු අංග හෘදයසාක්ෂියට එකඟව සලකා බැලීමෙන් සහ අගැයීමෙන්ද, එම නඩුවේ දී ඔප්පු වූයේ කවරක් ද යන්න බේරුම්කාර විනිශ්චය මණ්ඩලය විසින් නිශ්චය කර ගැනීමෙන්ද පසුව තීරණය ගත යුතුය.

26. එකී තීරණයේදී, බේරුම්කාර විනිශ්චය මණ්ඩලය ලෙස රැස්ව සිටින කොමිසම් සභාව තුළ, බේරුම්කාර විනිශ්චය මණ්ඩලයේ බහුතර මතය බලපැවැත්විය යුතුය.

27. වෙනම ගැටලුවක් හෝ පාර්ශ්වකරුවන් අතර ආරවුලට හේතු වූ කාරණයේ කොටසක් හෝ සම්බන්ධයෙන් වෙනම තීරණයක් ලබාදෙන ලෙස යම් පාර්ශ්වකරුවකු ඉල්ලා සිටියහොත් එය වෙනම තීරණයක් මගින් විසඳිය යුතුය. යම් පාර්ශ්වයක් විරෝධය පාන්නේ නම්, විශේෂිත (ව්‍යතිරේක) හේතු තිබෙන බවට බේරුම්කාර විනිශ්චය මණ්ඩලය සලකන්නේ නම් පමණක් එවැනි තීරණයක් ලබාදිය හැකිය.

28. යම් පාර්ශ්වයක් විසින් එවැනි ඉල්ලීමක් අර්ධ වශයෙන් පිළිගෙන ඇති අවස්ථාවක, ඉල්ලීමේ පිළිගෙන ඇති කොටස සම්බන්ධයෙන් බේරුම්කාර විනිශ්චය මණ්ඩලය විසින් වෙනම තීරණයක් ලබාදිය හැකිය.

29. කවර තීරණයක් වුව, බේරුම් කිරීම කරනු ලබන ස්ථානයේදීම ලබාදිය යුතුය. එම තීරණය තුළ නියෝගයක් හෝ ප්‍රකාශයක් ද ඒ සඳහා හේතු ද අන්තර්ගත විය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි ඊට බේරුම්කරු හෝ බේරුම්කරුවන් සියලු දෙනා විසින් අත්සන් කළ යුතුය. තීරණයට යම් බෙරුම්කරුවකු අත්සන් කර නැති නමුත් බේරුම්කරුවන් බහුතරයක් අත්සන් කර ඇත්නම් සහ අත්සන නොමැති බේරුම්කරු ආරාවුල පිළිබඳ තීරණය ගැනීමට සහභාගි වූ බවට බහුතරය විසින් කරන ලද සඳහනක් අන්තර්ගත නම්, යම් බේරුම්කරුවකුගේ අත්සන නොමැතිව පවා තීරණය දෙනු ලැබිය හැකිය.

30. බේරුම් කිරීමේ කාර්ය පටිපාටිය අවසන් කළ පසු බේරුම්කාර විනිශ්චය මණ්ඩලය විසින් එක් එක් තීරණයේ පිටපතක් මෙන්ම සියලු කාර්ය පාටිපාටි පිළිබඳ වාර්තාවක් ද පැමිණිලි කොමිසමට ඉදිරිපත් කළ යුතුය.

## තීරණය නිවැරදි කිරීම හෝ වෙනස් කිරීම

31. යම් තීරණයක පැහැදිලිව පෙනෙන වැරදි ගණන් බැලීමක් හෝ ලිපිකරු දෝෂයක් අන්තර්ගත වන්නේ නම් බේරුම්කාර විනිශ්චය මණ්ඩලය විසින් නිවැරදි කළ යුතුය.

32. තීරණය ලැබී දින තිහක් (30) ඇතුළත දී යම් පාර්ශ්වයක් එලෙස ඉල්ලා සිටියහොත්, තීරණය තුළ දී විසඳිය යුතුව තිබුණු නමුත් එහිදී නොවිසඳන ලද ප්‍රශ්නයක් පිළිබඳව විනිශ්චය මණ්ඩලය විසින් තීරණයක් ලබාදිය හැකිය.

33. තීරණය ලැබී දින තිහක් (30)ක් ඇතුළත දී යම් පාර්ශ්වයක් විසින් එලෙස ඉල්ලා සිටියහොත්, බේරුම්කාර විනිශ්චය මණ්ඩලය විසින් ඒ පිළිබඳව ලිඛිත අර්ථ නිරූපණයක් සැපයිය හැකිය.

34. බේරුම්කාර විනිශ්චය මණ්ඩලය විසින් එවැනි පියවරක් ගනු ලැබීමට පෙර පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් සලසා දිය යුතුය.

## බලාත්මක කිරීම

35. කිසියම් ප්‍රකාශනයක් සමාදාන කිරීමේ, සමථයකට පත් කිරීමේ සහ/හෝ බේරුම් කිරීමේ කාර්ය පටිපාටිය විසින් නියෝග කරන ලද නිරවුල් කිරීමේ නියමයන්ගෙන් බැඳී සිටීම පැහැර හරින අවස්ථාවක, 1995 අංක 11 දරණ බේරුම්කරණ පනතේ විධිවිධාන අනුව මහාධිකරණය ඉදිරියේදී එම නිරවුල් කිරීමේ නියමයන් බලාත්මක කිරීමට කොමිසම් සභාව විසින් පැමිණිලිකරුට ආධාර කළ යුතුය.

36. බේරුම් තීරණයක් ලබාදීමෙන් දින දහහතරක් (14) ඉකුත් වීමෙන් පසු අවුරුද්දක කාලයක් (01) ඇතුළත මහාධිකරණය වෙත අයැදුම් කිරීමෙන්, 1995 අංක 11 දරන බේරුම්කරණ පණතේ විධිවිධානවලට අනුකූලව එම තීරණය බලාත්මක කරනු ලැබිය හැකිය.

37. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් සභාව විසින් කරන ලද යම් විනිශ්චය කිරීමක්, අදාළ පුවත්පත හෝ සඟරාව හෝ විසින් ඉන්පසුව පළකරන මුල්ම කලාපයේ සම්පූර්ණයෙන්ම පළකළ යුතුය.

38. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් සභාව විසින් කරන ලද එවැනි විනිශ්චය කිරීමක් 1995 අංක 11 දරණ බේරුම්කරණ පනතේ සඳහන් බේරුම්කාර විනිශ්චය මණ්ඩලයක් විසින් දෙන ලද තීරණයකට සමාන වන අතර, එවැනි විනිශ්චය කිරීමක් බලාත්මක කිරීම සඳහා එකී පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගත යුතුය.

39. ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ යම් තීරණයක් සහ/හෝ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් සභාවේ යම් විනිශ්චය කිරීමක් සියලු කාරණා සම්බන්ධයෙන් අවසාන හා ඒකාන්ත තීරණය විය යුතු අතර, අධිකරණයක් ඉදිරියේ අභියෝග නොකරනු ලැබිය හැකිය.

40. ලැබෙන සියලු පැමිණිලිවල සහ සමාදාන කිරීමේ, සමථයකට පත් කිරීමේ සහ බේරුම් කිරීමේ කාර්ය පටිපාටියේ සියලු තීරණවල වාර්තා ප්‍රධාන විධායක නිලධාරීවරයා විසින් පවත්වාගෙන යා යුතු අතර, වාර්ෂික වාර්තාවක් ලෙස පැමිණිලි කොමිසමට ලබා දිය යුතුය. ඉක්බිතිව පැමිණිලි කොමිසම විසින් කරනු ලබන ප්‍රසිද්ධ ප්‍රකාශනයක් ලෙස එය මහජනයාට ලබා ගැනීමට හැකිවිය යුතුය.

41. මේ ක්‍රියා පටිපාටිය, 2003 ඔක්තෝබර් මස 15 වන දින හෝ ඉන් පසුව පළකරන ලද පුවත්පතක හෝ සඟරාවක පළකරන ලද අයිතමයකට එරෙහි යම් පැමිණිල්ලක් සම්බන්ධයෙන් බලාත්මක විය යුතුය.

## ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය අනුමත කළ, ශ්‍රී ලංකා කර්තෘ සංසදය විසින් සකසන ලද වෘත්තීය ප්‍රතිපත්ති මාලාව

42. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සහ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා කර්තෘ සංසද වෘත්තීය ප්‍රතිපත්ති මාලාව අර්ථ නිරූපණය කිරීම, එම රීති යටතේ ඇති සියලු විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා සභාව සතුවිය යුතුය.

## ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ප්‍රකාශකවරයා

43. මණ්ඩලයට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සඳහා ප්‍රකාශකවරයා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ සභාපතිවරයා හෝ මණ්ඩලය වෙනුවෙන් කතා කිරීමට බලය දී ඇති මණ්ඩලයේ කිසියම් සාමාජිකයෙකු හෝ විය යුතුය.

44. ලැබුණු සියලු පැමිණිලි සඳහා සහ සභාව විසින් ගන්නා ලද සියලු තීරණ සඳහා ප්‍රකාශකවරයා ප්‍රධාන විධායක නිලධාරිවරයා විය යුතුය. එසේ වුව ද, දූරදර්ශී යැයි සිතන අවස්ථාවක ප්‍රධාන විධායක නිලධාරිවරයාට සභාවේ සභාපතිවරයා විමසිය හැකි අතර, එහෙත් කවර කරුණක් නිසාවත් සිදුවෙමින් පවතින පරීක්ෂණයක් සම්බන්ධ කිසිදු තොරතුරක් මුද්‍රිත සහ/හෝ විද්‍යුත් මාධ්‍යවලට සහ/හෝ මහජනයාට නොසැපයිය යුතුය. කොමිසම් සභාව විසින් ලබාදෙන ලද යම් බේරුම් තීරණයක් පිළිබඳ කවර අර්ථ නිරූපණයක වුව කළ යුත්තේ, කොමිසම් සභාවේ සභාපතිවරයා සහ/හෝ බේරුම්කාර මණ්ඩලය විමසීමෙන් පසුව ප්‍රධාන විධායක නිලධාරිවරයා විසින් පමණකි.

45. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ වැඩ කටයුතු සම්බන්ධයෙන් කිසියම් ලිපියක් සැපයීමට හෝ විද්‍යුත් මාධයෙහි ඒ පිළිබඳව කෙරෙන යම් මාධ්‍ය සාකච්ඡාවක පාර්ශ්වකරුවකු වීමට කැමති ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ යම් නිලධාරියකු ප්‍රධාන විධායක නිලධාරියාගේ පූර්ව අනුමැතිය ලිඛිත ලියවිල්ලකින් ලබාගත යුතු වේ. එහෙත් කවර කරුණක් නිසාවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ පරම අයිතියක් වියයුතු ප්‍රතිපත්තිමය කාරණා පිළිබඳව කතා කිරීමෙන් එම නිලධාරියා වළක්වනු ලැබේ.

46. ප්‍රධාන විධායක නිලධාරියා විසින් නිකුත් කරනු ලබන සියලු පුවත්පත් නිවේදන සඳහා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ සභාපතිවරයාගේ පූර්ව අනුමැතිය අවශ්‍ය වේ. කෙසේ වුව ද, ඒවා පැමිණිල්ලකට අදාළ යම් කාරණයක් සම්බන්ධයෙන් වන විට ඊට පැමිණිලි කොමිසම් සභාවේ සභාපතිවරයාගේ අනුමැතිය අවශ්‍ය වේ.

47. මෙම ක්‍රියා පටිපාටි වාර්ෂිකව හෝ අවශ්‍ය පරිදි හා අවස්ථාවල හෝ සමාලෝචනය කරන අතර, අවශ්‍ය වුවහොත් සංශෝධනය කොට ප්‍රධාන විධායක නිලධාරිවරයා විසින් අනුමැතිය සඳහා ආරාවුල් නිරාකරණ මණ්ඩලය (DRC) වෙතද, අපරානුමත කොට ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතද ඉදිරිපත් කළ යුතුය.

# උපග්‍රන්ථය 7

# ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ පැමිණිලි ආකෘති පත්‍රය

**ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම**
**இலங்கை பத்திரிகை முறைப்பாட்டு ஆணைக்குழு**
**Press Complaints Commission of Sri Lanka**

## COMPLAINT FORM

**Name in Full:**..................................................................

**Address:** ..........................................................................................

**Telephone:** ............................, **Mobile:**.............................. **Fax:**................................

**Email:**............................................

**Newspaper/Magazine**...................................... **Publication date:**................................

**Headline:**.........................................................................................................

**Please indicate which clause/clauses of the Code of Professional Practice, in your view has been breached. (Give clause number only)**...........................................................................

**By signing below I agree to abide by the following terms and conditions:**

1. **I agree to participate in the process adopted by the Press Complaints Commission of Sri Lanka (PCCSL) in resolving the complaint.**
2. **I agree to abide by the settlement reached between myself and the Editor through the facilitation of the PCCSL.**
3. **I have enclosed a copy of the newspaper article against which the complaint is being made, and my version of the facts.**

**Please note that the PCCSL follows the Rules and Complaints Procedure of the Commission in seeking a settlement. As per clause 38 of the Procedure, if a settlement is reached through the intervention of the Dispute Resolution Council (DRC) of the PCCSL, such a decision is equivalent to an award by the Arbitral Tribunal referred to in the Arbitration Act No. 11 of 1995, and provisions of the said Act shall apply "mutatis mutandis" (as it is) for the enforcement of such adjudication.**

**Any decision of the CEO and or the Adjudication of the Council of the PCCSL is deemed final and conclusive for all purposes, and cannot be challenged before a court of law.**

.................................................... ......................................

**Signature of Complainant** **Date**

***Conciliation is the first step in seeking a settlement. The PCCSL obtains the services of the DRC to adjudicate in the matter if conciliation fails.***

**96, Kirula Road, Colombo -05, Sri Lanka**
**Tel: (+94 11) 5353635 | Fax: (+94 11) 5335500 | E-mail: pccsl@pccsl.lk | Web: www.pccsl.lk**

## උපග්‍රන්ථය 8

# 'මුනිවත බිඳීම'

# සම්මුඛ සාකච්ඡා කලාව

**එරික් නේඩර් - 'සියැටල් ටයිම්ස්'**

## පිළිවෙළ

පර්යේෂණ: හොඳම ප්‍රශ්න යනු අදාළ විෂය පිළිබඳව සිදු කරන ප්‍රමාණවත් අධ්‍යයනයකින් පසු යමකු මතු කරන ප්‍රශ්නයි. ඔබට ඇත්තේ පැය පහක් හෝ දින පහක් වුවත්, අදාළ පුද්ගලයා පිළිබඳ පුවත්පත් වාර්තා හා නඩු වාර්තා කියවා, ඔහුගේ හෝ ඇයගේ අනුගාමිකයින් සමග කතාබහ කිරීම ඔබ සම්මුඛ සාකච්ඡාව සඳහා සූදානම් කරනු ඇත.

උපායශීලී බව: ඔබ උපායශීලී ලෙස අදාළ පුද්ගලයන්ගෙන් තොරතුරු ලබාගැනීමට සැලසුමක් සකසා ඔබේ මිතුරකුගෙන් හෝ සගයකුගෙන් ඒ පිළිබඳ අදහස් විමසන්න. හැකි සෑම විටම ඔබ ලියමින් සිටින කාර්යයට අදාළ පුද්ගලයන් එම කාර්යයෙහි නිරත වෙමින් සිටින අතරතුර ඔවුන් සමග කතාබහට එළඹෙන්න. එහෙත්, උරුහන්බාන්නන් සහ අදහස් ප්‍රකාශ කිරීමට පැකිලෙන පුද්ගලයන් පහසුවෙන් කතා කිරීමට පෙලඹවිය හැක්කේ ඔවුන්ගේ නිවෙස තුළදීය. තොරතුරු හෙළිකිරීමට යම් චකිතයක් දක්වන පුද්ගලයන් සමග කිසියම් ස්ථානයක ඇවිදීම සඳහා යාම වැනි දෙයකින් ඔවුන් සන්සුන් කොට කතාබහ කිරීමට යොමු කරගත හැකි වේ. එවැනි තවත් උපක්‍රමයක් වන්නේ අදාළ පුද්ගලයන් සමග දිවා ආහාරයට යාමයි. ඒ මගින් ඔබ සමග අවම වශයෙන් පැයක් වැනි කාලයක් වත් අදාළ පුද්ගලයාට ගත කිරීමට සිදු වනු ඇත.

නිසි සංවිධානාත්මක බව: ඔබේ සටහන් පොතේ ඇතුළත කවරයේ ඔබ ඇසීමට බලාපොරොත්තු වන ප්‍රශ්න ඔබට මතක් කර දීමට තනි වචනයේ ඉඟි සටහන් කරගන්න. ඔබට ප්‍රශ්න ඇසීමට අදාළ වන ලිපි ගොනු නිසි ලෙස තබාගැනීමෙන් කරුණු අමතක වීමත් ප්‍රශ්න ඇසීමට කාලය ගතවීමත් වළක්වාගත හැකිය. ප්‍රශ්න ඇසීමේදී, විවිධ කාලවකවානුවල ජීවන තොරතුරු වැනි සරල ප්‍රශ්න ඇසීමෙන් සම්මුඛ සාකච්ඡාව ආරම්භ කරන්න. එහෙත්, ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන් වැළකී සිටින පුද්ගලයන් හට මුහුණ දීමට ඔබට සිදුවිය හැකි බැවින්, එවැනි අවස්ථා සඳහා සෑම තොරතුරක්ම ආවරණය වන ආකාරයේ ප්‍රශ්නාවලියක් සකසාගන්න.

පෙරපුහුණුව: ඔබේ සම්මුඛ සාකච්ඡාව සාර්ථකව සිදු කරන ආකාරය මනසින් මවාගන්න (උදෑසන ස්නානය අතරතුර මෙය කළ හැකිය). තමාට සම්මුඛ

සාකච්ඡාවක් ලැබෙන්නේ නැතැයි හෝ සම්මුඛ සාකච්ඡාව මගින් අදාළ තොරතුරු ලබාගැනීමට නොහැකි වෙතැයි යන දෙගිඩියාවෙන් පෙළෙන විට සාමාන්‍යයෙන් ලැබෙන ප්‍රතිඵලයද අසාර්ථකය. එහෙත් කිසිම කෙනකු මා හා කතා කිරීම ප්‍රතික්ෂේප නොකරන්නේයැයි සිතන්න. ඔබට සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකි වනු ඇත.

කතාබහ ඇරඹුම සහ අඛණ්ඩව පවත්වාගැනීම: අදාළ සම්මුඛ සාකච්ඡාව සිදු කරන ආකාරය පිළිබඳ 'පෙරපුහුණුව' නොකඩවා සිදු කරන්න. කිසිවිටෙකත් ඔබට තොරතුරු ලබා දෙන පුද්ගලයන් තර්ජනාත්මක විය හැකියැයි හෝ සාකච්ඡාව අතරමග නවත්වතැයි යන හැඟීමෙන් සම්මුඛ සාකච්ඡාව සඳහා එළැඹීමෙන් වළකින්න. අහිංසක, මිත්‍රශීලී, බියවීමට හේතුවක් නැති සහ කුතුහලයෙන් පිරුණු අයකු ලෙස ඔහු ඉදිරියේ පෙනී සිටින්න. ඔබ දයාවෙන් තොර, සෑම දෙයකම දොස් දකිමින් කතා කරන අයකු නම් ඔබට රඟපෑම පුහුණු වීමට සිදු වනු ඇත.

සෑම කුඩා දෙයක් කෙරෙහිම අවධානය යොමු කරන්න: ඔබ සම්මුඛ සාකච්ඡාව පවත්වන විට, ඔබට දකින්නට ලැබෙන සෑම දෙයක් පිළිබඳවම විමසිලිමත් වෙන්න. අවට ඇති බිත්ති දෙස බලන්න. මේසය මත ඇති දෑ කියවන්න. කබා පටියේ එල්ලාගෙන සිටින්නේ මොනවාදැයි පිරික්සා බලන්න. ඔබේ කතා ප්‍රවෘත්තියට අදාළ යමක් සම්මුඛ සාකච්ඡාව සිදු වන වටපිටාව ආශ්‍රයෙන් ඔබට සොයා ගත හැකි වනු ඇත. ඔබ දකින සෑම දෙයක් පිළිබඳවම සටහන් තබා ගන්න.

වෙනත් මූලාශ්‍ර වෙත්දැයි සොයා බලන්න: ඔබ සම්මුඛ සාකච්ඡාව සිදු කිරීමට යන අවස්ථාවේදී, අදාළ පුද්ගලයාගේ ලේකම්වරයා සහ ඔහු සමග සේවය කරන අනෙක් පුද්ගලයන් හමුවීමටත්, ඔවුන්ගේ තොරතුරු සටහන් කර ගැනීමටත් කටයුතු කරන්න. ඒවා ඔබගේ මූලාශ්‍ර බවට පත් කරගත හැකිය.

## අදහස් ප්‍රකාශ කිරීමට පැකිලෙන පුද්ගලයෝ

ආරම්භ කළ කාර්යය නවත්වන්න එපා: යමකු ඔබ සමග කතාබහ කිරීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවලදී, ඔබටත් අනෙක් පුද්ගලයන්ටත් පොදු යමක් පිළිබඳව විමසීමට උත්සාහ කිරීමෙන් ඔවුන් කතාවට පොලඹවා ගන්න. "දවසක් මම දැක්කා ඔබේ පුංචි පූඩ්ල් බල්ලා. මටත් එයින් එකෙක් ඉන්නවා. හරි පුදුම බල්ලො ජාතියක්. තවත් දවසක මම දැක්කා ..." අදාළ පුද්ගලයා ඇමතුම අවසන් කොට දුරකථනය තබන විටම, ඔබට වුවමනා කරන්නේ ඔබ ලියමින් සිටින්නේ කමක්දැයි පැහැදිලි කිරීමට පමණක් බවත්, ඔහු අඩු ගණනේ එය වත් දැන සිටිය යුතු බවත් ඉක්මනින් පවසන්න (සාමාන්‍යයෙන්, ඔබ කරමින් සිටින දෙය දැන ගත් විට ඔහු අදහස් දක්වනු ඇත). එසේ නැත් නම්, නොසැලකිලිමත් ලෙස සාවද්‍ය යමක් නැවත නැවතත් පවසන්න. එවිට ඔහු වාර්තාවක් එළියට ඇද ඔබ වැරදි බව පෙන්වා දෙනු ඇත. ඔබ ඉක්මන්, අවංක, කාරුණික හා ආචාරශීලී විය යුතුය.

කතා නොකරන අය කතා කරවන ක්‍රම: "මට මේ පිළිබඳව යමක් හරිහැටි ප්‍රකාශ කිරීමට අපහසුයැ"යි පවසන පුද්ගලයන් සමග, ඒ මන්දැයි විමසමින් තර්ක කිරීමට යෑමෙන් වළකින්න. ඒ වෙනුවට මෙවැනි කතා බහකට යෑම ඵලදායක විය හැකිය. "ඔබට කරදරයක් වෙන්නේ නැහැ. ඔබ මම මේ පිළිබඳව අදහසක් ලබා ගැනීමට කතා කළ තවත් පුද්ගලයෙක් පමණයි. මම දන්නා ආකාරයට මෙය සිදුවුණේ මෙහෙමයි. අපි මේ ගැන ටිකක් කතා කරමු...." ඉන් පසු ඔබට තහවුරු කර ගැනීමට වුවමනා කරුණ ගැන කතාව පටන් ගෙන එය දිගටම කරගෙන යන්න.

සහානුකම්පී බව අත්‍යවශ්‍ය කාරණයකි: "මම මේ ගැන කතා කරන්න බයයැ"යි කියා සිටින අයට සුලු අනුකම්පාවක් දක්වන්න. නමුත් ඔවුන් බෙහෙවින් සනසන්න. "මට ඔබේ තත්ත්වය තේරුම් ගැනීමට හැකියි. මේක ඔබේ ආයතනයට අමාරු කාලයක්. මේ වැනිම තත්ත්වයන්ට පත්ව සිටි බොහෝ අය මා සමග අදහස් පවසා තිබෙනවා. මම ඔබෙන් මේ කාරණා කිහිපය පමණක් විමසන්නම්. ඒක මට ලොකු උපකාරයක් වේවි." ඔවුන්ට බලපාන කාරණා පිළිගන්නා බවක් පෙන්වන අතරම කෙළින්ම අදාළ කතා පුවතෙන් ඔබට අවශ්‍ය තොරතුරු දැනගැනීමට ප්‍රවිෂ්ට වන්න.

රාජ්‍ය නිලධාරියකුගෙන් හෝ වෙනත් ලොක්කකුගෙන් ප්‍රකාශයක් ලබාගැනීම: "මට මේ පිළිබඳව කිසිම අදහසක් ප්‍රකාශ කළ නොහැකියැ"යි පවසන 'වැදගත්' පුද්ගලයකුට හෝ නිලධාරියකුට, "ඔබ එසේ කී බව පළ කිරීමට මට නම් එතරම් කැමැත්තක් නෑ. මොකද, එය කියවන පාඨකයා ඔබ යමක් වසන් කරමින් කතා කරනවා යැයි සිතන්න පුළුවන්. ඒ නිසා මේ ගැන යමක් කිව හැකි ආකාරයක් පිළිබඳව සිතමු. උදාහරණයක් විදිහට ...... ගැන ඔබ යමක් ප්‍රකාශ කළොත් ..." වැනි දෙයක් කීමෙන් ඔවුන් කතා කිරීමට පෙලඹවිය හැකිය.

තෝරා ගැනීමට විකල්ප දෙකක් ඇත: අදහස් ප්‍රකාශ කිරීමට පැකිලෙන ඉහළ නිලධාරීන්ට ඔබ පැවසිය යුත්තේ, "ඔබ අදහස් ප්‍රකාශ කළත් නොකළත් මම මේ කතා ප්‍රවෘත්තිය ලියනවා. හැබැයි ඔබට අවශ්‍ය නම් ක්‍රම දෙකක් තියෙනවා. ඉන් එකක් තෝරා ගන්න පුළුවන්. පළමුවැනි එක තමයි, ඔබ කිසිදු අදහසක් ප්‍රකාශ නොකළ බවත්, සහයෝගය ලබා නොදුන් බවත් සඳහන් කරමින් සාධාරණ ලෙස මේ කතා ප්‍රවෘත්තිය වාර්තා කිරීම. දෙවැනි එක තමයි, ඔබේ අදහස් ඇතුළත් කර සාධාරණ ලෙස මේ කතා පුවත වාර්තා කිරීම. දැන් ඔබ තෝරාගන්නේ පළමුව සඳහන් කළ ආකාරයද, දෙවනුව සඳහන් කළ ආකාරයද?" බොහෝ අවස්ථාවන්හිදී, තොරතුරු ලබා දීමට පැකිලුණු නිලධාරීහු දෙවැන්න තෝරා ගනිති.

තවත් මාර්ග ඇත: යම් පුද්ගලයකු ඔබ හා කතා කරන්නේ නැත් නම්, ඔහුගේ හෝ ඇයගේ කාර්යාලයේ සේවය කරන අය හෝ ඔහුට/ඇයට සහාය වන පුද්ගලයන් හමු වන්න. ඔබ අපේක්ෂා කළාට වඩා වැඩි තොරතුරු ඔබට ලබා ගැනීමට හැකි වනවා පමණක් නොව, මෙසේ කිරීමෙන් ඔබ ඔවුන්ගේ මුනිවත බිඳදමනු ද ඇත.

උපක්‍රමශීලීබව: යමකු 'පසුබිම මත' පදනමේ සිට කතා කරන බව අවධාරණය කරන විට, කෙසේ වෙතත් ඔබ ඒ තොරතුරු සටහන් කරගන්න. සම්මුඛ සාකච්ඡාව අවසානයේ, ඔබ සටහන් කර ගත් තොරතුරු අතුරින් අදාළ පුද්ගලයා ප්‍රකාශ කළ එතරම්ම වරදකාරී හැඟීමක් ඇති නොකරන ප්‍රයෝජනවත් කාරණයක් තෝරාගෙන ඒ පිළිබඳව මෙසේ විමසන්න: "ඔබ ප්‍රකාශ කරන්න යෙදුණා මේ කාරණය පිළිබඳව. ඔබට ඒ ගැන 'වාර්තාගත' පදනමේ සිට යමක් කියන්න බැරිද?" ඔහු හෝ ඇය ඊට

එකඟ වී ඒ පිළිබඳව යමක් ප්‍රකාශ කළොත් තවත් එවැනි ප්‍රයෝජනවත් තොරතුරක් ඔබගේ සටහන් තුළින් සොයාගන්න. ඒ පිළිබඳවත් පෙර ආකාරයෙන්ම ඔහුගෙන් හෝ ඇයගෙන් අදහසක් ලබා ගැනීමට උත්සාහ කරන්න: "ඔබ වාර්තාගත පදනමේ සිට ඒ දේ කිව්වා නම්, ඇයි ඔබට මේ දේ කියන්න බැරි?" මෙලෙස, පසුබිමේ සිට ඔවුන් කළ ප්‍රයෝජනවත් ප්‍රකාශ එකිනෙක යොදා ගනිමින් ඒවා සියල්ල වාර්තාගත ප්‍රකාශ ලෙස ලබා ගත හැකිය. එසේ වුවත්, ඔහු හෝ ඇය තමන් නිර්නාමිකව සිටිය යුතු බව අවධාරණයෙන් කියා සිටින්නේ නම් එයට ගරු කිරීම ඔබගේ යුතුකමකි.

නිර්නාමිකත්වය: යමකු සෑම විටම 'පසුබිම මත' පදනමේ සිට කතා කිරීමට උත්සාහ කරන්නේ නම් නිකම්ම ඒ තොරතුරු භාර නොගන්න. ඔහු/ඇය හමු වීමට කීප වතාවක් හෝ ගොස්, වාර්තාගතව තොරතුරු ලබාදීම සඳහා එකඟ කරගැනීමට උත්සාහ කරන්න. (ඇත්තටම, 'පසුබිම මත' පදනමේ සිට ලබාදෙන තොරතුරුවලින් පලක් නොවේ. ඔබට ඒවා කිසිවිටෙක ප්‍රයෝජනයට ගත නොහැකිය. ඒවා බැහැර කරන්න. එය කාලය කා දැමීමකි.)

කරුණුවල නිරවද්‍යතාව වෙනුවෙන්: යමකු ඔබට අදාළ කතා ප්‍රවෘත්තියට සම්බන්ධ තොරතුරුවලින් කොටසක් පමණක් ප්‍රකාශ කොට අනතුරුව මග හරින අවස්ථා හෝ ඔබ දැනටමත් කතාවේ කොටසක් දැනසිටියත් ඉතිරිය දැනගත නොහැකි වන අවස්ථා ඇත. මේ සඳහා ඔබට කළ හැක්කේ, "බලන්න, දැනටමත් ඔබ මේ කතාවෙන් වැඩි කොටසක් කියලා ඉවරයි (නැත් නම්, දැනටමත් මම මේ කතාවෙන් වැඩි කොටසක් දන්නවා). ඔබ ඉතිරි කොටසත් කියනවා නම් හොඳයි. එහෙම නැති වුණොත් මම වාර්තා කරන කතාව නිවැරදි නොවෙන්න පුළුවන්. උදාහරණයක් විදියට, (ඔබේ සටහන්වල තිබෙන යම් දෙයක් ගැන සඳහන් කරමින්) මෙන්න මේ කොටස ගැන මොනවා ද කියන්න පුළුවන් ...' යනුවෙන් පැවසීමයි.

ඔබ දන්නා බව හඟවන්න: උදාහරණයක් ලෙස, යම් උසස් නිලධාරියකු ඔහු යටතේ සේවය කරන, ආයතනයේ අක්‍රමිකතා හෙළිදරව් කළ උරුහන්බාන්නකු සේවයෙන් පහ කළ අවස්ථාවක, ඔබ ඒ පිළිබඳව අදාළ නිලධාරියාගෙන් විමසිය යුත්තේ ඔහු එය 'කළාද' යන්න නොව, ඔහු ඒ නිලධාරියා සේවයෙන් පහ කළේ 'ඇයිද' යන්නයි. එලෙස ප්‍රශ්න කිරීමෙන් ඔබ අදහස් කරන්නේ, ඔබ තවම හරියටම තහවුරු කරගෙන නැතත්, එසේ සේවයෙන් ඉවත් කිරීමක් සිදු වී ඇතැයි ඔබ දන්නා බව අදාළ නිලධාරියාට හැඟවීමයි. එවිට ඔහු පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීම වෙනුවට පැහැදිලි කිරීම පටන්ගනු ඇත.

සත්‍යය ප්‍රකාශ කිරීමට දිරිමත් කරන්න: යමක් ප්‍රකාශ කිරීමේදී සෑම විටම තම නමින් එය ප්‍රකාශ කිරීම වැදගත් බවත්, ජනයා තොරතුරු වඩා විශ්වාස කරන්නේ එවිට බවත් අවධාරණය කරන්න.

උදව් අවශ්‍ය විට ඉල්ලා සිටීම: කිසිවිටෙකත් ඔබ සමග සාකච්ඡා කරන පුද්ගලයාගෙන් උදව් ඉල්ලා සිටීමට පැකිලෙන්න එපා. මෙසේ අසන්න: "ඔබ නැත් නම් කවුද මට මේක පැහැදිලි කරලා දෙන්නේ?"

නැවත උත්සාහ කරන්න: එක් වරක් ඔබ වෙත අදහස් දැක්වීම ප්‍රතික්ෂේප කළ පුද්ගලයන් නැවත දින කිහිපයකින් හමු වී අදහස් දැක්වීමට එකඟ වන්නේදැයි බලන්න. මිනිස්සු තම සිත් වෙනස් කරගනිති.

# අවශ්‍ය කළමනා සූදානම් කරගැනීම

යම් සිදුවීමක මුල සිට අග දක්වා පිළිවෙළින් තොරතුරු ලබාගන්න: ඔබ යම් පුද්ගලයකුගෙන් තොරතුරු විමසීමේදී කතාව මුල සිට අග දක්වා දැන ගැනීමෙන් එය වඩා හොඳින් අවබෝධ කරගැනීමටත්, එහි අඩුපාඩු සහ එය කොතරම් තාර්කිකදැයි සොයා බැලීමටත් ඔබට හැකි වනු ඇත.

කෙසේද, මක්නිසාද: යම් පුද්ගලයකු යම් වැදගත් කාරණයක් පවසන විට, මෙවැනි ප්‍රශ්න ඇසීමෙන් ඔබට වැඩිදුර සහ විශ්වසනීය ලෙස තොරතුරු ලබා ගතහැකි වනු ඇත, තවත් මූලාශ්‍ර සොයාගත හැකි වනු ඇත:

- "ඔබ ඒ ගැන දන්නේ කොහොමද?"
- "('ඔබ කළේ කුමක්ද?' යන්න වෙනුවට) ඔබ ඒ අවස්ථාවේ එලෙස කටයුතු කළේ ඇයි?"

වේගය පාලනය කරන්න: යම් පුද්ගලයකු හා කතාබහ කරන විට සෑම තොරතුරක්ම පැහැදිලිව විචිත්‍රව ලබාගැනීම සඳහා, එම පුද්ගලයා තොරතුරු පවසන වේගය පාලනය කර ඔහු අදාළ අවස්ථාව වෙත රැගෙන යන්න. ඔහුගෙන් මෙවැනි ප්‍රශ්න අසන්න:

- "ඔබ සිටියේ කොතැනද?"
- "ඔබ ඒ අවස්ථාවේ කරමින් සිටියේ කුමක්ද?"
- "ඔබ ඇඳ සිටි ඇඳුම් ඔබට මතකද?"
- "ඒ මොහොතේ තිබුණේ මොන වගේ තත්ත්වයක්ද, ඒ ස්ථානයේදී ඇසුණු හඬවල් ඔබට මතකද?"

දැන් නැවත ඔහු හෝ ඇය වර්තමානය වෙත කැඳවන්න. ඒ සඳහා ඔබට මෙවැනි ප්‍රශ්න විමසිය හැකිය:

- "ඔබ දැන් ඒ පිළිබඳව කරමින් සිටින්නේ කුමක්ද?"
- "ඔබේ මිතුරන් ඒ පිළිබඳව දරන අදහස කුමක්ද?"

අනතුරුව ඔහු හා එක්ව යළි අදාළ අවස්ථාව තුළට පිවිස කතාබහ මුල සිට කරගෙන යන්න. මේ සියල්ල අසාර්ථක වුවහොත් ඒ බව ඔහුට පවසන්න. "මම උත්සාහ කරනවා. ඒත් තවම මට ඒක හරියට හිතාගන්න බැහැ. ඇත්තටම ඒක කොයි වගේද?" ඔබට තොරතුරු රැසක් වෙනුවට කතාවක් ලැබෙන්නේ මේ අයුරිනි.

දුරකථනය භාවිත කිරීම: දුරකථනයෙන් තොරතුරු විමසීමේදී අදාළ පුද්ගලයාගෙන් ඔහු සිටින වටපිටාව විස්තර කරන මෙන් ඉල්ලා සිටින්න (ඔහුගේ බිත්තියේ එල්ලා ඇති ඵලකයෙන් කියැවෙන දේ ස්වාධීනව තහවුරු කරගත් පසුව එය කතාවේ ප්‍රධාන තොරතුරක් බවට පත් විය හැකිය). ඉහත අවස්ථාවේදී මෙන් ඔහුගේ කතාව ත්‍රිමාන ආකාරයෙන් කීමට සලස්වන්න.

අවධානයෙන් සවන් දෙන්න: අපි සම්මුඛ සාකච්ඡාවලදී වැඩිපුර කතා කරන්නට පෙලඹෙමු. එහෙත් අප වැඩි වශයෙන් කළ යුත්තේ, අදාළ පුද්ගලයාට කතා කිරීමට වැඩි අවස්ථාව ලබා දීමත්, ඒ සඳහා අප හොඳින් කන් යොමා සිටීමත්ය. ඔබේ අදහස් පසුව පැවසිය හැකිය. ඔහුගේ කාර්යාල කාමරයේ දොර අබියසදීම ඔබේ අදහස් පසෙක තබා ගොස් විවෘත මනසින් සවන් දෙන්න.

ඔවුන් ලවා පාපෝච්චාරණය කරවන්න: ඔහුට හෝ ඇයට සහාය වන පුද්ගලයන් පිළිබඳව විමසන්න. අනතුරුව, විවේචන එල්ල කරන්නන් පිළිබඳව විමසන්න. ඔවුන්ගේ නම් දැනගැනීමට උත්සාහ කරන්න. ඉන්පසුව, ඔවුන් කියන්නේ මොනවාදැයි විමසන්න. මෙය අපහසුවක් දනවන අමිහිරි තොරතුරු සහ ඉඟි තරමක් මුදා හරිනු ඇත. ඔහුට විරුද්ධව යම් විනයානුකූල පියවරක් ගෙන තිබේ ද, රැකියාවෙන් හෝ පාසලෙන් නෙරපා හැර තිබේ ද, අපරාධයකට චෝදනා හෝ දඬුවම් ලැබ තිබේ ද, බීමත්ව රිය පදවා අත් අඩංගුවට ගෙන තිබේ ද, නඩුවකට මුහුණ දී තිබේ ද, උසාවියේදී සාක්ෂි දී තිබේ ද යනාදි කරුණු විමසන්න. මේ කරුණු සියල්ල කොතැනක හෝ වාර්තාගතව තිබෙන ඒවා බැවින්, මෙවැනි කරුණු ප්‍රකාශ කිරීමෙන් අනතුරුව සම්මුඛ සාකච්ඡාවට සහභාගි වන පුද්ගලයකු බොරු හෝ වැරදි තොරතුරු ලබා දීමට ඉදිරිපත් නොවනු ඇත.

මුසාබස් ප්‍රකාශ කරන්නා හැසිරවීම: ඔබට යම් කෙනකු අදහස් දක්වන විට, ඔහු/ඇය දිගින් දිගටම බොරු කියන බව ඔබ දැනගත්තද, ඔහුට/ඇයට සිය බේගලය සම්පූර්ණයෙන් කියා නිමකිරීමට ඉඩ දෙන්න. වැඩි විස්තර දැනගැනීමට මිස බාධාවක් නොකරන්න. රැවටිලිකාරයන් බොහෝ විට විස්තරාත්මක තොරතුරු සපයන්නේ, අංග සම්පූර්ණ කතාවක් පැවසූ විට ඉන් ඔවුන් පිළිබඳ විශ්වාසය වැඩි වනු ඇතැයි සිතාගෙනය. සවන් දෙමින් ප්‍රයෝජනවත් අයුරින් සටහන් තබාගන්න. ඔවුන් සිය කතාව අවසන් කළ පසු ඉතා තාර්කික ලෙස ඔහුගේ හෝ ඇයගේ ප්‍රකාශ බිඳහෙළන්න. එහෙත් ඔබ ඉක්මන් වන්නට එපා. යම් අවස්ථාවකදී ඔවුන් කොටු වනු ඇත. තවදුරටත් අසත්‍ය ප්‍රකාශ කරමින් සිටීමට නොහැකි වනු ඇත.

ජීවිත කතාව දැනගන්න: ඔබ වාර්තා කරන ප්‍රවෘත්තියට අදාළ නැතත් ඔබ හා සාකච්ඡාවේ යෙදෙන පුද්ගලයාගේ ජීවන තොරතුරු දැනගැනීමට උත්සාහ කරන්න. නඩුවක් පිළිබඳව නීතිඥයකුගෙන් හෝ රජයේ ප්‍රතිපත්තියක් පිළිබඳව නිලධාරියකුගෙන් හෝ සම්මුඛ සාකච්ඡාවක් ලබාගන්නා විටත්, කාලය තිබේ නම් ජීවන තොරතුරු විමසන්න. එය ප්‍රයෝජනවත් තොරතුරු ලබාගැනීමටත්, වඩාත් හොඳින් ඔබේ ප්‍රශ්න ඉදිරිපත් කිරීමටත් ඔබට උපකාරී වනු ඇත.

අනුකම්පාව නිසා අරමුණු අමතක කරන්න එපා: සානුකම්පික වන්න. ඒත් ඔබ හා සාකච්ඡාවක් ලබා දීමට එකඟ වූ පමණින්ම සහභාගි වන පුද්ගලයාගේ නිර්දෝෂීභාවය පිළිබඳව සහතික විය හැකියැයි සිතන්න එපා. ඔහු හෝ ඇය මෙවැනි ප්‍රකාශයක් සිදු කළේයැයි සිතන්න. "ඒ අයගෙන් මුදල් ලබාගත යුතුයැයි මා කිසිසේත් විශ්වාස කරන්නේ නෑ." ඔබේ පිළිතුර විය යුත්තේ, "ඒක ඇත්ත වෙන්න පුළුවනි. නමුත් මට අසන්නට සිදු වෙන්නේ ඔබ ඒ අයගෙන් මුදල් ලබා ගත්තාද නැද්ද, එසේ කළ යුතුයැයි විශ්වාස කරනවාද නැද්ද යන්නයි."

නැවත නැවත විමසන්න: සමහර අවස්ථාවන්හිදී එකම කරුණ පිළිබඳව කිහිපවරක් තොරතුරු විමසා සිටීම ප්‍රයෝජනවත්ය. එවිට යම් කරුණක් සම්බන්ධයෙන් එකිනෙකට පරස්පරවිරෝධී ප්‍රකාශ සිදු වීමට ඉඩ ඇත.

සමාලෝචනය: අදාළ පුද්ගලයා සමග එක්ව නැවත වතාවක් ඔබේ සටහන්වල අඩංගු කරුණු නිවැරදිදැයි පරීක්ෂා කර බලන්න. මින් ඔබ සතු කරුණුවල හිස්තැන් පිරවෙනු ඇති අතර, එමගින් ඔබට වැඩි තොරතුරු ලැබෙනු ඇත.

නිර්මාණශීලීත්වය: ඔබේ සිතට එන අතිශය දරුණු හෝ සාහසික යැයි හැඟෙන ප්‍රශ්න මෙන්ම, අතිශය පෞද්ගලික පිළිතුරක් ලැබිය හැකි ප්‍රශ්නද එල්ල කරන්න. පිළිතුරුවලින් විනා ප්‍රශ්නවලින් අපහසුවක් ඇති වන්නේ නැත. ඔබේ තියුණු ප්‍රශ්නවලින් ගැටලුවේ සියලු පැති හෙළි වනු ඇත.

ඔවුන්ගේ තොරතුරු පැස හිස් කරන්න: සාමාන්‍යයෙන් කොතරම් තොරතුරු තමන් සතුදැයි යන්න පිළිබඳව බොහෝ පුද්ගලයන් හට වැටහීමක් නැත. එහෙයින්, මතකය ඇවිස්සීමට ඔවුන් යොමු කිරීම මගින් ඔවුන් සතු තොරතුරු ප්‍රකාශ කිරීමට ඔවුන් පෙලඹෙනු ඇත. අදාළ පුද්ගලයා තොරතුරු පැසක්යැයි සිතා එය හිස් කරන්න.

අවංකභාවය: වෙනත් කෙනකු ලෙස පෙනී නොසිටින්න. බොරු නොකියන්න. ඔබට තොරතුරු නොපවසා සිටිය හැකි නමුත්, ඔබේ කතාවේ ස්වභාවය හෙළි කරන තරමට ඔහු ද වඩා පහසුවෙන් උපකාර කරනු ඇත.

සම්මුඛ සාකච්ඡාව මෙහෙයවන්නේ ඔබයි: ඉතා හොඳින් සිදු වන සම්මුඛ සාකච්ඡාවක් දැනෙන්නේ සාර්ථක කතාබහක් ලෙසටයි. කෙසේ වුවත්, එවැනි අවස්ථාවකදීත් අවශ්‍ය තොරතුරු කෙරෙහි අවධානය යොමු කරමින් එය සිදු කළ යුතුය. තත්ත්වය පාලනය කරන්න. එහෙත් එය මෘදු ලෙස කරන්න.

එකම රාමුවකට සීමා වන්න එපා: ඔබට අවශ්‍ය කතා පුවත කුමක්දැයි ඔබ දැන සිටියත් ඊටම ඇලී සිටින්න එපා. එයට පරිබාහිර විස්තර දැනගැනීමට ද යොමු වීම වැදගත්. ඉන් ඔබේ කතාව වෙනස් වෙන්න පුළුවනි.

පෞරුෂත්වය: ඔබේ පෞරුෂත්වය ඉස්මතු වීමට ඉඩ හරින්න. ඔබ කිසිම අදහසක් නැති පුද්ගලයෙකු ලෙස පෙනී නොසිටින්න.

තවදුරටත් තොරතුරු ලබාගත හැකි ආකාරයේ ප්‍රශ්න අසන්න: ඔබේ සම්මුඛ සාකච්ඡාව අවසානයට එළඹෙත්ම, අපේ පාඨකයන්ගේ සිත් ගත හැකි තවත් යමක් ඇද්දැයි සම්මුඛ සාකච්ඡාවට සහභාගි වන පුද්ගලයාගෙන් විමසන්න. මෙමගින් ඔබට තවත් කතා පුවතකට අදාළ ප්‍රවෘත්තියක් සපයා ගත හැකි වනු ඇත.

නැවත පරීක්ෂා කිරීම: ප්‍රවෘත්ති පළ වූ පසු අදාළ පුද්ගලයාට ඒ පිළිබඳව දැනුම් දී ප්‍රතිචාර ලබා ගැනීම වැදගත් වනු ඇත. එමගින් ඔහු හෝ ඇය ඔබට තවත් කතා හෝ ඉඟි ලබා දීමට ද ඉඩ ඇත.

# උපග්‍රන්ථය 9

# මාධ්‍යවේදීන් සඳහා වන ආරක්ෂණ පද්ධතිය

## ප්‍රවෘත්ති වාර්තාකරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර ආයතනය (INSI)

## ප්‍රවෘත්ති වාර්තාකරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර ආයතනය

ජනමාධ්‍යවේදීන්ට පහරදීම්වලින් හා නීති මගින් දඬුවම් ලැබීමෙන් නිදහස්ව සහ තම ජීවිතයට හා ශරීරයට එල්ල විය හැකි අනෙකුත් අනතුරුවලින් වැළකෙමින් තම වෘත්තියේ නියැළීමට ඇති අයිතිය සහතික කරලීම සඳහා ප්‍රවෘත්ති වාර්තාකරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර ආයතනය (INSI) කැප වී සිටී. ඇතැම් පරිසරයන් හා වාතාවරණයන්හිදී වාර්තාකරුවන්ගේ සහ ජනමාධ්‍ය කාර්ය මණ්ඩලයන්ගේ කටයුතු කිසිසේත්ම සම්පූර්ණයෙන් ආරක්ෂාකාරී හා සුරක්ෂිත නොවන බව පිළිගනිමින්, සාමකාමී හෝ යුද වාතාවරණයක් මධ්‍යයේ වුවද ඇතිවිය හැකි අනවශ්‍ය අවදානම් මගහැරීමට INSI ආයතනය පරිශ්‍රම දරයි. නිදහස්ව හා ස්වාධීනව ප්‍රවෘත්ති රැස් කිරීමට සහ වාර්තාකරණයට පවත්නා භෞතික හා මානසික අවහිරතාවන්ට මුහුණදෙන, INSI වෘත්තීය ප්‍රතිපත්ති මාලාව අනුව කටයුතු කරන ක්‍රියාකාරී මාධ්‍යවේදීන් වෙනුවෙන් පෙනීසිටීමටත්, සහාය ලබාදීමටත්, එම ආයතනය තම සාමාජිකත්වයෙන් හා ඊට බැඳී සිටින සංවිධානවලින් විශේෂඥ සහයෝගය ලබාගනී.

## INSI ආරක්ෂණ පද්ධතිය

1. ජීවිතය රැකගැනීමට හා ආරක්ෂාවට ප්‍රමුඛත්වය. යම් වාර්තාවක් ලබාගැනීම සඳහා අනවශ්‍ය ලෙස අන්තරායකර තත්ත්වයන්ට මුහුණදීම නොපිළිගන්නා බවත්, එවන් කාර්යයන්හි යෙදීම ඉතා දැඩි ලෙස වළක්වනු ලබන බවත් පිළිබඳව මාධ්‍යවේදී කාර්ය මණ්ඩල සහ නිදහස් මාධ්‍යවේදීන් දැනුම්වත් කළ යුතුය. කලහකාරී වාතාවරණයන්හිදී තරගකාරී ප්‍රවෘත්ති වාර්තාකරණයේ වාසිය ලබාගැනීමට පෙර මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාවට මුල් තැන දිය යුතු බව ප්‍රවෘත්ති ආයතනයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

2. යුදමය වාතාවරණයන් හා අනෙකුත් අන්තරායකර පසුබිම් යටතේ වාර්තාකරණයේ යෙදෙන්නන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් විය යුතුය. එසේ නොමැති නම්, ඒ සඳහා අත්දැකීම්වලින් සමන්විත වාර්තාකරුවන් හෝ ඔවුන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක මාධ්‍යවේදීන් යෙදිය යුතුය. යම් අන්තරායකර වාර්තාකරණයක යෙදීම ප්‍රතික්ෂේප කරන මාධ්‍යවේදියකුගේ වෘත්තීය ජීවිතය අහිමි වීමට ඉඩ නොදිය යුතුය. කර්තෘවරුන් හෝ ක්ෂේත්‍රයේ නියැළී සිටින මාධ්‍යවේදීන් එක්ව නිසි පරිදි අන්‍යෝන්‍ය අදහස් විමසා යම් අන්තරායකර වාර්තාකරණයක් නවතා දැමීමට තීරණය කළ හැකිය.

3. අනතුරුදායක ප්‍රදේශයන්හි වාර්තාකරණයේ යෙදවීමට පෙර, එහි පැවතිය හැකි කලහකාරී වාතාවරණයන් සහ අවදානම් පිළිබඳව සියලු මාධ්‍යවේදීන්ට පූර්ව අවබෝධයක් ලබාදිය යුතුය. හාම්පුතුන් විසින් මෙය අනිවාර්යයෙන් සිදුකළ යුතු බවට නියම කෙරේ.

4. වාර්තාකරණය පැවරීමට පෙර අදාළ ප්‍රදේශය තුළ පවත්නා දේශපාලනික, භෞතික සහ සමාජ වාතාවරණයන් පිළිබඳව මාධ්‍යවේදීන් අලුත් තොරතුරුවලින් පූර්ණ ලෙස දැනුම්වත් කරන බව මාධ්‍ය අයිතිකරුවන් විසින් සහතික කළ යුතුය. එමෙන්ම, ජිනීවා සම්මුතියෙන් සහ මානුෂීය නීතිය පිළිබඳ අනෙක් ප්‍රධාන ලියවිලි මගින් හඳුන්වාදී ඇති සන්නද්ධ ගැටුම් පිළිබඳ ජාත්‍යන්තර නීතිරීති පිළිබඳවද මාධ්‍යවේදීන්ට අවබෝධයක් ලබාදිය යුතුය.

5. අනතුරුදායක වාතාවරණයන්හි සිට වාර්තාකරණයේ යෙදෙන සියලු මාධ්‍ය කාර්ය මණ්ඩලවලට හා නිදහස් මාධ්‍යවේදීන්ට ඒ ඒ ස්ථානවලදී එල්ල විය හැකි තර්ජනයට ගැළපෙන ආරක්ෂණ මෙවලම් මෙන්ම වෛද්‍ය හා සෞඛ්‍ය ආරක්ෂාවන් ලබාදීමට පියවර ගත යුතුය.

6. කලහකාරී ප්‍රදේශයන්හි සේවයේ නිරත සියලු මාධ්‍යවේදීන්ට පෞද්ගලිකව ලබන තුවාල හා මරණද ආවරණය වන පෞද්ගලික ජීවිත රක්ෂණයක් ලබාදිය යුතුය. මාධ්‍ය කාර්ය මණ්ඩල හෝ නිදහස් මාධ්‍යවේදීන් යැයි කිසිම බෙදීමක් එහි නොතිබිය යුතුය.

7. පීඩාකාරී සිදුවීම් වාර්තාකරණයේ යෙදෙන මාධ්‍යවේදීන්ට අවශ්‍ය විටක නිදහසේ සහ රහස්‍යව මානසික උපදේශනය ලබාගැනීමට හාම්පුතුන් විසින් හැකියාව ලබාදිය යුතුය. එවන්වූ මානසික කම්පනයන් හඳුනාගෙන ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව ඔවුන් කළමනාකරුවන් පුහුණු කළ යුතුය. එමෙන්ම, අනතුරුදායක ප්‍රදේශයන්හි සේවයේ නිරත මාධ්‍යවේදීන්ගේ පවුල්වලට ඔවුන්ගේ සමීපතමයන්ගේ ආරක්ෂාව පිළිබඳව කාලීන හා යෝග්‍ය උපදෙස් නිරන්තරයෙන් ලබාදිය යුතුය.

8. මාධ්‍යවේදීහු යනු මධ්‍යස්ථ නිරීක්ෂකයෝය. එබැවින්, කිසිම මාධ්‍යවේදියකු තම රාජකාරියේදී ගිනිඅවියක් පරිහරණය නොකළ යුතුය.

9. මාධ්‍යවේදීන් යුද මෙහෙයුම් සිදුවන ප්‍රදේශවල සේවයේ නිරතව සිටින විට, ඔවුන් සිටින්නේ තම රටේ හමුදාව සමග වුවත් නැතත්, රජයයන් මෙන්ම සියලු සන්නද්ධ අංශ හා ආරක්ෂක හමුදාවන් තම මෙහෙයුම් ප්‍රදේශවල සිටින මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාවට ගරු කළ යුතුයැයි ඉල්ලා සිටිනු ලැබේ. තොරතුරු රැස් කරගෙන ඒවා වාර්තා කිරීම සඳහා ගමන් කිරීමට මාධ්‍යවේදීන්ට පවත්නා නිදහස අනවශ්‍ය ලෙස සීමා කිරීම හෝ ඒ සඳහා ප්‍රවෘත්ති මාධ්‍යවලට ඇති අයිතිය සම්මුති ගස්වා යටපත් කිරීම ද ඔවුන් විසින් නොකළ යුතුය.

10. තම නීත්‍යානුකූල වෘත්තියේ යෙදී සිටින මාධ්‍යවේදීන්ට ඒ හේතුවෙන් හිරිහැර කිරීමට, බිය ගැන්වීමට හෝ ශාරීරික හිංසනයට ආරක්ෂක හමුදාවන් කිසිවිටක ක්‍රියා නොකළ යුතුය.

ප්‍රධාන ජනමාධ්‍ය කණ්ඩායම් සහ මාධ්‍ය සංවිධාන මගින් සකස් කොට දැනට පවත්නා විවිධ ආරක්ෂණ පද්ධති ගණනාවක් ආශ්‍රයෙන් INSI ආරක්ෂණ පද්ධතිය සකස් කර ඇත.

## තමන් යම් සුපරීක්ෂාවකට ලක්ව සිටින්නේ නම් ගත යුතු පියවර

- සැමවිට අවධානයෙන් පසු වන්න.
- ඔබගේ අසල්වැසියන් සමග කුලුපග වන්න.
- සැකකටයුතු පුද්ගලයන් සහ වාහන පිළිබඳව සටහනක් තබාගන්න.
- සැකයක් ඇති නොවන පරිදි ඉහත පුද්ගලයන්ගේ හා වාහනවල ඡායාරූප ගන්න.
- සැකකටයුතු පුද්ගලයන් හෝ වාහන තමා පසුපස එන්නේ නම් ඒ පිළිබඳව තම සගයන්, හිතවතුන් හා පවුලේ සාමාජිකයන් දැනුම්වත් කරන්න.
- පොලීසියේ පැමිණිල්ලක් කරන්න.
- සංඥා පුවරු, වාහන තදබදයන්, පාලම් සහ කුඩා පාරවල් වැනි ස්ථානවලදීද සුපරීක්ෂාකාරීව සිටින පුද්ගලයන් හඳුනාගත හැකිය.
- ඔබ වාහනයක් පදවන්නේ නම්, යම් වාහනයක් විශේෂයෙන් මෝටර් සයිකලයක් ඔබ පසුපස එන්නේදැයි විමසිලිමත් වන්න.
- ඔබේ වාහනයේ වීදුරු ඔසවා සැමවිටම දොරවල් ඇතුළතින් අගුලු ලා තබන්න.
- ඔබේ වාහනය හොඳ ධාවන තත්ත්වයේ තබාගන්න.
- විශාල මාර්ග ඔස්සේ ගමන් ගන්නා විට සැමවිටම මැද මං තීරුවේ ගමන් කිරීමට උත්සාහගන්න.
- මහජනයා නොගැවසෙන හෝ අඳුරු මාවත් හෝ පටු පාරවල් ඔස්සේ ගමන් නොකරන්න.
- කිසිවකු ඔබ លුහුබඳින බවට සැකයක් ඇති වුව හොත් ළඟම ඇති පොලිස් ස්ථානය වෙත යන්න.
- කුලීරථයක ගමන් කරන්නේ නම් සැමවිටම එම වාහනය පසුපසින් සමීපව එන වාහන පිළිබඳව සැලකිලිමත් වන්න. යමකු លුහුබඳින බවට සැකයක් ඇත්නම්, නළාව වේගයෙන් හඬවමින් ළඟම ඇති පොලීසිය වෙත යන ලෙස රියැදුරුට දන්වන්න.

## මරණ තර්ජනයක් ඇති විට

- තර්ජනය හෝ තර්ජන එල්ල කළ ආකාරය පිළිබඳ විස්තර සටහන් කරගන්නා අතර, තර්ජනය කිරීමට යොදාගත් වචන නිවැරදිව සටහන් කරගන්න. ඒ මගින් ඔබ පොලීසියට ඉතා සවිස්තරාත්මක වාර්තාවක් සපයයි.
- එවන් තර්ජන සැහැල්ලුවෙන් නොගත යුතුයි. වහාම ඒ පිළිබඳව ප්‍රධානීන්ට, සගයන්ට සහ පවුලේ සාමාජිකයන්ට දන්වන්න.
- තර්ජනය පිළිබඳව සැලකියයුතු හඬක් නැගිය යුතුයි. ඒ සඳහා මාධ්‍ය සංවිධානවල සහ අනෙකුත් මාධ්‍ය කණ්ඩායම්වල සහයෝගය ලබාගන්න. ඊට ප්‍රසිද්ධියක් ලබාදෙන ලෙස ජනමාධ්‍ය ආයතනවලින් ඉල්ලා සිටින්න.
- ජංගම දුරකථනයෙන් කෙටි පණිවිඩ ඔස්සේ ඔබට තර්ජනය එල්ල වූයේ නම් එය ආරක්ෂිතව තබාගන්න. එම පණිවිඩය ඔබ විසින් නිසි බලධාරීන්ට කරනු ලබන පැමිණිල්ලකදී උපකාරී වනු ඇත.
- තර්ජනය ඉක්මනින් ක්‍රියාවට නැංවේයැයි ඔබ සිතනවා නම් පදිංචිව සිටින ස්ථානයෙන් වෙනත් ස්ථානයකට යෑම ගැන සලකා බලන්න.
- අත්‍යවශ්‍යම නම් පමණක් පොලිස් ආරක්ෂාව ලබාගන්න. එමෙන්ම, ඔබ ප්‍රදේශයේ පොලිස් ස්ථානය ඔබට විශ්වාසදැයි සිතා බලන්න.

## ඔබේ පවුලේ සාමාජිකයන්ට ආරක්ෂාව සැපයීම

- දුරකථනය ඔස්සේ හෝ නොදන්නා පුද්ගලයන්ට ඔබ පිළිබඳව තොරතුරු ලබානොදීමට කටයුතු කරන මෙන් පවුලේ සාමාජිකයන්ට හා නිවැසියන්ට උපදෙස් දෙන්න.
- තුවක්කුවකින් එල්ල විය හැකි වෙඩි පහරවල් යනාදියෙන් ආරක්ෂා වීමට හැකි වන පරිදි පවුලේ සාමාජිකයන් සමග නිරන්තරයෙන් ආරක්ෂණ අභ්‍යාසවල යෙදෙන්න.
- නාඳුනන පුද්ගලයන් සහ සැක කටයුතු වාහන පිළිබඳව අවධානයෙන් පසුවන අතර, ඒ පිළිබඳව යම් සටහනක් තබාගන්නා ලෙස පවුලේ සාමාජිකයන්ට පවසන්න.
- ඔබේ නිවසේ දොරගුලු සියල්ල බදැණ යොදා ආරක්ෂිතව වසා තැබීමට සැලකිලිමත් වන්න.
- ප්‍රහාරයකදී පවුලේ සාමාජිකයන්ට ආරක්ෂා විය හැකි පරිදි නිවස තුළ යම් ආරක්ෂිත කාමරයක් හඳුනාගන්න. එම කාමරය ශක්තිමත් දොරකින් සමන්විත විය යුතු අතර, දුරකථනයක්, පානීය ජලය, ආහාර, සැණෙළි පහනක්, ප්‍රථමාධාර කට්ටලයක් වැනි දෑවලින් සම්පූර්ණ කරගන්න. එයින් පිටව යා හැකි ආරක්ෂිත මාර්ගයක්ද සැලසුම් කරන්න.
- ඔබ නිවසින් පිටව යන විට නිවසේ යතුරු ඉදිරිපස පාපිස්නය යට හෝ මල් පෝච්චි තුළ හෝ නොතබා ඔබේ විශ්වාසවන්ත අසල්වැසියකුට බාරදීමට කටයුතු කරන්න.
- හැකි නම් මුර බල්ලකු ඇති කරන්න.
- යම් ලෙසකින් ඔබ පසුපස යම් සුපරීක්ෂාකාරී වීම් පවතී නම්, ඒවා හඳුනා ගැනීමට උපකාරී විය හැකි අසල්වැසියන් පිළිබඳ ලැයිස්තුවක් සකස් කරගන්න.

## යුදමය හෝ ගැටුම්කාරී වාතාවරණයන් වාර්තා කිරීම

- පැහැදිලිවම තර්ජනයක් එල්ල වූ සැණින් ඉවත් වන්න.
- යුද පිටිය හරහා නොයන්න. එය බෙහෙවින් අනාරක්ෂිත විය හැකිය.
- ගැටුමේ දෙපාර්ශ්වයේම සිට වාර්තාකරණයේ යෙදීම ගැන සැලකිලිමත් වන්න.
- එක් හෝ අනෙක් පාර්ශ්වයකට නතු වීමෙන් වළකින්න.
- හමුදා කඳවුරු සහ අනෙකුත් ස්ථාන පිළිබඳ සිතියම් ඔබේ සටහන් පොතේ සටහන් කරගැනීමෙන් වළකින්න. එමෙන්ම, හමුදා ආම්පන්න පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන බව නොපෙන්වා සිටින්න.
- ඔබ සතු පැහැදිලි සටහන් ප්‍රසිද්ධියේ පෙන්වීමෙන් වළකින්න. එමෙන්ම, අවසරයකින් තොරව පටිගත කිරීමේ යන්ත්‍ර හෝ සටහන් පොත් එළියට ගැනීමෙන් වළකින්න.

## ගිනි අවි ප්‍රහාරයක් ඔබ සිටින දෙසට එල්ල වන්නේ නම්

- ඔබ නොපෙනෙන ලෙස ආවරණය වන්න. කැපීපෙනෙන ඇඳුම් පැලඳුම්වලින් සැරසී නොසිටින්න.
- ආලෝක පරාවර්තනය අඩු කිරීම සඳහා ඔබ සතු දිලිසෙන උපකරණවල පැහැය අඩු කිරීමට එය අපිරිසිදු කරන්න. මඩ තවරන්න.
- මෑතදී යම් පුද්ගලයකුට ප්‍රහාරයක් එල්ල වුණු ස්ථානයක ආරක්ෂිතව නොසැඟවෙන්න.
- පොළොවේ ඇති වළකින් හෝ බෑවුමකින් ප්‍රමාණවත් ආවරණයක් ලැබිය හැකිය.
- ගොඩනැගිල්ලක් තුළ නම් හෝටල් වැසිකිළියක් වැනි එළියට විහිදුණු බිත්ති නොමැති කාමරයක සැඟවෙන්න.

- සැඟවී සිටින ස්ථානයේ සිට එබී නොබලන්න.
- ඔබ සැඟවී සිටින්නේ බිත්තියක් පිටුපස වුවද එතැන බිම දිගා වී සිටින්න.
- ඔබ සැඟවී ගත්විට එතැනින් ආරක්ෂිතව පිට වී යා හැකි ක්‍රමයක් සැලසුම් කරන්න.
- ඔබ ඉවත්ව යනවිටදී වෙඩි තබන ස්ථානයත් ඔබත් අතර ඇති ගහකොළ හෝ තාප්ප වැනි ආරක්ෂාවන්ට මුවා වී දිව යන්න.
- ඔබ ආරක්ෂිතව දිව යන විට ඔබ සතු උපකරණ බාධාවක් වේයැයි සිතන්නේ නම් ඒවා තබා යන්න.

## උද්ඝෝෂණ හෝ වෙනත් මහජන කැලඹීම් වාර්තා කිරීම

- කල්තියා සැලසුම් කරන්න.
- ඔබ සමග යන කණ්ඩායම (ඡායාරූප ශිල්පියා, කැමරා ශිල්පියා, නිෂ්පාදකවරයා යනාදින්) වෙන් වෙන් වශයෙන් ආවරණය කිරීමට යන්නේ නම් නැවත හමු වන ස්ථාන සැලසුම් කරන්න.
- සැමවිටම මාධ්‍ය හැඳුනුම්පත රැගෙන යන්න. නමුත් එයින් අනවශ්‍ය අවධානයක් තමන් දෙසට යොමු වන්නේයැයි හැඟෙන්නේ නම් එය සඟවා තබාගන්න.
- එක් බොත්තමක් ඔබා කඩිනමින් හදිසි අංකයන්ට කතා කළ හැකි පරිදි ජංගම දුරකථනය සූදානම්ව තබන්න.
- කඳුළුගෑස් ප්‍රහාරයක් එල්ලවෙතැයි අපේක්ෂා කරන්නේ නම් සැමවිටම සුළං හමන දිශාවට ප්‍රතිවිරුද්ධව ස්ථානගත වෙන්න.
- පිහිනුම් කණ්ණාඩි හෝ කාර්මික ඇස් ආරක්ෂණ වැනි, ඇස් වසාගැනීමට හැකි පලඳනා රැගෙන යන්න.
- ප්‍රථමාධාර කට්ටල රැගෙන යන්න. ඒවා පරිහරණය කිරීම පිළිබඳව දැනුම්වත් භාවයකින් පසුවන්න.
- බොහෝ විට පෙට්‍රල් බෝම්බ වැනි ප්‍රහාර එල්ල විය හැකි නිසා, වාර්තාකරණයට යන විට කෘත්‍රිම රෙදි වැනි පහසුවෙන් ගිනි ඇවිළීමකට ලක් නොවන සැහැල්ලු ස්වාභාවික රෙදිවලින් සැකසූ ඇඳුම්වලින් සැරසී සිටීමට උත්සුක වන්න.
- උද්ඝෝෂණය පවතින ස්ථානයෙන් පහසුවෙන් පිටව යා නොහැකි වේයැයි සිතන්නේ නම් දිනකට සරිලන පානීය ජලය, ආහාර රැගෙන යන්න.
- ඔබ වාර්තාකරුවකු නම් ඔබට යමක් දර්ශනය කරගැනීම සඳහා සැමවිටම උද්ඝෝෂකයන් අතර සිටිය යුතු නැත.
- ඔබ ඡායාරූප ශිල්පියකු හෝ කැමරා ශිල්පියකු නම් හැකි හැමවිටම උස් ස්ථානයක සිට රූගත කිරීම් සිදු කිරීමට උත්සාහ ගන්න.
- සැමවිටම කණ්ඩායම සමග සම්බන්ධීකරණය තබාගන්න. උද්ඝෝෂණය යම් දරුණු මට්ටමකට හැරේයැයි සිතන්නේ නම් ආරක්ෂිතව පිටව යා හැකි මාර්ගය පිළිබඳව සිතින් සිතියමක් ඇඳ තබාගන්න.
- එවන් සිදුවීමක් ආවරණය කර පැමිණි පසු එහි අත්දැකීම් උකහාගැනීම සඳහා වහාම ප්‍රවෘත්ති කාමරය තුළ සංවාදයක යෙදෙන්න.

## ස්වාභාවික විපත් වාර්තාකරණය

- පළමුව තත්ත්වය තක්සේරු කරන්න.
- ගංවතුර, භූමිකම්පා, සුනාමි, නාය යෑම් වැනි ඔබ ආවරණය කිරීමට යන විපත් පිළිබඳව හැකි තාක් දුරට අධ්‍යයනයක යෙදී කරුණු සොයන්න.
- සුදුසු ආරක්ෂිත ඇඳුම් සහ උපකරණ පලඳින්න.
- වතුර බෝතලයක් රැගෙන යන්න.

- ස්වාභාවික විපත් පිළිබඳ විශේෂඥයන් සහ බලධාරීන් ලබාදෙන උපදෙස් පිළිපදින්න.
- පොලිස් රැකවල් හරහා ගමන් නොකරන්න.
- සහන සේවකයන්ට සහ අනතුරට පත් වූවන් බේරාගැනීමට කටයුතු කරන්නන්ට බාධාවක් නොවන අයුරින් හැසිරෙන්න.
- හානිකර රසායන ද්‍රව්‍ය තිබිය හැකි කුඩා බඳුන් හෝ බහාලුම්වලට අත නොතබන්න. ඒවා නාසයට ළං නොකරන්න.
- දුම්බීමෙන් වළකින්න (අනතුරු සිදු වූ ස්ථානවල ගෑස් නළ පිපිරී තිබෙන්නට පුළුවන).

## ආරක්ෂක මුරපොළක් අසලදී කටයුතු කළ යුතු ආකාරය

- විනීතව හැසිරෙන්න.
- වාදයන්ට පැටලීමෙන් වළකින්න.
- ඔබ මාධ්‍යවේදියකු බව හඳුන්වාදෙන්න.
- ඔබ පයින් ගමන් කරන්නේ නම් අවශ්‍ය ලියකියවිලි ඇතිව පමණක් මුරපොළ අසලට යන්න. වාහනයක ගමන් කරන්නේ නම් සැමවිටම ජනේල හා දොරවල් අගුලු ලා තබන්න. දැනුම්දීමක් සිදු කළ හොත් පමණක් වාහනයෙන් එළියට බසින්න.
- අවසරයක් නොමැති විට රූගත කිරීමෙන් වැළකී සිටින්න.
- මුරපොළේ සිටින සොල්දාදුවන් හෝ සන්නද්ධ භටයන් එදිරිවාදීව හෝ නොසන්සුන්ව කටයුතු කරන්නේ නම් ඔවුන් සමග කුලුපග වීමට උත්සාහ දරන්න.
- ඔබගේ හැඳුනුම්පත පෙන්වන විට, හැකියාවක් පවතී නම් ඔබගේ බිරිඳගේ හෝ දරුවන්ගේ ඡායාරූපද පෙන්වීමට කටයුතු කරන්න. එමගින් යම් මානුෂීය හැඟීමක් ජනිත කළ හැකිය.
- ඔබ එහි පැමිණෙන බව වෙනත් අය දන්නා බවත්, නැවත පැමිණීම ඔවුන් අපේක්ෂාවෙන් සිටින බවත් සඳහන් කරන්න.
- ඔබ ඔවුන්ට තර්ජනයක් නොවන බව අවබෝධ වන ආකාරයට කටයුතු කරන්න.

## අත්අඩංගුවට ගැනීමක් සිදු වුව හොත් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග

- ඔබේ අයිතීන් දැන සිටින්න: නිහඬව සිටීමේ අයිතිය, ඔබේ කැමැත්ත පරිදි ස්වාධීන සහ දක්ෂ නීතිඥයකුගේ සහාය ලබාගැනීමේ අයිතිය ඔබ සතුය.
- වධ බන්ධනවලට, බිය ගැන්වීමට හෝ ඕනෑම ආකාරයක බලාත්කාරී හිංසනයකට ලක් නොවීමේ අයිතිය ඔබට හිමිය.
- මෙම අයිතීන් සහ ඔබ පවසන දෑ උසාවියක දී ඔබට එරෙහිව යොදාගත හැකි බව පිළිබඳව දැනුම්වත් වීමට ඔබට අයිතිය ඇත.
- ඔබ රඳවා ගනු ලැබුවද සාමාන්‍ය මිනිසකු හා සමාන සැලකිල්ලට ලක් විය යුතු අතර, නිසි ක්‍රියාමාර්ගයන්ට පිවිසීමටද අවසරය ඇත.

## පැහැරගැනීමකට ලක් වුව හොත් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

- පැහැරගැනීමෙන් කෙසේ හෝ ගැළවීයෑමට නම්, අවශ්‍ය සුබවාදී ආකල්පයෙන් හා මානසික අවධානයෙන් පසුවිය යුතුය.
- ඔබ පැහැරගත් පිරිසට අවනත වී ඔවුන් පවසන දෑ කිරීමට උත්සාහ ගන්න. ඔවුන් එදිරිවාදී කර නොගන්න.
- ඔබේ බිරිඳ හෝ සැමියා, ඔබේ සගයෙකු වැනි කවුරුන් හෝ සමග මනසින් සංවාදයේ යෙදෙන්න. එය තත්ත්වය මැනවින් අවබෝධ කරගැනීමට ඔබට උදව් වනු ඇත.

- මානසික ඒකාග්‍රතාවෙන් පසුවීම සඳහා කළ හැකි සෑම දෙයක්ම කරන්න. නැවත නිවසට ගිය පසු කරන දෑ පිළිබඳව චිත්‍රයක් මවමින් මානසික පීඩනයට ලක් වීමෙන් වැළකී සිටීමට ඔබට හැකිය.
- විශේෂයෙන්ම, ඔබ දිනකට වඩා වැඩි කාලයක් රඳවාගෙන සිටිය හොත් ශාරීරිකව ශක්තිමත්ව සිටීමට උත්සාහ ගන්න.
- ඔබ අත්අඩංගුවට ගත් පුද්ගලයන්ට ඔබට එරෙහිව අමානුෂික ලෙස කටයුතු කළ නොහැකි වන පරිදි ඔබේ පවුලේ සාමාජිකයන් පිළිබඳව කතා කිරීමට පියවර ගන්න.
- ඔබ දරුණු තාඩනපීඩනයන්ට ලක් වන්නේ නම් සැමවිටම තමන් ආදරය කරන පිරිස් සමග මානසික සංවාදයක යෙදෙන්න. එසේ නැත් නම් දෙවියන් ආමන්ත්‍රණය කරන්න.
- ඔබ ඉක්මනින්ම නිදහස් කරන බවට ලබාදෙන පොරොන්දු විශ්වාස නොකරන්න.

## ප්‍රවෘත්ති කාමරය සුරක්ෂිත කරගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග

- ඔබ යන එන ස්ථානයන් සහ ඔබගේ දිනයේ චාරිකා ගමන් මාර්ගය පිළිබඳව කර්තෘවරුන් හෝ අංශ ප්‍රධානීන් දැනුම්වත් කරන්න. ඔබ හමුවන්නට යන්නේ කවුරුන්ද යන්නත්, ඒ කුමන වේලාවක කොතැනකදීද යන්නත් ඔවුන්ට දැනුම් දෙන්න.
- යම් අනතුරුදායක වාර්තාකරණයක නියැළීමට ඇති අවස්ථාවන්හිදී, යම් ක්‍රමවේදයක් හරහා හැමවිටම කාර්යාලය සමග සන්නිවේදනය පවත්වාගෙන යන්න. ඒ හරහා ඔබට ඔවුන් වෙත පහසුවෙන් හා කඩිනමින් ළඟාවිය හැකිය.
- සංවේදී ලිපිගොනු, ලියවිලි, වීඩියෝ පට, සංයුක්ත තැටි, හඬ පටිගත කළ තැටි ආදිය ආරක්ෂිතව තබාගත යුතුය. ප්‍රවෘත්ති කාමරයෙන් පිටත ස්ථානයක ඒවා ආරක්ෂිතව තැබීම වඩාත් ප්‍රයෝජනවත්ය.
- හැකි සෑම විටම දුරකථනයෙන් සිදු කරනු ලබන කතාබහ ඔස්සේ සංවේදී තොරතුරු හුවමාරු කර නොගන්න.

## උපග්‍රන්ථය 10

# ආශ්‍රිත ආයතන නාමාවලිය

## කලාපීය හා ගෝලීය ගවේෂණාත්මක ජාල

- Arab Reporters for Investigative Journalism (ARIJ)
- Balkan Investigative Reporting Network(BIRN)
- Forum for African Investigative Reporters (FAIR)
- Global Investigative Journalism Network (GIJN)
- International Consortium of Investigative Journalists (ICIJ)
- Investigative Reporters Network Europe (IRENE)
- Organized Crime and Corruption Reporting Project (Southeastern Europe)
- SCOOP (East and Southeastern Europe)

## ගෝලීය ගවේෂණාත්මක වාර්තාකරණ මධ්‍යස්ථාන

- Bulgarian Investigative Journalism Center (BIJC)
- Caucasus Media Investigations Center (CMIC)
- Center for Investigative Journalism, UK
- Center for Investigative Reporting, Bosnia & Herzogovina (CIN)
- Center for Investigative Reporting, Nepal
- Center for Investigative Reporting, Serbia
- Centro de Investigation le Information Periodistica (CIPER), Chile
- Ghana Center for Public Integrity
- Investigative Journalism Center (IJC), Croatia
- Investigative Journalism Center of Moldova
- Investigative Journalists NGO, Armenia
- Philippine Center for Investigative Journalism (PCIJ)
- Romanian Center for Investigative Journalism (CRJI)
- The Canadian Centre for Investigative Reporting (CCIR)

## එක්සත් ජනපදයෙහි ගවේෂණාත්මක වාර්තාකරණ මධ්‍යස්ථාන

- Center for Investigative Reporting(CIR)
- Center for Public Integrity(CPI)
- Investigate West
- Investigative Reporting Workshop, American University
- New England Center for Investigative Reporting at Boston University
- ProPublica
- Rocky Mountain Investigative News Network
- Schuster Institute for Investigative Journalism, Brandeis University
- Stabile Center for Investigative Journalism, Columbia University
- Texas Watchdog
- Wisconsin Center for Investigative Journalism

## උපග්‍රන්ථය 11

# ආශ්‍රිත වෙබ් අඩවි නාමාවලිය

- Article 19 - http//www.gn.apc.org/article 19
- Canadian Journalists for Free Expression - http//www.cjfe.org
- Cobrapost - http://www.cobrapost.com/
- Committee to Protect Journalists (CPJ)- http//www.cpj.org
- Commonwealth Press Union - http//www.compressu.co.uk/
- European Journalism Centre - http//www.ejc.nl
- European Journalism Network - http//www.ejn.org
- FACSNET - www.facsnet.org
- Freedom Forum - http//www.freedomforum.org
- Groundviews - http//www. groundviews.org
- Independent Journalism Foundation - http//www.ijf-cij.org
- International Federation of Journalists - http//www.ifj.org
- International Freedom of Expression Exchange - http//www.ifex.org
- International Institute for Journalism -http//www.scripps.ohiou.edu
- International Journalists Network - http//www.ijnet.org
- International Media Support- http//www.i-m-s.dk
- International PEN - http//www.internationalpen.org.uk
- International Press Institute- http//www.freemedia.at/
- International Women's Media Foundation- http//www.iwmf.org
- Knight Center for Journalism in the Americas -http//www.knightcenter.utexas.edu
- Malaysiakini - http://www.malaysiakini.com/
- Online Journalism Review - www.ojr.org
- Panos South Asia - http://www.panossouthasia.org
- Poynter Institute- www.poynter.org
- Press Foundation of Asia -http//www.pressasia.org

- Reporters San Frontiers(RSF) -http//www.rsf.fr
- Salzburg Seminar- http//www.salzburgseminar.org
- Society of Professional Journalists in the United States - www.spj.org/ethics.asp
- Tehelka.org - http://www.tehelka.com
- The Freedom Forum -http//www.freedomforum.org
- The Reporters' Committee for Freedom of the Press- www.rcfp.org
- The Thomson Foundation -http//www.Thomfound.ac.uk
- UNESCO - http//www.unesco.org/webworld
- World Association of Newspapers -http//www.wan-press.org
- World Press Freedom Committee-http//www.wpfc.org
- World Press Photo -http//www.worldpressphoto.nl

## උපග්‍රන්ථය 12

# ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය


- Arab Reporters for Investigative Journalism - http://arij.net/en/?cat=13
- *Arthasastra* by Kautilya
- The Elements of Journalism: What Newspeople Should Know and What the Public Should Expect by Bill Kovach and Tom Resenstiel (2007)
- Story-Based Inquiry: A Manual for Investigative Journalists by Mark Lee Hunter, Nils Hanson, Rana Sabbagh, Luuk Sengers, Drew Sullivan and Pia Thordsen - http://www.arij.net/look/englishmanual.pdf
- Digging Deeper: A Guide for Investigative Journalists in the Balkans by Sheila Coronel (2009)
- http://groundviews.org
- Investigative Editors and Reporters - http://www.ire.org/
- The Code of Professional Practice (Code of Ethics) of the Editors Guild of Sri Lanka – http://www.fojo.se/polopoly_fs/1.1900!Code%20of%20Ethics-%20English.pdf
- Complaint Form of the Sri Lanka Press Complaints Commission - http://www.pccsl.lk/how to make complain.php
- International Federation of Journalists: Declaration of Principles on the Conduct of Journalists- http://asiapacific.ifj.org/en
- Tehelka - http://www.tehelka.com
- Cobrapost - http://www.cobrapost.com/
- ABC Television Network, US- http://abc.go.com/

- Definitions of Corruption - http://www.unodc.org/pdf/crime/corruption/Handbook.pdf
- Lexis-Nexis - http://www.lexisnexis.com/
- Loosening Lips (The Art of the Interview) by Eric Nader - http://home.earthlink.net/~cassidyny/naldertip.htm
- The Society of Professional Journalists - http://www.spj.org/pdf/ethicscode.pdf.
- Attacks on the Press 1999: Sri Lanka by the Committee to Protect Journalists - http://cpj.org/2000/03/attacks-on-the-press-1999-sri-lanka.php
- http://www.article19.org/data/files/pdfs/publications/sri-lanka-fifty-years-on.pdf
- Section 5.1 of The Code of Professional Practice (Code of Ethics) of the Editors Guild of Sri Lanka – http://www.fojo.se/polopoly_fs/1.1900!Code%20of%20Ethics-%20English.pdf
- http://groundviews.org/2010/11/04/a-turn-for-the-worse-undergraduate-protests-and-unrest-in-sri-lanka/
- Google - http://www.google.com/
- Wikipedia - http://www.wikipedia.org/
- South Florida Hurricane Relief Fraud Report - http://www.sun-sentinel.com/news/local/southflorida/sfl-femacoverage,0,3866065.storygallery
- Edgar Database at the US Securities and Exchange Commission - http://www.sec.gov/edgar/searchedgar/webusers.htm
- http://groundviews.org/2010/11/19/record-breaking-rice-cakes-but-at-what-cost/
- Press Freedom Index by Reporters Sans Frontiers 2010 - http://en.rsf.org/press-freedom-index-2010,1034.html

- 2009 UNESCO Press Freedom Prize Awarded to Lasantha Wickrematunge - http://portal.unesco.org/ci/en/ev.php-URL_ID=28500&URL_DO=DO_TOPIC&URL_SECTION=201.html

- Getting Away with Murder: Impunity Index by the Committee to Protect Journalists - http://www.cpj.org/reports/2010/04/cpj-2010-impunity-index-getting-away-with-murder.php

- Live News: A Survival Guide for Journalists by the International Federation of Journalists - http://www.ifj.org/assets/docs/091/223/51c565b-ee6f6df.pdf

- Safety Code by the International News Safety institute - http://www.newssafety.org/index.php?option=com_content&view=article&id=165:insi-safety-code&catid=166:safety-code&Itemid=100066
- http://www.icrc.org/customary-ihl/eng/docs/v2_rul_rule34

- Safety Matters - For Journalists and Media Workers by the International Federation of Journalists, Free Media Movement, Internews and Young Asia Television (2009)

- International Media Support on Safety of Journalists - http://www.i-m-s.dk/page/introduction-ims

- Accuracy Checklist - http://www.scribd.com/doc/31924802/Checklist-Craig-Silverman-Regret-the-error

- Safety Case Study - http://www.thesundayleader.lk/archive/20060423/spotlight.htm

- The Seven Basic Rules for Investigative Reporting by Clark Mollenhoff - http://www.concernedjournalists.org/seven-basic-rules-investigative-reporting

# යතිර බිඳහැර...

## ගවේෂණාත්මක මාධ්‍යකරණය

ෆෙඩ්රික් ඊබට් පදනම
අංක 4, ඇඩම්ස් මාවත, කොළඹ-4.
දුරකථනය: +94 112502710/1
ෆැක්ස්: +94 112502727
ඊමේල්: office@fessrilanka.org
වෙබ්: http://www.fessrilanka.org

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
අංක 6, 37 වන පටුමග, රැජින මාවත, කොළඹ-3.
දුරකථනය: 011 4369781 - 3
ෆැක්ස්: 011 2506419
ඊමේල්: tisl@tisrilanka.org
වෙබ්: www.tisrilanka.org

ISBN: 978-955-1281-51-9